

# සෝවියට් දේශයේ බිඳවැටීම සහ ධනවාදයේ වත්මන් අර්බුදය

ජනතා විමුක්ති පෙරමුණ

# සෝවියට් දේශයේ
# බිඳවැටීම සහ
# ධනවාදයේ වත්මන් අර්බුදය

# සෝවියට් දේශයේ බිඳවැටීම සහ ධනවාදයේ වත්මන් අර්බුදය

නියමුවා ප්‍රකාශන

# සෝවියට් දේශයේ
# බිඳවැටීම සහ
# ධනවාදයේ වත්මන් අර්බුදය

© නියමුවා ප්‍රකාශන

ISBN 978-955-8696-43-9

පළමු මුද්‍රණය : 2016 නොවැම්බර්

**මුද්‍රණය:**
නියමුවා ප්‍රකාශන,
43/20, නුගගහ පෙදෙස,
පිළියන්දල පාර,
මහරගම.

**විමසීම්:**
දුරකථනය-: +94112785612
ෆැක්ස්-: +94112786050
විද්‍යුත් තැපෑල-: niyamuwanews@gmail.com
වෙබ්-: www.jvpsrilanka.com

# පටුන


පෙරවදන vii

1. සමාජවාදී කඳවුර බිඳ වැටීමෙන් විසි වසරකට පසු 01

2. සමාජවාදය යනු කුමක්ද ? 11

3. පසුගාමී රටක සමාජවාදය හමුවේ වන අභියෝග 27

4. සමාජවාදී කඳවුර හා එහි ජයග්‍රහණයන් 53

5. සමාජවාදී රාජ්‍ය පද්ධතිය බිඳවැටීමට හේතු 85

6. බිඳ වැටුණු සමාජවාදී රටවල වත්මන් තත්වය 105

7. සමාජවාදය අහිමිවීමෙන් බිඳ වැටුණු ජීවිත 115

8. ලෝක ධනවාදයේ වත්මන් තත්වය 149

9. කඩා වැටෙන ධනවාදයේ යථා රූපය 165

10. අර්බුදය සමඟ මතු වූ නව තත්වයන් 187

# පෙරවදන

ලොව පළමු සමාජවාදී රාජ්‍යය ලෙස සමාජවාදී සෝවියට් දේශය බිහිකළ ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවයට මේ මස නොවැම්බර් 07වැනිදාට (නව දින දර්ශනයට අනුව) වසර 99කි. ලබන 2017 වසරේදී ඔක්තෝබර් විප්ලවයට වසර සියයක් පිරේ.

20වැනි සියවසේ සිදුවූ ශ්‍රේෂ්ඨතම සිදුවීම ලෙස මානව ඉතිහාසයට එක්වූ ඔක්තෝබර් විප්ලවය විසින් බිහිකළ සෝවියට් දේශය ඉන් වසර 74කට පසු 1991දී බිඳ වැටුණේ, ලොවම මවිතයට පත් කරමින් හා විශේෂයෙන් සමාජවාදය වෙනුවෙන් ලොව පුරා සටන් කරමින් සිටි ජනතාව දුෂ්කරතාවයට පත් කරමිනි.

සෝවියට් දේශය බිඳ දැමීමෙන් තාවකාලික ජයක් අත්පත් කරගත් අධිරාජ්‍යවාදීහු, සමාජවාදය යථාර්ථයක් නොවන බවත් ධනවාදී ක්‍රමය සදාකාලික බවටත් මත පතුරුවා හළ අතර ලෝක බල තුලනයේ ඇතිවූ වෙනස උපයෝගී කර ගනිමින් ඒක ධ්‍රැවීය ලෝකයක්ද නිර්මාණය කළහ; ලොව රටවල් ආක්‍රමණය කළහ. සෝවියට් දේශය නැති පාඩුව ලෝකයට බරපතළ ලෙස දැනුණි.

සෝවියට් දේශය ප්‍රමුඛ නැගෙනහිර යුරෝපීය සමාජවාදී රාජ්‍ය පද්ධතිය බිඳ දැමීමේ උද්දාමයෙන් සිටි අධිරාජ්‍යවාදී කඳවුරේ රටවලට එම සතුට වැඩි කලක් භුක්ති විඳීමට හැකි වූයේ නැත. සෝවියට් දේශය බිඳ දැමූ ප්‍රීතිය සමරනුවස් සච්දිය පිරීමට අතට ගත් මධුවිත මුව තැබීමටත් පෙර දැවැන්ත ආර්ථික පසුබෑමකට මුහුණ දීමට අධිරාජ්‍යවාදයට සිදුවිය. ඒ, 2008 සැප්තැම්බරයේ ඇමරිකානු එක්සත් ජනපදයෙන් ඇරඹුණු මහා ආර්ථික අවපාතයක් ධනවාදී ලෝකය දෙදරවමින් සුළි කුණාටුවක් ලෙස හමා යාම නිසාය.

ඒ සමගම ලෝක ධනවාදයේ නායකයින්ට සිදුවූයේ, "සමාජවාදයේ අසාර්ථකකම" ගැන කරමින් සිටි කථාව නවතා ධනවාදයේ බිඳ වැටීම ගැන කෙඳිරි ගෑමටය. ඉන් යළිත් තහවුරු කරනු ලැබූයේ, ධනවාදයේ අර්බුදයත් ඊට ඇති විසඳුම නවීන සමාජවාදයත් බවය. මේ පිළිබඳව ලොව පුරා විවිධ මත පළවන්නට පටන් ගැනුණි.

මේ තත්වය තුළ සෝවියට් දේශයේ බිඳවැටීම පිළිබඳවත් ලෝක ධනවාදය මුහුණ දුන් දැවැන්ත ආර්ථික අවපාතය පිළිබඳවත් න්‍යායික හා ප්‍රායෝගික කරුණු පදනම් කරගත් පුළුල් හා ගැඹුරු සංවාදයක් ලංකාව තුළ ගොඩනැගීම අත්‍යවශ්‍ය කරුණක් විය. එය අරමුණු කරගනිමින් සෝවියට් දේශයේ බිඳවැටීමට වසර 20ක් ගතවූ තැන ජනතා විමුක්ති පෙරමුණේ අධ්‍යාපන අංශය විසින් තම සාමාජිකයින් සඳහා අධ්‍යාපන සම්මන්ත්‍රණ මාලාවක් පවත්වනු ලැබීය.

එම සම්මන්ත්‍රණයෙන් පසු ගෙවුණු වසර කිහිපය විසින්ද යළි යළිත් තහවුරු කරමින් සිටින්නේ, ධනවාදයේ අර්බුදයට ධනවාදය තුළ විසඳුමක් නොමැති බවය; ඊට ඇති එකම විසඳුම නවීන සමාජවාදය බවය. එහෙත් සමාජවාදී සෝවියට් දේශයේ බිඳවැටීම සමාජවාදයේ බිඳවැටීමක් ලෙස වැරදියට අර්ථ දැක්වීමට ඇතැම්හු තවමත් උත්සාහ

දරති. මේ තත්වය තුළ සෝවියට් දේශයේ බිඳවැටීමට හේතු වූ කරුණු පිළිබඳවත් ධනවාදී කඳවුරේ ආර්ථික අවපාතයේ සැබෑ ස්වරූපය පිළිබඳවත් විස්තර කරමින් පැවැත්වූ ඉහත සම්මන්ත්‍රණයේ කාලීන වැදගත්කම සලකා එය කෘතියක් ලෙස මුද්‍රණය කිරීමට අපි තීරණය කළෙමු. "සෝවියට් දේශයේ බිඳවැටීම හා ධනවාදයේ වත්මන් අර්බුදය" නමින් ඔබ අතට පත්වන්නේ එම කෘතියයි.

මෙම කෘතිය සකස් කරනු ලැබූයේ අධ්‍යාපන සම්මන්ත්‍රණයේ කරුණු සාකච්ඡා කළ අනුපිළිවෙළමය. ඒ නිසාම මෙහි ඇතැම් කරුණු කිහිප තැනක අවධාරණය වීමේ පුනරුක්ති දෝෂය තිබේ. එහෙත් අධ්‍යාපන කටයුත්තකදී එම දෝෂය අවශ්‍ය දෙයක් ලෙස සලකා එසේ තැබීමට ඉඩ හැරියෙමු. ධනවාදයට එරෙහිව සමාජවාදය වෙනුවෙන් කරන මතවාදී සටනේදී මෙහි සාකච්ඡා කරනු ලබන කරුණු කිසියම් හෝ පිටිවහලක් වන්නේ නම් අපේ බලාපොරොත්තුවද එයම බව සඳහන් කරමු.

***නියමුවා ප්‍රකාශකයෝ***
***2016 නොවැම්බර් 08***

# 1

# සමාජවාදී කඳවුර බිඳ වැටීමෙන් විසි වසරකට පසු

1917 ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවය සමාජ සංවර්ධන ඉතිහාසයේ නව සමාජ ආර්ථික ක්‍රමයක උදාව සනිටුහන් කළේය. ඉන් ඇරැඹි ගමන් මඟ මානව ඉතිහාසයේ සුවිශේෂී පියවරයන් පෙළක් ලෙසින් ජාතීන් ගණනාවකගේ විමුක්තිය උදෙසා වන මාවත විවර කරන ලදී. එවන් වූ ප්‍රගතිශීලී සමාජ පරිවර්තන ක්‍රියාවලිය රුසියාව, නැගෙනහිර යුරෝපය, චීනය, ඉන්දු චීනය, ලතින් ඇමරිකාව, කැරිබියානු කලාපය ආදී වශයෙන් පෘථිවි තලය සිසාරා පැතිර යන්නට විය. එම විප්ලවීය ක්‍රියාදාමය නිර්ධන පංතිය ප්‍රමුඛ පීඩිත පංතියේ සිත්සතන් උද්දාමයටද, බලාපොරොත්තු සහගත සහ ධෛර්යමත් බවටද පත් කරන්නක් විය. මානව සංවර්ධන ඉතිහාසයේ සුවිශේෂ වූ කාර්යභාරයක් වෙනුවෙන් උරදුන් මෙම ඓතිහාසික ක්‍රියාවලිය අධිරාජ්‍යවාදී ලෝකය බියෙන් සලිත කරවන්නක් වීම පුදුම සහගත දෙයක් නොවේ. ධනවාදී සමාජ ආර්ථික ක්‍රමය එහි පදනමින්ම බිඳවට්ටන ද්‍රව්‍යමය බලවේගය වන නිර්ධන පංතිය ප්‍රමුඛ පීඩිත

පංතිය කුමන ආකාරයේ බලවේගයක් දැයි මොනවට පෙන්වාලූයේ එම විප්ලවයන්හිදීය. ඉන් නොනැවතී රුසියන් විප්ලවයට ඓතිහාසික වශයෙන් තවත් සුවිශේෂී ස්ථානයක් හිමිවිය. එය නම් නිර්ධන පංති රාජ්‍ය බලය හා සමාජවාදය ගොඩනැගීමේ පළමු අත්දැකීම රුසියන් සමාජවාදී සමාජ විප්ලවය බවට පත්වීමය. රුසියන් විප්ලවයේ නියමු කාර්යභාරය ඉටු කළ ලෙනින් නැවත නැවතත් සඳහන් කළ පරිදි ලෝක සමාජවාදී විප්ලවයේ පූර්ව අත්දැකීම් සහිත ගුරුවරයා බවට එය නිතතින්ම පත්වූයේය. ඒ හා සබැඳෙමින් ඉන් පසුව බිහිවූ සමාජවාදී රාජ්‍ය පද්ධතිය ලෝක සමාජවාදී විප්ලවයට නවමු ආශ්වාදයක් මෙන්ම නවමු අත්දැකීම් සම්භාරයක්ද විය. එතැන් පටන් පංති සටන් ඉතිහාසයේ අවසාන පංති සටන වන නිර්ධන පංතිය හා ධනපති පංතිය අතර වන අරගලය යල් පැනගිය හෙවත් කල් ඉකුත්වූ ධනවාදී ලෝකය හා නවමු බිහිවෙමින් පවතින සමාජවාදී ලෝකය අතර ගැටුමක් ලෙස විද්‍යාමාන වන්නට විය.

මෙලෙස 1917 ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවයෙන් ආරම්භවූ සමාජවාදය 1980 වන විට සමාජවාදී රාජ්‍ය පද්ධතියක් ලෙස වර්ධනය වී තිබුණේය. පළමුව 1917 රුසියානු සමාජවාදී සමාජ විප්ලවයෙන් පසුව සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමය(USSR) (සෝවියට් දේශය) පිහිටුවනු ලැබීය. පසුව සෝවියට් දේශයේ මඟ පෙන්වීම ලබමින් සමාජවාදී රාජ්‍ය පද්ධතිය බිහිවිය. එම සමාජවාදී රාජ්‍ය පද්ධතියට අයත් රාජ්‍යයන් වූයේ සෝවියට් දේශය(1917 ඔක්තෝබර්), මොංගෝලියාව(1924), යුගෝස්ලාවියාව(1943), ඇල්බේනියාව(1944), පෝලන්තය(1945), නැගෙනහිර ජර්මනිය(1945), උතුරු කොරියාව(1945), බල්ගේරියාව(1946), රුමේනියාව(1947), චෙකොස්ලොවැකියාව(1948 - 1950), හංගේරියාව(1949), චීනය(1949), කියුබාව(1959), දකුණු යේමනය(1967), ඉතියෝපියාව(1974), වියට්නාමය(1945 - 1975), ලාඕසය(1975), ඇෆ්ගනිස්ථානය(1978),

කම්පූචියාව(1979), නිකරගුවාව(1979), ග්‍රෙනෙඩාව(1979) යන රටවල්ය. සෝවියට් සමාජවාදී සමුහාණ්ඩුවට මුළු මහත් පෘථිවි තලයේ භූමි ප්‍රමාණයෙන් හයෙන් එකක් අයත් විය. මේ අතර සමාජවාදී චීනය ලෝක ජනගහනයෙන් ඉහළම අගය දරන රටයි. ඒ අනුව අනෙකුත් සමාජවාදී රටවල්ද ඇතුළත්ව භූමි ප්‍රමාණය සහ ජනගහනය අනුව සමාජවාදී රාජ්‍ය පද්ධතිය සුවිසල් එකක් විය. එපමණක් නොව එල්සැල්වදෝරය, ගුවතමාලාව, චිලිය, ග්‍රෙනෙඩාව, බොලිවියාව වැනි එවකට පැවැති ධනවාදී රටවල් අතරින් බොහෝමයක විප්ලවීය අරගලයන් ඇවිලෙමින් තිබිණ. ධනවාදී ලෝකය තුළ පවතින අනෙකුත් ධනවාදී රටවල් බොහොමයක ප්‍රබල කොමියුනිස්ට් පක්ෂ පැවතුණේය. මේ අතරට හුදු අධිරාජ්‍ය විරෝධී රටවල්ද එක්වූ පසුව කොමියුනිස්ට්වාදින් ප්‍රමුඛ අධිරාජ්‍ය විරෝධී කඳවුර පුළුල් සහ ප්‍රබල එකක් විය.

එහෙත් 90 දශකය මුල් වකවානුව වන විට අභ්‍යන්තර හා බාහිර හේතු රැසක් නිසා සමාජවාදී කඳවුරේ රටවල් බොහොමයක් බිඳ වැටුණි. චීනය, කියුබාව, වියට්නාමය, උතුරු කොරියාව, ලාඕසය වැනි රටවල් කිහිපයක් පමණක් සමාජවාදය වෙනුවෙන් පෙනී සිටින, තමන් සමාජවාදී යැයි පිළිගන්නා රටවල් ලෙස නොවැටී සිටීමට සමත් විය. එසේ නමුදු සමාජවාදී කඳවුර බිඳවැටීමත්, ඒ සමඟ ඇතිවූ "සමාජවාදය තවදුරටත් යථාර්ථයක් නොවේය" යන මතයත් විසින් කළ බලපෑම නිසා ලෝකයේ එවකට පැවැති බොහෝ කොමියුනිස්ට් පක්ෂ පසු බැමකට ලක්වී තම පක්ෂ නාමයෙන් 'කොමියුනිස්ට්' යන්න පවා ඉවත් කරගන්නා ලදී. ඒවා සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ බවට පත් විය. උදාහරණයක් වශයෙන් සලකා බලන විට නිකරගුවාවේ ඩැනියල් ඔටේගාගේ නායකත්වයෙන් යුත් සමාජවාදී පාලනය 1992 දී ධනේශ්වර පන්නයේ මැතිවරණ ආකෘතියට පසුබැසීම නිසා පරාජයට පත් විය. ඔවුනට නිර්ධන පංති පාලනය අත්හරින්නට සිදුවිය. ඉන්

පසුව ධනේශ්වරය නියෝජනය කරමින් වයලේටා චැමරෝ බලයට පත්විය. වර්තමානයේදී මැතිවරණය හරහාම ඩැනියල් ඔටේගා යළි බලයට පත්ව ඇතත් පෙර තිබූ විප්ලවකාරීත්වය සහිත සමාජවාදී බලය යළි ගොඩනැගීමට ඔවුනට හැකිවී නැත. එපමණක් නොව ඇෆ්ඝනිස්තානය වැනි සෝවියට් දේශයේ ආරක්ෂාව හා අනුග්‍රහය යටතේ පැවැති රටවල් හුදකලා විය. ඉන් නොනැවත සෝවියට් සංගමය බිඳවැටීමත් සමඟ රුසියාවේ දී හා පිටතදී ප්‍රතිගාමිත්වය විසින් ලෙනින්ගේ පිළිරූ පවා අපහාසාත්මක ලෙස කඩා බිඳ දමන ලදී. ප්‍රතිගාමිත්වය ලෙනින්ගේ අනුරුව සහිත කේක් කපමින් ධනවාදයේ විජයග්‍රහණය සැමැරුවේය. සමාජවාදයට එරෙහිව නැගී සිටි (සමාජවාදය පාවා දුන්) රුසියාවේ යෙල්ට්සින්, පෝලන්තයේ ලෙක් වැලේසා වැන්නෝ ධනවාදී මාධ්‍ය ලෝකයේ වීරයෝ බවට පත් වූහ. සමාජවාදය මිත්‍යාවක් බවත් එය අසාර්ථක බවත්, ධනවාදය සදාකාලික බවටත් ප්‍රකාශ නිකුත් විය. ලෝක බල තුලනය වෙනස්වී ඒක ධ්‍රැවිය ලෝකයක් නිර්මාණය වූ අතර එක්සත් ජනපදය ප්‍රමුඛ අධිරාජ්‍යවාදීහු එහි නායකත්වය දැරූහ.

එනමුත් සමාජවාදී කඳවුර බිඳවැටීමෙන් දශක දෙකක් ගතවීමටත් පෙර යළි අධිරාජ්‍යවාදයේ අර්බුදය සමහන් කළ නොහැකි සේ ප්‍රකාශයට පත්විය. සමාජවාදී කඳවුර බිඳ වැටීමෙන් පසු අධිරාජ්‍යවාදය ගයමින් සිටියේ ධනවාදයේ හංස ගීතය බව වත්මන් අර්බුදය විසින් මනාව තහවුරු කර දක්වයි. නැවත වතාවක් 2008 වර්ෂයෙන් පැන නැගි ධනවාදයේ අර්බුදය සමාජ ක්‍රමයක් ලෙස එහි නිමාව සංඥා කරමින් පවතී. ඇමරිකාව, බ්‍රිතාන්‍ය, ප්‍රංශය වැනි අධිරාජ්‍යවාදයේ මර්මස්ථානවලින්ම අර්බුදය ඔඩුදුවා ඇත. සමාජවාදී කඳවුර බිඳවැටීමත් සමඟම, ගෝලීය ලිබරල් ධනවාදයට න්‍යායික මග පෙන්වීම කළ "මානව දෘෂ්ටිවාදී පරිණාමයේ අවසානයක් " හා "ලිබරල් ධනවාදයේ සදාතනික විශ්වීකරණයක් " පිළිබඳව ඊනියා මත

සකස්කළ ෆ්‍රැන්සිස් ෆුකුයාමාගේ විග්‍රහයන් නැවත කණපිට පෙරළෙමින් පවතී. ලෝක ගෝලයේ ඇමරිකානු බල ආධිපත්‍යය සාධාරණීකරණය කරමින් හා දිරිමත් කරමින් න්‍යාය හා මතවාද සකස් කළ සැමුවෙල් හන්ටින්ග්ටන්ගේ අභිප්‍රායන්ද බොඳව යන සිහින බවට පත්වෙමින් තිබේ. සමාජවාදී කඳවුර බිඳ වැටීමෙන් පසු ඉතිරිව පවතින සමාජවාදී රටවල් අතළොස්ස අධිරාජ්‍යවාදීන්ගේ ප්‍රබලතම කුමන්ත්‍රණ හමුවේ බොහෝ දුෂ්කරතා ජයගනිමින් එහෙත් ධනවාදයට විකල්පයක් වෙමින් සිටීමට තරම් සමත්ව තිබේ. මාක්ස් ලෙනින්වාදයේ දෘෂ්ටිකෝණයෙන් බලන විට එම රටවල විශාල අඩුපාඩුකම් සහ දුර්වලතා තිබේ. එහෙත් ඒවා තම තමන්ට ආවේණිකවූ සමාජවාදී පාලනයන් පවත්වාගෙන යමින් පවතී. සමාජවාදී රටවල් අතර දැනට තිබෙන විශාලතම හා ප්‍රබලම රට වන මහජන චීනය, පෙර ප්‍රබලව පැවති, එහෙත් වර්තමානයෙහි දුබල වෙමින් පවතින ඇමරිකාව වැනි අධිරාජ්‍යවාදී ආර්ථිකයන් හා තරග කරමින් ලොව ප්‍රබල ස්ථානයකට පත්ව ඇත. එය ධනවාදී විචාරකයන්ගේ වචනයෙන්ම මෙසේ ප්‍රකාශයට පත්විය.

"සෝවියට් සමූහාණ්ඩුව කඩා වැටීමෙන් ලද ප්‍රතිඵලවලට සමානව රජයක සමස්ත ආකෘතිය හා ආර්ථිකය කඩා වැටී තිබේ. ඇමරිකානු භාණ්ඩාගාර ලේකම්වරයා දණ ගසා සිටින අතර, චීන ගගනගාමීන් අභ්‍යාවකශයේ ඇවිදීම කෙතරම් සංකේතාත්මක අවස්ථාවක්ද ?"

ජෝන් ග්‍රේ (දේශපාලනය පිළිබඳ දාර්ශනික)

"චීන ගගනගාමීන් අභ්‍යවකාශයේ ඇවිදිද්දී එක්සත් ජනපද භාණ්ඩාගාර ලේකම් දණ බිම ඇනගෙන සිටීම කෙතරම් අපූරු සරදමක්ද ?"

පෝල් රෙනෝල්ඩ්ස් (බීබීසී සේවය) 2008 ඔක්තෝබර් 01

මේ අතර සමාජවාදී උතුරු කොරියාව ලෝකයේ හතරවන ස්ථානයේ පවතින ප්‍රබල සන්නද්ධ හමුදාවකට හිමිකම් කියමින් අධිරාජ්‍යවාදය හා මුහුණට මුහුණලා සිටගෙන සිටියි. කියුබාව, ඇමරිකා එක්සත් ජනපදය විසින් අතපොවන මානයේ (කිලෝමීටර් 150ක දුරින් සිටිමින්) වුවද කෙළින් සිටගෙන සමාජවාදයේ අභිමානය මේ යැයි ලොවට විදහා පෙන්වයි. සමාජවාදී වියට්නාමයද නිහඬව නමුත් සමාජවාදී ආර්ථිකය පදනම් කොට ගනිමින් රට කෙමෙන් ඉහළට නැගිටුවාලමින් පවතී. ලාඕසය පවා ධනවාදී කුණාටු හමුවේ සමාජවාදය වෙනුවෙන් නොසැලී ඉන්නට තරම් සමත්ව සිටී.

මෙලෙස ඉතිරි වූ සමාජවාදී රටවල් දිරියෙන් හා අභිමානයෙන් පවතිද්දී අධිරාජ්‍යවාදයේ නියමු රටවල් ප්‍රමුඛ සමස්ත ධනවාදී ලෝකයම මින් පෙර සිදුවූවාටත් වඩා ගැඹුරු ආර්ථික අර්බුදයකින් පෙළමින් පවතී. පිටතින් මූල්‍ය ප්‍රාග්ධනය කෘත්‍රිම ලෙස පොම්ප කරමින් කොටස් වෙළඳපොළ, මූල්‍ය වෙළඳපොළ රැක ගැනීමට අධිරාජ්‍යවාදීන් කොතෙක් වෙර දැරුවද ධනවාදයේ කඩාවැටීම අවසන් වන ස්ථානයක් පෙනෙන තෙක් මානයේ දක්නට නැත. ධනේශ්වර ආර්ථික විශේෂඥයෝ මෙම අර්බුදය තව පරම්පරා ගණනාවක් යන තෙක්ම නොවිසදෙනු ඇතැයි මැසිවිලි නගති.

"ධනවාදයේ කොටසක් වන ගෝලීයකරණය උරුමය හා සම්ප්‍රදාය විනාශ කරනවා පමණක් නොව ඇදහිය නොහැකි ලෙස අස්ථාවර වෙයි. එය ක්‍රියාත්මක වන්නේ අර්බුදයන් මාලාවක් අතරිනි. එසේම මෙම අර්බුදය මෙම සුවිශේෂී යුගයේ අවසානය සනිටුහන් කිරීමක් ලෙස සැලකිය හැකිය. "

(ඉතිහාසඥ එරික් හොබ්ස්බෝව්ම්)

එහෙත් ධනවාදී ආර්ථික විශේෂඥයන් සිතන්නේ, කෙදිනක හෝ ධනවාදයේ අර්බුදය විසදෙන තෙක් උපේක්ෂා සහගතව ලෝකය

එකම ස්ථානයක පවතිනු ඇතැයි යන්නය. ඕනෑම සමාජ ක්‍රමයක මෙන්ම ධනවාදී සමාජයේ පැවැත්ම සැකසෙන්නේ, නිෂ්පාදන බලවේගයන් හා නිෂ්පාදන සම්බන්ධතා අතර වන අනුරූපීතාවයෙනි. මෙහි අනුරූපීතාවය බිඳවැටෙන්නේ යම් මොහොතකද එය සමාජයේ ඉදිරි ගමනට බාධාකරයි. නිෂ්පාදනය ඉදිරියට ගෙනයාමට දායක වන සියල්ල නිෂ්පාදන බලවේගයන් වන අතර නිශ්චිත නිෂ්පාදන ක්‍රියාවලියක් තුළ පවත්නා සම්බන්ධතා සියල්ල නිෂ්පාදන සබඳතා යන්නට අයත්වේ. ධනවාදී සමාජ ක්‍රමයෙහි පවතින්නේ ධනවාදී නිෂ්පාදන සබඳතාවන්ය. ධනපතියාගේ ප්‍රාග්ධනය විසින් හසුරුවනු ලබන සබඳතාවන්ය. අනවරතව වර්ධනය වන නිෂ්පාදන බලවේගයන්ට අනුරූපී වන නිෂ්පාදන සබඳතාවල අත්‍යවශ්‍යතාවය සමාජ සංවර්ධනයේ මූලික මූලධර්මයකි. නිරන්තර වර්ධනය වන නිෂ්පාදන බලවේගයන්ට බාධාවන යල්පැන යන නිෂ්පාදන සබඳතා බිඳ දැමීමේ සහ නව නිෂ්පාදන බලවේගයන්ට අනුරූපී නව නිෂ්පාදන සබඳතා බිහිකිරීමේ අවශ්‍යතාවය සමාජ විප්ලවයක ස්වරූපයෙන් ප්‍රකාශයට පත්වේ. (යල් පැන ගිය ධනවාදී සමාජ ආර්ථික ක්‍රමය පමණක් මෙම මූලධර්මයෙන් මිදෙන්නේ නැත. ) එම අවශ්‍යතාවය විසින් සමාජ බලවේගයන්ගේ සහභාගිත්වයෙන් හා නිර්ධන පංතියේ නායකත්ව කාර්යභාරය උසුලන පක්ෂය මැදිහත් වීමෙන් කල් ඉකුත් වූ ධනවාදී සමාජ ආර්ථික ක්‍රමය පෙරළා දමයි. එපමණකින් නොනැවතී නව සමාජ සබඳතා සහිත නව සමාජ ආර්ථික ක්‍රමයකට පරිවර්තනය වෙයි. එහෙත් ධනවාදයේ නියමුවන් ලෝකයට ඒත්තු ගන්වන්නට උත්සාහ ගනු ලබන්නේ, ධනවාදයේ සදාකාලික බවය. එම මතය වෙනුවෙන් පෙනී සිටින විවිධ නිර්මාක්ස්වාදී සමාජ ආර්ථික විග්‍රහයන් මේ මොහොතේ සිදුවෙමින් පවතී. ඒවා වදන් හරඹ මිස න්‍යායිකවද ප්‍රායෝගිකවද සාර්ථක විග්‍රහයන් නොවේ. සැබෑව නම් ලෝක ධනවාදයේ පසුබෑම තුළ සමාජවාදී විප්ලවය සඳහා තර්කානුකූල හා

විෂය මූලික වටපිටාවක් නිර්මාණය වී තිබීමයි. දැන් අවශ්‍ය වන්නේ ඒ සඳහා මතවාදීමය හා සංවිධානමය නායකත්වයකි.

තවද, සමාජවාදී කඳවුරේ බිඳවැටීමෙන් දශක දෙකක් ගතවීමටත් පෙර 2008 සැප්තැම්බරයේදී එක්සත් ජනපදයෙන් ඇරඹී, ලොව පුරා හමා යමින් තිබෙන ධනවාදයේ විසඳිය නොහැකි අර්බුදය යළි සමාජවාදය වෙත ජනතාවගේ බලාපොරොත්තු දැල්වීමට හේතුවී තිබේ. ධනවාදයේ කඩා වැටීම ඇරඹුණු වසරේ බටහිර රටවල වැඩියෙන්ම අලෙවි වූ පොත් අතර ඉහළින්ම මාක්ස්ගේ 'දාස් කැපිටාල්' (ප්‍රාග්ධනය) පොත දක්නට ලැබීමෙන් එය වඩාත් පැහැදිලි වේ. ධනවාදයේ කඩාවැටීම සමාජවාදී පරිවර්තනයකට පෙරවදන බවට පත්ව තිබුණද කලින් පැවැති සමාජවාදී කඳවුර බිඳ දැමීම විසින් සමාජය තුළ තහවුරු වී ඇති විවිධ නිර්මාක්ස්වාදී සහ අවිද්‍යාත්මක මත නූතන සමාජවාදී සමාජයක් නිර්මාණය කිරීමට බාධාවක්ද වී තිබේ. එනිසා මේ තීරණාත්මක මොහොතේදී "සෝවියට් දේශය ප්‍රමුඛ සමාජවාදී කඳවුර බිඳ වැටුණේ ඇයි?" යන්න පිළිබඳවත්, "සමාජවාදය යනු කුමක්ද? සහ සමාජවාදී විප්ලවය යනු කුමක්ද?" යන කරුණ පිළිබඳවත් විද්‍යාත්මක විධි ක්‍රමයක් මත පිහිටා (මාක්ස් ලෙනින්වාදී දැක්මක් මත පිහිටා) කරගනු ලබන නිවැරදි විග්‍රහයක් අත්‍යවශ්‍ය වන්නේය. මේ ගනු ලබන උත්සාහය ඒ සඳහාය.

# 2

# සමාජවාදය යනු කුමක්ද ?

සමාජවාදය පිළිබඳව නිවැරදි න්‍යායික විග්‍රහයකින් තොරව අපට ඉදිරියට යාමට නොහැකිය. එනිසා මෙතැන් සිට අපි මෙම අධ්‍යයනය ආරම්භ කරමු. සමාජවාදය පිළිබඳවද විවිධ වූ විග්‍රයන් පවතී. බොහෝ විට ඒවා මාක්ස් ලෙනින්වාදයෙන් බැහැරවූ විග්‍රහයන්ය. එසේම ධනපති හා අවස්ථාවාදි මතවාදයන් හා අවශ්‍යතාවයන්ද සමාජවාදී මුහුණුවරින් පෙනී සිටියි. එයින් සිදුව ඇත්තේ, සමාජවාදය පිළිබඳව විකෘති කරන ලද හා සාවද්‍ය හැඳින්වීම් තහවුරුවීමය. සමාජවාදය යන්න පිළිබඳව නිවැරදිව න්‍යායික අවබෝධයක් ලබාගැනීම එහි භාවිතාවේදී මහත් සේ වැදගත්වේ.

## සමාජවාදය සංක්‍රමණීය සමාජ අවධියකි

සමාජවාදය යනු ධනවාදී සමාජයෙන් පසුව පවතින තවත් එක් සමාජ ක්‍රමයක් නොවේ. සමාජවාදය තවත් එක් සමාජ ක්‍රමයක් ලෙසින් වරදවා වටහා ගැනීම විසින් එහි ඓතිහාසික කාර්යභාරය

අවබෝධ කරගැනීම අපහසු කරයි. එමෙන්ම සමාජවාදය උදෙසා වන අනිවාර්ය කොන්දේසි අත්හැරෙයි. නිවැරදිව පවසන්නේ නම් සමාජවාදය යනු ධනවාදයේ සිට කොමියුනිස්ට් ක්‍රමය දක්වා වන සංක්‍රමණීය කාලපරිච්ඡේදයකි. සමාජවාදය යනු කොමියුනිස්ට් සමාජ ක්‍රමයේ පහළ අවධියයි. මෙම සමාජවාදී පරිවර්තන අවධියේදී පංති සහිත ධනපති ක්‍රමයේත් පංති රහිත කොමියුනිස්ට් ක්‍රමයේත් අංග ලක්ෂණ හා ස්වභාවයන් එක්වර එහි අඩංගු වේ. පංති සහිත සමාජයක් පංති රහිත සමාජයකට පරිවර්තනය වීම සඳහා දිගු කාලයක් ගැනීම ස්වභාවිකය. පංති අහෝසිවීම ඉබේ සිදුවන්නේ නැත. සමාජ නිෂ්පාදන ක්‍රියාවලියෙහි වර්ධනයේ නිශ්චිත අවධියකදී සමාජයේ සියලු අවශ්‍යතා සපුරාලිය හැකි මට්ටමකට සමාජ ධනය වර්ධනය වීම සිදුවේ. එම තත්වය විසින් පංති පැවැත්මේ විෂය මූලික පදනම බිඳ වැටීමේ හේතුවෙන් පංති අහෝසි වේ. එය කොමියුනිස්ට් සමාජ ක්‍රමයේ ඉහළ අවධියයි. නිර්ධන පංති රාජ්‍ය බලය ස්ථාපිත කිරීමේ සිට ඒ දක්වා මානව සමාජය ගෙවාලන සංක්‍රමණීය කාලය සමාජවාදී අවධිය ලෙසින් හැඳින්වේ. මේ පිළිබඳව ලෙනින් වරක් මෙසේ පැවසීය.

"ධනපති ක්‍රමය හා කොමියුනිස්ට් ක්‍රමය අතර ඒ දෙකෙහිම අංග ලක්‍ෂණ හා ගතිගුණ ඒකාබද්ධ කරගත් නිශ්චිත පරිවර්තනීය කාලපරිච්ඡේදයක් පවතින බවට න්‍යායික වශයෙන් සැකයක් තිබිය නොහැකිය. මෙම පරිවර්තනීය කාලපරිච්ඡේදය අභාවයට යන ධනපති ක්‍රමයත් වැඩීගෙන එන ළදරු කොමියුනිස්ට් ක්‍රමයත් අතර කෙරෙන අරගලයක කාලයක් විය යුතුය. නැතහොත්, වෙනත් වචනවලින් කිවහොත්, පරාජය කර ඇති එහෙත් විනාශ කර නැති ධනපති ක්‍රමයත් උපත ලබා ඇති එහෙත් තවමත් දුර්වලව තිබෙන කොමියුනිස්ට් ක්‍රමයත් අතර අරගලයක කාලයක් විය යුතුය."

(ලෙනින්, තෝරාගත් කෘති, 10වන වෙළුම, 46 පිටුව)

"අප මෙහි දී (කම්කරු පක්ෂයේ වැඩපිළිවෙළ විග්‍රහ කිරීමේදී) සැලකිල්ලට ගත යුත්තේ, ස්වකීයමය පදනමක් මත සංවර්ධනය වූවක් නොවන, ඊට ප්‍රතිකූල වශයෙන්, ධනපති සමාජයෙන් උද්ගත වන ලෙසටම ගත්, කොමියුනිස්ට් සමාජයක් ගැනය. එනිසා එම සමාජය, ආර්ථිකමය, සදාචාරමය සහ බුද්ධිමය යන සෑම අතින්ම තම මව් කුස වූ පැරණි ධනපති සමාජයෙන් ගෙන ආ උපන් ලපවල මුද්‍රාව තවමත් දරන්නේය."

(මාක්ස් - 'ගෝතා වැඩපිළිවෙළ ගැන විවේචනය')

මෙවන් සංක්‍රමණීය කාලපරිච්ඡේදයක් අවශ්‍ය වන්නේ, සමාජවාදී විප්ලවය තුළ වන සුවිශේෂී ලක්ෂණයන් නිසාමය. සමාජවාදී සමාජ විප්ලවයට පෙරාතුව පැවැති සමාජ විප්ලවයන් හා සමාජවාදී සමාජ විප්ලවයත් අතර පවතින්නේ මුළුමනින්ම වෙනස් ලක්ෂණයන්ය. ඉතිහාසයේ මෙතෙක් පැවැති සමාජ විප්ලවයන්ගේ කාර්යය බලය ලබාගැනීමත් සමගම සම්පූර්ණ වේ. ඉන්පසුව සූරාකෑම වෙනත් ආකාරයකින් පවත්වාගෙන යෑම හා පවතින පාලන ආකෘති අවශ්‍ය ලෙස වර්ධනය කරගැනීම සිදු කෙරේ. නමුත් සමාජවාදී සමාජ විප්ලවයේදී නව සමාජයක් ගොඩනැගීම ආරම්භ වන්නේ, බලය ලබාගත් අවස්ථාවේ සිටය. එයට හේතුව සමාජවාදී සමාජ විප්ලවය ඉතිහාසයේ ප්‍රථම වතාවට පංති අහෝසි කිරීම ඉලක්ක කොට ගත් එකක් වීමය. පංති අහෝසි කිරීම ක්ෂණික ක්‍රියාදාමයක් නොව පීඩිත පංතිය බලය ලබාගත් අවස්ථාවේ සිට සිදු කරනු ලබන ක්‍රමික ක්‍රියාවලියක් බැවින් ඒ සඳහා වූ සංක්‍රමණීය කාලපරිච්ඡේදයක් අත්‍යවශ්‍ය වේ.

මෙතෙක් පැවැති සමාජ විප්ලවයන්හිදී එක් පීඩක පංතියක් අතින් නැවත බලය ලබා ගනු ලැබූයේ තවත් පීඩක පංතියක් විසින්මය. වහල් සමාජය බිඳවැටීමෙන් පසු වහලුන්ද, වැඩවසම්

ක්‍රමය බිඳවැටීමෙන් පසු ප්‍රවේණිදාසයන්ද බලය අත්පත් කරගත්තේ නැත. සැම විටම පීඩක පංතීන්ම බලයට පත් විය. සමාජ සංවර්ධන ඉතිහාසයේ ප්‍රථම වතාවට සමාජවාදී සමාජ විප්ලවයේදී පීඩක පංතිය අතින් පීඩාවට ලක් වූ පංතිය වන නිර්ධන පංතිය විසින් බලය අත්පත් කරගනු ලබයි. එලෙස බලයට පත් නිර්ධන පංතිය ප්‍රමුඛ පීඩිත පංතීන් සිය පාලනය තුළ ධනවාදය අහෝසි කරමින් කොමියුනිස්ට්වාදය ගොඩනැගීම සිදුකරන්නේය. එය එක් රැයකින් කළ හැක්කක් නොවේ. එය තනි රටක් තුළ කළ හැක්කක්ද නොවේ. ඒ සඳහා සමස්ත ලෝක සමාජවාදී ව්‍යාපාරයම ජයග්‍රහණය කළ යුතුය. සැබෑ කොමියුනිස්ට් පක්ෂවල නායකත්වයෙන් එක් එක් රට තුළ සමාජවාදී පරිවර්තනයන් ඉටුකළ යුතුය. මෙලෙස සමාජවාදය නම් සංක්‍රමණීය කාලපරිච්ඡේදයක් අවශ්‍ය වන්නේ ඒ සඳහාය. මෙම සංක්‍රමණීය කාලය තුළ පරාජය වූ නමුත් තවමත් යළි බලයට පත්වීමේ අරමුණ සහිතව කටයුතු කරන ධනපති පංතිය වියරු ලෙස කටයුතු කරයි. මේ හේතුවෙන් සමාජවාදය ගොඩ නැඟීමේත් එය ආරක්ෂා කරගැනීමේත් කාර්යභාරයක් සමාජවාදී සමාජ විප්ලවය සතුය. සැබවින්ම "සමාජවාදය යනු පංති නැති කිරීමයි." සමාජවාදී සමාජ විප්ලවයේ මෙම ස්වභාවය විසින් අනිවාරණීය ලෙසින්ම එය සංක්‍රමණීය කාලපරිච්ඡේදයක් වන්නේය.

"පංති නැති කිරීම සඳහා ප්‍රථමයෙන් ඉඩම් හිමියන් හා ධනපතියන් නෙරපා දැමීම අවශ්‍යය. අපගේ කර්තව්‍යයේ මෙම කොටස සාර්ථක කර තිබේ. එහෙත් එය එක කොටසක් පමණක් වන අතර, කර්තව්‍යයේ ඉතාමත් දුෂ්කර කොටස නොවේ. පංති නැති කිරීම පිණිස දෙවැනිව, සියලුදෙනාම වැඩ කරන්නන් බවට පත් කිරීම අවශ්‍යය. මෙය එක් වරම, එක මොහොතකින් කළ හැකි දෙයක් නොවේ. මෙය පමණ නොකළ හැකි තරම් දුෂ්කරය. ඒ සඳහා අත්‍යවශ්‍යයෙන්ම දීර්ඝ කාලයක් ගත වනු ඇත. එය මොන යම් හෝ

පංතියක් නෙරපා දැමීමෙන් විසඳිය හැකි ප්‍රශ්නයක් නොවේ. එය විසඳිය හැක්කේ මුළු මහත් සමාජ ආර්ථිකයම සංවිධානාත්මක ලෙස නැවැත ගොඩ නැගීමෙනි."

(ලෙනින්, තෝරාගත් කෘති, වෙළුම 10, පිටුව 52)

## සමාජවාදයෙහි වන මූලික ප්‍රතිවිරෝධය

ඕනෑම ප්‍රපංචයකදි මෙන්ම සමාජවාදී සංක්‍රමණීය අවධියේද එහි වන මූලික ප්‍රතිවිරෝධයක් පවතී. එමෙන්ම එහි "ප්‍රතිපක්ෂයන්ගේ ඒකත්වය හා අරගලය" යන නියාමයද ක්‍රියාත්මකව පවතී. සමාජ චලනයන්ගේ ගාමකත්වය හා දිශානතිය තීරණය කරනු ලබන මූලික සාධකය එයයි. සමාජවාදී සංක්‍රමණීය අවධියේ මූලික කාර්යය පංති අහෝසි කිරීම බව මෙයට ඉහතදී පැවසුවෙමු. එහෙත් පීඩක පංතිය (ධනපති පංතිය) යටපත් කොට පීඩිත පංතිය (නිර්ධන පංතිය) අතට බලය ගත්තද ධනපති පංතිය ඉබේ අහෝසිවී නොයන්නේය. ඔවුහු පරාජයට පත් වුවද, පංතියක් ලෙස දුබලව නමුත් යළි අහිමි වූ බලය ලබාගැනීමේ අරමුණ සහිතව කටයුතු කරති. පරාජයට පත් ධනපති පංතියේ ඒකායන අරමුණ හා ක්‍රියාකාරිත්වය යළි ධනවාදය ජයග්‍රහණය කොට එය තහවුරු කිරීම වේ. එනිසාම පරාජයට පත්කළ පංතිය අහෝසි කිරීම සඳහා වන නිර්ධන පංතියේ සවිඥානක සහ අරමුණු සහගත ක්‍රියාකාරිත්වයක් අවශ්‍යය. එහිදී නිර්ධන පංතිය විසින් තම පංතියේ පාලනය යොදාගනිමින් බලය පවත්වා ගැනීම හා තහවුරු කරගැනීම සිදු කරනු ලබයි. එපමණක් නොව ඉන් ඔබ්බට සමාජවාදී සමාජය ගොඩනැගීමේ ක්‍රියාවලියක්ද පවතී. මේ හේතුවෙන් සමාජවාදී සංක්‍රමණීය අවධියේදී එය තුළ වන මූලික ප්‍රතිවිරෝධය වන්නේ, "පරාජය කළ එහෙත් විනාශ නොකළ ධනපති ක්‍රමයත් උපත ලබා ඇති එහෙත් තවමත් ශක්තිමත් නොවන කොමියුනිස්ට් ක්‍රමයත් අතර ගැටුමයි." සැබැවින්ම එය "මිය යමින් පවතින ධනවාදය හා උපත ලබා ඇති නමුත් තහවුරු නොකළ කොමියුනිස්ට් ක්‍රමය අතර වන

ප්‍රතිවිරෝධයයි.” එය ප්‍රකාශයට පත්වන්නේ, නිර්ධන පංති පක්ෂය ප්‍රමුඛ පීඩිත පංතිය හා ධනපති පංතිය අතර ගැටුමක් ලෙසිනි. මෙය පංති අරගලයේ අවසාන ආකාරයයි. එහි උච්චාවචනයන් අනුව සමාජවාදයේ ජයග්‍රහණයන් හා පසුබැසීම් දක්නට ලැබේ.

## සමාජවාදයෙහි සටන් පාඨය

සමාජවාදී ඉලක්ක සපුරා ගැනීම අරමුණු කරගත් සටන් පාඨ එය විසින්ම නිර්මාණය කරගනු ලැබේ. එහිදී සමාජවාදී සංක්‍රමණීය අවධියට හා කොමියුනිස්ට් සමාජයේ ඉහළ අවධියට අනුකූල ලෙස එම සටන්පාඨ සකස් වේ. සමාජවාදය යනු අංක ගණිතමය ලෙසින් සියල්ල සමානව බෙදීයාම නොවේ. සමාජවාදය තුළ පංති අහෝසි වීමට අදාළ පූර්ව තත්වයන් සැකසෙමින් පවතින නමුත් තවමත් පංති පවති. එනිසා විශේෂයෙන්ම ශ්‍රමයෙහි වන අසමානකම් පවතී. එවන් තත්වයක් තුළ අංක ගණිතමය ලෙස සමානත්වය ඇති කිරීම යනු අසමානතාවය තවදුරටත් වර්ධනය කිරීමකි. සියලු මිනිසුන් හට මූලික මිනිස් අවශ්‍යතාවයන් සමාන විය හැකි නමුත් ඒවා අවශ්‍ය වන ප්‍රමාණය එකිනෙකා අනුව වෙනස්ය. මිනිසුන් තිදෙනෙකු අතර සමාන ලෙස යම් ආහාර සලාක ප්‍රමාණයක් බෙදා දුන් විට එහි සමානතාවය පවතින්නේ නැත. එකිනෙකාට අවශ්‍ය වන ආහාර ප්‍රමාණය මෙන්ම එහි පෝෂණ අවශ්‍යතාවය හා රුචිකත්වයද වෙනස් විය හැකිය. එය තම පංචේන්ද්‍රයන්ගේ හුරුවට අනුව, ආහාර පිළිබඳව වන ආකල්පයන්ට අනුව, ආහාරයේ ගුණාත්මක බව අනුව සහ අවශ්‍යතාවය අනුව සකස් වන්නකි. එයින් පැහැදිලි වන්නේ තම ආහාර පිළිබඳව භෞතික වශයෙන් මෙන්ම මානසික වශයෙන්ද ඔහුගේ ශරීරය තෘප්තිමත් විය යුතු බවය. සාමාන්‍ය වහරින් පවසන්නේ නම් කාගෙත් ආමාශයේ ප්‍රමාණය සමාන වන්නේ නැත. එබැවින් ඉරි ඇඳ, කොටු ඇඳ සකසාගත් හතරැස් සමාජවාදයක් නොමැත. එනිසාම

කොමියුනිස්ට් අවධියේදී සමාජයේ පවතින්නේ සමාන අයිතියයි. සුදුසු ආහාරයක් ලැබීමේ, අධ්‍යාපනය ලැබීමේ, ආරක්ෂාව ලැබීමේ, තොරතුරු දැන ගැනීමේ, තම කොමියුනිස්ට්වාදි ශ්‍රමය වැගිරවීමේ සමාන අයිතියයි. අයිතීන් භුක්ති විඳීම පිළිබඳව සමාන හිමිකමයි.

සමාජවාදී අවධිය තුළ ධනපති පංතිය දුබලව නමුත් තවමත් පවතින බව අපි දැනටමත් දනිමු. ඔවුහු සමාජවාදය ගොඩනැගීම උදෙසා උරදෙනවා වෙනුවට එය කඩාකප්පල් කිරීම සඳහා කටයුතු කරති. මෙම ධනපති කොටස් සමාජවාදයේ ඵලදාව භුක්ති විඳිමින් හා විනාශ කරමින් සමාජවාදය උදෙසා නොව සමාජවාදයට එරෙහිව කරන කටයුතු වළකාලිය යුතුය. පංති රහිත කොමියුනිස්ට් අවධියේදී නම් නිෂ්පාදනයේ අති දැවැන්ත වර්ධනය නිසාම "සැමගෙන් ඔහුගේ හැකියාවට අනුවත්, සැමට ඔහුගේ අවශ්‍යතාවයට අනුවත් " යන ආදර්ශ පාඨය තුළ සමාජය හැසිරවේ. සමාජවාදයේදී සමාජ නිෂ්පාදන ක්‍රියාවලියට ශ්‍රම දායකත්වය ලබාදීම පුරවැසියා සතු සමාජ වගකීමකි. (රෝගීන්, දුබලයන්, බාල වයස්කරුවන්ට මෙය අදාළ නොවේ.) සමාජවාදය යනු සමාජයේ පැවැත්ම හා වර්ධනය වෙනුවෙන් නිෂ්පාදන ක්‍රියාවලියට සැවොම දායක වන වැඩකරන ජනතාවගේ සමාජ ක්‍රමයකි. එම නිසා සමාජවාදී සංක්‍රමණීය අවධියේදී එහි ආදර්ශ පාඨය වන්නේ, "සැමගෙන් ඔහුගේ හැකියාවට අනුවත්, සැමට ඔහු කරන වැඩවලට අනුවත්" යන්නය. සමාජවාදයේදී සමාජයේ සාමාජිකයින් අතර නිෂ්පාදන භාණ්ඩ බෙදා හැරීම සහ ශ්‍රම කටයුතු වෙන් කර දීම විෂයෙහි ක්‍රියාත්මක වන තීරක සාධකය එයය.

"සමාන ශ්‍රම ප්‍රමාණයක් සඳහා සමාන නිෂ්පාදිත භාණ්ඩ ප්‍රමාණයක්" යන අනිත් සමාජවාදී ප්‍රතිපත්තියද දැනටමත් සාර්ථක වී ඇත. එහෙත් මෙය තවමත් කොමියුනිස්ට් ක්‍රමය නොවේ. අසමාන (ඇත්ත වශයෙන්ම අසමාන) ශ්‍රම ප්‍රමාණයන් සඳහා අසමාන පුද්ගලයන්ට සමාන නිෂ්පාදිත භාණ්ඩ ප්‍රමාණයන් දෙන 'ධනපති

අයිතිය' තවමත් අහෝසි නොවන්නේය."

(ලෙනින්, තෝරාගත් කෘති, වෙළුම 6 පිටුව 102)

## නිර්ධන පංති රාජ්‍ය බලයේ අත්‍යවශ්‍යතාවය

ධනපති සමාජ ක්‍රමයක පවතින්නේ, ධනපති පංතියේ රාජ්‍ය බලයයි. එමෙන්ම සමාජවාදී සමාජ විප්ලවයට පූර්වයෙන් පැවැති වහල්, වැඩවසම්, ධනේශ්වර විප්ලවයන්හිදි නව පීඩක පංතිය විසින් බලය අත්පත් කරගැනීමෙන් පසු එම විප්ලවයන්හි අවසානය සනිටුහන් කරන ලදී. එම විප්ලවයන්හිදී බලය අත්පත් කරගත් පංතියට එය තහවුරු කොට අවසන් කිරීම එතරම් අපහසු නැත. එය එතරම් පහසු වන්නේ, යළි බලය අත්පත් කරගනු ලබන්නේද තවත් පීඩක පංතියක් විසින් වන බැවිනි. ඔවුන් තවදුරටත් පංති සමාජයේ පවතින රාජ්‍යය යන ආකෘතිය වෙනස් කරමින් වැඩි දියුණු කරයි. රාජ්‍යය යන්නේ අඩංගුව එලෙසම පැවතියදී එහි ආකාරය වෙනස් කරයි. ඒ අනුව රාජ්‍යයේ හරය පංති පීඩක උපකරණයක් ලෙස එලෙසම පවතිමින් පෙනුම පමණක් වෙනස් වේ. රජය යන්න බලය අත්පත් කොට ගත් පංතියේ ආධිපත්‍යය පවත්වා ගන්නා උපකරණයයි. පූර්ව විප්ලවයන්හිදී සිදුවූයේ පුද්ගලික දේපළ හිමිකමේ ස්වරූපය පමණක් වෙනස් වීමයි. පුද්ගලික දේපළ ස්වරූපය වෙනස් වුවද එහි හිමිකම එලෙසම පවතී. තවද සූරාකන පංතිය හා සූරාකෑමේ ආකාරය වෙනස් වන නමුත් සූරාකෑම අහෝසි නොවී තවදුරටත් පවතී.

නමුත් සමාජවාදී සමාජ විප්ලවය සිදුවන්නේ, සූරාකන්නන්ට එරෙහිව සූරාකෑමට ලක්වන්නන්ගේ මැදිහත් වීමෙනි. එහිදී නිර්ධන පංතිය රාජ්‍ය බලය තමන් වෙත අත්පත් කරගනු ලැබුවද එය තහවුරු කිරීම සඳහා යම් කාලයක් ගතවේ. සමාජවාදී සමාජ විප්ලවයේදී සූරාකෑම අවසන් කිරීම පිණිස පුද්ගලික දේපළ සබඳතාවයන් අහෝසි කළ යුතුය. එයින් බිහිවන නව ආර්ථික ක්‍රියාවලිය හරහා නිෂ්පාදනය

අති දැවැන්ත වර්ධනයක් කරා ගෙනයනු පිණිස යම් කාලයක් අවශ්‍ය වේ. මෙම කාලය අතරතුර ධනපති පංතිය නව සමාජයට එරෙහිව දියත් වන ප්‍රතිවිප්ලවය වෙනුවෙන් පෙනී සිටීම අනිවාර්යයකි. එහිදී ඔවුහු තමනට අහිමිව ගිය බලය යළි ලබාගැනීම උදෙසා මාරාන්තිකව සටන් වදිති. එනිසා නිර්ධන පංතියට සමාජවාදය රැක ගැනීම උදෙසා තමන්ගේ වූ රාජ්‍ය බලය තීරණාත්මක සාධකයකි.

නිර්ධන පංති රාජ්‍ය බලයේ කාර්යභාරය අනුව එහි පැති දෙකක් දක්නට හැකිය. එයින් එක් පාර්ශ්වයක් වන්නේ, ප්‍රතිවිප්ලවය පරදා සමාජවාදී විප්ලවයේ ජයග්‍රහණය තහවුරු කිරීම උදෙසා වන කාර්යයයි. එහි අනෙක් පැත්ත වනුයේ, නව සමාජ ක්‍රමය ගොඩනැගීම සඳහා පංතියට දේශපාලන නායකත්වයක් සැපයීමේ අවශ්‍යතාවය හා කාර්යයයි. මේ අරමුණු දෙක සාර්ථක කර ගැනීම සඳහා අව්‍යාජ බොල්ෂෙවික් පක්ෂයක පරිණත නායකත්වයක් අවශ්‍යය. එමෙන්ම ඒ සඳහා නිර්ධන පංතියේ ආධිපත්‍යය හෙවත් ජනතාවාදී පාලනයක කාලයක් අවශ්‍ය වේ. එය නිර්ධන පංති රාජ්‍ය බලයේ අවධියයි.

"සූරාකන්නන්ගේ, ඉඩම් හිමියන්ගේ සහ ධනපතියන්ගේ පංතිය තවමත් අහෝසි වී නැත. නිර්ධන පංති ආඥාදායකත්වය යටතේ එය එක්වරම අහෝසිවීම බලාපොරොත්තු වීමටද නොහැක. සූරාකන්නන් තලා දමා ඇති නමුත්, ඔවුන් තවමත් විනාශවී නැත. ජාත්‍යන්තර ප්‍රාග්ධනයේ ස්වරූපය ගත් ජාත්‍යන්තර පදනමක් තවමත් ඔවුන් සතුව ඇත. ඔවුහු තවමත් නිෂ්පාදන මාර්ග සමහරක් අර්ධ වශයෙන් රඳවාගෙන සිටිති. තවමත් ඔවුන් වෙත මුදල් ඇත. ඔවුහු පැතිර ගිය සමාජ සම්බන්ධතාවයන් සහිතව සිටිති. ඔවුන් පරාජයට පත්කර සිටින නිසා, ඔවුන්ගේ ප්‍රතිරෝධය සිය ගුණයෙන් සහ දහස් ගුණයෙන් බලවත්ව තිබේ."

( ලෙනින්, තෝරාගත් කෘති, වෙළුම 10, පිටුව 55 )

"ධනපති හා කොමියුනිස්ට් සමාජ අතර එකක් අනිකට විප්ලවීය ලෙස පරිවර්තනය වන කාල සීමාවක්ද ඇත. මීට අනුරූපී වන දේශපාලන පරිවර්තනයේ කාල සීමාවක්ද ඇත. එය අන් කිසිවක් නොව නිර්ධන පංතියේ විප්ලවකාරී ආඥාදායකත්වය විය යුතුය."

(කාල් මාක්ස් )

## සමාජවාදී වැඩපිළිවෙළෙහි අභියෝග

ධනවාදයට එරෙහිව සමාජවාදය තහවුරු කිරීම සඳහා වන වැඩපිළිවෙළ නොයෙක් අභියෝගයන්ට ලක්වීම වරින්වර සිදුවිය. එම අභියෝගයන් අනුව එම වැඩපිළිවෙළෙහිද වෙනස්කම් කරන්නට මාක්ස්වාදයේ ගුරුවරු සමත් වූහ. ඔවුනගේ අත්දැකීම් ඔස්සේ සිතා බලන විට අපට මෙය වටහා ගැනීම පහසු වනු ඇත. සූරාකෑමේ මාධ්‍යය ප්‍රාග්ධනය බවට පත් කරගත් ධනවාදය පළමුවෙන්ම කරළියට පැමිණෙන්නේ, නිෂ්පාදනයේ 'නිදහස් තරගයක' ස්වරූපයකිනි. තනි තනි ධනපති නිෂ්පාදකයන් අතර වූ නිදහස් තරගය විසින් අධිනිෂ්පාදන අර්බුදය නම් අර්බුදයට ධනවාදය ඇද දැමීය. එනිසා නිෂ්පාදනයේ යම් අරාජික බවක්ද දක්නට ලැබුණි. එය විසින් ධනේශ්වර ක්‍රමයේ දැවැන්ත අර්බුදයන් නිර්මාණය කරන ලදී. එම අවධියේදී සමාජවාදී සමාජ විප්ලවය ලෝකයේ දියුණු ධනපති රටවලින් ඇරඹී ලෝකය පුරා එක විට පැතිරයාමේ හැකියාව මාක්ස් හා එංගල්ස් දෙදෙනා විසින් දක්නා ලදී. තාර්කිකව ගත් විට සමාජවාදය යනු ධනවාදයේ වර්ධනය විසින්ම ඇති බිහිකරගන්නක් වන නිසා එය බිහිවිය යුතුව තිබුණේ, ධනවාදය වඩාත් සංවර්ධනය වූ රටවලිනි. එහෙත් නිදහස් තරගය තුළ ධනවාදය අර්බුදයටයත්ම එය සමහන් කරගැනීම උදෙසා ගනු ලබන උපායමාර්ග හා උපක්‍රම හේතුවෙන් එය නව අවධියකට පත් විය. තනි තනි නිෂ්පාදකයන් අතර වූ නිදහස් තරගය වෙනුවට නිෂ්පාදනයේ ඒකාධිකාර බිහිවිය. එය ලෙනින් විසින් විග්‍රහ කළ පරිදි

ඒකාධිකාරී ධනවාදය හෙවත් අධිරාජ්‍යවාදයයි. මෙය ධනපති ක්‍රමයේ ගුණාත්මක වෙනසක් වූ අතර මෙම නව තත්වය තුළ සමාජවාදී විප්ලවයේ හැකියාව ධනවාදයේ කේන්ද්‍රයෙන් එහි පරිධියට මාරුවිය. අධිරාජ්‍යවාදී අවධියේ විශේෂතාවයන්ට අනුව සමාජවාදී සමාජ විප්ලවය ධනේශ්වර සංවර්ධනයේ පසුපසින් සිටින පරිධියේ රටවලින් ආරම්භ වීමේ හැකියාව මතු විය. ඒ හේතුවෙන් ධනපති සමාජ ක්‍රමයට විකල්පය වූ සමාජවාදය උදෙසා වන වැඩපිළිවෙළට නව අභියෝගයන් මතු විය. එයට අනුව සමාජවාදය උදෙසා වන වැඩපිළිවෙළෙහි ස්වභාවය වෙනස් විය යුතු බව ලෙනින් විසින් පැහැදිලි කරන ලදී. මේ හේතුවෙන් මාක්ස්ගේ හා ලෙනින්ගේ යුගයන් හිදී ඊට අනුරූපීව සමාජවාදය උදෙසා වැඩපිළිවෙළෙහි වන වෙනස්කම් ඇති විය. එම වෙනස්කම් හා එයට හේතු වූ කාරණා හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේදී වැදගත් වේ. ප්‍රථමයෙන් මාක්ස්ගේ යුගයේදී අනුගමනය කළ සමාජවාදය උදෙසා වැඩපිළිවෙළ විමසා බලමු.

## මාක්ස්ගේ යුගයේ සමාජවාදය උදෙසා වැඩපිළිවෙළ

මාක්ස්ගේ යුගයේදි ධනවාදය පැවැතියේ, එහි මුල් අවධියේය. ප්‍රාග්ධනයේ ක්‍රියාකාරිත්වය පැවැතියේ, නිදහස් තරගයක ආකාරයෙනි. නිදහස් තරගය තුළ අධිනිෂ්පාදන අර්බුදය ප්‍රබල ලෙසින් ප්‍රකාශයට පත්වූයේ, දියුණු ධනේශ්වර රටවලය. අධිනිෂ්පාදන අර්බුදය යනු එක් මොහොතක වැඩි ලාභයක් ලබාදෙමින් තිබූ නිෂ්පාදන ක්ෂේත්‍රයන්ට සියලු තනි තනි නිෂ්පාදකයින් කඩාවැදීම නිසා එම ක්ෂේත්‍රයේ නිෂ්පාදනය වැඩිවී, එහිම ප්‍රතිඵලයක් ලෙස වෙළඳපොළ තුළ මිල පහළ ගොස් ලාභය පහත වැටීම නිසා ඇතිවන අර්බුදයයි. මෙය නිෂ්පාදන අරාජිකත්වය දක්වා වර්ධනය වේ. මෙහි ප්‍රතිඵලය වන්නේ, අධිනිෂ්පාදනය විසින් නිර්මාණය කළ වැඩි නිෂ්පාදනයන් විනාශ

කිරීම, කර්මාන්ත වසා දැමීම, රැකියා අහිමිවීම විසින් නිර්මාණය වන දැවැන්ත අර්බුදයකි. මෙහිදි මුළු ධනවාදී නිෂ්පාදනයම කඩාවැටී මුළු ධනවාදය එක තැන නතරවන තත්වයක් මතුවේ. එවිට ධනවාදය දුර්වල වේ. එබැවින් සමාජවාදී විප්ලවයට අවශ්‍ය විෂයමූල තත්වයන් මෝරා තිබුණේ එම රටවලය. එමෙන්ම දියුණු ධනපති රටවල සමාජවාදය ගොඩනැගීම පහසු කටයුත්තක් මෙන්ම වාසි සහගත එකක් විය. එයට හේතු ගණනාවකි.

සමාජවාදය යනු ධනවාදී සංවර්ධනයේ ඉහළ අවධියෙන් පසු විප්ලවීය අරගලයෙන් ගොඩනැගෙන කොමියුනිස්ට් ක්‍රමයේ සංක්‍රමණීය අවධියයි. සමාජවාදය ආරම්භ කිරීම වඩාත් පහසු වන්නෙත්, ඒ සඳහා අවශ්‍ය කරන නිෂ්පාදන බලවේග සංවර්ධනය වී තිබෙන්නේත් දියුණු ධනවාදී රටවලය. දියුණු ධනපති රටවල් මහා පරිමාණයෙන් කාර්මීකරණය වූ රටවල් නිසා ඒවායේ විප්ලවයේ ගාමක බලවේගය වන නිර්ධන පංතිය පසුගාමී රටවලට සාපේක්ෂව ප්‍රමාණයෙන් හා බලයෙන් ඉතා ශක්තිමත්ය. එසේම දියුණුභාවයෙන් ඉහළය. දියුණු ධනපති රටවල ධනේශ්වර විප්ලවයේ තවදුරටත් සම්පූර්ණ කිරීමට තරම් තත්වයන් නොවන බැවින් එම රටවල සමාජවාදය ගොඩනැගීම පහසුය.  සුළු පරිමාණ දේපළවලට වඩා මහා පරිමාණ දේපළ, ඉතා වැඩි බැවින් පසුගාමී ධනේශ්වර රටකදී සමාජවාදය ගොඩ නැගීමේදී වන දුෂ්කරතා දියුණු ධනපති රටකදී මගහැරේ. තවද දියුණු ධනපති රටවල සමාජවාදී විප්ලවය ජයග්‍රහණය වීමෙන් ලොව පසුගාමී රටවල සමාජවාදය ජයගැනීමට එය රුකුලක්වේ.

මේ සියලු වාස්තවික තත්වයන් ගැඹුරින් විමර්ශනය කළ මාක්ස් විසින් ධනවාදයේ නිදහස් තරගයට අනුව සමාජවාදය ලොව පුරා එකවිට නැතිනම් දියුණු ධනපති රටවලින් ආරම්භ වන බව පැවසීය.

"කොමියුනිස්ට් ක්‍රමය නිෂ්පාදන බලවේගයන්ගේ සහ ඒ හා බැඳුණු ජගත් වෙළඳාමේ විශ්ව සංවර්ධනය පෙර හඟවන හෙයින් අනුභූතිකව එය සිදුවිය හැක්කේ 'සියල්ල එකවිට' නැතහොත් සමගාමීව කෙරෙන ඉදිරියෙන් සිටින ජනතාවගේ ක්‍රියාවක් වශයෙන් පමණි."

(මාක්ස්-එංගල්ස් - ජර්මන් මතවාදය - උපුටා ගැනීම: අවස්ථාවාදයද ? නිර්ධන පංති ජාත්‍යන්තරවාදයද? රෝහණ විජේවීර)

ඒ අනුව මාක්ස්ගේ වැඩපිළිවෙළ වූයේ දියුණු ධනපති රටවලින් ආරම්භ වන සමාජවාදී විප්ලවයක් සඳහාය. එම වාස්තවික තත්වයන් වෙනස් වූ පසු ඉහත දැක්ම මාක්ස් අතින් වූ අත්වැරැද්දක් ලෙස අවස්ථාවාදීන් විසින් දැකීම හිතා මතා කරනු ලබන මුළා කිරීමකි. ධනවාදයේ එම යුගයට අනුව මාක්ස් නිවැරදිය.

## සමාජවාදය වෙනුවෙන් ලෙනින් යුගයේ වැඩපිළිවෙළ

එහෙත් 20වන සියවසේ ආරම්භයත් සමඟ නිදහස් තරගය තුළ වර්ධනය වූ ධනවාදය පියවරක් පෙරට යමින් ඒකාධිකාරී ධනවාදය හෙවත් අධිරාජ්‍යවාදී අවධියට පා තැබීමත් සමඟ ධනවාදයේ වූ ඒ ගුණාත්මක වෙනසත් සමඟ මාක්ස්ගේ යුගයේ සමාජවාදී විප්ලවය සඳහා වූ දළ වැඩපිළිවෙළ වෙනස් විය. මෙම වෙනස හොඳින් විග්‍රහ කරගත් ලෙනින් තම යුගයවූ අධිරාජ්‍යවාදී යුගය මාක්ස්වාදීයට අනුව විග්‍රහ කරමින් නව වැඩපිළිවෙළක් සකස් කළේය.

ධනේශ්වර සමාජ ආර්ථික ක්‍රමය නිදහස් තරගය මගින් ඇතිවන අධිනිෂ්පාදන අර්බුදය හරහා ලෝක පරිමාණයෙන් අර්බුදයට යන්නටත්, එම අර්බුදය චක්‍රීය අර්බුදයක් ලෙසින් යළි යළිත් ප්‍රමාණයෙන් හා ගුණයෙන් විශාල වෙමින් පැන නගින්නට වීම හේතුවෙන් ඉන් මිදීමේ තාවකාලික මඟක් වෙත පිළිපන්නේය. එහිදී ප්‍රාග්ධන ඒකාධිකාරීන් මගින් නිෂ්පාදිත ප්‍රමාණය, ඒවායේ වර්ගය,

මිල, හා වෙළඳපොළට නිකුත් කරන ප්‍රමාණයන් ආදිය පාලනය කිරීමේ අවධියකට පිළිපන්නේය. ඒ හේතුවෙන් අනෙකුත් සුළු ප්‍රාග ්ධනයන් පරදවමින්, හීලෑ කරමින්, යටත් කරමින් හෝ විනාශ කරමින් දැවැන්ත ප්‍රාග්ධනයන් තව තවත් ශක්තිමත් කරන අධිරාජ්‍යවාදී අවධියට ධනවාදය එළැඹිණ. දැවැන්ත ප්‍රාග්ධන ඒකාධිකාරීන් විසින් ලෝකයේ සියලු දේ සූරාකමින් සියල්ල එක් ලක්ෂයකට ඒකරාශි කරන්නට විය. අනෙක් අතට මුල්කාලීන ධනවාදය හැඳින්වූයේ රාජ්‍ය නිර්බාධිත ධනවාදය ලෙසය. ධනවාදී නිෂ්පාදනයට රජය සෘජුව මැදිහත් වූයේ නැත. එහෙත් අධිරාජ්‍යවාදී අවධියේදී ප්‍රාග්ධනය සඳහා රාජ්‍ය මැදිහත්වීම වැඩිවිය. රටවල සම්පත් කොල්ලකෑම සඳහා වෙළඳපොළ අල්ලාගැනීම සඳහා අධිරාජ්‍යවාදී බලවත්හු එකිනෙකා සමඟ යුද වදින්නටද වූහ. ලෝක යුද්ධ නිර්මාණය වූයේ ඒ අනුවය. අධිරාජ්‍යවාදයේ කේන්ද්‍රයේ පවතින රටවල් විසින් පරිධියේ රටවල් සූරාකෑමට ලක් කිරීම නිසා එම රටවල අර්බුදය තව තවත් උග්‍ර වන්නට විය. පරිධියේ රටවල් සූරාකමින් එක් රැස් කරන ධනයෙන් දියුණු ධනපති රටවල කම්කරු පංතියට සුභසාධනය සලසන ලදී. ඒ තුළින් එම රටවල කම්කරු අරගල මොට කෙරිණි. පරිධියේ රටවල සිදුවූයේ මෙහි අනෙක් පැත්තයි. සම්පත් කොල්ලය හා ශ්‍රම සූරාකෑම උත්සන්න වූ බැවින් පරිධියේ රටවල අධිරාජ්‍යවාදී පීඩනය වඩාත් උත්සන්න වන්නට විය. මේ නිසා ලෙනින් අධිරාජ්‍යවාදය යනු ධනපති ක්‍රමයම බවත්, එය ධනපති ක්‍රමයේ ඉහළ අවධිය බවත්, එපමණක් නොව එයින් සමාජවාදයට අවශ්‍ය ද්‍රව්‍යමය තත්වයන් සකසන බවත් තර්කානුකූලව පෙන්වා දුන්නේය. මේ තත්වය මත ධනවාදයේ පරිධියේ රටවලින්, පසුගාමී සංවර්ධනයක් සහිත රටවලින් පවා (අධිරාජ්‍යවාදී දම්වැලේ දුබල පුරුක් තුළින්) සමාජවාදී විප්ලවය ආරම්භ විය හැකි බව ලෙනින් දුටුවේය. එහෙත් ලෝක විප්ලවය සඳහා දියුණු ධනපති රටවල විප්ලවය ජයගැනීමේ අනිවාර්ය බවද ලෙනින් අවධාරණය කළේය.

# 3

# පසුගාමී රටක සමාජවාදය හමුවේ වන අභියෝග

සමාජ පසුගාමීත්වය යනු යම් රටක් ගෝලීය සමාජ සංවර්ධනයට සාපේක්ෂව එහි පසුපසින් ගැටීමයි. ධනේශ්වර සමාජ ආර්ථිකය තුළ එහි පූර්ව සමාජයන්හි සමාජ ආර්ථික හා චින්තන මට්ටම් වැඩිපුර දක්නට ලැබේ නම් එය සමාජ පසුගාමීත්වයයි. එවන් පසුගාමී රටවල සමාජවාදය ගොඩනැගීමේදී විශේෂ වූ ගැටලු ගණනාවක් දක්නට ලැබේ. සමාජ සංවර්ධනයේදී දියුණු ධනපති රටවල් ධනවාදය තුළම කල් බලමින් සිටිද්දී පසුගාමී සංවර්ධනයක් සහිත ධනපති රටක සමාජවාදය ගොඩනගන විට මුහුණ දෙන ගැටලු මෙහි ප්‍රධාන වේ. එවිට ධනවාදී ලෝකය එවන් රටවල සමාජවාදය පරාජය කිරීම උදෙසා වට කොට පහර දෙනු ලබයි. කෙසේ වෙතත් එවන් පසුගාමීත්වය විසින් සමාජවාදය ගොඩනැගීමේදී මතු කරනු ලබන අභියෝගයන් ගණනාවක් දක්නට ලැබේ. ඒ අතරින් මූලිකම අභියෝගයන් කිහිපය මෙසේ සලකා බලමු.

## 1. නිෂ්පාදන බලවේගයන්ගේ සංවර්ධනයේ පහත් මට්ටම හෙවත් තාක්ෂණයේ පහළ මට්ටම හා ජනතාවගේ නොදියුණු බව

ඉහත කාරණා දෙකම එකිනෙකට අන්‍යෝන්‍ය වශයෙන් බලපෑම් කරනු ලබන සාධක දෙකකි. ඒ අනුව සමාජ සංවර්ධනයේ ඉදිරියෙන් සිටින, නිෂ්පාදන බලවේග වඩාත් සංවර්ධනය වූ රටක ජනතාවගේ චින්තනය හා සමාජමය විඥානය වඩාත් දියුණු වන අතර එවිට ජනතාව සංස්කෘතිකමය වශයෙන් ඉදිරියෙන් සිටී. එසේම එලෙස ජනතාව දියුණු ජනතාවක් වන විට ඊට අනුව නිෂ්පාදන බලවේග හා විද්‍යාව හා තාක්ෂණයද දියුණු වේ.

### තාක්ෂණයේ පහළ මට්ටම

පසුගාමී සංවර්ධනයක් සහිත ධනවාදී රටවල නිෂ්පාදන උපකරණ හා බලවේග පවතින්නේ සාපේක්ෂව දුර්වල මට්ටමකය. එය සමාජවාදය ගොඩනැගීමේදී ප්‍රධාන අභියෝගයක් වේ. එවිට ධනවාදී නිෂ්පාදනය විසින් ඇති කරගත යුතුව තිබූ නිෂ්පාදන බලවේගයන්ගේ වර්ධනයද සමාජවාදය මතට පැවරෙයි. නිෂ්පාදනයේ වන එවැනි පහත් මට්ටම විසින් දියුණු තාක්ෂණ භාවිතය වෙනුවට ශ්‍රම සූක්ෂම නිෂ්පාදන ක්‍රමයට වැඩි නැඹුරුවක් දක්වයි. එවන්වූ නිෂ්පාදන ක්‍රියාවලියක් විසින් එහි ශ්‍රම ඵලදායකත්වය අවම කරනු ලබයි. ශ්‍රමයේ ගුණාත්මක දියුණුව අඩාල කරනු ලබයි. එය සමාජවාදී ආර්ථිකයේ වර්ධනයට බාධාවක් බවට පත්වේ. තවද එම සමාජයේ වන පසුගාමීත්වය නිසාම ජනතාව තුළ වැඩි වශයෙන් අතීතකාමී ස්වභාවයක් ප්‍රකාශයට පත්වේ. එහිදී නවීන තාක්ෂණයට වඩා අතීත ශිල්පීය ක්‍රමයන් පිළිබඳව අධිතක්සේරුවක හා අධිනිශ්චය වීමක පවතී. එබැවින් ජනතාව පසුගාමී චින්තනය තුළ කොටුවීම විසින් පවතින ධනපති සමාජයේ චින්තන මට්ටමටවත් ඔවුන් පැමිණෙන්නේ නැත. මිනිස් වර්ගයාගේ නවතම විද්‍යාත්මක හා තාක්ෂණික සොයා ගැනීම්

දෙස එවන්වූ පසුගාමී සමාජයේ මිනිසුන් බලන්නේ සැක සහිත ආකල්පයෙන්ය.

ඉහත කාරණය තහවුරු කරගැනීම පිණිස සමාජවාදී විප්ලවයට පෙර පැවැති රුසියාව උදාහරණයක් ලෙස සලකා බැලීමට හැකිය. සමාජවාදයට පෙර එරට ස්වයං රැකියාවල නියුතු ජනගහනයෙන් පහෙන් හතරක්ම කෘෂිකර්මාන්තයේ යෙදෙන්නෝ වූහ. එබැවින් කම්කරු පංතිය ප්‍රමාණයෙන් කුඩා වන අතර ගොවි ජනතාව ප්‍රමාණයෙන් වැඩි පිරිස බවට පත් විය. රටේ වැඩිපුරම පැවතියේ සුළු කර්මාන්ත හා සුළු පරිමාණ දේපළය. පූර්ව සමාජවාදී රුසියාවේ බොහෝ ප්‍රදේශවලට විදුලි බලය නොතිබිණි. එමෙන්ම කෘෂිකර්මාන්තයට ට්‍රැක්ටර් වැනි අත්‍යවශ්‍යම උපකරණ පවා නොතිබිණි. එබැවින් සාර් රුසියාවේ කාර්මීකරණය හා තාක්ෂණික භාවිතය ඉතා පහත්ම මට්ටමක විය. ඒ හේතුවෙන් සමාජවාදී ගොඩනැගීම් ආරම්භ කරන මුල් අවධිය වන විට රුසියාව තුළ තාක්ෂණය හා කාර්මිකකරණය ඉතාම ප්‍රාථමික මට්ටමක පැවැතුණි. යුද්ධය ආසන්නයේ රුසියාවේ ඉඩම්වලින් සෑම වර්ග කිලෝමීටර් සියයකටම දුම්රිය මාර්ග පැවැතියේ කිලෝමීටර් 0.4 කි. එවකට දියුණු ධනපති රටක්වූ ජර්මනියේ එය කිලෝමීටර් 11.7කි. මෙම තාක්ෂණයේ වූ දුප්පත්කමට සාපේක්ෂව රුසියන් සමාජය තුළ පැවැති පසුගාමී චින්තනය නිසාවෙන් එම ජනතාව සම්ප්‍රදායික ආකල්ප හා සිතුම් පැතුම්වලට වහල් වූවෝ වූහ. කාර්මිකකරණය හා නවීන තාක්ෂණය දෙස සැකයෙන් හා අද්භූත යමක් දෙස දකින මානසිකත්වයෙන් සිතා කටයුතු කරන සමාජයක් තුළ ජනතාව නොමඟ යැවීමේ හා මුළා කිරීමේ හැකියාව වැඩියෙන් පවතී. මෙම සමාජ පසුගාමීත්වය සමාජවාදය ගොඩනැගීමේදී එයට  බාධා කරන විලංගුවක් විය.

## ජනතාවගේ නොදියුණු බව

පසුගාමීත්වය යනු ධනේශ්වර විප්ලවය සම්පූර්ණ නොවීම විසින් ඇතිවන විකෘතිතාව හේතුවෙන් ඇති වන්නකි. පසුගාමීත්වය තුළ පසුකල වැඩවසම් හෝ ආසියාතික සමාජ විඥානය ප්‍රබල ලෙස බලපෑම් කරනු ලබයි. ධනේශ්වර සමාජ විඥානය සම්පූර්ණ නොවූ තත්වයක් තුළ ඔවුන් සැමවිටම සිතන්නේ, ධනේශ්වර සමාජ ක්‍රමයටද පසුපසින් සිටය. මෙය සමාජවාදය ගොඩනැගීමේදී විශාල බාධාවන් ඇති කරයි. ධනේශ්වර විප්ලවය විසින් ඉටුනොකළ ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී කටයුතු ලෙස ජාතික ගැටලුව නොවිසඳීම, ගම සහ නගරය අතර මහා පරතරය හා ප්‍රතිවිරෝධය අහෝසි නොකිරීම, කාන්තාවන් සඳහා ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයේ සමානත්වය ඇති නොකිරීම, කුල හා ප්‍රදේශීය බෙදීම් අහෝසි නොකිරීම ආදිය පවතී. එක් උදාහරණයක් ලෙසින් 'ජාතික පීඩනය' සලකන්නේ නම් පූර්ව සමාජවාදී රුසියාව තුළ රුසියානු ජාතිකත්වය සියයට හතළිස් තුනක් විය. එය මහ ජාතිය යන මානසිකත්වයෙන් යුතුව කටයුතු කළේය. තවද රුසියාවේ ඉතිරි සියයට පනස් හතම රුසියානු නොවන ජාතීන් ලෙස සිටි පිරිසයි. ඔවුහු සුළු ජාතීන් ලෙස පීඩාවට පත්වූහ. එනිසාම සාර් රුසියාව 'ජාතීන්ගේ සිරගෙදර' ලෙස හැඳින්විණි.

මෙවන් වූ පසුගාමීත්වය හමුවේ ධනේශ්වර විප්ලවයෙන් ඉටු නොවූ කාරණා සපුරාලීමේ වගකීමක් එම රටවල සමාජවාදී විප්ලවය ආරම්භයේදීම පැවරී තිබේ. එවිට සමාජවාදය ගොඩනැගීමේ සමාජවාදී පියවරයන් පසුපසට යෑමක් හා පමාවීමක් සිදුවේ.

## 2. නිම නොවූ ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී කටයුතු

සමහර රටවල ධනේශ්වර විප්ලවය සිදුවූ විවිධ තත්වයන් තුළ එම විප්ලවය විසින් අවසන් නොකළ ප්‍රජාතන්ත්‍රවාදී කටයුතු ගණනාවක්ම ඉතිරිව පවතී. එම හේතුව නිසා ඇතිවන සමාජ

පසුගාමීත්වය පිළිබඳව ඉහතදී කථා කළෙමු. එලෙස නිමනොවූ ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී කටයුතු මොනවාදැයි සලකා බැලීම මෙන්ම සමාජවාදී සමාජ විප්ලවයේදී ඒවා මඟහැර යාමට හැකිද යන්න හෝ එසේ නොමැතිනම් එම නිමනොවූ ධනේශ්වර විප්ලවීය කටයුතු සපුරාලන්නේ කෙසේදැයි යන්න සලකා බැලිය යුතු වැදගත් කාරණයකි.

මේ ගෙවී යන්නේ, ධනේශ්වර විප්ලවයේ අවධිය නොව සමාජවාදී විප්ලවයේ අවධියයි. එනිසා යල්පැන ගිය ධනපති ක්‍රමය තවදුරටත් සංවර්ධනය වන්නේ නැත. එය දැන් තම වැහැරීම ආරම්භ කොට බොහෝ දුර ගෙවා ඇත. ධනවාදයට යළි ඉටු නොවූ ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී කර්තව්‍යයන් සම්පූර්ණ කළ නොහැක. නමුත් සමාජ සංවර්ධනයේ ගමන් දිශාවට අනුව ධනේශ්වර විප්ලවය සම්පූර්ණ නොවූ තත්වය තුළ එය මගහැර සමාජවාදය වෙත යාමටද නොහැක. මේ ගැටලුව විසඳාගැනීම සඳහා ලෙනින් විසින් "ධනේශ්වර නොවන සංවර්ධන මාවත" යන්න පෙන්වා දෙන ලදී. ඉන් පැවසෙන්නේ, නිම නොකරන ලද ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී කර්තව්‍යයන් එම රටවල සමාජවාදී විප්ලවය විසින් පවරා ගත යුතු බවයි; සමාජවාදී විප්ලවයේ ප්‍රමුඛ කටයුත්තක් ලෙසින් සලකා ඉටු නොවූ ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී කර්තව්‍යයන් සපුරාලිය යුතු බවයි. එම ක්‍රියාවලියේම අඛණ්ඩ දිගුවක් ලෙසින් සලකමින් සමාජවාදය ගොඩනැගීමේ පියවරයන්ද පවත්වා ගත යුතුය. එහෙත් නිම නොවූ ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී කර්තව්‍යයන් සමාජවාදය වෙත පැවරුන විට සමාජවාදයේ කාර්යය වඩාත් සංකීර්ණ වේ. එමෙන්ම වඩාත් දුෂ්කර වේ.

## 3. පසුගාමී රටක සමාජවාදයට එරෙහිව වන තර්ජන හා බලපෑම්

ධනපති ලෝකය සමාජවාදයට එල්ල කරන තර්ජනයන් ක්ෂේත්‍ර කිහිපයක් ඔස්සේ දිවයයි. ඒ මතවාදීමය, සංවිධානමය, ආර්ථිකමය හා යුදමය වශයෙනි.

එහිදී මතවාදී ප්‍රචාරය ඉදිරියෙන්ම වේ. සමාජවාදයෙහි අනිවාරණීය බවත්, ජයග්‍රාහී බවත් වසන් කරලනු සඳහා අධිරාජ්‍යවාදය විසින් ඉතා ප්‍රබලව ප්‍රතිවිප්ලවීය මතවාදී ප්‍රචාරයන් ගෙන යනු ලැබේ. විශාල වශයෙන් මුදල් යොදවමින් හා ඒ සඳහා වන යාන්ත්‍රණයක් නඩත්තු කරමින් මෙම ප්‍රචාරයන් ගෙන යනු ලබයි. එවන් බොරු ප්‍රචාරයන් කීපයක් මෙසේය.

මූලිකවම සමාජවාදය තුළ නිදහස නැත යන්න හුවාදක්වයි. එයට අනුව සමාජවාදය යනු බලහත්කාරයෙන් වැඩගන්නා ක්‍රමයක් බව ප්‍රචාරය කරයි. ඇත්ත වශයෙන් සමාජවාදය තුළ වැඩ නොකර සිටීමට බාධාවක් නොමැත. වැඩ නොකරන අලසයින්ට සමාජවාදය තුළ අනුන්ගේ ශ්‍රමයෙන් යැපීම කළ නොහැකිය. ධනවාදය තුළ සිදුවන්නේ, මෙහි අනෙක් අන්තයයි. එක් අතකින් ධනවාදය තුළ ජනතාව රැකියා නොමැතිකමින් පීඩා විඳී. අනෙක් අතට කිසිවක් නොකරන අලස ධනපති පංතිය වැඩකරන මිනිසුන්ට හිමිවිය යුතු සම්පත් පැහැර ගෙන භුක්ති විඳීමයි. ධනපති ක්‍රමය යනු දහදිය බිඳක් හෝ නොහෙළන අලස ධනපති සුළුතරය විසින් වැඩකරන බහුතරයක් ජනතාවගේ ශ්‍රමය කිසිදු ගෙවීමකින් තොරව පැහැර ගන්නා අසාධාරණ කෲර සමාජ ක්‍රමයකි.

"ධනපති පංතිය තමනට ආධිපත්‍යය ලැබුණු හැම තැනකදීම රදලවාදී වූද, පීතෘ මූලික වූද, සරල ගැමි ජීවිතය අරභයා වූද සියලු සමාජ සබඳතාවයන් අහෝසි කර දැම්මේය. මිනිසා තම 'ස්වභාවික අධිපතියන්ට' බැඳ දමා තිබුණු සියලු රදල බන්ධනයන් තු තු කොට ඉරා දැමූ එය මිනිසෙකු හා මිනිසෙකු අතර නග්න ආත්මාර්ථකාමයද, නිර්දය 'මුදල් ගෙවීමද ' හැර අන් කිසිදු සබඳතාවයක් ඉතිරි නොකළේය. එය ආගමික භක්තියේ ස්වර්ගමය ප්‍රමෝදයන්ද, ධීර වීර උනන්දුවද, අවරසික අනුරක්තතාවයද, මමත්ව කේන්ද්‍රික ගණන් බැලීම නැමැති අයිස් වතුරෙහි ගිල්වා දමා ඇත. එය පෞද්ගලික වටිනාකම හුවමාරු

වටිනාකම බවට පෙරළා ඇත. එමෙන්ම වරලත් දිනාගත් නිදහසවල් අසංඛ්‍යයක් වෙනුවට, හෘදය සාක්ෂියට කොහෙත්ම එකඟ නොවන එකම නිදහස වන ස්වාධීන වෙළදාම පිහිටුවාලීය. එක වචනයකින් කියතොත්, ආගමික හා දේශපාලන මායාවන්ගෙන් වසා තිබුණු සූරාකෑම වෙනුවට එය නග්න, අල්ලජ්ජි, ඍජු හා ම්ලේච්ඡ සූරාකෑමක් ආදේශ කළේය."

(කොමියුනිස්ට් ප්‍රකාශනය)

සමාජවාදය අලසයින් බිහිකරනවා යන්න සමාජවාදය පිළිබඳව තවත් ධනපති ප්‍රලාපයකි. එයට හේතුව ලෙසින් ඔවුන් දක්වන්නේ පුද්ගලික දේපළ අහිමිවීමත් සමඟ මිනිසුන්ගේ ශ්‍රම කටයුතුවල යෙදීමේ උනන්දුව අඩුවන බවයි. ඔවුන් සැම විට පුද්ගලික ප්‍රතිලාභ බලාපොරොත්තු වන බවයි. කොමියුනිස්ට් ප්‍රකාශනය තුළ මාක්ස් පවසන්නේ ධනපති ක්‍රමයෙහි දැනටමත් දේපළ අහිමි කළ බහුතරයක් මිනිසුන් සිටින බවයි. එසේ නම් අලසකම වැඩිපුරම තිබිය යුත්තේ ධනපති ක්‍රමය තුළ බවයි.

"පෞද්ගලික දේපොළ අවලංගු කිරීමෙන් ඉක්බිතිව සියලු වැඩ හා ක්‍රියාකාරිත්වය නතර වනු ඇතැයි ද, සමස්ත ලෝකයේ අලසකම රජකරනු ඇතැයිද යනුවෙන් විරුද්ධත්වයක් ඉදිරිපත් කර ඇත.

මෙය මෙසේ නම් ධනවාදී සමාජය මීට බොහෝ කලකට පෙර විනාශවී යායුතුව තිබුණි. මන්දයත්, මෙම සමාජය යටතේ වැඩකරන්නාට කිසිවක් අයිති නොවන බැවිනි. අයිති කරගන්නා කිසිදු ශ්‍රමයක් වැය නොකරන බැවිනි. තවදුරටත් ප්‍රාග්ධනය නොපවතින නිසා වැටුප් ශ්‍රමයකුත් ඇති විය නොහැකි යැයි කියාපාන පුනරුක්තියට යට කියන ලද සියලු විරුද්ධත්වයන් සමාන වෙයි."

(කොමියුනිස්ට් ප්‍රකාශනය )

ඉහත විවේචනයන්ට අමතරව සමාජවාදය තුළ ප්‍රජාතන්ත්‍රවාදය නැති බවත් මහජන නියෝජිතයින් තෝරා පත්කරන්නේ නැති බවත් පවසමින් ධනපති මතවාදය මඟින් විවිධ බොරු ප්‍රචාරයන් පතුරුවා හරිනු ලබයි. එයට ඔවුන් පදනම් කරගනුයේ එම සමාජවාදී රටවල ධනේශ්වර සම්ප්‍රදායට අනුව බහුපක්ෂ මැතිවරණ නොතැබීමයි. බහු පක්ෂ ක්‍රමය යනු රැවටිල්ලකි. එයින් කෙරෙන්නේ පීඩිත පංතිය යම් නිශ්චිත කාලයකට සූරාකනු ලබන්නේ ධනපති පංතියේ කුමන කණ්ඩායමද යන්න තෝරා ගැනීමක් බව ලෙනින් විසින් පෙන්වා දී ඇත. බහු පක්ෂ ක්‍රමය නම් රැවටිල්ල නොවුණාට ජනතාව අතරින් පුළුල් ලෙස මහජන නියෝජිතයින් තෝරා පත්වන, දූෂණ නොමැති ඡන්ද ක්‍රමයක් සමාජවාදී රටවල පවතී. ප්‍රජාතන්ත්‍රවාදී යැයි කියාගන්නා ධනවාදී ලෝකයේ මැතිවරණ ජයගනු ලබන්නේ ධනය හා ඒ නිසාම අත්පත් කරගන්නා බලය මඟින්ය. සමාජවාදය තුළ එය එසේ වන්නේ නැත. සැබෑ ජනතා කැමැත්ත මත මහජන නියෝජිතයින් තේරී පත්වේ. පත්කළ නියෝජිතයින් මහජනතාවට වග නොකියන්නේ නම්, පොදු දේපළ සොරාගන්නේ නම්, ජනතා විරෝධී ක්‍රියාවන්හි යෙදෙන්නේ නම් ඔවුන් ඊළඟ මැතිවරණයට පෙර ඕනෑම අවස්ථාවක ආපසු කැඳවීමේ ජනතා අයිතියක් සමාජවාදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම සහතික කොට ඇත.

'සමාජවාදී රටවල් බාහිර ලෝකය හා සම්බන්ධ නැත' යන්න තවත් එවැනිම වූ අසත්‍ය ප්‍රචාරයකි. එම ප්‍රචාරකයින් විසින් සමාජවාදී රටවල් බාහිර ලෝකයෙන් වෙන් කොට පවතින රහසිගත ලෝකයක් බව ඉස්මතු කොට දක්වයි. සෝවියට් දේශය 'යකඩ තිරයකින් ' බාහිර ලෝකය වසන් කර ඇතැයි යන කියමන ජනප්‍රිය යෙදුමක් බවට පත් කර තිබිණි. සමාජවාදය ජාත්‍යන්තර වශයෙන් සම්පූර්ණ වන විප්ලවයක් බැවින් සාමාන්‍යයක් ලෙසින්ම එය ජාත්‍යන්තර සබඳතා සහිත විප්ලවයකි. සමාජවාදය ප්‍රතිවිප්ලවයට වසන් කොට ආරක්ෂා

කළද එය බාහිර ලෝකයට වසන් කර නැත. නමුත් සමාජවාදී රාජ්‍ය වෙත ධනවාදී විෂ බීජ ඇතුළුවීම වළකා ඇති බව සත්‍යයකි. එය වාරණයක් නොව අත්‍යවශ්‍ය ආරක්ෂාවකි.

'සමාජවාදය තුළ පුද්ගලික ජීවිතයක් නැත' යන්න තවත් ධනපති අවලාදයකි. ඔවුහු ජනතාව නොමඟ යැවීම සහ බිය ගැන්වීම සඳහා මෙවන් බොරු ප්‍රචාරයන් ගෙන යති. මිනිසුන්ගේ පෞද්ගලික ජීවිතය පමණක් නොව සමාජ ජීවිතය පවා අහිමි වී ඇත්තේ ධනවාදය තුළය. සමාජවාදය මිනිසාගේ සමාජමය ජීවිතය ශක්තිමත් කරන අතර ඒ තුළ ඔහුගේ පෞද්ගලික ජීවිතයද ආරක්ෂා වේ.

සමාජවාදයට එරෙහිව සංවිධානාත්මකව බලපෑම් කිරීම පිණිස අධිරාජ්‍යවාදී රටවල්, එක්සත් ජාතීන්ගේ සංවිධානය වැනි ජාත්‍යන්තර දේශපාලන සංවිධාන පවා අනියමින් පොළඹවා ගනු ලබන අතර සමහර ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධාන මෙන්ම විවිධ ආර්ථික සංවිධානයන් උදෙසා මුදල් යොදවමින් මැදිහත් වෙයි. මෙයට අමතරව නේටෝව වැනි යුදමය සංවිධාන මගින් සමාජවාදී රටවල් යුදමය වශයෙන් වටලෑමද සිදුකරයි. තවද පල්ලිය වැනි විවිධ ආගමික ආයතන මඟින් ජනතාව රවටමින් සමාජවාදයට එරෙහිව ඔවුන් පෙළඹවීම සිදු කරයි.

එහි ප්‍රතිඵලයක් වශයෙන් සමාජවාදී රටවලට මානව හිමිකම් හෝ න්‍යෂ්ටික අවි පිළිබඳව බොරු චෝදනා ඉදිරිපත් කරමින් ආර්ථිකමය සම්බාධක පනවනු ලබයි. කියුබාව සහ උතුරු කොරියාව මේ තත්වය දැනටමත් අත්දකිමින් සිටියි. සමාජවාදී රටවල ආර්ථික මර්මස්ථාන විනාශ කිරීම සඳහා ඉතා පහත් සහ කෲර කුමන්ත්‍රණයන් දියත් කරයි. කියුබාවේ කෙසෙල් වගාව වැනසීම උදෙසා ඇමරිකාව විසින් ගුවනින් හානිකර දිලීර ඉසීම වැනි ආර්ථිකය ඇද වට්ටන කුමන්ත්‍රණ සිදුකිරීම හා ඉන් නොනැවත අවසානයේ යුදමය මැදිහත්

වීම් පවා සිදුකරයි. 1961 පරාජය කරනු ලැබූ කියුබන් ආක්‍රමණය එවන් පැහැදිලි නිදර්ශනයකි. 1983 ඔක්තෝබර් 25 දින ග්‍රෙනෙඩා ආක්‍රමණය වැනි ආක්‍රමණයන් තුළින් අධිරාජ්‍යවාදීන් විසින් සමාජවාදී විප්ලවය ජයගත් රටවල යළි බලය පෙරළා දැමීම සිදු කළේය.

★ න්‍යෂ්ටික අවි තරගය

ඉහත සඳහන් පරිදි එක් කලෙක සමාජවාදයට එරෙහිව අධිරාජ්‍යවාදී කඳවුරේ තර්ජන හා බලපෑම් හමුවේ එයට එරෙහිව ගෙනගිය අරගලය අවසානයේදී න්‍යෂ්ටික අවි තරගයක් දක්වා ඉහළ නැංගේය. දෙවන ලෝක යුද්ධය අවසන් වෙමින් පැවැතියේදී ඇමරිකාව විසින් ජපානය මත පරමානු බෝම්බ හෙළීම සිදු කරන ලදී. ඒ 1945 අගෝස්තු 6 වෙනිදා හිරෝෂිමාවටත් 1945 අගෝස්තු 9 වෙනිදා නාගසාකිවලටත් යන ආකාරයෙනි. ඇමරිකානු ඇස්තමේන්තු වලට අනුව හිරෝෂිමාවේ 70000ක් පමණද නාගසාකිවල 40,000 පමණද මියගිය අතර අද පවා එම ප්‍රදේශවල උපදින දරුවන් එම බෝම්බවල බලපෑම නිසා අංග විකලව හා ආබාධිතව උපත ලබයි. වර්ග කිලෝමීටර් 10 ක භූමි ප්‍රදේශයක් තුළ සියයට 68ක් ගොඩනැගිලි මුළුමනින්ම විනාශ විය. ඉතිරි ගොඩනැගිලිවලින් සියයට 24ක් කැඩී බිඳී යන ලදී. මේ වන විට ජපානය යටත්වී නොසිටියද පරාජය ලබමින් සිටියේය. එසේ තිබියදී ඇමරිකාව විසින් ජපන් ජනතාව ඉලක්ක කොට මෙම ප්‍රහාරය දියත් කරනු ලැබූයේ තම න්‍යෂ්ටික අවි අත්හදා බැලීමට මෙය අවස්ථාවක් කරගනිමිනි. එතැන් සිට අධිරාජ්‍යවාදයට මුහුණ දෙන සමාජවාදී සෝවියට් දේශයට ආරක්ෂාව උදෙසා න්‍යෂ්ටික අවි ස්ථානගත කරන්නට සිදුවිය. 1949 සමාජවාදී විප්ලවය ජයගත් චීනයද න්‍යෂ්ටික අවි නිපදවීමට එක් විය. ආරක්ෂක ක්‍රියා මාර්ගයක් ලෙස මෙය අත්හැරිය නොහැකි කටයුත්තක් වුවද න්‍යෂ්ටික අවි අත්හදා බැලීමේ හා ස්ථානගත කිරීමේ තරගයේදී සමාජවාදය ගොඩනැගීම සඳහා යෙදවිය යුතු සම්පත් විශාල ප්‍රමාණයක් මේ සඳහා යෙදවිණි.

මෙය සමාජවාදය ගොඩනැගීමට යම් බාධාවක් විය.

මේ අතර ලෝක සමාජවාදී විප්ලවය සම්පූර්ණ නොවීම හේතුවෙන් එක් රටකට හෝ කිහිපයකට හුදකලාව පරිවර්තනීය කාලපරිච්ඡේදයක් තුළ, දිගු කලක් කල් බැලීමට සිදුවීම බොහෝ ගැටලු නිර්මාණය කරන්නට විය. තවද සමාජවාදය ගොඩනැගීම උදෙසා ජනතාවගේ කැපකිරීම් සහ දරාගැනීම්වල විවිධ සීමාවන් පවතී. එම සීමාවන් ඉක්මවා යන මොහොතේ සිට ජනතාවගේ සිත් තුළ බලාපොරොත්තු හා විශ්වාසය වෙනුවට වැනෙන සුළු හා චපල බව ඇතිවේ. මේ තත්වය නිසා සතුරන්ට ජනතාව නොමඟ යැවීමේ හා ප්‍රතිවිප්ලවය සංවිධානය කිරීමේ අවස්ථාවන් වැඩිවේ. ඒ තුළින් සමාජවාදී රාජ්‍ය තුළ අභ්‍යන්තර හා බාහිර ගැටලු මතු කිරීමේ ඉඩ සැකසෙයි. නිර්ධන පංති ජාත්‍යන්තරයේ සහය නොමැති විටක මෙය වඩාත් අනතුරුදායක තත්වයක් බවට පත්වේ. ලෝක සමාජවාදී විප්ලවය නිම නොවූ තත්වයක් තුළ මෙහි වඩාත්ම වාසිය අත්වන්නේ ධනපති පංතියටය.

සියල්ල සලකා බැලීමේදී සමාජවාදය යනු කිසිදු නිදහසක් නොමැති, ප්‍රජාතන්ත්‍රවාදය අහිමි කළ, අලසයින් බිහිකරන, කිසිදු පෞද්ගලිකත්වයක් නොමැති ක්‍රමයක් ලෙසින් ධනපති ලෝකය හුවා දක්වනු ලැබීය. සමාජවාදයට එරෙහිව එවන් මතවාදීමය ප්‍රහාරයන්ට අමතරව ආර්ථිකමය, සමාජමය ආදි පාර්ශ්වයන් ඔස්සේද එකවර සිදුවූ ප්‍රහාරයන් බොහෝ විය. ඉන් නොනැවතී සමාජවාදයට එරෙහිව දේශීය හා ජාත්‍යන්තර වශයෙන් වන ධනපති සංවිධානයන් මගින් අවසානයේ යුදමය වැටලීම් දක්වා සංවිධානාත්මකව බලපෑම් කරන්නට විය. මේ සියල්ලෙහි තර්කානුකූල ප්‍රතිඵලය වශයෙන් න්‍යෂ්ටික අවි තරගය වැනි ආරක්ෂක ක්‍රියාමාර්ගවලට පොළඹවාලීම මගින් ආර්ථික වශයෙන් සමාජවාදය ගොඩනැගීමේ අරගලය වෙනත් දිසාවන්ට සිරකරන ලදී. මේ සියල්ල සමාජවාදයට එරෙහිව දැවැන්ත

ප්‍රතිවිප්ලවීය ව්‍යාපෘති හා ක්‍රියාමාර්ග විය. එනිසාම මෙම තත්වය හමුවේ සමාජවාදය මුහුණ දුන් දුෂ්කර තත්වයන් ඉක්මවීම සඳහා වන උපක්‍රමික ක්‍රියාමාර්ගයන්ගේ අවශ්‍යතාවය පැන නැගුණේය.

## පසුගාමී රටවල සමාජවාදය ගොඩ නැගීමේදී මුහුණ දෙන අභියෝග අභිභවනය සඳහා වූ ලෙනින්වාදී ක්‍රියාමාර්ග

පසුගාමී ධනේශ්වර සංවර්ධනයක් සහිත රටවලදී සමාජවාදය මුහුණ දෙන අභියෝග ජයගැනීම සඳහා වූ වැඩපිළිවෙළක් ලෙනින් විසින් සකස් කරනු ලැබීය. නව අභියෝග තුළ සමාජවාදය ගොඩනැගීමත් ලෝක විප්ලවයත් සඳහා නව උපාය උපක්‍රම හා ක්‍රියාමාර්ග ගනු ලැබීය. ඒ සඳහා අනුගමනය කළ ප්‍රධාන ක්‍රියාමාර්ග මෙසේ විය.

### 1. කොමියුනිස්ට් ජාත්‍යන්තරය සහ ජාත්‍යන්තරවාදයේ අත්‍යවශ්‍යතාවය

'ප්‍රාග්ධනය ජාත්‍යන්තර ස්වරූපයක් දරන බැවින් එයින් විමුක්තිය ලැබීමේ නිර්ධන පංති අරගලයද ජාත්‍යන්තර ස්වරූපයක් දරයි' යන මාක්ස්ගේ ඉදිරිපත් කිරීම අදටත් එලෙසම පවතී. තවද ඒ සඳහා සැබවින්ම විය යුත්තේ, බිහිවන සමාජවාදී රාජ්‍යයන් සියල්ලම එක් සංගමයකට එක්වීමයි. සෝවියට් සංගමය හා චීනය එලෙස එක් වූවා නම් ආසියාවේ හා යුරෝපය පුරා පැතිරි දවැන්තම සමාජවාදී රාජ්‍ය එකමුතුව ලෙසින් එය ලෝක සමාජවාදී විප්ලවයට ප්‍රබල ශක්තියක් වන්නට ඉඩ තිබුණි.

පසුගාමී රටක සමාජවාදය තහවුරු කිරීමේදී එයට ජාත්‍යන්තර සහය අත්‍යවශ්‍යය. දියුණු ධනපති රටවලදී මෙන් නොව පසුගාමී රටක සමාජවාදී විප්ලවයේ පැවැත්ම උදෙසා එහි හුදකලා නොවීම තීරණාත්මකය. බිහිවූ සමාජවාදී රට එහි ළදරු අවස්ථාවේ සිටම ධනපති පංතිය විසින් ආර්ථික වශයෙන්, මතවාදීමය වශයෙන්, සංවිධානමය වශයෙන් හා දේශපාලනමය වශයෙන් වටලෑමට පටන්

ගනියි. ශක්තිමත් ජාත්‍යන්තරයක් පවතී නම් එහිදී සමාජවාදයේ උපකාරය සඳහා එහි ශක්තිය යොදාගත හැකිය. එවිට ධනවාදී රටවල් තුළ පවා එයට එරෙහිව එම රටවල නිර්ධන පංතීන් හා සංවිධාන හරහා බලපෑම් කළ හැකිය. විශාල හඬක් නැගිය හැකිය. නිදර්ශනයක් වශයෙන් ගන්නේ නම් වියට්නාම් විප්ලවය අවස්ථාවේ ජාත්‍යන්තරය දුබලව තිබියදී පවා ජාත්‍යන්තර සහය උපරිම වශයෙන් ගන්නා ලදී. එසේම තවදුරටත් ධනවාදී රටවල තිබෙන කොමියුනිස්ට් පක්ෂවල සහෝදරාත්මක සහයෝගය සමාජවාදය ගොඩනැගීමේදී ලබාගත හැකිය. ලෙනින්ගේ අවධිය වන විට දෙවන ජාත්‍යන්තරයද බිඳවැටී තිබුණි. එමෙන්ම එහි කාර්යභාරය අවසන්ව තිබුණි. එනිසාම ලෙනින්ගේ මූලිකත්වයෙන් 1919 දී තෙවන ජාත්‍යන්තරය ගොඩ නැගුණි. ඒ, ලෝක සමාජවාදයේ ජයග්‍රහණයන් උදෙසාය.

## 2. ජාතික විමුක්ති අරගල සමාජවාදී විප්ලවය දක්වා පෙරට ගෙන ඒම

20වන සියවසේ ආරම්භයේදීම රුසියාවේ සමාජවාදී විප්ලවය ජයගැනීමත් සමඟ ලොව පුරා යටත්විජිත ලෙස පැවති රටවල යටත්විජිතභාවයෙන් නිදහස් වීමේ නිදහස් අරගල හෙවත් ජාතික විමුක්ති අරගල ඇතිවිය. බොහෝ විට මේවායේ නායකත්වය ගනු ලැබුවේ එම රටවල දේශීය ධනපති පංතියය. මෙම රටවල කම්කරු පංති ව්‍යාපාරයන්ද බිහි වෙමින් තිබූ අතර ලෙනින්ගේ නායකත්වයෙන් යුත් 3වැනි ජාත්‍යන්තරයේ වැඩපිළිවෙළ වූයේ මෙම ජාතික විමුක්ති අරගල සමාජවාදී විප්ලවයෙන් කෙළවර කිරීම සඳහා මැදිහත් විය යුතු බවය. මෙය තේරුම් ගැනීම සඳහා ජාතික විමුක්ති අරගල යනු කුමක්ද යන්න වටහා ගැනීම අවශ්‍යය.

ධනේශ්වර විප්ලවය ආරම්භ වන්නේ, 16වැනි සියවසේදී පමණය. ඒ එවකට පැවැති වැඩවසම් සමාජ ආර්ථික රටාව බිඳ දමමින්ය. ධනේශ්වර විප්ලවය විවිධ රටවල සිදුවූයේ ආකාර

කිහිපයකින්ය. එම රටවල පවතින සමාජ ආර්ථික තත්වයන් මත එම ආකාරය කුමක්ද යන්න තීරණය විය. ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය, ධනේශ්වර විප්ලවය, උත්තරාරෝපිත ධනේශ්වර විප්ලවය හා ජාතික විමුක්ති අරගලය ඒ ධනේශ්වර විප්ලවයේ ආකාරයන්ය. ප්‍රංශය වැනි ධනේශ්වර විප්ලවය මුළුමනින්ම සම්පූර්ණ කළ අවස්ථාවන්හි එය ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයක ආකාරය ගත්තේය.

එමෙන්ම ධනේශ්වර විප්ලවය සම්පූර්ණ කළ එහෙත් රාජ්‍යත්වය, ඒ, හා බැඳි වෙනත් සම්ප්‍රදායික වැඩවසම් බල ආකෘති ආදිය ඉතිරි කරමින් එංගලන්තයේ වැනි රටවල ධනේශ්වර ක්‍රමය තහවුරු කරන්නේ ධනේශ්වර විප්ලවය යන ආකාරයෙන්ය. එය ප්‍රංශ විප්ලවයට වඩා වෙනස්වූ ආකාරයක් ගත්තේය. තවදුරටත් ශ්‍රී ලංකාව වැනි ආසියාතික සමාජයක් පැවැති රටවල විප්ලවීය තත්වයක් එම සමාජයන්හි අභ්‍යන්තරයෙන් පැන නැගුණේ නැත. ඒ එම රටවල පැවැති මූලික හා අභ්‍යන්තර ප්‍රතිවිරෝධයන්ගේ මන්දගාමිත්වය හේතුවෙනි. උපත ලද වහාම ප්‍රාග්ධනයේ ජාත්‍යන්තර ස්වභාවය හේතුවෙන් ලොව වටා පිම්මේ ගිය ධනේශ්වර ක්‍රමය මෙවන් වූ රටවලටද කඩා වැදුණි. එනිසා එම රටවල ධනේශ්වර ක්‍රමය ස්ථාපිත වන්නේ, උත්තරාරෝපිත ආකාරයටය. පිටතින් එලෙස සමාජ ආර්ථික ක්‍රමයක් බලෙන් පැටවීම විසින් එවන් රටවල සමාජයේ ඇති කළ විකෘතිතා අදටද පවතියි. එම රටවල පවතින අන්ත සමාජ පසුගාමීත්වයට හේතු වන්නේ මෙයයි. එය පැරැදවිය හැක්කේ, යල් පැනගිය ධනපති නිෂ්පාදන රටාව තුළ නොව නැවුම් සමාජවාදී සමාජ ආර්ථික ක්‍රමයකදීය.

විශේෂයෙන්ම යටත්විජිත පීඩනයේ හා අධිරාජ්‍යවාදී බලපෑමට යටත්ව පවතින රටවල ජාතික විමුක්ති අරගලයන් පැන නැගුණේය. ඇමරිකානු ජාතික රාජ්‍යය පවා ගොඩනැගෙන්නේ

ජාතික විමුක්ති අරගල ආකාරයෙන්ය. ධනේශ්වර ක්‍රමය පෘථිවි තලය මත පැන නැගෙන මුල් පැයේ ධනේශ්වර ජාතික රාජ්‍ය බිහිවීම ප්‍රගතිශීලී බවක් දැක්වීය. එතැන් පසු ධනේශ්වර ක්‍රමය යල් පනින්නට පටන් ගන්නා අතර ඉන් පසු එළැඹෙන්නේ, සමාජවාදයේ යුගයයි. එනිසාම අධිරාජ්‍යවාදය හා යටත්විජිත පීඩනයට එරෙහිව පැන නැගි ජාතික විමුක්ති අරගලයන් ධනේශ්වර ජාතික රාජ්‍යයෙන් ඔබ්බට සමාජවාදයේ ජයග්‍රහණයෙන් අවසන් කිරීමේ කාර්යභාරයක් සමාජවාදී සමාජ විප්ලවයට පැවරිණි. මෙම අවධියේ එවන් හැකියාවක්ද පවතී. එතැන් සිට ලෙනින්ගේ මඟ පෙන්වීම වූයේ එම විමුක්ති අරගලයන් නිර්ධන පංතියේ නායකත්වයෙන් සමාජවාදය වෙත මෙහෙයවීමටය. මේ සඳහා තත්වයන් සකස් වන්නේ, ධනපති ක්‍රමය සමාජ ක්‍රමයක් ලෙසින් යල් පැන ඇති බැවිනි. එනිසා පැන නගින ජාතික විමුක්ති අරගලයන් හරහා ධනේශ්වර ජාතික රාජ්‍ය ගොඩනැංවීම හෝ ධනේශ්වර ක්‍රමය ප්‍රතිගාමී දිශාවට පරිවර්තනය කිරීම මහලු ධනපති ක්‍රමය තුළ තවදුරටත් කළ නොහැකි දෙයකි. සැබවින්ම මෙම යුගයේ සමාජ සංවර්ධනය උදෙසා තත්වයන් පෙළ ගැසී ඇත්තේ, ඉන් එහා වන සමාජවාදී සමාජය වෙත පිය නැඟීම පිණිසය.

මේ අතර යටත්විජිතභාවයේ පවතින ධනපති රටවල පසුගාමීත්වය හේතුවෙන් ඒවායේ පංති ව්‍යුහය සංකීර්ණ විය. ඒ අනුව එම රටවල නිර්ධන පංතිය සාපේක්ෂව කුඩා වන අතර ගොවි ජනතාව ප්‍රමාණයෙන් විශාලය. අර්ධ නිර්ධන, සුළු ධනේශ්වර පහළ පංතික කොටස් වැනි නිර්ධන පංතියේ නොවන එහෙත් ධනපති පංතියෙන් පීඩාවට පත්වන වෙනත් පංතීන් තිබේ. එම නිසා මෙම නිර්ධන පංතිය නොවන අනෙක් පීඩිත පංතීන් එම පංතිය සමඟ විප්ලවීය බලවේගයක් ලෙසින් පෙළගැස්වීමේ අවශ්‍යතාවය පැන නගියි. තවද මෙම රටවල් අධිරාජ්‍යවාදීන්ගේ සෘජු සූරාකෑමට ලක්වෙමින් පවතින ඒවාය. එනිසාම එම රටවල අධිරාජ්‍ය ගැති දේශීය (පාලක) ධනපති

පංතියට හා එම රටවල් සූරාකමින් සිටින අධිරාජ්‍යවාදයට එරෙහිව අරගලයන් පැන නැගීමේ හැකියාවක් පවතියි. එමෙන්ම ඒවා ජාතික විමුක්ති අරගලයන්සේ පෙළගැසීම සිදුවේ. එනිසා මෙම ජාතික විමුක්ති අරගලයන් සමාජවාදයෙන් අවසන් කිරීමට උපායමාර්ගය සකසා ගැනීම එම රටවල කොමියුනිස්ට් පක්ෂවල වගකීමයි. චීනය, උතුරු කොරියාව, වියට්නාමය මේ පිළිබඳව වන හොඳම නිදර්ශනයන්ය.

ධනේශ්වර විප්ලවය සම්පූර්ණ නොවූ රටවල සමාජවාදය ගොඩනැගීමේදී වන සුවිශේෂී තත්වයන් හා අභියෝගයන් නිසාම ඒ සඳහා වන සුවිශේෂී මාවතක් අවශ්‍යය. මෙම න්‍යායික ගැටලුව විසඳමින් ලෙනින් විසින් 'ධනේශ්වර නොවන සංවර්ධන මාවත' යන්න පසුගාමී ධනේශ්වර රටවල සමාජවාදය ගොඩනැගීමේදී නියමිත මාර්ගය බව පෙන්වා දෙනු ලැබිය.

## ධනේශ්වර නොවන සංවර්ධන මාවත

සමාජවාදී විප්ලවය සඳහා ධනේශ්වර විප්ලවය ජයගෙන තිබිය යුතුය යන්න මාක්ස්වාදයේ පොදු න්‍යායික පිළිගැනීම විය. එහෙත් සෝවියට් සමාජවාදී රාජ්‍යය ගොඩ නැගීමෙන් පසු ඒ වන විටත් ධනේශ්වර විප්ලවය ජයගෙන නොතිබූ යටත්විජිත රටවල වූ විමුක්ති අරගල සමාජවාදයෙන් කෙළවර කිරීමේ කාර්යයට ඉහත පිළිගැනීම බාධාකාරී විය. ලෙනින් එය විසඳමින් නව තත්වයට අනුව නව න්‍යායක් බිහි කළේය. ඒ, ධනේශ්වර නොවන සංවර්ධන මාවත යන්නයි. ජාතික විමුක්තිය සඳහා අරගල කරන ධනේශ්වර සංවර්ධනය සම්පූර්ණ නොවූ හෝ ධනේශ්වර විප්ලවය සිදු නොවූ රටවලට, ධනේශ්වර විප්ලවය මගහැර කෙළින්ම සමාජවාදයට යා හැකි බව ඉහත න්‍යායෙන් තහවුරු කරන ලදී. නමුදු එය එසේ වන්නේ දියුණු සමාජවාදී රාජ්‍යයක උදව් ලැබීම සහ තවත් කොන්දේසි සම්පූර්ණ වීම තුළ පමණකි. මෙමගින් ජාතික විමුක්ති අරගල අනිවාර්යයෙන්

ධනේශ්වර විප්ලවයෙන් කෙළවර වීම වළක්වා සමාජවාදී විප්ලවයට එකතුකර ගැනීමට යෝජනා විය.

"දැනට විමුක්තියේ මාවතෙහි (ගමන් කරමින්) සිටින සහ යුද්ධයෙන් පසුව ප්‍රගතිය කරා කිසියම් ඉදිරි ගමනක යෙදෙන නොදියුණු ජාතීන් ආර්ථික සංවර්ධනයේ ධනපති අවධියට අනිවාර්යනීය වශයෙන්ම එළඹිය යුතු යැයි ස්ථිර කොට කීම නිවැරදි සේ අපට සැලකිය හැකිද? අප එයට පිළිතුරු දුන්නේ, නැත යනුවෙනි. ජයග්‍රාහී විප්ලවවාදී නිර්ධන පංතිය එම ජාතීන් අතර ක්‍රමානුකූල ප්‍රචාරයක් ගෙනයයි නම්, එසේම සෝවියට් රාජ්‍යයන් තම ප්‍රයෝජනය සඳහා ඇති සියලුම මාධ්‍යයන් යොදාගනිමින් ඔවුන්ගේ ආධාරයට එන්නේ නම් එවැනි තත්වයක් යටතේ නොදියුණු රටවල් අනිවාර්යනීය වශයෙන්ම ධනපති සංවර්ධන අවධිය ඔස්සේ ගමන්කළ යුතුයැයි සිතාගැනීම වරදක් වනු ඇත."

(ලෙනින්, තෝරාගත් කෘති, 11 වෙළුම, 55 පිටුව)

## 3. නිර්ධන පංති රාජ්‍ය බලය හා කම්කරු ගොවි සන්ධානය

තම පංති බලය අහිමිවීමෙන් පසු වියරු වැටෙන ධනපති කොටස්වල ප්‍රතිවිප්ලවීය ක්‍රියා වළකාලීම සඳහා නිර්ධන පංති රාජ්‍ය බලය ශක්තිමත් කිරීම අනිවාර්ය කාර්යයකි. එය ධනේශ්වර හෝ අවස්ථාවාදී දෘෂ්ටියක පිහිටා නොව නිවැරදි නිර්ධන පංතික දෘෂ්ටියේ පිහිටා පවත්වාගත යුතුය. එමෙන්ම කිසිදු මොහොතක කුමන හේතු මත හෝ එම නිර්ධන පංති රාජ්‍ය බලය ලිහිල් කළ යුතු නැත. එසේම එය ධනපතින් ප්‍රමුඛ වූ ප්‍රතිවිප්ලවයට එරෙහිව මිස පොදු ජනතාව උදෙසා නොවිය යුතුය. මෙහිදී නිර්ධන පංතියේ රාජ්‍ය බලය යන්නට හුදු පක්ෂයේ නිලධාරිවාදී ආඥාදායකත්වය ආදේශ වීමට ඉඩ ප්‍රස්ථා නොතැබීම පිළිබඳව පරෙස්සම් විය යුතුය. එසේම සැබෑ ලෙසම

නිර්ධන පංතිය හා ගොවි ජනතාව නිර්ධන පංති රාජ්‍ය බලය උදෙසා හවුල් කරගත යුතුය. මක්නිසාද යත් නිර්ධන පංති ආඥාදායකත්වය යනු පංතියේ ආධිපත්‍යය මිස හුදු පක්ෂයේ නිලධාරිවාදී කොටස්වල ආධිපත්‍යය නොවේ. සමස්ත පීඩිත පංතිය අවි දරා සමාජවාදී රාජ්‍ය ආරක්ෂා කරන තත්වයට එය පළල් ලෙස අරුත් ගැන්විය යුතුය. ෆිදෙල් කස්ත්‍රෝ අධිරාජ්‍යවාදී කුමන්ත්‍රණ පිළිබඳව කතා කරමින් පවසනුයේ කියුබාව යළි අධිරාජ්‍යවාදයට පරාජය කළ නොහැකි බවයි. එයට හේතුව ලෙස ඔහු පවසන්නේ, "අපේ රටේ සමස්ත ජනතාවම ප්‍රතිවිප්ලවයට එරෙහිව අවි දරා සිටිනවා" යන්නයි. සමාජවාදී කියුබාවට එරෙහිව පෙළගැසුණු අධිරාජ්‍යවාදීන්ගේ විවිධ කුමන්ත්‍රණයන්හිදී ඒවාට මුහුණ දෙමින් ඔවුන් එහි සත්‍යතාවය මනාව තහවුරු කොට තිබේ. නිර්ධන පංති රාජ්‍ය බලය මඟින් සමාජවාදය සුරැකීමේ හා ගොඩනැංවීමේ කාර්යයේදී කම්කරු ගොවි සන්ධානය ශක්තිමත් මිනිස් පවුරක් ලෙස ගොඩනැඟිය හැකිය.

## 4. නිලධාරිවාදය පැරදවීම

නිලධාරිවාදය යනු පංතිය හා පක්ෂය අතර වන සමීප බැඳීම දුරස් කරන ප්‍රායෝගික වරදකි. සෝවියට් කොමියුනිස්ට් පක්ෂයේ පැන නැගි නිලධාරිවාදය විසින් පක්ෂය ජනතාවගෙන් වඩ වඩාත් දුරස් කළේය. ප්‍රතිවිප්ලවවාදීන් විසින් තම අරමුණු උදෙසා යොදවා ගනු ලැබූයේ මෙසේ දුරස්වූ ජනතාවයි. එබැවින් නිලධාරිවාදය යනු සමාජවාදයට සතුරු භාවිතයකි. සමාජවාදය ගොඩනැංවීමේ කටයුත්තේදී නිලධාරිවාදය පැරදවීම ඉතා සුපරීක්ෂාවෙන් කළ යුත්තකි. සමාජවාදී අවධියේදී නිලධාරිවාදයේ නැගී සිටීම සඳහා බලපාන තත්වයන් අන් කවර කලෙකටත් වඩා ඉස්මතු වේ. ඒවා පහත ලෙස ගෙන හැර දැක්විය හැකිය.

**1. රාජ්‍ය බලයේ වගකීම පුද්ගලිකව ආරෝපණය කරගැනීම**

රාජ්‍ය බලය හොබවන නිසාම බලහත්කාරය හා වරප්‍රසාද ලැබීම ආදී නිලධාරි ලක්ෂණයන් වෙත පෙළඹීමට වන ඉඩකඩත්, අවස්ථාවත් සැලසෙයි. පසුගාමී මානසිකත්වය විසින් මේ සඳහා තවදුරටත් පෙළඹවීම් සිදුවේ.

**2. අවශ්‍ය තරමට පවතින සම්පත් හිගකම**

සම්පත් හිඟකම විසින් ඒවා ලබාගැනීමේ තරගකාරි පෙළඹවීමක් ඇතිවේ. එහිදී තම නිල බලය යොදාගනිමින් වරප්‍රසාදිතව කටයුතු කිරීමට කෙනෙකු පෙළඹවීමේ පරිසරයක් නිතතින්ම ඇතිවේ.

**3. ජනතාවගේ තුළ පවතින පසුගාමීත්වය හා උදාසීනත්වය**

සමාජ පසුගාමීත්වය නිසාම නිලධාරිවාදයට උදාසීන ලෙස ප්‍රතිචාර දැක්වීම හා නිලතල හා වරප්‍රසාද දරන්නන් උසස් කොට සැලකීම සිදුවේ. මෙම තත්වයට අකමැති නමුත් එයට එරෙහි වනවා වෙනුවට උදාසීනව ප්‍රතිචාර දැක්වීම්වලට සීමාවේ. වැඩිපුරම සිදුවන්නේ 'ඒක එහෙම තමයි.' යන ආකල්පයෙන් බලා සිටීමයි. එහෙත් එය සමාජ විරෝධයක් ලෙසින් කැටිවී පුපුරා යන විට එය සමාජවාදයද විනාශ කර දමයි.

නිලධාරිවාදය නැති කිරීම සඳහා නිශ්චිතවම කළ යුත්තේ සම්පත්වල හිඟකම පරදවමින් දැවැන්ත ලෙස නිෂ්පාදනය ඉහළ නැංවීමයි. එවිට ඒවා බහුල වන බැවින් තවදුරටත් වරප්‍රසාද බවට පත් වන්නේ නැත. නමුත් එය තරමක් දිගුකාලීන ක්‍රියාවකි. එනිසා කෙටිකාලීනව එය වළකාලිය හැක්කේ, නීති රීති මගින් හා සංස්කෘතිකමය ක්‍රියාවලියක් තුළය. පක්ෂය තුළ පක්ෂ විනය මඟින්ද, රට තුළ නීති රීති මඟින්ද, මෙය කළ යුතුය. සෝවියට් ව්‍යවස්ථාව තුළ පවතින 'මහජන නියෝජිතයින් ඕනෑම අවස්ථාවක ආපසු කැඳවීමේ බලය ජනතාවට ඇත.' යන්න එක් නිදර්ශනයකි. අල්ලස, දූෂණය, ජාතික සම්පත් දේපළ වැනසීම ආදීයට බරපතළ දඬුවම් පැනවීම

මෙහිදී වැදගත්වේ. සමාජවාදී රාජ්‍යයන් තුළ පොදු දේපළ සොරකමට සමාවක් නැත. එමෙන්ම අසමානතාවය සමාජවාදී අවධියට සාපේක්ෂව අවම කිරීම මඟින් නිලධාරිවාදයට පසුබිම සදන විෂයමූල තත්වය ඉවත් කළ හැකිය. කෙසේ හෝ නිලධාරිවාදය පැරදවීම සමාජවාදයේ පැවැත්ම උදෙසා වන ප්‍රමුඛතම සාධකයකි.

## 5. නවීන තාක්ෂණය ලබා ගැනීමේ උපක්‍රම

සමාජවාදය යනු මිනිසා මෙතෙක් ලබාගන්නා ලද ජයග්‍රහණයන් ඉදිරියට ගෙන යන හා ඉදිරියට නව ජයග්‍රහණයන් බිහි කරන්නකි. ධනේශ්වර සමාජයේ පවතින දියුණු සහ යහපත් දේවල්ද සමාජවාදය උදෙසා  උපයෝගී කරගනියි. එනිසාම සමාජවාදය දැනට ධනේශ්වර ක්‍රමය දක්වා ලබා ඇති තාක්ෂණික දියුණුව ආරම්භයක් ලෙසින් යොදවා ගැනීමට පසුබට නොවේ. එහෙත් පවතින පසුගාමීත්වය හා දුබලතාවය නිසාම තාක්ෂණය වර්ධනය කිරීම පිළිබඳව බරපතළ ගැටලු එවන් රටවල සමාජවාදය ගොඩනැංවීමේදී ඇතිවේ. එයට පිළියමක් ලෙසින් සෝවියට් විප්ලවයේදී ලෙනින් විසින් සිදු කරන ලද්දේ, විදෙස් සමාගම්වලට රට තුළ ඉදිකිරීම් හා නිෂ්පාදනයට ඉඩ දෙමින් ඔවුන්ගෙන් ඒවායේ තාක්ෂණය උරා ගැනීමයි. තවද තම රටේ පුද්ගලයින් විදේශවලට යවා තාක්ෂණය පිළිබඳව අධ්‍යාපනයක් ලබාදීමයි. එපමණකින් නොනැවතී රට තුළ විවිධ තාක්ෂණික පරීක්ෂණයන් සඳහා දිරිමත් කිරීම් කරන ලදී. ලෙනින් විසින් මුළු මහත් රුසියාවම විද්‍යුත්කරණයට ලක් කිරීම මෙහිදී ප්‍රධානතම නිදර්ශනයකි. ලෙනින් පුන පුනා පැවසූයේ, සමාජවාදී ආර්ථිකය හා සමාජවාදී ජීවිතය ගොඩනැගීමේදි මුළු මහත් රටම විද්‍යුත්කරණයට ලක් කිරීම අත්‍යවශ්‍ය හා අනිවාර්ය කොන්දේසියක් බවයි. එය කර්මාන්තවල වර්ධනයටද, තාක්ෂණික දියුණුවටද, ජනතාවගේ පසුගාමීත්වය පලවා හැරීමටද මාවත පුළුල්

කළේය. කර්මාන්තයේදී මෙන්ම දෛනික ජන ජීවිතයේදී තාක්ෂණය උපයෝගී කරගැනීම පිළිබඳව ජනතාවගේ අත්දැකීම් පුළුල්වීමට මෙය රුකුලක් විය. අභ්‍යවකාශය පවා ජයගන්නා දැවැන්ත තාක්ෂණයන් වෙත සෝවියට් දේශය ඔසවාලීමෙහි ඇරඹුම මේ තුළින් සිදුවිය.

## 6. ජනතාව පෙරටුකොට දිනන සමාජවාදය

සමාජවාදී සමාජ විප්ලවයේදී බලය ගැනීමේ කටයුත්ත මෙන්ම සමාජවාදී පරිවර්තනයන් ජයගැනීම සඳහා ජනතාවගේ කැමැත්ත හා දායකත්වය තීරණාත්මකය. සමාජවාදය යනු හුදකලා කල්ලියක හෝ කණ්ඩායමක කුමන්ත්‍රණයක් නොවේ. එනිසා රට තුළ සාතිශය බහුතරයක සහය නොලැබෙන්නේ නම් සමාජවාදය මොහොතකදු පවතින්නේ නැත. මේ සඳහා ප්‍රබලම උදාහරණය කියුබාවයි. ඇමරිකා එක්සත් ජනපදයේ අත පොවන මානයේ සිටිමින් ඇමරිකාවේ විවිධ කුමන්ත්‍රණ හා ආක්‍රමණයන් මැද්දේ පවා සමාජවාදී කියුබාව රැකෙන්නේ, ජනතාව සමඟ අත්වැල් අල්ලා ගැනීමෙනි. ලෙනින්, ගොවි ජනතාව සිටින රටක ප්‍රමුඛතම කටයුත්තක් ලෙස ගොවිජන ගැටලුව විසඳීම සිදු කළේය. ඒ සඳහා සමාජවාදී රාජ්‍යයේ 'පළමු පනත ලෙස ලෙනින් විසින්ම ඉඩම් පනත' සකස් කරන ලදී. තවද සුළු නිෂ්පාදනය බිඳ වැටීම තුළින් භාණ්ඩ හිඟයක් ඇතිවීමේ අනතුර දුටු අවස්ථාවේ නව ආර්ථික සැලසුම් හරහා සුළු නිෂ්පාදනයට හා වෙළඳමට ඉඩ සලසන ලදී. මෙය සමාජවාදයේ අත්‍යවශ්‍ය පසු බැසීමක් ලෙස ලෙනින් දුටුවේය. නමුත් එම තාවකාලික පසුබැසීමට ලෙනින් බිය වූයේ නැත. මේ සියල්ල තුළින් සතුරු ප්‍රතිවිරෝධයන් දුබල කිරීමට හා සමාජවාදී අවධිය තුළ කල් බලන කාලය අවම කරගැනීමට ඔහු උත්සාහ කළේය.

පීඩිත පංති කොටස් තුළින් මතුවන ප්‍රතිවිරෝධයන් අවම කරමින් සමාජවාදය සමග ජනතාවගේ විරසකයක් නොවනසේ කටයුතු කිරීම වැදගත්ය. එහිදී සමාජවාදයේ ප්‍රතිලාභ ජනතාවට වැඩි වැඩියෙන් ලැබෙනසේ සැලසුම් සැකසිය යුතුය. ඒ නිසාම ජනතාවට සමාජවාදයේ පලදාව තමන් උදෙසාම බව දැනෙන්නට වන්නේය. උදාහරණයක් සලකන්නේ නම් ප්‍රවාහනය සඳහා ජනතාව ගෙවන මුදලින් පොදු ප්‍රවාහන පහසුකම් වැඩි වන විට ජනතාව එම ප්‍රවාහනය තමන්ගේ කොට සලකා ආරක්ෂා කරයි. සෝවියට් දේශය සෑම වැඩබිමක් තුළම මාස්පතා සේවකයින්ගේ සෞඛ්‍ය තත්වය පරීක්ෂා කරනු ලබන සායන පැවැත්වීය. ඔවුන් පෞද්ගලිකව ඒ සඳහා දුෂ්කරතා විඳිය යුතු වූයේ නැත. සමාජවාදී රජය නිරෝගිමත් ශ්‍රම බලකායක් යන ප්‍රතිලාභය උදෙසා කටයුතු කිරීම තම ප්‍රතිපත්තිය කොටගෙන සිටී.

සමාජවාදී පොදු දේපළ සුරැකීමත්, වර්ධනයත් තුළින් ජනතාවගේ ජීවිතය යහපත් වනවාට සාපේක්ෂව දිවි හිමියෙන් සමාජවාදය සුරැකීමේ වුවමනාවත් වර්ධනය වේ, සැබෑ නිර්ධන පංති රාජ්‍ය බලය තුළින් සතුරු පංතීන්ගේ ප්‍රතිවිරෝධතා අඩු කරලීම කළ යුතුය. එමෙන්ම ජාත්‍යන්තර සහය සමඟින් ලෝක සමාජවාදයේ ජයග්‍රහණය උදෙසා කටයුතු කිරීම වැදගත්ය. ඒ සඳහා තෙවන ජාත්‍යන්තරය යළි පිහිටුවීම උදෙසා අරගලය හා මැදිහත්වීම් අත්‍යවශ්‍ය කාරණයකි. සමාජවාදී සමාජ විප්ලවය සම්පූර්ණ වනුයේ, ලෝක විප්ලවයක් ලෙසින් මිස ප්‍රාදේශීයකරණයට ලක්වූ විප්ලවයක් ලෙසින් නොවේ. එය ජාත්‍යන්තරවාදී විප්ලවයකි. ඒ සඳහා එක් එක් රටවල් විසින් සම්පූර්ණ කළ යුතු එම රටට අදාළ කොටසක් පවතී. ඒ ඔස්සේ සමාජවාදය ගොඩනැගීමේ වෙනස් අත්හදා බැලීම් සිදුවන්නට විය. ඒවා සිදුවීම් දාමයක් ඔස්සේ වෙමින් සමාජවාදී කඳවුරක් බිහිවිය. එය

තුළ මිනිසාගේ ජීවිතය පොදුවේ ඔසවා තබන ජයග්‍රහණයන් බොහෝ විය.

මෙතෙක් කළ අධ්‍යයනය තුළ ඉතා පැහැදිලිව දක්නට ලැබෙන කාරණය වන්නේ, සමාජවාදය යනු පංති සමාජයක් වන ධනවාදයේ සිට පංති විරහිත කොමියුනිස්ට් සමාජය දක්වා වන සංක්‍රමණීය අවස්ථාවක් බවයි. එහි මූලික ප්‍රතිවිරෝධය හඳුනා ගනිමින් දැවැන්ත සමාජ ආර්ථික පරිවර්තනයන් ඔස්සේ පෙරට ගෙනයෑම සඳහා නිර්ධන පංතික රාජ්‍ය බලය යන්න අනිවාර්යයෙන්ම සපුරාලිය යුතු කොන්දේසියකි. සමාජවාදී විප්ලවය පෙරට ගෙනයාමේදී වන අභියෝග හමුවේ මාක්ස් ලෙනින්වාදය මත පිහිටා කටයුතු කිරීම නිර්ධන පංති පක්ෂයේ කාර්යභාරයයි. එහෙත් ධනපති පංතිය පරාජය වී ඇති නමුත් ඔවුන් කිසිදා තම කැමැත්තෙන් අත්හැර යන්නේ නැත යන්නද අනිවාර්යයකි. එනිසා ඔවුනට මුහුණ දීමේදී ජනතාව තීරණාත්මක සාධකය වේ. අවස්ථාවාදයට ගොදුරුවීම විසින් සමාජවාදයේ ජයග්‍රහණය උදෙසා වන අරගලය මංමුළාවට පත්විය හැකිය. කෙසේ වුවද ලෝක සමාජවාදී විප්ලවයේ ජයග්‍රහණය තෙක් මෙම පංති ගැටුම සහිතව නිර්ධන පංති රාජ්‍ය බලයේ මෙහෙයුම තුළ සමාජවාදය පසුබැසීම් හා ජයග්‍රහණයන් ඔස්සේ එහෙත් පෙරට යමින් පවතියි. සමාජවාදී කඳවුර බිහිවීම නිර්ධන පංතිය ප්‍රමුඛ පීඩිත පංතියට මහත් ආශ්වාදයක් මෙන්ම බලාපොරොත්තුවක්ද විය. එහිදී ප්‍රාග්ධනයේ වියගහෙන් ශ්‍රමය සදාකාලික විමුක්තිය වෙත ළඟා වන්නේ මෙම ජයග්‍රහණයන් ඔස්සේ බව පියවරෙන් පියවර පංතියට වඩ වඩාත් ප්‍රත්‍යක්ෂ වන්නට විය. (සමාජවාදී කඳවුරෙහි පසුබැසීම විසින් තාවකාලිකව එම තත්වය වෙනස්වී ඇත.) සූරාකෑම විසින් ජනිත පීඩනයට එරෙහිව ඒකපාක්ෂික හෝ කණ්ඩායම්වාදී හුදකලා පලායාම්

සහිත විඥානවාදී පිළිතුරුවලින් මිදී සජීවී විප්ලවවාදී අරගලයන්ගෙන් ආශ්වාදයට පත් ලෝක පීඩිත ජනතාව ඉන් ලද ජයග්‍රහණයන්ද කළ අරගලයන්ද අතිමහත්ය. ඒ පිළිබඳව විමසා බැලීමක් දැන් අවශ්‍යය.

# 4

# සමාජවාදී කඳවුර හා එහි ජයග්‍රහණයන්

1871 මාර්තු 18 දින ධනවාදී "දෙව්ලොව" කළඹවන ලදී. ලොව පළමු කම්කරු රාජ්‍යය වන පැරිස් කොමියුනය බිහිවූයේ එදිනය. එහෙත් විද්‍යාත්මක කොමියුනිස්ට්වාදයට නව අත්දැකීම් එක් කරමින් එය දින 72ක් වැනි කෙටි කලකින් බිඳ වැටුණි. ඉන් වසර 46 කට පසුව ලොව සමාජවාදී රාජ්‍ය පද්ධතියක් බිහිවීම ආරම්භ වන්නේ, 1917 ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවය සමඟය. ධනපති ලොව කැළඹූ එම විප්ලවයට නායකත්වය ලබා දෙන්නේ වී. අයි. ලෙනින් ප්‍රමුඛ බෝල්ෂෙවික් පක්ෂය විසිනි. පළමුවන ලෝක යුද්ධය නිමාවන විට සෝවියට් දේශය බිහිවූ අතර දෙවන ලෝක යුද්ධය අවසාන වන විට ලෝක සමාජවාදී කඳවුරක් නිර්මාණය විය. සැබවින්ම අධිරාජ්‍යවාදීන්ගේ ලෝක යුද්ධවල මූලික හේතුව ආර්ථික වශයෙන් අධිරාජ්‍යවාදී බලවතුන් අතර බෙදා අවසන් කළ ලෝකය යළි භෞමික වශයෙන් බෙදා ගැනීමය. කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ උපක්‍රමික බව නිසාම අධිරාජ්‍යවාදී කෲර අරමුණ වෙනුවට මානව සංවර්ධනයේ ඉදිරි ගමන්මඟ වෙත සුභවාදී පෙළගැස්මක් ඇති කරන ලදී. ලෝක

යුද්ධය නැමැති මානව වර්ගයාට විනාශය ගෙනෙන අධිරාජ්‍යවාදී යුද්ධය වමේ උපාය උපක්‍රම හේතුවෙන් මානව වර්ගයා වෙත සමාජවාදය ගෙන එන ලදී. තම ආත්මාර්ථකාමී ඒකායන අරමුණ උදෙසා ආරම්භ කළ අධිරාජ්‍යවාදී ලෝක යුද්ධයට එරෙහිව සමාජවාදී විප්ලවීය රැල්ල ලෝකය වෙළා ගන්නට විය. එය ධනවාදය බියෙන් සලිත කරන දැවැන්ත කඩාවැදීමක් බව අවිවාදිතය. ලෝක ව්‍යාප්ත ධනේශ්වර ප්‍රාග්ධනයේ බල මහිමය අවමානයට හා පරාජයට පත් කරමින් නිර්ධන පංතිය ප්‍රමුඛ පීඩිත ජනතාවගේ විමුක්තියේ මාවත විවර විය. ඒ තුළින් ධනවාදී ප්‍රාග්ධනයේ රැහැන්වලින් බැඳි පීඩිත ජීවිතවලට නව මාවතක් විවර විය. මානව චින්තනයද ඇතුළු මානව ශ්‍රමයේ නිමවුම්වල අපූර්වත්වය හා අසමසම බලය මේ යැයි විදහා දක්වන සමාජ ආර්ථික, විද්‍යාත්ම හා තාක්ෂණික ජයග්‍රහණයන් මෙන්ම දැවැන්ත සාහිත්‍යය කලා නිර්මාණ සහිත ආධ්‍යාත්මික ජයග්‍රහණයන්ගේ පිම්මක් ඇතිවිය. විප්ලවයේ ආරම්භයට පෙර දිළිඳු බවේ හා නූගත් බවේ පතුලෙහි සිටි ජනතාවන් සමාජවාදී ඉදිරි ගමන ආරම්භයත් සමඟම ස්වාධීන, නිවහල්, ගෞරවනීය මෙන්ම අභිමානවත් ජාතින් බවට පත් විය. අධිරාජ්‍යවාදය විසින් රටවල් යටත් කර සම්පත් කොල්ලකමින්, දැවැන්ත ශ්‍රම සූරාකෑමකට එම ජනතාව ගොදුරු කරගනිමින් යටත්විජිත අත්පත් කරගැනීමට හා පවත්වා ගැනීමට එරෙහිව සෝවියට් රුසියාව තම භෞතික හා ආධ්‍යාත්මික ජයග්‍රහණයන් අනෙකුත් ජාතීන් සමඟ බෙදා හදා ගත්තේය. ලොව පුරා ජනතාවගේ සෞඛ්‍ය, අධ්‍යාපන හා තාක්ෂණික කටයුතු නංවා ලීමට ආධාර හා දිරිමත් කිරීම් නොමසුරුව කළේය. එමෙන්ම පීඩිත ජාතීන්ට තම විමුක්තිය දිනා ගැනීමේ අරගලයන් උදෙසා ආධාර උපකාර කළේය. කියුබාවද සමාජවාදී සහ අධිරාජ්‍ය විරෝධී රටවල් වෙනුවෙන් තම හමුදා සහය, වෛද්‍ය සහය සහ උසස් අධ්‍යාපන පහසුකම් සැලසීම ආදී ජාත්‍යන්තර යුතුකම් ඉටු කිරීමට නොමසුරු විය.

## රුසියාවේ විප්ලවයට පෙර තත්වය

සමාජවාදයේ ජයග්‍රහණයන් කෙතරම් විශිෂ්ට දැයි වටහාගත හැකි වන්නේ, පූර්ව විප්ලවීය සමාජ තත්වය වටහාගත් විටදීය. සැබවින්ම සමාජවාදී විප්ලවයට පෙර රුසියාවේ ජනගහනයෙන් අති විශාල ප්‍රමාණයක් අන්ත දුක්ඛිත ජීවිතයක් ගත කළේය. 1894 සිට 1917 දක්වා රාජ්‍ය පාලනය හෙබවූ දෙවන නිකලස් රජ සමයේ රුසියාවේ ඉඩම්වලින් තුනෙන් පංගු දෙකක්ම අයත්ව තිබුණේ උසස් පංතීන්ටය. රජ පවුල, පල්ලිය, රදල ඉඩම් හිමියන් සහ කුලාකයින් මීට අයත්ය. රටේ කෘෂිකාර්මික ඉඩම්වලින් තුනෙන් එකක් ඔවුන් සතු විය. 1913 වන විට රුසියානු ජනතාවගෙන් සියයට 82 කට වැඩි ප්‍රමාණය ග්‍රාමීය ජනතාව විය. 1897 වන විට රුසියාවේ ලිවීමේ කියවීමේ (සාක්ෂරතාවය) හැකියාව සියයට 24ක් තරම් ඉතා පහත් මට්ටමක විය. ධනේශ්වර ක්‍රමය පැවැත්මට පැමිණ තිබුණද ඉඩම් හිමියන් යටතේ ප්‍රවේණිදාසයෝද වූහ. රුසියානු ලේඛක ගොගොල්ගේ සුප්‍රකට 'මළ මිනිස්සු' නවකතාවේ රුසියාවේ මියගිය වහලුන්ගේ නාම ලේඛන එකතු කොට රජයෙන් වන්දි ගන්නා මියගිය මිනිස්සුන් පවා විකුණන මිනිසෙකු පිළිබඳව කියවේ. ඒ නවකතාව තුළ ගොගොල් දක්වන්නේ විප්ලවයට පෙර රුසියානු සමාජ යථාර්ථයයි. එවකට ගොවීහුද අන්ත දිළිඳු, අන්ත නූගත් පිරිසක් වූහ. එමෙන්ම ඉතාමත්ම නොදියුණු ශ්‍රම උපකරණ පරිහරණය කරන්නෝ වූහ. සී සෑම සඳහා ඔවුන් විසින් යොදා ගනු ලැබුයේ ලී නගුලය. එලෙස ඉතා මහත්සේ අසංවර්ධිතව තිබූ රුසියාව ඉන් වසර 30 - 40ක් ඇතුළත අභ්‍යවකාශය තරණය කළ පළමු ජාතිය බවට පත් කරන්නට සමාජවාදය සමත් විය. එය එසේ වන්නේ, අන් කිසිවක් නිසා නොව සමාජවාදයේ බල මහිමය නිසාය. මුළු මහත් සමාජවාදී කඳවුරේම අත්දැකීම වූයේ එයයි. සමාජවාදී චීනය ලොව වැඩිම ජනගහනය සහිත රටය. එය බිලියන 1.38කි. එහි භූමි ප්‍රමාණය ලොව අන් රටවල් අතරින් තෙවන ස්ථානයයි. වඩා විශාලතම රාජ්‍ය වූයේ සෝවියට් දේශයයි. ඒ විලසින්ම විප්ලවයට

පෙර කියුබාවද දුප්පත්කමින්, නූගත්කමින්, සෞඛ්‍ය ආරක්ෂාව නොමැතිකමින් පීඩාවට ලක්වූ, අධිරාජ්‍යවාදී සූරාකෑමට නතුවූ අසංවර්ධිත රටක් විය. එක්සත් ජනපද මුවවිටේ සිටිමින්, විවිධ සම්බාධක රැසකට මුහුණ දෙමින් කියුබාවද සමාජවාදී ජයග්‍රහණයන් රාශියක් අත්පත් කරගත් රටකි. භූමි ප්‍රමාණයෙන් (වර්ග කිලෝ මීටර 114,525ක්) ශ්‍රී ලංකාවට වඩා තරමක් විශාල සහ ජනගහනයෙන් ශ්‍රී ලංකාවට වඩා අඩු මට්ටමක (මිලියන 11ක් ) සිටින රටක් වුවද එය ලෝකය තුළ අති විශාල බලපෑමක් කරන රාජ්‍යයක් බවට පත්ව ඇත. 1976 වසරේදී සමාජවාදී විප්ලවය ජයගත් වියට්නාමයද අතිශයින්ම දරිද්‍රතාවයේ ගිලී සිටි රටකි. අති විශාල කාලයක් තිස්සේ ඇමරිකා එක්සත් ජනපදය හා ප්‍රංශය ඇතුළු රටවල් ගණනාවක් සමග යුද වැදීමෙන් විනාශයට පත්ව තිබූ වියට්නාමය 1976 සිට සමාජවාදී විප්ලවය තුළ ක්‍රමානුකූලව සංවර්ධනය වෙමින් පවතියි. ඒ අනුව සමාජවාදී විප්ලවය විසින් එම රටවල ජනතාවට අත්පත් කරදුන් ජයග්‍රහණයන් විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ විමසා බැලීමට අප දැන් සූදානම්ය.

## සමාජවාදය තුළ අධ්‍යාපනය

සමාජයක් දියුණු මට්ටමට ඔසවා තැබීමට නම් එහි ජනතාවගේ අධ්‍යාපන මට්ටම ඉහළින් තිබීම අත්‍යවශ්‍ය කොන්දේසියකි. ධනවාදය තුළ මිනිසුන් යනු අතිරික්ත වටිනාකම් බිහිකරනු ලබන උපකරණයක් පමණකි. උග්‍ර රැකියා විරහිතභාවය හා පාදඩකරණය තුළ ධනවාදය විසින් මිනිසුන් අයාලේ යවනු ලැබ ඇත. සමාජය කෙරෙහි කලකිරුණු පුද්ගලයින් හා සමාජ විරෝධීන් බවට ඔවුන් පත්කරනු ලැබ ඇත. එයට ප්‍රතිපක්ෂව සමජවාදය තුළ ප්‍රමුඛතම හා වටිනාම සම්පත මිනිසාය. මානව සම්පත්වල ගුණාත්මකභාවය උදෙසා සමාජවාදී රාජ්‍යයන් තම සම්පත් හා ශක්තිය උපරිම ලෙසින් යොදවයි.

විප්ලවයට පෙර රුසියාවේ අධ්‍යාපනය පැවතියේ, අතිශයින්ම පහත් අඩියකය. ජනගහන තොරතුරුවලට අනුව 1897 වන විට රුසියාවේ සාක්ෂරතාවය සියයට 24කි. ඒ වන විට ග්‍රාමීය ජනතාව තුළ සාක්ෂරතාවය සියයට 19.6කි. 1917 වන විට (මිලියන 160කට මඳක් වැඩි) රුසියානු ජනගහනයෙන් අඩකටත් වැඩි පිරිසකට කිසිදු සාක්ෂරතාවයක් නොවීය. සමාජවාදී විප්ලවයෙන් පසුව එනම් 1918 දී සෝවියට් සංගමය තුළ සිටින සියලු ජාතිකත්වයන්ට තම භාෂාවලින් අධ්‍යාපනය ලැබීමේ අයිතිය ඇති බව සෝවියට් රජය විසින් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම සමාජවාදය පවත්වා ගැනීම සඳහා පුළුල් පරාසයක් තුළ පැතිරුණු අධ්‍යාපන ක්‍රමයක් අත්‍යවශ්‍ය සාධකයක් වශයෙන් පිළිගන්නා ලදී. ඒ අනුව මෙතෙක් ලිඛිත භාෂා නොතිබුණු සමහර ජන කොටස් සඳහා  නව ලිඛිත අක්ෂර පවා හඳුන්වා දෙන ලදී. 1930 ගණන්වල රුසියාවේ සියලු දෙනාටම මූලික අධ්‍යාපනය ලබා දීමට කටයුතු සම්පාදනය  කළ යුතු යැයි සෝවියට් ආණ්ඩුව නීතියක් පැනවීය.  ඒ සමගම එය උදෙසා නව පාසල් පිහිටුවන ලදී. අධ්‍යාපනය ලබාදීම සමාජවාදී රජයේ පූර්ණ වගකීමක් වශයෙන්ම ගන්නා ලද හෙයින් සෝවියට් රුසියාව තම අධ්‍යාපනය වේගයෙන් ඉහළට ගෙන ඒමට සමත් විය. චිංගිස් අයිත්මාතව් විසින් ලියන ලද 'ගුරු ගීතය' කෘතියෙන් කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයින් අධ්‍යාපනය නංවාලීම සඳහා වෙහෙස වන ආකාරය පෙන්නුම් කළේය. පාසලක් කිසිදා නොතිබුණු කිර්ගීසියාවේ එක්තරා ගමක (අයිලයේ) මුල්ලාවරුන් විසින් එක් කොටසකට පමණක් වරප්‍රසාදයක් කොට තිබූ අධ්‍යාපනය සියල්ලන්ට හිමි කරලීම සඳහා අකුරු පවා හරි හැටි නොදත් දුයිෂෙන් නම් කොමියුනිස්ට්වාදී තරුණයෙක් ජනතාව කෙරෙහි වන අපරිමිත ස්නේහයෙන්, කොමියුනිස්ට්වාදී ගුණයෙන් යුක්තව කරනු ලබන කැපවීම හා පරිත්‍යාගයේ මහිමය ඉන් මොනවට ප්‍රකාශ වේ. මෙවන් උත්සාහයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් 1937 වන

විට සෝවියට් දේශයේ සාක්ෂරතාවය සියයට 86 දක්වා ඉහළ නැග තිබිණි.

මෙම කාර්යයේදී කොම්සොමොල් තරුණ සාමාජිකයින් විසින් මිලියන ගණන් වූ අකුරු නොදත් වැඩිහිටි ජනතාවට විශේෂ පාසල් පවත්වා ඔවුනගේ සාක්ෂරතාවය වර්ධනය කිරීමට කටයුතු කරන ලදී. මෙහිදී සෝවියට් කොමියුනිස්ට් පක්ෂයේ මඟපෙන්වීම යටතේ වැඩිහිටි අධ්‍යාපනයට ප්‍රමුඛත්වයක් දෙන ලදී. ඒ මැදිහත්වීම් සියල්ල මත, බිඳ වැටෙන මොහොත වන විට සෝවියට් රුසියාවේ සාක්ෂරතාවය සියයට 99.4 කි. 1960 වසරේදී, පසුව පැට්‍රිස් ලුමුම්බා මිත්‍රත්ව සරසවිය ලෙස නම් කළ සෝවියට් ජාතික මිත්‍රත්ව සරසවිය ආරම්භ කරන ලදී. ආසියාවේ, අප්‍රිකාවේ, ලතින් ඇමරිකාවේ තරුණ ජනයාට අධ්‍යාපනය ලබා දෙමින් තම ජාත්‍යන්තර යුතුකම ඉටුකිරීම මෙම සරසවිය ආරම්භ කිරීමේ ඒකායන අරමුණ විය. ජනතා විමුක්ති පෙරමුණේ නිර්මාතෘවර රෝහණ විජේවීර සහෝදරයාද අධ්‍යාපනය ලබන ලද්දේ මෙම පැට්‍රිස් ලුමුම්බා මිත්‍රත්ව සරසවියේය. සෝවියට් සමූහාණ්ඩුවට අයත් උස්බෙකිස්ථානය, තජිකිස්ථානය, කසකස්ථානය, තුර්ක්මේනියාව ආදිය විශේෂයෙන්ම මුස්ලිම් ජනයා ජීවත් වන ප්‍රදේශ විය. සාර් යුගයේ රුසියාවේ මෙම ප්‍රදේශවල සාක්ෂරතාවය සියයට 2ක් පමණ විය. රුසියන් සමාජවාදී විප්ලවයෙන් වසර 40ක් පමණ කාලය තුළදී මෙම ප්‍රදේශවල සාක්ෂරතාවය සියයට 98ක් දක්වා වර්ධනය කළේය. එවකට කිර්ගීසියානුවන්ට ලිඛිත භාෂාවක් නොවීය. ඔවුන් ජීවත්වූයේ තැනින් තැන ඇවිදින (සංචාරක) ජනතාවක් ලෙසිනි. සමාජවාදය විසින් 1960 ගණන් වන විට කිර්ගීසියානු ජනතාව තමන්ගේම භාෂාවෙන් තමන්ගේම විශ්වවිද්‍යාලයක ඉගනුම ලබන ජනතාවක් බවට උසස් කරන ලදී. පූර්ව සමාජවාදී රුසියාවේ ඉංජිනේරුවන්, කාර්මික ශිල්පීන්, වෛද්‍යවරු, ගුරුවරුන් 410,000ක් පමණ විය. 1960 වන විට සෝවියට් අධ්‍යාපනය විසින් ඉංජිනේරුවන් පමණක් 1,080,000ක් උපදවා ගැනීමට සමත් විය. එනමුත් ඒ වන

විට ඇමරිකා එක්සත් ජනපදයේ සිටි ඉංජිනේරුවන් ප්‍රමාණය වූයේ 32,500ක් පමණි.

සාක්ෂරතාවය ඉහළ නැංවීම හා අධ්‍යාපනය, සාහිත්‍ය ආදිය වෙනුවෙන් රාජ්‍ය අනුග්‍රහය ඉහළින්ම ලැබීම හේතුවෙන් සෝවියට් දේශය පොත්පත්, සඟරා, විවිධ ප්‍රකාශන බහුල රටක් බවට පත්විය. බස් රථවල ගමන් කරන විට පවා සෝවියට් පුරවැසියකු පොතක් සඟරාවක් කියවීම සාමාන්‍ය දසුනක් විය. බස් රථවල සිටගෙන යන්නන් මොස්කව්හි දුලබ දසුනක් වූ නමුත් ඉඳහිට හෝ එවැන්නෙකු යන්නේ නම් ඔහුද පොතක්, සඟරාවක් කියවමින් යෑම බොහෝ දුරට දක්නට ලැබුණකි. සෝවියට් ජනතාවට පොත්පත්, ප්‍රකාශන කියවීමේ දැඩි පිපාසයක් විය. එහෙත් සාර් අවධියේ රුසියාවේ ජනතාව බහුතරයක් අකුරු නොදත්තවුන් විය.

මීළඟට සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුවෙන් ඔබ්බට සමාජවාදී චීනයට ගොස් එහි අධ්‍යාපනයේ මට්ටම විමසා බලන්නේ නම් 1949 චීන විප්ලවය සිදුවූ කාලය වන විට චීන ජනතාවගේ සාක්ෂරතාවය සියයට 20කි. සමාජවාදය යටතේ 2000 වසර වන විට චීන ජනතාවගේ සාක්ෂරතාවය සියයට 98.9 දක්වා වර්ධනය විය. 2007 දී චීන රජය අධ්‍යාපනයට උපායමාර්ගික ප්‍රමුඛතාවයක් දිය යුතු බව ප්‍රකාශ කරන ලදී. 2007 - 2009 රාජ්‍ය අයවැයෙන් ශිෂ්‍යත්ව සඳහා කරන වියදම තුන් ගුණයකින් වැඩි කරන ලදී. 2007 වන විට චීනයේ ප්‍රාථමික පාසල් 396,567ක්ද ද්විතීයික පාසල් 94,116ක්ද උසස් අධ්‍යාපන ආයතන 2,236ක්ද දක්වා එහි අධ්‍යාපනය වර්ධනය කරන ලදී. 2009 වසරේ EISA නම් වැඩසටහන මගින් සිදු කරන ලද අවුරුදු 15 සිසුන්ගේ අධ්‍යාපන තත්වය පිළිබඳව සමීක්ෂණයක් අනුව ෂැංහයි නගරය ගණිතය, විද්‍යාව විෂයන් පිළිබඳව සාක්ෂරතාවය අතින් ලොව හොඳම ප්‍රතිඵලය අත් කරගෙන ඇති බව නිරීක්ෂණය විය.

එමෙන්ම සමාජවාදී කියුබන් ජනරජයද අධ්‍යාපනයට රාජ්‍යයේ ප්‍රමුඛ ස්ථානයක් ලබා දුන්නේය. 1959 වන විට කියුබාවේ අවුරුදු 15 ට වැඩි ජනගහනයෙන් සාක්ෂරතාවය පැවතියේ සියයට 22කට පමණි. එයින් සියයට 66ක් ඉගෙන ගෙන තිබුණේ තෙවන ශ්‍රේණිය දක්වා පමණකි. එහෙත් අද වන විට කියුබානු ජනතාවගේ සාක්ෂරතාවය සියයට 97කටත් වඩා වැඩිය. 1959 විප්ලවයෙන් පසු කියවීමේ හැකියාව වර්ධනය හා කියවීමේ හුරුව ඇති කිරීම වෙනුවෙන් කියුබානු රජය විශේෂ වෙහෙසක් දරන ලදී. 1959 අප්‍රේල් මාසයේ අකුරු කියවීම පුහුණු කිරීමේ මධ්‍යස්ථාන 817ක් විවෘත කරමින් අධ්‍යාපනය තුළ මෙම පෙරළිය අරඹන ලදී. ඒ සඳහා ස්වේච්ඡා සේවක සේවිකාවන් 280,000ක් සහභාගි කරගත් සාක්ෂරතාවය නැංවීමේ ව්‍යාපාරයක් දියත් කෙරිණි. එක් වසරකින් එම ව්‍යාපාරය සාක්ෂරතාවයේ පහත් මට්ටම මුළුමනින් උපුටා දමන ලදී. නිදහස් අධ්‍යාපන ක්‍රමයක් ක්‍රියාත්මක වන කියුබාව ව්‍යවස්ථාවෙන් හා ප්‍රායෝගික වශයෙන් නිදහස් අධ්‍යාපනය සහතික කරන ලදී. පොත්පත්, පෑන්, පැන්සල් පවා ලබාදීම මෙයට අයත්ය. අධ්‍යාපනය වෙනුවෙන් දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 13ක් එනම් ලෝකයේ වැඩිම ප්‍රතිශතයක් වෙන් කරනු ලබන රටවල් අතරින් එකක් බවට කියුබාව පත්වේ. ජනගහනයට සාපේක්ෂව ලොව වැඩිම ගුරුවරුන් සංඛ්‍යාවක් සිටින්නේ කියුබාවේය. කියුබාව තුළ අද වන විට ශිෂ්‍යත්ව පදනමින් විදෙස් සිසුහු රාශියක්ද අධ්‍යාපනය ලබමින් සිටිති. මේ වන විටත් විවිධ ජාතීන්ට අයත් සිසුහු 3432ක් වෛද්‍යවරු ලෙස කියුබාව තුළ පුහුණුව ලබමින් සිටිති. මේ ශිෂ්‍යත්වයන් විශේෂයෙන්ම ලබා දී තිබෙන්නේ ලතින් ඇමරිකානු, අප්‍රිකානු සහ ආසියානු කලාපයේ සිසුන්ටය. විශ්වවිද්‍යාල සිසුහු පමණක් ලක්ෂ 7ක් දැනට කියුබාවේ ඉගනුම ලබති.

මෙලෙසින්ම අධ්‍යාපනය වෙනුවෙන් සමාජවාදී වියට්නාමය තබා ඇති ප්‍රමුඛතාවය මෙසේ ගෙන හැර දැක්වීමට හැකිය. වත්මන් සමාජවාදී වියට්නාමයේ සෑම ගමකම ප්‍රාථමික පාසල් ඇති අතර එම ගම්මානවලින් සියයට 95කම ද්විතීයික පාසලක් ඇත. වර්ෂ 2000දී වියට්නාමය පූර්ණ වශයෙන්ම එහි අකුරු නොහැකියාව දුරු කළ අතර ප්‍රාථමික අධ්‍යාපනය ලැබීමද සම්පූර්ණ කරන ලදී. 2010දී එය ද්විතීයික හා ප්‍රාථමික අධ්‍යාපනය ලැබීමද සම්පූර්ණ කරන ලදී. 1986 අධ්‍යාපනය සඳහා රාජ්‍ය අයවැයෙහි වාර්ෂික දායකත්වය සියයට 10ක් විය. 2000 වසරේදී වාර්ෂික අයවැයෙන් අධ්‍යාපනය කෙරෙහි වන දායකත්වය සියයට 15ක් දක්වා වර්ධනයවේ. 2009දී එම දායකත්වය සියයට 20ක් දක්වා වර්ධනය විය. (අයවැයෙන් අධ්‍යාපනයට සියයට 6ක වත් දායකත්වයක් ඉල්ලා ශ්‍රී ලංකාව තුළ කෙරෙන අරගලය හා ඒ පිළිබඳව රජය දක්වන ප්‍රතිචාරය මෙය සමඟ සංසන්දනය කොට බලන්න.) වත්මනෙහි වියට්නාම් ජනතාවගෙන් සියයට 25ක් අන්තර්ජාලය භාවිතා කරයි.

මේ අනුව ඉතා මැනවින් පැහැදිලි වන්නේ, සමාජවාදී රටවල අධ්‍යාපනයට ප්‍රමුඛත්වය දී ඇති බවත්, ජාතික සම්පත් වැඩි ප්‍රමාණයක් වෙන්කොට ඇති බවත් නිදහස් ජනතාවාදී අධ්‍යාපනයක් පවතින බවත් ඒ තුළින් එම රටවල නූගත්භාවය මුලිනුපුටා දමමින් අධ්‍යාපන මට්ටම ඉතා ඉහළට ඔසවා තබා ඇති බවත්ය. සමාජවාදයේදී වැඩකරන ජනතාව යනු ආර්ථික වශයෙන් රටක ප්‍රධානතම සම්පත ලෙස සලකනු ලබයි. එනිසා ජනතාවගේ අධ්‍යාපන මට්ටම ඉහළයාම පෙරළා සමාජවාදී නිෂ්පාදන කර්මාන්තයේ වර්ධනය වෙනුවෙන් බලපායි. මේ තත්වය තේරුම් ගනිමින් අධ්‍යාපනය වෙනුවෙන් සමාජවාදී රටවල් වැඩි බර තැබීමක් කර ඇත.

## සමාජවාදය තුළ කර්මාන්තකරණය

ආර්ථිකය ඉහළ නැංවීම තුළින් ජන ජීවිතය වඩා යහපත් කිරීම උදෙසා සමාජවාදය විසින් කර්මාන්තකරණය ඉතා ඉහළින් සැලසුම්කරණ ලදී. නිෂ්පාදනය දියුණු කිරීමෙන් තොරව සමාජවාදය පිළිබඳව සිතා ගැනීමටවත් නොහැකිය. සමාජවාදය තුළ අසමානතාවය දුරලනුයේ මිනිස් අවශ්‍යතා සපුරාලනු ලබන නිෂ්පාදිතයන් සුලබ කිරීම මගිනි. එවිට ඒවා මිනිස් අවශ්‍යතාවයන් තෘප්ත කරන අතරම සම්පත් හිඟකම විසින් බිහිකරලන වරප්‍රසාද තත්වයන් දුරලයි. ඒ වෙනුවට මූලික සමාජවාදී මිනිස් අයිතිවාසිකම් සුරකිනු ලබයි. ඒවා ධනවාදය විසින් බලහත්කාරයෙන් පටවන අවශ්‍යතාවයන් මෙන් නොව වඩා යහපත් ජීවිතයක් උදෙසා මිනිසෙකුට අත්‍යවශ්‍ය වන ඒවාය. මේ සඳහා නිෂ්පාදනය දියුණු කිරීම යනු හුදු සංඛ්‍යාත්මක වැඩිකිරීමක් නොව සැලසුම් සහගත ලෙසින් ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව වැඩිකිරීමකි.

විප්ලවය සිදු වන විට රුසියාව කර්මාන්තමය වශයෙන් ඉතා නොදියුණු රටක් විය. එවකට පැවැති කර්මාන්තශාලාද ධනවත් රුසියානුවන් කිහිපදෙනෙකු සහ විදේශිකයන් සතු විය. ජර්මන්, ප්‍රංශ, බ්‍රිතාන්‍ය, ස්වීඩන් ආදී රටවල ධනවත්හු රුසියාවේ ගල් අඟුරු ආකර, තෙල් ආකර, බැංකු පාලනය කළහ. එපමණක් නොව අධිරාජ්‍යවාදීන් විසින් රුසියාව ණය උගුලක සිරකර තිබුණි. එසේ අධිරාජ්‍යවාදීන් විසින් රුසියාවේ සම්පත් කොල්ලකෑම පිණිස මෙම ණය උගුල භාවිත කරන ලදී.

එම තත්වයට එරෙහිව 1918 සිට 1958 දක්වා සෝවියට් දේශය එහි කර්මාන්ත සංවර්ධන වේගය සියයට 10ක වර්ධන මට්ටමේ තබා ගත්තේය. මෙම කාලය තුළ ඇමරිකා එක්සත් ජනපදයේ කාර්මික සංවර්ධන වේගය සියයට 3.2 වූ අතර බ්‍රිතාන්‍යයේ සියයට 1.9ක් ද විය. එම වර්ධන මට්ටම ප්‍රංශයේද සියයට 3.2ක් විය. සමාජවාදය

ආරක්ෂා කිරීමට නම් සමස්ත රුසියාවම විද්‍යුත්කරණය කළ යුතු යැයි ලෙනින් පෙන්වා දුන්නේය. විද්‍යුත්කරණය හරහා ජන ජීවිතය උසස් මට්ටමට පත්වන අතර නිෂ්පාදනයද වේගවත් සංවර්ධනයකට යොමුවේ. තවද විද්‍යුත්කරණය පසුපස තාක්ෂණික ඥානය රට තුළ ව්‍යාප්ත වේ. 1920දී ලෙනින්ගේ යෝජනාවක් අනුව අවුරුදු 10කින් විදුලිය කිලෝ වෝට් කෝටි 9000ක් නිපදවීම සඳහා සැලසුම් සකසන ලදී. බ්‍රිතාන්‍ය ජාතික එච්.ජී. වේල්ස් විද්‍යා ප්‍රබන්ධකරුවා ලෙනින් සමග මේ පිළිබඳව සාකච්ඡා කළේය. පසුව ඔහු පැවසුවේ, ලෙනින් මනෝරාජ්‍යයක සිරවී ඇති බවය. ඔහු ක්‍රෙම්ලිනයේ සිට සිහින දකින්නේ යැයි වේල්ස් පැවැසීය. බ්‍රිතාන්‍යයට තම කර්මාන්ත දියුණුව ලබාගැනීමට අවුරුදු 300ක් පමණ ගතවීම වේල්ස් එසේ සිතන්නට පෙළඹවූ කරුණ වන්නට ඇත. නමුත් සෝවියට් රුසියාව විසින් මෙම ඉලක්කය සම්පූර්ණ කරන ලදී. 1930 ගණන් වන විට සෝවියට් දේශය සතුව කිලෝ වොට් 48,000ක් සපයන විදුලි බලාගාර විය. 1958 දී එය කිලෝ වොට් කෝටි 233,000ක් දක්වා වැඩි විය. 1965 කිලෝ වොට් කෝටි 502,000ක් තරම් විදුලිය ප්‍රමාණයක් සෝවියට් දේශය නිපදවීය. ඒ තුළින් තාක්ෂණය හා කාර්මිකකරණය වඩා වේගවත් විය.

සාර් සමයේ අති බිහිසුණු බිමක් සේ සැලකුණු, සිරකරුවන් පිටුවහල් කළ ප්‍රදේශයක් වූ සයිබීරියාව සමාජවාදය යටතේ කර්මාන්ත පුරයක් බවට පත්විය. 1965 වන විට රුසියාවේ භාවිත යකඩවලින් සියයට 44ක්ද වානේවලින් සියයට 48ක්ද ගල් අඟුරුවලින් සියයට 50ක්ද තෙල්වලින් සියයට 30ක්ද විදුලි බලයෙන් සියයට 46ක්ද දැව නිෂ්පාදනයෙන් සියයට 45ක්ද සයිබීරියාවෙන් ලැබුණි.

මේ අතර චීනය අද ලෝකයේ කාර්මික බලවතාද නැද්ද යන විවාදය පවතී. එය එසේ වුවද පසුගිය කාලයේ චීනය තුළ ඔත්තු බැලීමට ඇමරිකාව විසින් එවනු ලැබූ ගුවන් යානයක් චීන හමුදාව විසින් අල්ලා ගන්නා ලදී. එහි තාක්ෂණය පිළිබඳව පරීක්ෂා

කිරීමට යාමේ දී එම ඔත්තු බැලීමේ ගුවන් යානාවේ අමතර කොටස්ද චීනයේ නිෂ්පාදනය කරනු ලැබූ ඒවා බව අනාවරණය විය. වර්තමාන ලෝකයේ සැබෑ කාර්මික බලවතා කවුරුන්ද යන්න විසඳා ගැනීමට මින් රුකුලක් පහසුවෙන් ඔබට ලැබෙනු ඇත. චීනයද මේසා විශාල දියුණුවක් අත්පත් කරගත්තේ 1949 සිට ගෙවුණු වසර 60කට මඳක් වැඩි කාලය තුළය. ඒවා අන් කිසිවක් නොව සමාජවාදී ආර්ථික ජයග්‍රහණයන්ය. මේ වන විට ලොව නිපදවන සියලුම තාක්ෂණික සහ කාර්මික උපකරණ වැඩිම ප්‍රමාණයක් චීනයේ නිෂ්පාදනයන්ය. එමෙන්ම චීනය යනු මිනිසකු අභ්‍යවකාශයට යැවූ ලොව තෙවන රටයි.

තවද ලෝකයේ විශාලතම අධිවේගී දුම්රිය මාර්ග පද්ධතියට හිමිකම් කියන්නේද චීනයයි. පැයට කි. මී. 200ක වේගයෙන් දුම්රිය ගමන් ගන්නා මාර්ග කි.මී 9300ක් චීනය සතුය.

චීනය සහ ටිබෙටය යා කර ඉදිකරන ලද දුම්රිය මාර්ගය (Sky Way) චිනයේ තවත් විශේෂ නිර්මාණයකි. නමුත් පෙරදී මෙය කළ නොහැකි දෙයක් බව ලෝකයේ බොහෝ රටවල් විසින් පවසනු ලැබිණි. එහෙත් සමාජවාදී චීනය එම අභියෝගය ජයගත්තේය.

වියට්නාමය සමාජවාදයට පෙර දරිද්‍රතාවයෙන් පෙළුණු එමෙන්ම පසුගාමී රටක් විය. ජනතාවගේ ජීවිතය පැවැති තත්වයෙන් ඉහළට ඔසවා තැබීමට සමාජවාදය සමත් විය. විප්ලවයට පෙර වියට්නාමයේ දුප්පත්කම හා සමාජවාදය තුළ එහි වෙනස්වීම පහත වගුවෙන් පැහැදිලි කර ගැනීම පහසුය.

## වියට්නාමයේ දරිද්‍රතාවය පරාජය කිරීම

| වසර | සමස්ත ජනගහනයෙන් දුප්පතුන් ප්‍රමාණය ප්‍රතිශතයක් |
|---|---|
| 1986 | 75 |
| 1993 | 58.1 |
| 1998 | 37.4 |
| 2002 | 29 |
| 2004 | 25 |
| 2006 | 19 |
| 2007 | 16 |
| 2008 | 13.5 |
| 2010 | 9.5 |

## සමාජවාදය තුළ කෘෂිකර්මය

සමාජවාදී විප්ලවයට පෙර රුසියානු කෘෂිකර්මය පැවැතියේ ඉතාමත් පහත් තත්වයකය. ඒ සඳහා දියුණු තාක්ෂණය භාවිත නොවුණු තරම්ය. ට්‍රැක්ටර් වැනි කෘෂි යන්ත්‍ර ග්‍රාමීය ප්‍රදේශවලට පැමිණියේ 1920 ගණන්වලින් පසුවය. ඉඩම් අයිතියද විශාල ඉඩම් හිමියන් අත වූ අතර සාමාන්‍ය ගොවීන් 300ක් සතු ඉඩම් ප්‍රමාණය සාර් රුසියාවේ එක් ඉඩම් හිමියකු සතු විය. ගම්බද ගොවීහු ඉතාමත් දුෂ්කර ලෙස පැල්පත්වල දිවි ගෙවූහ. සී සෑම සඳහා යොදා ගනු ලැබූයේ ලී නගුල්ය.

සැබවින්ම කෘෂි නිෂ්පාදනය දියුණු කිරීම උදෙසා පළමුව එය කාර්මීකරණයට ලක්කළ යුතු විය. දියුණු තාක්ෂණය භාවිතා කළ යුතු විය. නවීන යන්ත්‍ර සූත්‍ර භාවිතා කළ යුතු විය. නව විද්‍යාත්මක කෘෂිකාර්මික ක්‍රමවලට පිවිසිය යුතු විය. පසුගාමී කෘෂිකාර්මික රටවල එය එතරම් පහසු කටයුත්තක් නොවේ. ඒ සඳහා පළමු කොන්දේසිය

වන්නේ, මහා පරිමාණ ගොවිපළ ඇති කිරීමය. ඉඩම්වලින් බහුතරයක් සුළු පරිමාණ ඒවා වන රටක එවන් කාර්යයක් අතිශය දුෂ්කර වීම අනිවාර්යයකි. එබැවින් සෝවියට් දේශය සාමූහික ගොවිපළ ආකෘතිය තුළින් සංක්‍රමණීය ගමන් මඟක් ඔස්සේ මහා පරිමාණ ගොවිපළ ගොඩනැගීම වෙත ගමන් කිරීම උපක්‍රමය කොට ගෙන කටයුතු කළේය. කෘෂි පර්යේෂණයන්ට ප්‍රමුඛත්වය, නවීන තාක්ෂණය හා යන්ත්‍ර සූත්‍ර යොදාගනිමින් සමාජවාදී රටවල අවශ්‍ය ආහාර නිපදවා ගත්තාක් මෙන්ම අතිරික්තය ලෝක වෙළඳපොළට එක් කරන ලදී. ඉන් කොටසක් සහෝදර සමාජවාදී රටවල් සමඟ සහනදායී ක්‍රමවලට බෙදා ගැනිණි.

සෝවියට් දේශය කෘෂිකර්මාන්තය වර්ධනය කිරීමේදි වැදගත් කරුණු කිහිපයක් ඉටු කරන ලදී. එම කරුණු කෙටියෙන් මෙසේ විමසා බැලිය හැකිය.

1. කෘෂිකර්මාන්තය රජයේ ප්‍රමුඛතම කටයුත්තක් සේ සලකා කටයුතු කරන්නට විය.

2. කෘෂි නිෂ්පාදනය වර්ධනය සඳහා ඉහළ තාක්ෂණය වැඩි වශයෙන් යොදවන ලදී. එහිදී තාක්ෂණික උපකරණ, දියුණු බීජ වර්ග, පොහොර සහ කෘෂි රසායන උපයෝගී කරගන්නා ලදී. පර්යේෂණ ආයතන පිහිටුවා කෘෂි පර්යේෂණ කාර්යය දියුණු කරන ලදී.

3. එමෙන්ම කුඩා පරිමාණ ගොවියන් සමූහ ගොවිපළ ක්‍රමය දක්වා පරිවර්තනය වීමට උනන්දු කළේය. එසේ ගොඩනැගෙන සමූහ ගොවිපළවලට කෘෂි උපකරණ, තාක්ෂණික දැනුම, පොහොර සහ රසායන ද්‍රව්‍ය ලබා ගැනීමට රජය සහය දක්වන ලදී. තවද කුඩා පරිමාණ, සම්ප්‍රදායික හා අවිද්‍යාත්මක කෘෂිකර්මය අධෛර්යය කිරීමක්ද ඉන් සිදු විය. එනිසා විද්‍යාත්මක හා මහා පරිමාණ කෘෂිකර්මාන්තයේ වර්ධනය හේතුවෙන් කෘෂි නිෂ්පාදනයේ දැවැන්ත

ඉහළ යාමක් සිදුවිය.

1947 වන විට සෝවියට් දේශය තුළ කෘෂිකර්මය පිළිබඳ විද්‍යාත්මක පර්යේෂණ ආයතන 111ක් ස්ථාපිත කරන ලද අතර ඒවාට තවත් ශාඛාවන්ද අයත් විය. එමෙන්ම එම ආයතන එකිනෙක හා සම්බන්ධව ආයතන ජාලයක් ලෙසින් කටයුතු කරන ලදී. එය 1963 වන විට කෘෂි පර්යේෂණ ආයතන 177ක් දක්වාද 1974 වන විට එය කෘෂි පර්යේෂණ ආයතන 222ක් දක්වාද වර්ධනය විය. සමස්ත සෝවියට් දේශයම ආවරණය වන පරිදි බිහිකරන ලද මෙම ආයතන පද්ධතිය තුළ පර්යේෂණ සේවකයින් 35,000ක් පමණ සේවය කරන ලදී. ඒ අතර ආචාර්ය උපාධිධාරීන් 850ක් ක්‍රියාකාරීව කටයුතු කළේය. මෙයින් පැහැදිලි වන්නේ, කෘෂිකර්මාන්තය සංවර්ධනය සඳහා සමාජවාදී සෝවියට් දේශය ගන්නා ලද සැලසුම් සහගත උත්සාහයේ ප්‍රමාණයයි.

මේ අතර 1980 වන විට කෘෂිකර්ම ක්ෂේත්‍රය තුළ සේවය කළ සෝවියට් ජනතාව මිලියන 26ක් වූ අතර ඒ වන විට ඇමරිකානු එක්සත් ජනපදයේ කෘෂි ජනගහනය මිලියන 6ක් වැනි පහළ අගයක් විය. 1972 - 1975 කාල වකවානුවේ අස්වනු තත්වය ඉතා පහත් මට්ටමට වැටී තිබියදී වුවද ලොව විශාලතම ධාන්‍ය නිෂ්පාදකයා වීමට සෝවියට් දේශයට හැකි විය. ඉන් පසුව 1978දී සෝවියට් දේශය විසින් වාර්තාගත අස්වැන්නක් ලබාගන්නා ලදී. සෝවියට් දේශයේ ධාන්‍ය අස්වැන්න වැඩිවීම පිළිබඳ සංඛ්‍යා දත්ත සටහන පහත දැක්වේ.

1976 - 1977 මෙට්‍රික් ටොන් මිලියන 10.3

1977 - 1978 මෙට්‍රික් ටොන් මිලියන 18.4

1978 - 1979 මෙට්‍රික් ටොන් මිලියන 15.1

1979 - 1980 මෙට්‍රික් ටොන් මිලියන 30.4

1980 - 1981 මෙට්‍රික් ටොන් මිලියන 34.0

1981 - 1982 මෙට්‍රික් ටොන් මිලියන 45.0

1982 - 1983 මෙට්‍රික් ටොන් මිලියන 46.0

පෙර නිසරු බිම් ලෙස අත්හැර දමන ලද බිම් රාශියක් සරුබිම් බවට බවට පත්කරන්නට සෝවියට් දේශය සමත් විය. ධාන්‍ය වගාව දැවැන්ත ලෙස වර්ධනය වීම නිසා කසකස්ථානය 'සෝවියට් දේශයේ ධාන්‍යාගාරය' ලෙසින් හැඳින්විණි. සෝවියට් දේශයේ මැදිහත් වීමට පෙර එම ප්‍රදේශයෙන් ලබා ගෙන තිබුණේ ධාන්‍ය අස්වැන්න ටොන් 1600 -1900ක් අතර ප්‍රමාණයක් විය. නමුත් සෝවියට් සමාජවාදයේ මැදිහත් වීම මගින් එහි වාර්ෂික ධාන්‍ය නිෂ්පාදනය ටොන් මිලියන 16 (16,000,000) දක්වා ඉහළ නංවන්නට සමත් විය.

චීනයේ සමාජවාදී සමාජ විප්ලවය හේතුවෙන් එරට කර්මාන්තය මෙන්ම, කෘෂිකර්මාන්තයේද අති විශාල දියුණුවක් ලබා ගෙන තිබේ. පෘථිවියේ මිනිසුන් විසින් ආහාරයට ගන්නා සෑම ඇපල් ගෙඩි 6 කින්ම එකක් චීනයේ නිපදවන ලද්දක් බව වාර්තා වේ. එනම් ලෝක ඇපල් පරිභෝජනයෙන් 6න් එක් පංගුවක් සැපයෙන්නේ චීනයෙනි. මේ උදාහරණයට අනුව වුවද චීනය, ලොව කෘෂිකාර්මික ක්ෂේත්‍රයෙහි දරන ස්ථානය පැහැදිලි වේ. සමාජවාදී චීනයේ කෘෂි නිෂ්පාදන වර්ධනය පහත සඳහන් සංඛ්‍යා දත්ත වගුවෙන් තවදුරටත් පැහැදිලි ලෙස පෙන්වා දිය හැකිය..

| කෘෂි නිෂ්පාදනයේ වර්ගය | 1949 නිෂ්පාදනය (ටොන්) | 1999 නිෂ්පාදනය (ටොන්) |
|---|---|---|
| ධාන්‍ය | 113,180,000 | 508,390,000 |
| කපු | 444,000 | 831,000 |
| උක් | 2,642,000 | 74,700,000 |
| පලතුරු | 1,200,000 | 63,376,000 |
| මස් | 2,200,000 | 59,609,000 |
| ජලජ නිෂ්පාදන | 450,000 | 41,220,000 |

## සෝවියට් යුදමය ජයග්‍රහණ

ධනවාදී කඳවුරෙන් වටලනු ලැබ තිබූ සෝවියට් දේශය තම ආරක්ෂාව සමාජවාදය පිළිබඳව ආරක්ෂාව ලෙසම සලකා කටයුතු කළේය. එසේ නොවන්නට ධනපති කඳවුර විසින් සෝවියට් දේශය මෙයට බොහෝ කලකට පෙර බිඳ දමන්නට ඉඩ තිබුණි. දෙවන ලෝක යුද්ධයේදී ෆැසිස්ට් ජර්මනිය පැරදවීමට ප්‍රබල වැඩ කොටසක් කරනු ලැබුයේ සෝවියට් දේශය විසිනි. එය ලෝක ඉතිහාසයට මහත්වූ සාමුහික ක්‍රියාදාමයක්ද, සටන්කාමීත්වයක්ද, ධෛර්යමත් බවක්ද, කැපකිරීමක්ද එක් කළේය. දෙවන ලෝක යුද්ධයේදී සෝවියට් දේශයට අහිමිවූ මිනිස් සම්පත අනෙකුත් යුද වැදුණු රටවල් සමඟ සංසන්දනාත්මකව බලන කළ විශාල එකකි. ලෝක යුද්ධයේදී දිවි පිදූ සෝවියට් සෙබළු සහ ජනතාව ප්‍රමාණාත්මකව සලකන්නේ නම් මිලියන 20 කි. එනම් කෝටි දෙකකි. ඇමරිකාවට අහිමි වූයේ සෙබළු 405,000 කි. බ්‍රිතාන්‍යයට සෙබළු 375,000 පමණක් අහිමි විය. දෙවන ලෝක යුද්ධයේදී මිය ගිය ඇමරිකානු හා බ්‍රිතාන්‍ය සෙබළුන් සංඛ්‍යාවේ එකතුව සෝවියට් පෙරමුණේ කළ දිවිපිදීම් හා සංසන්දනයේදී නොගිණිය හැකි තරම් සුළු අගයකි. සෝවියට් දේශයේ ජාතික ධනයෙන් සියයට 30ක් එම යුද්ධයෙන් ඔවුනට අහිමි විය. 70,000

කට අධික නගර සහ ගම්මාන සහ මුලින්ම විනාශයට පත් විය. රට යළි ගොඩනැගීමේ අභියෝගය කෙලෙස වී දැයි මෙම විනාශයේ ප්‍රමාණයෙන් මනාව පැහැදිලි වේ.

එහෙත් මෙවන් පසුබිමක සිටියදී පවා සමාජවාදී කඳවුර බිහිවීමෙන් පසුව එම රටවල ආරක්ෂාවට සහය දැක්වූයේ සෝවියට් දේශයයි. ඒ අනුව සමාජවාදී සෝවියට් දේශය ඉතා ඉක්මනින් ඉතා තියුණු යුද ශක්තියක් අත්පත් කරගන්නා ලද බව පැහැදිලි වේ. එරට විසින් ශක්තිමත් ගොඩබිම්, නාවික හා ගුවන් හමුදාවක් ගොඩ නගා ගන්නා ලදී. එමෙන්ම ඉතා දියුණු තාක්ෂණික උපකරණ රාශියක් සෝවියට් දේශය විසින් නිෂ්පාදනය කිරීමට සමත් විය. අන්තර් මහද්වීපික මිසයිල, යුද නෞකා, ගුවන් යානා, සබ්මැරීන් සහ න්‍යෂ්ටික අවි අභ්‍යන්තරව නිෂ්පාදනය කර ගැනීම අතින් සෝවියට් දේශය ලොව අන් රටවලට වඩා ඉදිරියෙන්ම විය. 1957 වසරේ ප්‍රථම අන්තර් මහාද්වීපික මිසයිලය නිපදවීමටද සමාජවාදී සෝවියට් රාජ්‍යය සමත් විය. එපමණක් නොව න්‍යෂ්ටික බලයෙන් ක්‍රියා කරන සබ්මැරීන් සහ නෞකාද සෝවියට් දේශය විසින් නිෂ්පාදනය කරන ලදී. එහෙත් සෝවියට් දේශය ඒවා විනාශකාරී ලෙස යොදා නොගත්තේය. සුප්‍රකට ස්වයංක්‍රීය ගිනි අවියක් වන AK-47 නිපදවන ලද්දේ සෝවියට් දේශයයි. ලොව පුරා ප්‍රචලිත මිග් ප්‍රහාරක ගුවන් යානා, එමෙන්ම ඇන්ටනොව් ප්‍රවාහන ගුවන් යානා, දෙවන ලෝක යුද්ධයේදී ප්‍රහාරක කටයුතු සහ ප්‍රවාහන කටයුතු සඳහා සෝවියට් දේශය විසින් නිපදවන ලද දියුණු යානාවන් වේ.

## සෝවියට් අභ්‍යවකාශ ජයග්‍රහණ

අප වසන පෘථිවියට ශක්තිය සපයන සූර්යයා තව වසර කෝටි පන්සියයකට ආසන්න කාලයක් පවතිනු ඇතැයි යන්න විද්‍යාත්මක සත්‍යයකි. ඉන් පසුව ශක්ති උත්පාදනය නතරව යාමෙන්

සූර්යයා විනාශ වනු ඇත. ඒ වන විට මිහිකත ද එහි ශක්තිය නොලැබීයාමෙන් අජීවි ග්‍රහ ලොවක් බවට පත්වනු ඇත. ඉන් පසු මානව වර්ගයාගේ පැවැත්ම අවසන් වනු ඇතිද? මිනිසා විශ්වයේ හුදකලා සහ අසරණයෙකු ලෙසින් තම අනාගතය ගතකරයිද? එය එසේ නොවේ. මිනිසා නැමැති කිසිදා පසු නොබාන සුළු සත්වයා එම අභියෝගය නියත වශයෙන්ම ජයගනු ඇත. ඔහු විශ්වයේ විවිධ සම්පත් මිනිස් වර්ගයාගේ යහපත උදෙසා යොදාගනු ඇත. මිනිසා සතු විශ්වයේ රහස් සෙවීමේ නොසිඳෙන කුතුහලය විසින්ම එයට මංපෙත් සකසා ගනු ඇතැයි දාර්ශනික සුභවාදයක සිට දකින්නෙකුට නම් අරුමයක් නොවේ. එවන් මාවතක් වෙත මිනිසා තබන යෝධ පියවරක් වනුයේ අභ්‍යවකාශ තරණයයි. ධනවාදී ලෝකයට නම් එය ලාභය, තරගය හා යුදමය හේතු සමඟ බැඳුණු ආයෝජනයක් පමණි. සමාජවාදය එය යොදාගනුයේ ඉහත කී පුළුල් අරමුණෙනි. මානව වර්ගයාගේ ජයග්‍රහණය උදෙසාය.

සෝවියට් දේශය තම අභ්‍යවකාශ ගවේෂණ කටයුතු අරඹන ලද්දේ 1930 ගණන්වල සිටය. 1957 ඔක්තෝබර් 04 දින ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවයට වසර 40ක් පිරෙද්දී සෝවියට් දේශය විසින් ලොව ප්‍රථම කෘත්‍රිම චන්ද්‍රිකාව වන ස්පුට්නික් 1 කක්ෂගත කරන ලදී. මානව වර්ගයාගේ අභ්‍යවකාශ යුගය ඉන් ආරම්භ විය. දෙවනුව ස්පුට්නික් 2 මගින් ලයිකා නැමැති බැල්ල අභ්‍යවකාශයට යවමින් විශ්ව තරණයේ තවත් යෝධ පියවරක් සමාජවාදී සෝවියට් දේශය විසින් තබන ලදී. අභ්‍යවකාශය තරණය කරන ලද ලොව ප්‍රථම පෘථිවි ජීවියා ලෙස ලයිකා බැල්ල ඉතිහාසයට එක්වේ. ඒ, 1957 නොවැම්බර් 3වැනිදාය. එපමණක් නොව පළමු වරට මිනිසෙකු අභ්‍යවකාශ තරණයට යෙදවූයේද සෝවියට් දේශයයි. ඒ අනුව 1961දී වොස්ටොක් 1 අභ්‍යවකාශ යානය මගින් යූරි ගගාරීන් අභ්‍යවකාශ ගත විය. ලොව පළමු වරට අභ්‍යවකාශ ගතවූ ප්‍රථම කාන්තාව වූයේද සෝවියට්

දේශයේ වැලැන්ටිනා තෙරෙෂ්කෝවාය. ඇය 1963 වොස්ටොක් 6 අශ්‍යාවකාශ යානයෙන් අභ්‍යවකාශ ගත විය. මිනිසුන් රහිත යානයක් ප්‍රථමයෙන්ම අභ්‍යවකාශ ගත කරනු ලැබූයේද සෝවියට් දේශය විසිනි. එය ලූනා 2 යානය නම් විය. පළමු වරට මිනිසකු රහිත යානයක් හඳ මතට ගොඩබස්සවනු ලැබූයේද සෝවියට් දේශයයි. මේ සියල්ල මානව වර්ගයාගේ සුවිශේෂී ජයග්‍රහණයන් බව නිතැතින්ම පිළිග ැනෙන දෙයකි.

## සෝවියට් දේශයේ ක්‍රීඩා ජයග්‍රහණ

අධිරාජ්‍යවාදී බලවතකු වන ඇමරිකාව වැනි රටවල ආකාරයෙන් ප්‍රදර්ශනාත්මක ලෙස මිනිසුන් අභ්‍යවකාශයට යවා මහපොළවේදී ඔවුන් නොසලකා හැරීමක් සෝවියට් දේශයේ සිදු නොවීය. ඒ වෙනුවට පෘථිවියේද, අභ්‍යවකාශයේද සමස්ත මානව වර්ගයා දිනවීම උදෙසා සමාජවාදය උපයෝගී කරගන්නා ලදී. සමාජවාදී රටවල් ක්‍රීඩාව කෙරෙහි දක්වන ලද ආකල්පයෙන් එය මනාව පැහැදිලි වේ. රටක සංවර්ධනය, එහි දියුණුව සැඟවිය නොහැකි ලෙස මතුවී පෙනෙන ක්ෂේත්‍රයක් ලෙස ක්‍රීඩාව පෙන්විය හැකිය. අධ්‍යාපනයට මෙන්ම ක්‍රීඩාවටද සමාජවාදී රටවල් වැඩි අවධානයක් යොමු කළේය. සෝවියට් දේශය, නැගෙනහිර ජර්මනිය, කියුබාව, චීනය වැනි රටවල් තුළ ක්‍රීඩකයින් ජාත්‍යන්තර මට්ටමේ තරගවලදී දක්වන ලද දස්කම් අති විශිෂ්ටය. අද සමාජවාදී කඳවුර තුළ ඉතිරිවී ඇති රටවල් කිහිපයක උදාහරණ වුවද එම යථාර්ථය ඔප්පු කිරීමට සාක්ෂි සපයයි. ක්‍රීඩාව මුදල් උපයන ව්‍යාපාරයක් කිරීම වෙනුවට ක්‍රීඩාව ශාරීරික හා මානසික සෞඛ්‍ය ආරක්ෂා කරගැනීමේ මෙන්ම හොඳ මිනිසෙකු ගොඩනැගීමේ මාධ්‍යයක් ලෙස සමාජවාදී රටවල් සැලකීය. ඔවුන් විසින් ක්‍රීඩාව යොදා ගැනුණේ එම අරමුණෙන් යුතුවය.

ඔලිම්පික් තරගාවලිය යනු ලොව ප්‍රමුඛතම ක්‍රීඩා උළෙල වේ. අද එහි ප්‍රමුඛස්ථානයක සිටීමට සමාජවාදී චීනය සමත්ව සිටියි.

සෝවියට් දේශය බිඳවැටීමට පෙර ඔලිම්පික් තරගාවලියේ අඛණ්ඩව ඉදිරි පෙළෙහි සිටීමට තරම් එම රට සමත් විය. සෝවියට් දේශය මුලින්ම ඔලිම්පික් තරගවලට සහභාගි වන්නේ 1952 දීය. එතැන් සිට සෝවියට් දේශය බිඳ වැටෙන තෙක් එහි පදක්කම් සටහන පහත දැක්වෙන පරිදි විය.

| වර්ෂය | පැවැත්වූ ස්ථානය | රන් | රිදී | ලෝකඩ | ලබාගත් ස්ථානය |
|---|---|---|---|---|---|
| 1952 | හෙල්සින්ස්කි | 22 | 30 | 19 | 02 |
| 1956 | මෙල්බෝන් | 37 | 29 | 32 | 1 |
| 1960 | රෝමය | 43 | 29 | 31 | 01 |
| 1964 | ටෝකියෝ | 30 | 31 | 35 | 02 |
| 1968 | මෙක්සිකෝ | 29 | 32 | 30 | 02 |
| 1972 | මියුනිච් | 50 | 27 | 22 | 01 |
| 1976 | මොන්ට්‍රියෙල් | 49 | 41 | 35 | 01 |
| 1980 | මොස්කව් | 80 | 69 | 46 | 01 |
| 1984 | ලොස් ඇන්ජලීස් | 1980 දී මොස්කව්හි පැවැත්වූ ඔලිම්පික් උළෙල ඇ.එ. ජනපදය විසින් වර්ජනය කළ නිසා මෙවර සෝවියට් දේශය සහභාගි නොවීය. | | | |
| 1988 | සියොල් | 55 | 31 | 46 | 01 |

ලොව වැඩිම ඔලිම්පික් පදක්කම්ලාභීන් අතර සමාජවාදයේ බල මහිමයෙන් බිහි කළ ලැරිස්සා ලැටියානිනා (පදක්කම් 18 යි), නිකොලොයි ආන්ඩ්‍රපෝෆ් (පදක්කම් 15 යි) ආදීන් වේ. මේ අතරට සමාජවාදී සෝවියට් දේශයේ සර්ජි බුබ්කා වැනි අනභිබවනීය ක්‍රීඩකයින්ද විය. රිටි පැනීමේ ක්‍රීඩාවේ ඔහු තරම් විශිෂ්ටයෙක් මෙතෙක් ලොව බිහිවී නැත. ඔහු රිටි පැනීමේ ඉසව්වෙන් තමන් තැබූ ලෝක වාර්තාවන්ම යළි යළිත් තමන් විසින්ම 35 වතාවක් බිඳ දමා ඇත. ලැරිස්සා ලැටියානිනාද එවැනිම වූ ලෝකයේ අග්‍රගණ්‍ය

ජිම්නාස්ටික් ක්‍රීඩිකාවකි. සෝවියට් දේශයේ පාසල්, කම්හල්, වැඩබිම් ආදී සෑම තැනකදීම නිරෝගි දිවියක් වෙනුවෙන් එම ජනතාව ක්‍රීඩා සහ ව්‍යායාම්වලට යොමු කරවනු ලැබිණි.

ක්‍රීඩා ක්ෂේත්‍රයේද මේ වන විට චීනය ඉදිරියට එමින් සිටින රටක් බවට පත්ව ඇත. 2008 බීජිං ඔලිම්පික් තරගාවලියේදී ලොව වැඩිම පදක්කම්ලාභියා වීමට චීනයට හැකි විය. ලෝකයේ සමාජවාදී කඳවුරේ බොහෝ රටවල් බිඳ වැටෙද්දී සමාජවාදයේ ධජය දරාගනිමින් චීනය තවමත් සමාජවාදී අපේක්ෂාවන් සහිතව ඉදිරියට යමින් සිටියි.

සමාජවාදී කියුබාවද 'සියලු දෙනාටම ක්‍රීඩාව ' යන තේමාව යටතේ එයට ප්‍රමුඛත්වයක් දී ඇත. හොඳ ක්‍රීඩකයින් පුහුණුකරුවන් ලෙස රටවල් 50කට වැඩි ප්‍රමාණයකට යවා ඇත. කියුබාවේ ක්‍රීඩාව පවතින උසස් මට්ටම මැනෙන උදාහරණයක් මෙසේය. 2012 වසරේ ලන්ඩන් ඔලිම්පික් උළෙලට රටවල් 200ක් සහභාගි විය. කෝටි 122ක ජනගහනයකින් යුත් ඉන්දියාව පවා එහිදී ලබා ගනු ලැබූයේ 55වැනි ස්ථානයයි. එහෙත් කියුබාව රන් පදක්කම් 05ක්ද රිදී 03ක්ද ලෝකඩ 07ක් වශයෙන් සමස්ත පදක්කම් ප්‍රමාණය 15ක් ලබමින් 16වැනි ස්ථානය දිනාගත්තේය. 2016 ඔලිම්පික් සත්කාරක වරම් ලබා සිටි ජනගහනය කෝටි 20.5ක් වූ බ්‍රසීලය පදක්කම් සටහනේ 22 ස්ථානයට පත්විය. 2016 රියෝ ඔලිම්පික් උළෙලෙහි කියුබාව රන් පදක්කම් 5ක්ද රිදී පදක්කම් 2ක්ද ලෝකඩ පදක්කම් 11ක්ද ලබමින් 18 වන ස්ථානයට පත් විය. නමුත් ජනගහනයට සාපේක්ෂව (ඒක පුද්ගල) ඔලිම්පික් පදක්කම් ලැබීම වැඩිම දෙවන රට කියුබාවයි. තවද ජනගහනයට සාපේක්ෂව අන්තර්ජාතික (ඒක පුද්ගල ) පදක්කම් ලැබීමේ වැඩිම රට කියුබාවයි. කියුබාවේ මුදලට ක්‍රීඩා කිරීමට වඩා විනෝදය වෙනුවෙන් ක්‍රීඩා කිරීම දිරිගන්වයි. වෘත්තීය ක්‍රීඩකයින් සිටින නමුත් තරග පාවා නොදෙන, මුදලට විකිණෙන්නේ නැති ක්‍රීඩා සදාචාරයක් එරට සතුවේ.

මෙසේ ක්‍රීඩාව තුළින් නීරෝගිමත් ජනතාවක්, විශිෂ්ට ගණයේ මිනිසුන් බිහි කරලමින් සමාජවාදය, මුදලට නොවන මානවයාගේ සතුට, විනෝදය, යහපත් සෞඛ්‍යය ප්‍රමුඛ කොටගත් ක්‍රීඩාවක් ප්‍රචලිත කළේය. ඒ තුළින් සමාජය වෙත නව ආශ්වාදයක් හා ජවයක් එක් කරන්නට සමත් විය.

## සෞඛ්‍ය තත්වය

සමාජවාදය ගොඩනැගීමේදීද, ඒ සඳහා නිෂ්පාදනය වැඩි දියුණු කිරීමේදීද ජනතාවගේ සෞඛ්‍ය සම්පන්න බව තීරණාත්මකය. මානව සම්පතෙහි කායික හා මානසික නිරෝගිභාවය නොමැති වූ තැන සමාජය දුබල වනවා මිස ධෛර්යයෙන් ඉදිරියට නොයයි. සෞඛ්‍ය සඳහා සමාජවාදී රජය දරනු ලබන වැය සහ වෙහෙස මඟින් මෙය තීරණය වේ. ධනවාදී රටවල සෞඛ්‍යය ඵලදායී සමාජ ආයෝජනයක් නොව පුද්ගලික ලාභය පදනම්වූ ප්‍රාග්ධන ආයෝජනයක් පමණකි.

කියුබාවේ විශේෂ ජයග්‍රහණයන් රාශියක් අතර සෞඛ්‍ය ක්ෂේත්‍රය යනු විශේෂයෙන්ම සැලකිල්ලට ලක්කළ යුතු එකකි. කියුබාවේ පෞද්ගලික රෝහල් හෝ සායන නොමැත. සෞඛ්‍ය වගකීම සහමුලින්ම රජය විසින් දරනු ලබයි. ආරම්භයේදී සෝවියට් දේශයේ ආධාර සහිතව කියුබාව තම සෞඛ්‍ය ක්ෂේත්‍රය වර්ධනය කරගත් අතර, අද වන විට ස්වාධීනවම එහි වර්ධනයක් ලබාගනිමින් සිටියි. කියුබාව තම දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 7.3ක් සෞඛ්‍යය වෙනුවෙන් වියදම් කරයි. සෞඛ්‍ය තත්වය ඉහළ නංවා ගැනීම තුළ කියුබානු ජනතාව 1959 දී වසර 58ක් වූ ආයු අපේක්ෂිත කාලය දැන් වසර 78ක් දක්වා වර්ධනය කොට ගෙන තිබේ. ඒ පිරිමියෙකුට වසර 78ක් සහ ගැහැනියකට වසර 80ක් වශයෙනි. ලෝකයේ ළදරු මරණ අනුපාතය පහළම රටවල් අතරින් තෙවන ස්ථානය කියුබාවට හිමිව තිබේ. 1959 කාලයේ 1000 කට 93.9ක් වූ කියුබානු ළදරු මරණ

අනුපාතය මේ වන විට 1000 කට 4.2ක් දක්වා අඩු කර තිබේ. මේ වන විට බොහෝ ලතින් ඇමරිකානු රටවල ළදරු මරණ අනුපාතය කියුබාවේ මෙන් දස ගුණයක පවතී. ඇමරිකා එක්සත් ජනපදයේ ළදරු මරණ අනුපාතය උපත් 1000කට 7ක් වශයෙන් කියුබාවට වඩා 2.8ක ඉහළ අගයක් ගනියි. 1957 කියුබානු ජනගහනය 1000,00කට (ලක්ෂය) වෛද්‍යවරුන් සහ දන්ත වෛද්‍යවරුන් 128ක් වූ අතර මේ වන විට ජනගහනය ලක්ෂයකට වෛද්‍යවරුන් 627ක් සහ දන්ත වෛද්‍යවරුන් 94ක් වශයෙන් සිටියි. එහෙත් තවමත් ඇමරිකා එක්සත් ජනපදයේ ජනගහනය ලක්ෂයකට වෛද්‍යවරුන් සිටින්නේ 225ක් හා දන්ත වෛද්‍යවරුන් 54ක් පමණි. ජනගහන අනුපාතයට අනුව කියුබාවේ වෛද්‍යවරුන් සංඛ්‍යාව ඇමරිකා එක්සත් ජනපදයට වඩා දෙගුණය ඉක්මවයි. ඒක ශීර්ෂ වශයෙන් බැලුවද කියුබාව ලොව වැඩිම වෛද්‍යවරුන් සිටින රටයි. එය 850,00කි. ඉන් 15,400ක් කියුබාවේ ජාත්‍යන්තර යුතුකම ඉටුකිරීම වෙනුවෙන් රටවල් 66ක සේවය කරති. කැරිබියානු කලාපයේ ඉතාමත් හොඳින් ඒඩ්ස් පාලනය කළ රට වන්නේද කියුබාවයි. ඒඩ්ස් රෝගීන් ප්‍රමාණය 2003 දී ජනගහනයෙන් සියයට 0.05ක් වූ අතර, අනෙකුත් කැරිබියානු දූපත් වල එම ප්‍රතිශතය සියයට 1ත් සියයට 4ත් අතර ප්‍රතිශතයකි.

වසංගත රෝග පාලනය අතින්ද කියුබාව ඉහළින්ම සිටින අතර ඩෙංගු වැනි මාරාන්තික රෝග සහමුලින්ම මැඩ පැවැත්වීමට කියුබාව සමත් විය. සමාජවාදී කියුබාවේ සෞඛ්‍ය සහ අධ්‍යාපන යන ක්ෂේත්‍ර දෙක අගය කිරීමෙන් වැළකීමට ධනේශ්වර ආයතනයන්ට පවා නොහැකිවී ඇත. BBC ආයතනය "විශිෂ්ටතම මහජන සේවය පවතින රට කියුබාව ලෙස හඳුන්වා ඇත. ලෝක සෞඛ්‍ය සංවිධානය සහ තවත් විවිධ සංවිධාන රාශියක්, කියුබානු සෞඛ්‍ය තත්වය පැසසුමට ලක් කරයි.

සමාජවාදී වියට්නාමයේද සෞඛ්‍යය තත්වය වර්ධනය ඉතා ප්‍රශස්ත මට්ටමක පවතී. වයස අවුරුදු 5ට අඩු දරුවන්ගෙන් මන්දපෝෂණයෙන් පෙළෙන ප්‍රමාණය 1995දී සියයට 51ක් වූ අතර 2010දී සියයට 18කි. ළදරු මරණ අනුපාතිකය 1990දී උපත් 1000කට මරණ 81කි. 2008 වසරේ දී එය මරණ 20 දක්වා පහත හෙළා ඇත. 1990දී මාතෘ මරණ සංඛ්‍යාව උපත් 100,000කට (ලක්ෂය) 223කි. 2007 වසරේදී එය උපත් 100,000 කට 56ක් බවට පහත හෙළා ඇත. වියට්නාම් ජනතාවගේ ආයු අපේක්ෂිත කාලය 1990 දී අවුරුදු 62කි. 2007දී එය අවුරුදු 72ක් බවට පත්කොට තිබේ.

මේ අතර උතුරු කොරියාවේ කර්මාන්ත ශාලා හා පතල් බිම් ආශ්‍රිතවද රෝහල් පිහිටුවා ඇත. එයින් බලාපොරොත්තු වන්නේ වැඩබිම් තුළදීම සෞඛ්‍ය දැනුම, රෝග වැළැක්වීම හා ප්‍රතිකාර ලබාදීමයි.

එනිසා සමාජවාදය නිරන්තරයෙන් නීරෝගිමත් සෞඛ්‍ය සම්පන්න ජනතාව තම සම්පත කොට සලකයි. ඒ අනුව සෞඛ්‍යය වෙනුවෙන් ජාතික ආර්ථිකයෙන් සැලකිය යුතු කොටසක් වෙන් කරයි. එබැවින් සමාජවාදය නිරන්තරයෙන් රෝග වැළැක්වීමේත්, රෝග සුවපත් කිරීමේත් කාර්යයේදී ජනතාවාදී ලෙස එහි ඉදිරියෙන්ම සිටියි.

## නව මිනිසා ගොඩනැගීම

අධ්‍යාපනය, විද්‍යා, තාක්ෂණය, කර්මාන්තය, කෘෂිකර්මාන්තය, ක්‍රීඩාව, සාහිත්‍යය, කලාව ආදී ලෙස ඕනෑම ක්ෂේත්‍රයක් ඔස්සේ සෝවියට් දේශය විප්ලවයෙන් පසු ලබාගත් සමාජවාදී ජයග්‍රහණයන් රාශියක් පිළිබඳව උදාහරණ පෙන්වා දිය හැකිය. සෝවියට් දේශයේ පමණක් නොව මුළු මහත් සමාජවාදී කලාපයේම අත්දැකීම මෙයයි. අද අප අතර ඉතිරිවී ඇති සමාජවාදී රටවල් ගත්තද ඒ සඳහා බොහෝ

උදාහරණ වෙයි. අද වන විට ලෝකයේ වේගයෙන්ම සංවර්ධනය වෙමින් පවතින රට වන්නේ සමාජවාදී චීනයයි. 2008 ඔලිම්පික් තරගාවලියේදී වැඩිම පදක්කම්ලාභී රට වූයේද සමාජවාදී චීනයයි. ලොව වැඩිම ජනගහනය සහිත රට වන චීනය එම සියලු ජනතාවන්ට ආහාර, අධ්‍යාපනය ලබාදීමට සමත්ව ඇත. එසේම ලොව හොඳම සෞඛ්‍ය ආරක්ෂාවක් සහිත රටවල් අතුරින් කියුබාවට ලැබී ඇත්තේ ඉහළම තැනයි. එය කිසිවකුට අභියෝග කළ හැකි දෙයක් නොවේ. ධනවාදී කඳවුරේ මහත් සම්බාධකයන් හමුවේ මේ වන විටද කියුබාව නොසැලී තම සමාජවාදී ආර්ථිකය පරෙස්සමින් ජනතා හිතකාමීව පවත්වා ගනිමින් සිටියි.

සමාජවාදය භෞතික වශයෙන් ලබාගන්නා ජයග්‍රහණයන් අතර තවත් සුවිශේෂී මෙන්ම අත්‍යවශ්‍ය වූ කරුණක්ද ඇත. එය නම් සමාජවාදය උදෙසා වන නව මිනිසකු ගොඩනැගීම පිළිබඳව වුවමනාව හා ක්‍රියාකාරිත්වයයි. සමාජවාදී සංවර්ධනයේ අඛණ්ඩ භූයක් ලෙස නව මිනිසා බිහි කිරීම පිළිබඳව වුවමනාව දිවයයි. සමාජවාදය ජයග්‍රහණය කිරීම උදෙසා පෞද්ගලික දේපළ ක්‍රමය තුළ තම ආත්මාර්ථය හෙවත් ලාභය මත සිතන, මතන, ජීවත්වන මිනිස් අංශුවක් වෙනුවට මුළු මහත් මානව වර්ගයාගේ පොදු යහපත උදෙසා සිතන, මතන, කටයුතු කරනු ලබන සාමූහික චින්තනය සහිත මිනිස් යෝධයකු අවශ්‍යය. විශේෂයෙන්ම අධ්‍යාපනයද සාහිත්‍යයද, කලාවද, ක්‍රීඩාවද, මේ අරමුණ පෙරදැරි කරගෙන උපයෝගී කරගැනීම සමාජවාදයේ ක්‍රමවේදයයි. ෂවර්ස් කරපෙත්යාන් යනු වසර කිහිපයක් තුළ පිහිනුම් ලෝක වාර්තා 17ක් පිහිටවූ ක්‍රීඩකයෙකි. ඔහු ලෝක ශූරතා 11ක් ලැබූවෙකි. මොහු සෝවියට් සමාජවාදය විසින් ගොඩ නගන ලද නව මිනිසා කෙසේද යන්නට දැවැන්ත උදාහරණයකි. සැබවින්ම ඔහු ලෝක ශූරයෙකි. එමෙන්ම ශ්‍රේෂ්ඨ වීරයෙකි. ඒ ක්‍රීඩා ජයග්‍රහණයන්ගෙන් පමණක් නොව පිරිපුන් මනුෂ්‍යත්වයෙනි. ප්‍රධාන

වශයෙන් අවස්ථා දෙකකදී ඔහු එය මැනවින් තහවුරු කොට තිබේ. ඒ 1976 සැප්තැම්බර් 16 වෙනිදාය. එදින තම සොයුරු කාමො සමග ෂවාර්ෂ් කර්පෙත්යාන් යෙරෙවාන් ජලාශය අසල පුහුණුව පිණිස දුවමින් සිටියේයය ඔවුහු කිලෝමීටර් 20 සම්පූර්ණ කළා පමණි. එක් වරම මහා හඬක් නගමින් ට්‍රොලි බස් රථයක් යාන්ත්‍රික දෝෂයක් හේතුවෙන් කරපෙත්යාන් සහ සොයුරා දුවමින් සිටි අසලින්ම ජලාශයට ඇද වැටිණ. ලොව දක්ෂතම ක්‍රීඩකයාටද වඩා ඉහළින් වන මානව ප්‍රේමියා ක්ෂණිකව ක්‍රියාත්මකව ගිලුණු බස් රථයේ සිටි මිනිසුන් බේරා ගැනීම සඳහා ජලාශයට පැන්නේය. කිලෝමීටර් 20ක් දිවයාමෙන් අධිකව උණුසුම්ව තිබූ සිරුරට ජලාශයේ අධික සීතල දරාගත නොහැකි තරම් විය. ජලාශය මීටර් 25ක් පමණ ගැඹුරු විය. බසය තිබූ ස්ථානයට ළඟාවීමට කරපෙත්යාන්ට මීටර් දහයක ගැඹුරට කිමිදෙන්නට සිදුවිය. ඔහු වහා ට්‍රොලි බසයේ පසුපස වීදුරුව සොයා ගත්තේය. ක්ෂණිකව එයට පා පහරක් එල්ල කොට ඔහු බසයේ සිරව සිටි මිනිසුන් පිටතට රැගෙන ඒම ආරම්භ කළේය. වීදුරුවට කැපී තම කකුලෙන් අධිකව ලේ ගලමින් තිබියදීම ඔහු ට්‍රොලි බසයේ සිරව සිටි මිනිසුන් ජලය මතු පිටට ගෙනවිත් තම සොයුරාට භාර කළේය. බස් රථයේ මගීහු 52ක් සිටියෝය. කාලය ඉතා සීමිත බව ඔහුට වැටහිණ. එක් එක් මිනිසකු වෙනුවෙන් තත්පර 30ක් 35කට පමණ වඩා වැය කළ නොහැකි විය. එබැවින් ඔහු වෙහෙස නොබලා අඛණ්ඩව අධික වේගයෙන් තම කාර්යයේ නියළිණ. ජීවිතාරක්ෂක බෝට්ටුද වහා ඒ අසලට පැමිණියේය. වහාම එතනට බසය ගොඩ ගැනීම පිණිස දොඹකර යන්ත්‍ර පැමිණෙන විට කරපෙත්යාන් විසින් විනාඩි 20ක් තුළ මිනිසුන් 20ක් බේරාගෙන තිබිණ. අවසන අධික ලෙස රුධිරය ගලායාමෙන් හා අයිස් මෙන් වන ජලයේ පොර බැදීම විසින් වෙහෙසව ඔහු ක්ලාන්ත විය. කරපෙත්යාන්ද රෝහල් ගත කෙරිණ. ඔහුට නැවත සිහිය එන්නටද බොහෝ කලක් ගත විය.

පසුව ගිලෙන්නට ගිය 'මිනිසුන් බේරා ගැනීම වෙනුවෙන් වූ විශේෂ සම්මානයෙන්'ද 'ගෞරවයේ පදක්කමෙන්'ද කරපෙත්යාන්ට ඔහුගේ වීර ක්‍රියාව වෙනුවෙන් පුදනු ලැබීය. 1985 පෙබරවාරි 19දා තවත් මෙවන් සිදුවීමක් වාර්තා විය. ඒ ඔහු තවත් වරෙක ගින්නට හසුවූ මිනිසුන් බේරා ගැනීම සඳහාද ජීවිත පරිත්‍යාගයෙන් සටන් වැදුණු අවස්ථාවයි. ඔහු මාර්ගයේ ගමන් කරමින් සිටියදී රුසියාවේ උස් ගොඩනැගිල්ලක ගින්නක් ඇතිව තිබෙනු දක්නා ලදී. එහිදී මිනිසුන් බේරා ගැනීම වෙනුවෙන් ඔහු වහා ගින්න අතරින් ගොඩනැගිල්ල තුළට කඩා වැදිණ. ගින්නට හසුවූවන් බේරා ගැනීමට ගන්නා ලද උත්සාහයේදී දැඩි ලෙස ඔහුගේ සිරුර පිලිස්සී තිබිණ. ඒ, සමාජවාදය යටතේ හැදී වැඩුණු ක්‍රීඩකයාය. එනම් තම ජීවිතය පරදුවට තබා හෝ මිනිසුන් වෙනුවෙන් කැපවන සමාජවාදී මිනිසාය. මේ ඒ සඳහා පුළුල් සාක්ෂි බොහොමයක් අතරින් විශිෂ්ටතම වූ එක් උදාහරණයක් පමණි. එහෙත් ධනවාදී ලෝකයෙන් අපට හමුවන්නේ මුදල් වෙනුවෙන් ඕනෑම පහත් තත්වයකට වැටෙන ක්‍රීඩකයන්ය. ශ්‍රී ලංකාවේද ඒ සඳහා වන උදාහරණයන් බොහොමයකි.

කියුබාවේ ප්‍රකට බොක්සිං සූරයකුවූ ටියෝෆිලෝ ස්ටීවන්සන්ට මුදල් සඳහා ක්‍රීඩා කිරීමට ලද ආරාධනයකදී ඔහු දක්වන ලද ප්‍රතිචාරයද මීට වෙනස් කදිම උදාහරණයකි. "ඇමරිකානු ඩොලර්වලට වඩා කියුබානු ජනතාවගේ ආදරය මට වටී" යන්න ඔහුගේ ප්‍රතිචාරය විය. එයින් ප්‍රකට වන්නේ සමාජවාදය උදෙසා නිර්මාණය වන මෙම නව මිනිසාගේ ස්ථිර සාර සහ මිනිසාට ප්‍රේම කරන ගුණයයි. මුදල් මත ගොඩනගන ආත්මාර්ථකාමිත්වය ඔහුගේ ඇගයීම් නොවේ. ගොර්කි, ෂෝලහොව්, අයිත්මාතව් ආදී දක්ෂ සාහිත්‍යකරුවන් රුසක් සමාජවාදය තුළ නිර්මාණය විය. දාර්ශනික සුභවාදය, සාමූහිකත්වය, පෞද්ගලික ජයග්‍රහණ වෙනුවට සාමූහික ජයග්‍රහණ අපේක්ෂා කිරීම, සමාජ සංවර්ධනය පිළිබඳව අපේක්ෂාවන්

ආදිය ඔවුහු භාවිතා කළ සමාජවාදී කලාව හා සාහිත්‍යය තුළ ගැබ් විය. එම කලා සාහිත්‍යමය බලපෑම් සමාජවාදී කලාපයට පමණක් නොව මුළු ලෝකයටම අද දක්වාත් ප්‍රබල බලපෑමක් සිදුකරයි.

සමාජවාදය ජනතාවට බොහෝ ජයග්‍රහණයන් ගෙන දුන්නද සමාජවාදී කඳවුර බිඳ වැටුණි. එයට හේතුව මාක්ස් ලෙනින්වාදයේ යල් පැන යාමක්ද? සමාජවාදය පිළිබඳ අත්හදා බැලීම්වල වරදක්ද? නැතිනම් ධනවාදයේ නිරවද්‍යතාවය තහවුරු කරන්නක්ද? යන්න විමසා බැලීම අපගේ කෘතියෙහි මූලික අරමුණයි. දැන් අප එම ඉලක්කය අරමුණු කොටගත් අධ්‍යයනයක් වෙත ප්‍රවේශ වෙමු.

මේ සියල්ල ගෙන බලන විට පැහැදිලි වන්නේ සමාජවාදය අතිශය සැලසුම් සහගතව, මධ්‍යගත මෙහෙයුමකින් යුක්තව තම රටවල ආර්ථිකය මෙන්ම ඒ හා බැඳුණු අධ්‍යාපනය, සාහිත්‍යය, සෞඛ්‍යය, ක්‍රීඩාව හා විද්‍යාත්මක දියුණුව ධනවාදයට වඩා බෙහෝ ඉදිරියෙන් මෙහෙයවමින් සිටි අතර පවතින සමාජවාදී රටවල්ද එසේ සිටින බවයි. එනිසාම එදා සෝවියට් දේශය, වර්තමානයේ චීනය ලෝකය තුළ ප්‍රබල භූමිකාවක් බවට පත්ව තිබේ. එමෙන්ම සෞඛ්‍යය, අධ්‍යාපනය, ක්‍රීඩාව ආදී විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ වත්මන් කියුබාවද ලොව ප්‍රබල භූමිකාවක් ඉටුකරමින් සිටියි. ධනවාදයට වඩා මෙම රටවල ජන ජීවිතය එසවී තිබුණේ නම් ඒවා බිඳවැටුණේ ඇයි යනුවෙන් ප්‍රශ්නයක් ඇතිවීම ස්වභාවිකය. මෙයින් ඉදිරියට ඒ සඳහා වන නිවැරදි පිළිතුර සොයාගන්නට අපි උත්සාහයක් දරමු.

# 5

# සමාජවාදී රාජ්‍ය පද්ධතිය බිඳවැටීමට හේතු

1991 සෝවියට් දේශය බිඳවැටීමත් සමග නැගෙනහිර යුරෝපීය සමාජවාදී රටවල් ඇතුළු සමාජවාදී කඳවුරේ රටවල් රැසක් බිඳ වැටුණි. මෙම බිඳ වැටීම ආරම්භ වුයේ, 1990 වසරේදී පෝලන්තයෙනි. සමාජවාදී කඳවුරේ බිඳවැටීම ලෝක වමේ ව්‍යාපාරයට විශාල බලපෑමක් හා පසුබෑමක් සිදුකළ අතර එය අධිරාජ්‍යවාදය ලබාගන්නා ලද තාවකාලික වූ ජයග්‍රහණයක් විය. මේ වන විට සෝවියට් දේශය ප්‍රමුඛ සමාජවාදී කඳවුරේ බිඳවැටීමෙන් දශක දෙකකට වැඩි කාලයක් ඉක්ම ගොස් තිබේ. සෝවියට් දේශයේ වැටීම පිළිබඳ විවිධ පාර්ශ්වයන් විවිධ හේතු හා විවිධ වූ විග්‍රහයන් ඉදිරිපත් කරමින් සිටී. මෙහි බොහෝ විග්‍රහයන් එකිනෙකාගේ පංති දෘෂ්ටීන්ගෙන් බලා සිදුකරන ඒවා වන අතර සමහර විග්‍රහයන් සිදුවීම් දෙස මතු පිටින් බලා කරන විග්‍රහයන්ද වේ. ලෝක ධනවාදය බරපතළ පසුබෑමකට ලක්ව සමාජවාදයට මාවත විවෘත කරමින් තිබෙන මේ මොහොතේ සමාජවාදී කඳවුරේ බිඳ වැටීමට බලපෑ සැබෑ හේතු හඳුනා ගැනීම ඉතා වැදගත්ය.

නොදියුණු සාර්වාදී වැඩවසම් රුසියාව දැවැන්ත හා ශක්තිමත් සමාජවාදී රාජ්‍යයක් බවට ගොඩනගා විද්‍යාවේ තාක්ෂණයේ මහා පෙරළි ඇතිකළ, 2වැනි ලෝක යුද්ධයේදී හිට්ලර්ගේ නාසිවාදය පරදා ලොවට විමුක්තිය උදාකළ, කාටත් පළමුව අභ්‍යවකාශය තරණය කළ, ලොව පුරා සමාජවාදී රාජ්‍යයන්ට මෙන්ම සෝවියට් කඳවුරට පක්ෂපාතී පසුගාමී ධනපති රටවල් රැසකට කිසිදු ආර්ථික ප්‍රතිලාභයක් බලාපොරොත්තු නොවී ආර්ථික වශයෙන් විශාල උදව් කළ, අධිරාජ්‍යවාදයට අභියෝග කරමින් මහා බලගතු රාජ්‍යයක් ලෙස පැවතුණ, තම රට තුළ නව සමාජයක්, නව මිනිසෙක් නිර්මාණය කරමින් සිටි සමාජවාදී සෝවියට් දේශය එක් රැයකින් කඩා වැටුණේ ඇයි? මෙය පුදුම එළවන සුළු සිදුවීමකි. මෙතරම් සවිමත් රාජ්‍යයක් මෙලෙස කඩා වැටීමට බොහෝ දෙනෙකුට තේරුම් ගැනීමට නොහැකි

කරුණක්ව ඇත. විවිධ අය විවිධ හේතු ඉදිරිපත් කරන්නේද මේ නිසාය. කෙසේ වෙතත් හේතුවක් නැති ඵලයක් මෙලොව පැවතිය නොහැක. සෝවියට් දේශය වැටීමට බලපෑ හේතු සාධක රැසක් තිබේ. ඒවා කුඩා කුඩා සරල සිදුවීම්වල සිට මහා සංකීර්ණ සිදුවීම්, කුමන්ත්‍රණ, පාවාදීම්, වැරදි වැටහීම්, වැරදි පියවරයන්, න්‍යායික පීලි පැනීම් දක්වා විශාල පරාසයක විහිදී පවතී. සෝවියට් දේශයේ බිඳවැටීම දින කිහිපයක් තුළ සිදුවූ සිදුවීමක් ලෙස පෙනුණද එම තත්වය දශක කිහිපයක් තිස්සේ ඇතිවූ ප්‍රමාණාත්මක වෙනස්කම් ගුණාත්මක පරිවර්තනයකට ලක්වීමක් විය. මේ නිසාම සෝවියට් දේශය බිඳවැටීමේ සැබෑ දේශපාලන හේතු අධ්‍යයනය කළ යුතුය. එහිදී අප මාක්ස් ලෙනින්වාදී ස්ථාවරයක සිට සියල්ල විග්‍රහ කරගතහොත් මෙය අවබෝධ කරගැනීම එතරම් අපහසු නැත.

"විප්ලවයක් ශීඝ්‍ර ජයග්‍රහණවල සිට බරපතළ පරාජිතවීම් දක්වා හදිසි ලෙස හැරෙන කාලයකදී, විප්ලවයේ සංවර්ධනයට අනිවාරණීය වශයෙන්ම බරපතළ හානි සිදුකරන ව්‍යාජ විප්ලවවාදී වදන් නිර්මාණය වීමේ කාලසීමාවක්, නිතරම හා සෑම විප්ලවයකදීම ඇතිවන බව ඉතිහාසයේ අත්දැකීම් අපට උගන්වයි. ඒ නිසා සහෝදරවරුනි; අපට අපගේ උපක්‍රම ගැන නිවැරදි ලෙස අගය කළ හැකි වන්නේ අප ශීඝ්‍ර පහසු හා පූර්ණ ජයග්‍රහණවල සිට බරපතළ පරාජිතවීම් දක්වා ආපස්සට විසි කළ සිදුවීම් ඇතිවූ ආකාරය ගැන සලකා බැලීම ආරම්භ කළ විට පමණි."

(ලෙනින් - තෝරාගත් කෘති, 8 වෙළුම, 18 පිටුව)

නැගෙනහිර යුරෝපීය රටවල් ඇතුළු බොහෝ සමාජවාදී රටවල බිඳවැටීම සිදුවූයේ සෝවියට් දේශය බිඳවැටීමත් සමග සම්බන්ධවී නිසා පළමුව සෝවියට් දේශය බිඳවැටීමට හේතුවූ ප්‍රධාන කරුණු වටහා ගැනීම අත්‍යවශ්‍යය. එය අපට සමස්තය වටහා

ගැනීමට උපකාරයක් වන්නේය. සෝවියට් දේශය බිඳ වැටීමට හේතු ප්‍රධාන කොටස් දෙකක් ලෙස තේරුම් ගත හැකිය. එනම් සමාජවාදී සෝවියට් දේශයෙහි අභ්‍යන්තර හේතු හා එයින් පිටත වන බාහිර හේතු වශයෙනි. මේ පිළිබඳව ලොකු කුඩා හේතු රාශියක් ඇතත් එහිදී ප්‍රධානතම හේතු කිහිපය ගෙන අධ්‍යයනය කිරීම අපගේ කාරණයට ප්‍රමාණවත් වේ. සෝවියට් දේශය බිඳවැටීමට හේතු වූ කාරණා සියල්ලෙහි හරය වන්නේ, ලෙනින්වාදයෙන් පිට පැනීම ජනතාවගේ දායකත්වය දුර්වලවීම, නිලධාරීවාදී පිරිහීම, රට තුළ සමාජවාදය බිඳ වැටීමක් ගැන කල්පනා නොකිරීම, අධිරාජ්‍යවාදීන්ගේ කුමන්ත්‍රණ හා මැදිහත්වීම්ය. එය තවදුරටත් විස්තරාත්මකව විමසා බලමු.

## ලෙනින්වාදයෙන් පිට පැනීම

ධනේශ්වර සංවර්ධනය පවා හරි හැටි සිදු නොවූ පසුගාමී රුසියාවේ සමාජවාදය ගොඩනැගීමේදී මුහුණ දුන් ගැටලු රැසක් තිබූ බවත්, එම ගැටලුවලට ලෙනින් විසින් විසඳුම් හා උපායමාර්ග සකස් කළ බව ආරම්භයේදීමත් අප සඳහන් කළෙමු. එහිදී ආර්ථිකයේදී 1919 වකවානුවේ නිෂ්පාදනය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් සුළු පරිමාණ පෞද්ගලික නිෂ්පාදනයට හා වෙළඳාමට ඉඩ දෙමින් ලෙනින් නව ආර්ථික ප්‍රතිපත්තිය (NEP) ඉදිරිපත් කළේය. එය තාවකාලික පියවරක් විය. එසේම 1918දීම ජර්මනිය විසින් ළදරු සමාජවාදී රුසියාව ආක්‍රමණය කිරීමට දැරූ ප්‍රයත්නය වළකා ගැනීම සඳහා ජර්මනිය සමඟ උපක්‍රමික අර්ථයෙන් බ්‍රෙෂ්ට් සාම ගිවිසුම අත්සන් කරන ලදී. ඉහත ක්‍රියාමාර්ග දෙක සමාජවාදය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් හා ඒ තුළ නිෂ්පාදනය වැඩිකිරීමේ අරමුණින් අනුගමනය කළ ඒවා විය. ඊට අමතරව ප්‍රධාන ක්‍රියාමාර්ගයක් ලෙස ලෝක විප්ලවය සඳහා නායකත්වය දීමට 1919දීම 3වන ජාත්‍යන්තරයද ගොඩනගනු ලැබීය. හේතුව සෝවියට් දේශයේ සැබෑ ආරක්ෂාව හා

පැවැත්ම රඳා පැවැතියේ ලෝක සමාජවාදී විප්ලවය තුළ නිසාය. සෝවියට් දේශයේ සමාජවාදී විප්ලවයේ පැවැත්ම රඳා පැවැතියේ ලෝක විප්ලවය මත බව අවධාරණය කළ ලෙනින් ඒ සඳහාද උපක්‍රම සකස් කළේය. 1918 අප්‍රේල් 23 දා ලෙනින් මෙසේ පැවසීය

"අපේ නොදියුණුභාවය විසින් අප ඉදිරියට තල්ලුකොට දමා තිබේ. අනෙක් රටවල නැගී සිටින කම්කරුවන්ගේ බල සම්පන්න සහයෝගය අපට ලැබෙන තෙක් අපට අල්ලා සිටිය නොහැකි වුවහොත් අප වැනසී යනු ඇත."

(උපුටා ගැනීම - අවස්ථාවාදයද? නිර්ධන පංති ජාත්‍යන්තරවාදයද? රෝහණ විජේවීර)

එලෙස පැවසූ ලෙනින් යළි 1920 දී තවදුරටත් මෙලෙසින්ද අවධාරණය කළේය.

"අපි අපේ වැඩ කටයුතු පටන් ගෙන තිබුණේ මුළුමනින්ම ලෝක විප්ලවයේ බලාපොරොත්තුවෙන් බැවින් අපේ ජයග්‍රහණය ජයග්‍රහණයක් වනු ඇත්තේ, අපේ අභිප්‍රාය සමස්ත ලෝකයේම විජයග්‍රාහී වන්නේ නම් පමණක් යැයි අප එකල දැන සිටියෙමු."

(ලෙනින් 1920 ඔක් 06 විප්ලවයේ 3 සංවත්සරය වෙනුවෙන් කළ කථාවෙන් - උපුටා ගැනීම අවස්ථාවාදයද? නිර්ධන පංති ජාත්‍යන්තරවාදයද? - රෝහණ විජේවීර)

මෙසේ ලෙනින් 1918 බ්‍රෙෂ්ට් සාම ගිවිසුමට අදාළව පැවසුවේද "ජර්මනියේ විප්ලවයක් සිදුවීමෙන් තොරව අප වැනසී යන බව ඒකාන්ත සත්‍යය වන බැවින් මේ අපට පාඩමකි." යනුවෙනි. කිසියම් රටක, විශේෂයෙන් සංවර්ධනයේ පිටුපසින් සිටින රුසියාව වැනි රටක සමාජවාදී විප්ලවය ජයගත්තද, එයට හුදකලාව, තනිවම තම රට තුළ සමාජවාදය ගොඩනගමින් අධිරාජ්‍යවාදී ප්‍රහාර මැද දිගු කලක් අල්ලාගෙන සිටීමට හෝ ලෝක විප්ලවය තෙක් දිගු කලක්

කල් බලමින් සිටීම දුෂ්කරය. රුසියාවේ සමාජවාදය මුහුණ දෙන මෙම බරපතළ අභියෝගය ලෙනින් දුටුවේය. සෝවියට් දේශයට තනිවම ධනවාදී ලෝකය තුළ බොහෝ කලක් බලය රැකගත නොහැකි බවත්, ඒ සඳහා ලෝක විප්ලවයේ අවශ්‍යතාවය එලෙස දැඩිව අවධාරණය කළ ලෙනින් විසින් මෙම තත්වයට මුහුණදීම සඳහා ලෝක විප්ලවය ඉලක්ක කරගත් ක්‍රියාමාර්ගද ගනු ලැබුවේය. ඒ අනුව,

- 1919 දී 3වැනි ජාත්‍යන්තරය පිහිටුවීම
- ජාතික විමුක්ති අරගල පිළිබඳ උපායමාර්ගය ඉදිරිපත් කිරීම
- ධනේශ්වර නොවන සංවර්ධන මාවත ඉදිරිපත් කිරීම වැනි ක්‍රියාමාර්ග රැසක් ගන්නා ලදී.

එහෙත් ලෙනින්ගේ මරණයෙන් පසු සෝවියට් දේශයේ සිදුවූ න්‍යායික හා දේශපාලනික පීළිපැනීම් නිසා ඉහත උපක්‍රම වෙනස්වී වැරදි ක්‍රම භාවිතයට නැගිණි. එම ක්‍රමෝපායන් සමාජවාදය එහි නිවැරදි ගමන් මගෙන් පිට පැන්නවීම් බවට පත්විය. ඒවා විස්තරාත්මකව අධ්‍යයනය කිරීම මෙහිදී ඉතා වැදගත්ය. අධ්‍යයනයේ පහසුව සඳහා එම කරුණු අභ්‍යන්තර හා බාහිර හේතු වශයෙන් ගෙන විග්‍රහ කිරීම වඩා පහසුවේ.

## සෝවියට් දේශය බිඳවැටීමට බලපෑ අභ්‍යන්තර හේතු

සැබවින්ම සෝවියට් දේශය බිඳවැටීමක් පමණක් නොව බිඳවැට්ටවීමක්ද විය. සෝවියට් දේශය බිඳදැමීම සඳහා දිවා රෑ නොබලා කටයුතු කළ අධිරාජ්‍යවාදයට ඒ සඳහා අවස්ථා හා ඉඩකඩ සැලසුණේ සෝවියට් දේශයේ තිබූ අභ්‍යන්තර ගැටලු හා දුර්වලකම් නිසාය. ඉන් ප්‍රධානම කරුණු විමසා බැලිය යුතුය.

## 1. ජාත්‍යන්තරය හා ජාත්‍යන්තරවාදය අත්හැරීම

ලෙනින්ගේ මරණින් පසු සෝවියට් දේශයේ හා කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වයට පත් වූයේ ස්ටාලින්ය. රුසියාවේ සමාජවාදී රාජ්‍යය රැකගනිමින් සෝවියට් දේශය නිර්මාණය කිරීමටත් දෙවැනි ලෝක යුද්ධයේදී සෝවියට් දේශය ජයග්‍රහණය කරා මෙහෙයවීමටත් රුසියාව කාර්මීකරණය කිරීමටත් ස්ටාලින් කළ කාර්යයද අවකත්සේරු කළ යුතු නැත. එහෙත් ඔහු දේශපාලනයේදී නිලධාරීවාදී ගති පෙන්වූ අයෙක් වූ අතර ලෙනින්වාදී උගැන්වීම් හා උපක්‍රම නොසලකා කටයුතු කිරීම ඇරඹීය. එයින් ලෝක විප්ලවය ඉලක්ක කර ගනිමින් සකස් කළ ලෙනින්වාදී උගැන්වීම්, උපායමාර්ග දුර්වල වූ අතර සෝවියට් දේශයේ සමාජවාදය ගොඩනැගීම ගැන මාක්ස් ලෙනින්වාදයට පටහැණි සටන්පාඨ ඉදිරිපත් කෙරිණ. මෙහි ආරම්භය වුයේ 1928 දී 3 වන ජාත්‍යන්තරයේ 6 වන සමුළුවට ස්ටාලින් වෙනුවෙන් බුහාරින් විසින් 'තනි රටක සමාජවාදය' නම් සංකල්පය ඉදිරිපත් කිරීමය. මෙමගින් ජාත්‍යන්තරවාදය හා ජාත්‍යන්තර සහයෝගය හෑල්ලු කළ අතර එක් රටක් තුළ සමාජවාදය ගොඩනැගීමේ හැකියාව සහතික කරන ලදී. මෙය හුදකලා සටන්පාඨයක් නොවූ අතර මේ හා බැඳුණු සටන් පාඨ හා උපායමාර්ග කීපයක්ම වරින් වර ඉදිරිපත් විය. එය අවසානයේ සෝවියට් දේශය තුළ තනිවම කොමියුනිස්ට් සමාජයක් ගොඩනැගීමේ සටන් පාඨය දක්වා වර්ධනය විය. සෝවියට් දේශය තනිවම කොමියුනිස්ට් ක්‍රමයට යාමේ සිහිනය තුළ ජාත්‍යන්තරවාදය දුර්වල විය. එසේම 1935 ජූලි 25 - අගෝස්තු 20 පැවැත්වූ 3 වන ජාත්‍යන්තරයේ 7 වන සමුළුවට ස්ටාලින් වෙනුවෙන් බල්ගේරියානු කොමියුනිස්ට් පක්ෂයේ නායක ජෝර්ජ් දිමිත්‍රොව් විසින් ෆැසිස්ට්වාදයට එරෙහි 'මහජන පෙරමුණු න්‍යාය' ඉදිරිපත් කළේය. මෙහි ප්‍රකාශිත අරමුණ වූයේ, නැගී එන ෆැසිස්ට්වාදයට එරෙහිව ෆැසිස්ට් විරෝධී මහජන පෙරමුණක් ගොඩනැගීමය. එහෙත් මෙම සටන්

පාඨය ලොව බොහෝ කොමියුනිස්ට් පක්ෂ ධනේශ්වර සන්ධානවලට යාමට හා පංති සහයෝගිතාවයට වැටීමට මග පාදාලීය. පසු කලෙක ස්ටාලින්වාදී උගැන්වීම්වලට අනුව 'ජාතික ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය' ලෙසත් මාවෝවාදී ඉගැන්වීම්වලට අනුව' මහජන ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය' ලෙසත් විප්ලවය අවධිවලට බෙදා අවධි තුළින් සමාජවාදයට යාමේ නිර්මාක්ස්වාදී චින්තනයට මඟ පෙන්වූයේද මෙම සටන් පාඨයමය. මේ අනුව ජාතික විමුක්ති අරගල පැවැති බොහෝ රටවල කොමියුනිස්ට් පක්ෂ අරගලයේ නායකත්වය තමන් අතට ගන්නවා වෙනුවට ධනපති පංතිය ප්‍රමුඛ එක්සත් පෙරමුණුවලට ඒවා පවරා දෙන ලදී. 1965 ඉන්දුනීසියාව මීට හොඳම උදාහරණය වේ. රටේ ජනගහනයෙන් තුනෙන් එකක් කොමියුනිස්ට් පක්ෂ සාමාජිකයන්ව සිටි විශාලතම කොමියුනිස්ට් පක්ෂයක් වූ එය සුකර්ණෝගේ ධනේශ්වර පක්‍ෂය සමඟ එක්ව පෙරමුණක් ගොඩනගා 1960දී සභාග ආණ්ඩුවක්ද පිහිටුවීය. ජාතිකවාදයත් කොමියුනිස්ට්වාදයත් එක්කර Nationalist හා Communist යන වචන එක්කර NASACOM (නසකොම්) යන සංකල්පය ගොඩනැගීය. එහෙත් එය 1965 දී එම පංති සහයෝගිතා දේශපාලනය තුළ කොමියුනිස්ට් පක්‍ෂය සමූල ඝාතනයකට ලක්විය. අද දක්වාම ඉන්දුනීසියානු නිර්ධන පංතියට එම පසුබෑමෙන් ගොඩ ඒමට නොහැකිවී ඇත. ආරම්භයේදී සෝවියට් දේශයේ මග පෙන්වීම මත චීනය තුළද එක්සත් පෙරමුණු ගොඩනගන ලදී. ලොව බොහෝ ආසියානු, අප්‍රිකානු, ලතින් ඇමරිකානු කලාපවල මෙම එක්සත් පෙරමුණු දැකිය හැකිවූ අතර එයද ලෝක සමාජවාදී විප්ලවයට හානි කළේය. සමාජවාදී විප්ලවය අවදිවලට වෙන්කර එහි පළමු අවදිය ජාතික ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය හෝ මහජන ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය ලෙස නම්කළ අතර එක් ඒක රටවල සිටි ඊනියා ප්‍රගතිශීලී ධනපති පංතිය සමඟ පෙරමුණු ඇටවීමට කොමියුනිස්ට් පක්‍ෂ පොළඹවන ලදී. ධනපති පංතිය ප්‍රගතිශීලී වූයේ ධනපති ක්‍රමය බිහිවන අවධියේදීය.

ඒ, ඔවුන් එවකට ධනේශ්වර විප්ලවයට පක්ෂපාතීව සිටි නිසාය. ධනපති ක්‍රමය සමාජ ක්‍රමයක් ලෙසින් තම සංවර්ධනය අවසන් කොට ඇති තත්වයක් තුළ දැන් ධනපති ක්‍රමය සමාජවාදී සමාජ විප්ලවයට සතුරුය. විශේෂයෙන්ම සමාජවාදී විප්ලවයේ යුගය වන මේ මොහොතේ ධනපති පංතිය ප්‍රතිගාමිය. ඔවුහු පංතියක් ලෙසින් සමාජවාදී සමාජ විප්ලවයට බාධා කරමින් සිටිති. එබැවින් සමාජවාදී විප්ලවයේදී ධනපති පංතියට විප්ලවීය කාර්යභාරයක් නැත. සමාජවාදී සමාජ විප්ලවය නිර්ධන පංතියේ කාර්යයකි. ධනපති පංතිය හා එක්ව නිර්ධන පංතියට කළ හැකි විප්ලවයක් නැත. එනිසා එක්සත් පෙරමුණු න්‍යාය මාක්ස් ලෙනින්වාදය පිළි පැන්නවීමකි.

එසේම 1943 දෙවන ලෝක යුද්ධය අවසන් වෙමින් තිබියදී ස්ටාලින් විසින් 3වැනි ජාත්‍යන්තරය විසුරුවා හරින ලදී. ඒ සමගම ලෝක සමාජවාදී ව්‍යාපාරයට ලැබිය යුතු නායකත්වය නැතිව ගියේය. එම තත්වය ලෝක විප්ලවයට බලවත්සේ හානි ගෙන දුන්නේය. 1953 ස්ටාලින්ගේ මරණයෙන් පසුවද මෙම පිළි පැනීම් වඩ වඩාත් වැඩියෙන් සිදුවන්නට විය. 1961 ඔක්තෝබර් පැවැත්වූ සෝවියට් කොමියුනිස්ට් පක්ෂයේ 23 වන සමුළුවේදි චීන - සෝවියට් මතභේදය ප්‍රකාශයට පත්වීමත් සමඟ සමාජවාදී කඳවුරේ අභ්‍යන්තර ගැටුම් ආරම්භ වන්නට විය.

ඊට අමතරව සෝවියට් නායක කෲෂෙව් විසින් සෝවියට් දේශය තව "වසර විස්සකින් කොමියුනිස්ට් සමාජයක්" (communism in 20 years) බවට පත් කරන්නේය යන සටන් පාඨය ඉදිරිපත් කළේය. මෙය ලෙනින්ගේ ඉගැන්වීම්වලින් සහ මාක්ස්වාදීයේ මූලික සිද්ධාන්තවලින් මුළුමනින්ම පිට පැනීමක් වූ අතර එය බුහාරින්ගේ 'තනි රටේ සමාජවාදය' නම් මතය තවදුරටත් ඉදිරියට ගෙනයාමක් විය. තනි රටක් තුළ කොමියුනිස්ට් සමාජයක් ගොඩනැගීය නොහැකිය යන මාක්ස් ලෙනින්වාදී මූලික සිද්ධාන්තය මෙහිදී නොසලකා හරින

ලද අතර ඒවා විකෘති කරන ලදී. 1960 දශකයේදී සෝවියට් දේශය වර්ධිත සමාජවාදය නම් තත්වයට පැමිණ ඇති බවත් එය ආපසු හැරවිය නොහැකි බවටත් මතයක් ඉදිරිපත් කළේය. සෝවියට් දේශය රැකගැනීමේ අවදානම ඉන් අත්හළ අතර ලෝක විප්ලවයද අත්හරින ලදී. ඒ, සෝවියට් දේශයට තනිවම කොමියුනිස්ට්වාදයට යා හැකිය යන මිත්‍යාව නිසාය. මෙම වැරැදි සටන් පාඨය හා ප්‍රතිපත්ති සෝවියට් දේශයේ සමාජවාදී ගමන් මගට විශාල හානිකර බලපෑමක් කළේය. මේ නිසා ලෝක සමාජවාදී විප්ලවය සිදුනොවී සෝවියට් දේශයට දියුණු ධනපති රටවල් මධ්‍යයේ එහි කුමන්ත්‍රණවලට ලක්වෙමින් දිගු කලක් පැවැතීමට සිදු විය. එහිදී සෝවියට් දේශය අධිරාජ්‍යවාදී රටවල් සමග 'සාමකාමී සහජීවනය'නම් ප්‍රතිපත්තියද 1960 දශකයේ සිට ක්‍රියාවට නැගීය.

සෝවියට් දේශය වර්ධිත සමාජවාදී තත්වයට පැමිණීමත් සමඟ නිර්ධන පංති රාජ්‍ය බලය තමන් විසින්ම දුර්වල කරගනු ලැබිණ. ඊට හොඳම උදාහරණය 1961 ඔක්තෝබරයේ පැවති සෝවියට් කොමියුනිස්ට් පක්ෂයේ 23වැනි සමුළුවේදී ඉදිරිපත් වූ මෙම අදහසය. එනම් "නිර්ධන පංති ආඥාදායකත්වය තම ඓතිහාසික කාර්යභාරය සම්පූර්ණ කර ඇත. සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුවේ අභ්‍යන්තර සංවර්ධනයේ දෘෂ්ටිකෝණයට අනුව බලන විට එහි අවශ්‍යතාවය අවසන්ය. නිර්ධන පංති ආඥාදායකත්වයේ රාජ්‍යය ලෙස පෙනුණු රාජ්‍යය දැන් සමස්ත සමාජයේ රාජ්‍යයයි.

...නිර්ධන පංති ආඥාදායකත්වය තම අවශ්‍යතාවේ භූමිකාව අහෝසි කරගෙන ඇතැයි යන විශ්වාසය මත පක්ෂය කටයුතු කරයි."

මෙය ලෙනින්වාදය නොව ඉන් මුළුමනින්ම පිට පැනීමකි. රාජ්‍ය බලය පිළිබඳ ලෙනින්වාදී උගැන්වීම් අත්හැරීමකි. සමාජවාදී සංක්‍රමණ අවදිය තුළ නිර්ධන පංති රාජ්‍යයේ අවශ්‍යතාවය ලෙනින්

බොහෝ විට අවධාරණය කොට තිබුණද මෙහිදී එය අත්හරින ලදී, සෝවියට් දේශය බිඳ දැමීමේදී එය සතුරන්ට වඩාත් වාසිදායකද විය.

බ්‍රෙෂ්නෙෆ්ගේ යුගයේ තහවුරු වූ "සාමකාමී සහජීවනය" හා "නිරවි යුද්ධය"යන සටන්පාඨ හා ක්‍රියාමාර්ග ලෝක බලවතුන් අතර යුද තරගය අඩු කිරීමේ යුද අවදානමින් මිදීමේ අර්ථයෙන් යහපත්සේ පෙනුණද සමාජවාදයේ අවශ්‍යතාවයන්ගේ දෘෂ්ටියෙන් බලන විට අධිරාජ්‍යවාදයට වාසිදායක විය. මින් වැඩිම රැකවරණය ලබා ගත්තේත් සෝවියට් දේශයට එරෙහි මතවාදී පෙරමුණේ සටනට ඉඩ ලබාගත්තේත් අධිරාජ්‍යවාදයය. සමස්ත සෝවියට් පුරවැසියා අධිරාජ්‍යවාදයට එරෙහිව සමාජවාදය ගොඩනැගීම වෙනුවෙන් හා එය ආරක්ෂා කිරීම වෙනුවෙන් අවදියෙන් සිට සටන්කරන්නෙකුගේ තත්වයට පත්කොට මෙහෙයවනවා වෙනුවට සෝවියට් පුරවැසියා නරඹන්නෙකුගේ තත්වයට, සාමකාමී සහජීවනයට අනුව පාඩුවේ වැඩක් බලාගෙන සිටින්නෙකුගේ තත්වයට පත්කළ අතර පසුව අධිරාජ්‍යවාදී රටවල ඇතැයි කියූ 'ඊනියා නිදහස' හා විවිධ පාරිභෝගික භාණ්ඩ අගයන්නෙකුගේ තත්වයටද පත්කළේය. එය සෝවියට් ජනයා බලා සිටියදීම සෝවියට් සමාජය බිඳවැටීමට එහි සතුරන්ට අවස්ථාව සලසා දුන්නේය.

## 2. නිලධාරිවාදය තහවුරුවීම

ජාත්‍යන්තරවාදය අත්හැරීමට අමතරව සෝවියට් දේශය බිඳවැටීමට හේතු වන තවත් කාරණයක් වන්නේ සමාජවාදී අවධිය තුළ නිලධාරිවාදය තහවුරුවීමයි. නිලධාරිවාදය පාලනය කිරීම සඳහා නිර්දේශිත ලෙනින්ගේ උගැන්වීම් නොසලකා හැරි අතර ඒ නිසා නිලධාරිවාදය සෝවියට් රාජ්‍යය තුළ තහවුරු විය. මෙය පක්ෂය, නායකයින්ගෙන් දුරස් කිරීමට සහ පොදු ජනයා, පක්ෂයෙන් දුරස්

කිරීමටත් හේතු විය. කියුබාවේදී ෆිදෙල්, ජනතාව සමග පවත්වන සම්බන්ධය හා පුද්ගල වරප්‍රසාදවලට එරෙහිව හා පුද්ගල ප්‍රතිරූප ගොඩනැංවීමට එරෙහිව ගෙන යන ආදර්ශය සමග සසඳන විට, සෝවියට් නායකයින්ගේ නිලධාරිවාදය කෙතරම් බරපතළ දැයි වටහා ගැනීම එතරම් අපහසු නැත. මෙම නිලධාරිවාදී නායකයෝ සමාජවාදය තුළ වරප්‍රසාද භුක්ති විඳීම සඳහා තම නිලය, වගකීම ලැජ්ජා විරහිත ලෙස භාවිතා කළෝය. පසුගාමී සංවර්ධනයක් සහිත රටක සමාජවාදය ගොඩනගන විට ඒ තුළ නිලධාරිවාදය මතුවීමේ අනතුර ලෙනින් දුටුවේය. ඒ සඳහා ඔහු ක්‍රියාමාර්ගද යෝජනා කළේය. ස්ටාලින් පක්ෂයේ ප්‍රධාන ලේකම් තනතුරට පත්වීමෙන් ලබාගත් අසීමිත බලය පරිස්සමෙන් පාවිච්චි නොකරනු ඇති බව 1922 දෙසැම්බරයේ අග පැවති පක්ෂ සමුළුවට ලිපියක් ලියමින් ලෙනින් අවධාරණය කළේය. එහිදී මධ්‍යම කාරක සභාවේ සංඛ්‍යාව 100ක් දක්වා වැඩිකරන ලෙසත් ඊට කම්කරුවන් අතරින් වැඩි ප්‍රමාණය බඳවා ගන්නා ලෙසත් යෝජනා කළ ලෙනින් යළිත් 1922 දෙසැම්බර් 24 ලිපියක් ලියමින් සඳහන් කළේ ස්ටාලින් අධි ගොරහැඩි බවත් ඒ නිසා ප්‍රධාන ලේකම් ධුරයෙන් ඔහු ඉවත් කොට ඔහුට වඩා ඉවසිලිවත්, සහෝදරවරුන්ට ලැදි වඩාත් ආචාරශීලී අයෙක් පත්කර ගන්නා ලෙසත්ය. ලෙනින් මේ වනවිට විස කැවූ වෙඩි උණ්ඩයක් වැදීමෙන් බරපතළ අසනීප තත්වයෙන් සිටි අතර මෙම යෝජනා ක්‍රියාවට නැගුණේ නැත.

අනෙක් අතට නිලධාරිවාදය යනු පුද්ගල වැරැද්දක්ම නොවන බවත් එය උපදින්නේ සමාජයේ සංස්කෘතිකමය පසුගාමීත්වය හා සියලුදෙනාට අවශ්‍ය තරම් ලබාදීමට නොහැකි තරම් නිෂ්පදනය දුර්වල වීම නිසා බවත් ලෙනින් අවධාරණය කර තිබුණි. ඒ නිසාම නිලධාරීවාදය පාලනය කිරීමට ගෙන තිබූ පියවරයන් ක්‍රියාත්මක නොවීම නිසා නිලධාරිවාදය වර්ධනය විය. සෝවියට් දේශයේ බලය

ජනතාවගේ බලයක් වනවා වෙනුවට ජනතාවගෙන් වියෝ වූ බලයක් බවට පත්විය. ජනතාව හා පාලනය අතර ප්‍රතිවිරෝධයක් හා ජනතාව තුළ අතෘප්තියක්ද නිර්මාණය විය. අධිරාජ්‍යවාදය විසින් උපයෝගී කර ගන්නේ ජනතාව තුළ පැවති එම මනෝභාවයය.

## 3. සමාජ ආර්ථික නවීකරණයන් නොවීම

සෝවියට් දේශය ආරම්භයේදී විද්‍යාවේ හා තාක්‍ෂණයේ මහා වර්ධනයක් පෙන්නුම් කළද අවි තැනීමේදී අභ්‍යවකාශ වැඩපිළිවෙළේදී විශාල වර්ධනයක් පෙන්නුම් කළද පාරිභෝගික භාණ්ඩ නිපදවීමේදී සමහර අත්‍යවශ්‍ය නවීකරණයන් හා වෙනස්කම් නොසලකා හැරි බව පෙනේ. මේ නිසා කලානුරූපව හා වෙනස් වන තත්වයන් තුළ සමාජ ආර්ථික වශයෙන් අවශ්‍ය නවීකරණයන් සෝවියට් දේශය තුළ නොවීමද සමාජවාදය අභියෝගයට ලක්වීමට කිසියම් පමණකින් හෝ හේතුවූ බව පෙනී යයි. මෙයින් අදහස් වන්නේ සෝවියට් දේශය තුළ විද්‍යාවේ හා තාක්ෂණයේ දියුණුව නොතිබුණු බව නොවේ. එය එක්සත් ජනපදය පරදවන මට්ටමක තිබුණි. එහෙත් පාරිභෝගික භාණ්ඩ නිපදවීමේදී හා සමහර නිෂ්පාදන හා සේවා ක්ෂේත්‍රවල ඒවායේ ගුණය පමණක් ගැන සිතූ අතර පෙනුම ගැන එතරම් තැකීමක් කෙරුණේ නැත. මේ නිසා ධනේශ්වර භාණ්ඩවල බාහිර ආකර්ෂණය එක් විටෙක තරුණ පරපුර ඒ වෙත ඇද ගැනීමට හේතු විය. මෙම තත්වය සෝවියට් ජනතාව ධනේශ්වර වෙළඳ භාණ්ඩ වෙත ආකර්ෂණය කරගැනීමට අධිරාජ්‍යවාදීන්ට උපකාරී විය. අධිරාජ්‍යවාදී ප්‍රචාරක මාධ්‍යයන් හරහා විසුරුවාහළ විවිධ සිසිල් බීම පිළිබඳ දැන්වීම් පවා සෝවියට් තරුණයා මංමුළා කිරීමට තරම් සමත් විය. ඒ තුළ ඔවුන් දුටුවේ ධනපති ලෝකය විශ්මලන්තයක් ලෙසය.

## 4. සමාජවාදී අධ්‍යාපනය දුර්වල වීමෙන් ජනතාවගේ දායකත්වයක් නොලැබීයාම

අඛණ්ඩ මතවාදී අරගලයක්, සමාජවාදී අධ්‍යාපනයක් හා ජනතාව සමාජවාදය ගොඩනැගීමට දායක කරගැනීමේ ක්‍රියාවලිය දුර්වලව තිබීමද එම රටවල සමාජවාදය බිඳවැටීමට හේතුවක් විය. කෙසේ හෝ නව පරපුරේ සමාජවාදය ගැන හැඟීම දුර්වලවී තිබුණි. එය ජනතාව වෙත මතවාදය අඛණ්ඩව ගෙන නොයෑම හා සමාජවාදය පිළිබඳ අදහස කුළු ගැන්වීමේ දුබලකම නිසා වන්නකි. ඒ පිළිබඳව ෆිදෙල් පවසන්නේ මෙසේය.

"විප්ලවය එය විසින්ම ආරක්ෂා විය යුතුයි. එය ආරක්ෂා වන්නේ එලෙසයි. අපට න්‍යෂ්ටික අවි තිබීම නිසා හෝ අප පොහොසත් නිසා එය ආරක්ෂා වන්නේ නැහැ. අප වසර 40 ක සම්බාධකවලට මුහුණ දුන්නා. විවිධ බාධක හිරිහැර මැද අප විශේෂ දුෂ්කර කාලයක් පසු කළා. කිසිම රටක් ජනතාවගේ සහයෙන් තොරව එලෙස ආරක්ෂා වන්නේ නැහැ. ජනතාවගේ දේශපාලන කැමැත්ත නැතිව එසේ වන්නේ නැහැ."

## 5. ගොර්බචෝෆ්ගේ ප්‍රතිසංස්කරණයන්

සෝවියට් දේශය තුළ නිර්මාණය වෙමින් තිබූ නිලධාරිවාදය, ආර්ථිකයේ එක තැන පල්වීම, නිෂ්පාදන ආයතනවල කාර්යක්ෂමතාවය පහළ වැටීම වැනි අර්බුදවලට පිළියම් සෙවීමට අවසන් සෝවියට් නායක ගොර්බචෝෆ් ඉදිරිපත් කළ විසඳුම් වූයේ දේශපාලන නිදහස්කරණය (ග්ලාස්නොස්ට්) හා ආර්ථික ප්‍රතිසංස්කරණ (පෙරෙස්ත්‍රොයිකාව)යයි.

ඔහු පෙරෙස්ත්‍රොයිකාව ලෙනින්ගේ (NEP) වැඩපිළිවෙළට නව පණ දීමක් ලෙස හඳුන්වන ලදී. එහෙත් මෙම ක්‍රියාමාර්ග වලින් විශේෂයෙන් ග්ලාස්ට්නොට්වලින් සෝවියට් රාජ්‍ය බලය දුර්වල විය. සමාජවාදය ගොඩනගමින් පවත්වාගෙන යාමට අත්‍යවශ්‍ය දෙය

වූ නිර්ධන පංති රාජ්‍ය බලය දුර්වලවීම බාහිර මෙන්ම අභ්‍යන්තර සතුරන්ට වාසිදායක විය. සමාජවාදය බිඳ වැටෙද්දී සෝවියට් රතු හමුදාව අක්‍රීයව සිටීම විසින්ද මෙය තහවුරු වේ. ප්‍රමාණාත්මකව පිරිහෙමින් තිබූ සෝවියට් දේශය, ගුණාත්මක බිඳවැටීමක් බවට පත් කිරීමට ආසන්න සිද්ධිය ලෙස ගොර්බචෝෆ්ගේ ප්‍රතිසංස්කරණ හේතු විය.

(ගොර්බචෝෆ්ගේ සමාජවාදය ආපසු හරවන ප්‍රතිසංස්කරණවලට එරෙහි සෝවියට් කොමියුනිස්ට් පක්ෂ නායකයින් ඔහු නෙරපීමට සහ සමාජවාදී සෝවියට් දේශය ආරක්ෂා කරගන්නට උත්සාහ ගත්තද පැවැති තත්වය තුළ එම සන්නද්ධ ක්‍රියාමාර්ගයද යෙල්ට්සින් වැනි දක්ෂිණාංශිකයින් විසින් තමන්ගේ වාසියට හරවා ගන්නා ලදී. කුමන්ත්‍රණය පැරදවීමට යැයි පවසමින් ජනතාව නොමඟ යවමින් වීදිබට යෙල්ට්සින් අවසානයේ කොමියුනිස්ට් පක්ෂ නායකයින්ගේ මැදිහත් වීමෙන් ඇතිවූ සමාජවාදී සෝවියට් දේශය රැක ගැනීමේ සටන කුමන්ත්‍රණකාරීව පරදා, ගොර්බචෝෆ් ඉවත් කර රුසියාවේ බලය ඔහු අතට ගන්නා ලදී. ඒ අනුව සෝවියට් සමූහාණ්ඩුව බිඳී ගොස් සෝවියට් දේශය අහෝසි විය.)

## සෝවියට් දේශය බිඳවැටීමට බලපෑ බාහිර හේතු

සෝවියට් දේශය බිඳවැටීමට එහි අභ්‍යන්තරයේ ඇතිවූ හේතුවලට අමතරව බාහිර හේතුන්ද දායක විය. බාහිර හේතු සමහරක් සෝවියට් දේශයේ පාලනයෙන් තොර ඒවා විය. ඒ සමඟ අධිරාජ්‍යවාදී කුමන්ත්‍රණයන්ද සම්බන්ධිතය.

### 1. ජාත්‍යන්තරය බිඳ හෙළමින් සෝවියට් හිතවාදී රාජ්‍ය පද්ධතියක් පවත්වා ගෙනයාම.

ලෝක සමාජවාදී විප්ලවයට නායකත්වය සැපයීම හා නිර්ධන පංති ජාත්‍යන්තරවාදය පවත්වාගෙන යාම සඳහා ලෙනින්ගේ නායකත්වයෙන් 1919දී පිහිටුවන ලද 3වැනි ජාත්‍යන්තරය හෙවත්

කොමින්ටනය 1943 දෙවන ලෝක යුද්ධය නිමාවෙමින් තිබියදී ස්ටාලින් විසින් විසුරුවා හරින ලදී. ඒ තවදුරටත් ලෝක සමාජවාදී විප්ලවයට නායකත්ව සැපයීමට එවන් සංවිධානයක් අවශ්‍ය නැත යැයි කියමිනි. එහෙත් 1943 දී 3වැනි ජාත්‍යන්තරය හෙවත් කොමින්ටනය විසුරුවා හැරීමෙන් පසු 1947 දී Comminform නමින් ස්ටාලින් විසින් සංවිධානයක් ගොඩ නගන ලදී. එයට අයත් රටවල් හා පක්ෂ වූයේ බල්ගේරියාව, චෙකොස්ලොවැකියාව, ප්‍රංශය, හංගේරියාව, ඉතාලිය, පෝලන්තය, රුමේනියාව හා යුගොස්ලාවියාවය. එහෙත් යුගොස්ලාවියා නායක ටිටෝ සමග ඇතිවූ මතභේදය නිසා 1948දී යුගෝස්ලාවියාව මෙම සංවිධානයෙන් නෙරපන ලදී. පසුව ස්ටාලින්ගේ මරණයෙන් පසු 1956දී කෘෂෙව් විසින් රුසියන් කොමියුනිස්ට් පක්ෂයේ 20 වන සමුළුවේදී මෙම සංවිධානයද විසිරුවා හරින ලදී.

ලොව බොහෝ කොමියුනිස්ට් පක්ෂ රුසියානු උදව් මත පවත්වාගෙන ගිය අතර ඒවාට සිදුවූයේ සෝවියට් දේශයේ ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග අනුමත කරමින් තම රටවල රුසියානු ශාඛා ලෙස කටයුතු කිරීමටය. පෙරළා එය බරපතළම ප්‍රතිරෝධයක් ඇති කළේය. සමාජවාදී සෝවියට් ජනතාවගේ ශ්‍රමය මඟින් මුළු මහත් ලෝක කොමියුනිස්ට් පක්ෂ හා සමාජවාදී රාජ්‍යයන් නඩත්තු කරන තත්වයක් ඇති විය. එපමණක් නොව සෝවියට් දේශය සමඟ විවිධ අවශ්‍යතාවයන් මත මිතුරු වෙසින් පෙනී සිටි ධනපති රාජ්‍යයන් නඩත්තු කිරීමටද සමාජවාදයේ පලදාව යෙදවිණි. මෙය සෝවියට් ආර්ථිකයට දරාගත නොහැකි බරක් බවට පත්විය.

## 2. පංති සහයෝගිතාවය හා වාමාංශික ව්‍යාපාර මර්දනය

ධනපති රටවල් සමග මිත්‍රත්වය ප්‍රධාන වීම තුළ එම රටවල සමාජවාදයට උදව් නොදීම හා ජාතික විමුක්ති අරගල හරහා ධනපති පංතියට බලයට ඒමට ඉඩ හැරීම ප්‍රධාන වරදකි. අධිරාජ්‍ය විරෝධී හා ෆැසිස්ට් විරෝධී නාමකරණයන් යටතේ ලොව පරිධියේ රටවල

සමහර ධනපති පක්ෂවලට හා නායකත්වයන්ට "ප්‍රගතිශීලී"ලේබලය අලවා ඔවුන් සමග මිත්‍රව කටයුතු කරන ලදී. එම රටවල කොමියුනිස්ට් පක්ෂවලට උපදෙස් දී තිබුණේද ඉහත ප්‍රගතිශීලී ධනපති නායකයින් හා එක්ව කටයුතු කරන ලෙසය. මෙය ලෙනින්වාදයෙන් පිළි පැනීමක් වූ අතර එය ලෝක විප්ලවයට හානිකර ලෙස බලපෑවේය. උදාහරණයක් වශයෙන් චීනයේ චියැංකායිසෙක් හා එකතුවීමට උපදෙස්දීම, ඉන්දියාවේ නේරු, ලංකාවේ බණ්ඩාරනායක, මිසරයේ අන්වර් සදාත් හා අප්‍රිකානු රටවල එවැනි නායකයින් හා මිත්‍රත්වය විසින් විප්ලවය සඳහා අරගලය පස්සට තැබීමට සිදුවීම ගත හැකිය. ඒ තත්වය කෙතෙක් දුර ගියාද කිවහොත් සෝවියට් හිතවාදී ධනපති ආණ්ඩු රකිමින් විප්ලවවාදි පක්ෂ මර්දනයට සහය දීම දක්වා අවස්ථාවාදය තීව්‍ර විය. ශ්‍රී ලංකාවේ 1971 අරගලයේ දි ජනතා විමුක්ති පෙරමුණ මර්දනය කිරීමට සිරිමා බණ්ඩාරනායක රජයට සෝවියට් දේශයේ මඟ පෙන්වීම මත සමාජවාදී රාජ්‍යයන් කිහිපයක් උදව් උපකාර කිරීමද මෙවන් නිදසුනකි.

## 3. සමාජවාදී කඳවුරේ භේදය සහ අසමගිය

සමාජවාදී කඳවුරේ භේදය හා අසමගිය එහි බිඳවැටීමට විශාල ලෙස හේතු විය. මින් ප්‍රධාන භේදය වූයේ, 1961න් ඇරඹී 1963දී ප්‍රකාශයට පත් චීන - සෝවියට් මතභේදයයි. එය ලොව පුරා කොමියුනිස්ට් පක්ෂ දෙකඩ කළ අතර පසුව ඒවා එකිනෙකට සතුරුව කටයුතු කළේය. මෙය අවස්ථාව කොට ගෙන සෝවියට් දේශයට එරෙහිව චීනය යොදාගැනීම දක්වා දුර යාමට එක්සත් ජනපදයට හැකි විය. තවදුරටත් ට්‍රොට්ස්කිවාදය, ස්ටාලින්වාදය සහ යුරෝ කොමියුනිස්ට්වාදය වැනි වාදවලට ලොව වමේ ව්‍යාපාරය බෙදීමද වමට අවාසි සහගත විය. මෙහිදී සමාජ විප්ලවය වෙනුවෙන් නොව

සෝවියට් හිතවත් කොමියුනිස්ට් පක්ෂ පවත්වාගෙන යාම සඳහා විශාල ලෙස වියදම් දැරීමට සෝවියට් දේශයට සිදුවිය.

මේ සියල්ල හරහා සමාජවාදී සෝවියට් දේශය අසීමිත හා අනවශ්‍ය ආර්ථික බරකට උරදුන් අතර ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරය බේද භින්න කොට එයට අයත් රටවල් තම අතකොළු බවට පත් කර ගනිමින් අනාරක්ෂිත තත්වයට පත් විය. මේ තත්වය සමාජවාදය බිඳ දැමීමට මාන බලමින් සිටි අධිරාජ්‍යවාදීන්ට වාසිදායක තත්වයක් උදා කළේය.

## 4. අධිරාජ්‍යවාදී කුමන්ත්‍රණවල ප්‍රතිඵල

සමාජවාදී කඳවුර බිඳ දැමීම සඳහා අධිරාජ්‍යවාදීහු නිතර කුමන්ත්‍රණය කළෝය. ඒ සඳහා සමාජවාදී කඳවුරේ දුර්වලතා හා භේදයන් ඔවුන් විසින් යොදාගන්නා ලදී. සෝවියට් කඳවුරට එරෙහිව අවි නිෂ්පාදනය කිරීම හරහා ඇතිවූ අවි තරගය නිසාද සමාජවාදී රටවල ජනතාව වෙනුවෙන් වෙන් කළ යුතු විශාල මුදලක් අවි සඳහා වෙන් කිරීමට සිදුවිය. සෝවියට් දේශය හා අනෙක් සමාජවාදී රටවලට ජාතිවාදය ඇතුල් කිරීමට උත්සාහ කිරීමද එහි බිඳවැටීමට රුකුල් දුන් කරුණක් විය. සමාජවාදී රාජ්‍ය බලය දුර්වල වන විටම සෝවියට් දේශය සමූහාණ්ඩු 15කට කැඩී ගියේත්, චෙකොස්ලොවැකියාව චෙක් සහ ස්ලොවැක් ලෙස වෙන් වූයේත් මෙහි ප්‍රතිඵල අනුවය. මේ අතර අධිරාජ්‍යවාදීන් විසින් සෝවියට් දේශයට හා සමාජවාදී රටවලට එරෙහිව දැවැන්ත ප්‍රචාරයක් ගෙන යෑම, බොරුකීම, ජනතාව මුළා කිරීම සිදු කරන ලදී. ඒ සඳහා  ආගමික සංස්ථාවන් යොදා ගැනීම සිදු විය. මෙය පෝලන්තයේදි ඉතා හොඳින් සිදු විය. පෝලන්තයේ වෘත්තිය සමිති නායක ලෙස කටයුතු කළ පසුව ධනේශ්වර නායකයෙකු වූ ලේක් වැලේසා මෙහෙයවනු ලැබූයේ එවකට පෝලන්ත ජාතික පාප් වහන්සේ විසිනි.

එමෙන්ම සමාජවාදී කඳවුර තුළ තිබූ ස්ටාලින් විරෝධය න්‍යායික විවේචනයකින් එහාට ගෙන ගොස් එය සමාජවාදයට එරෙහි මතයක් බවට යොදාගන්නා ලදී. එක්සත් ජනපදය කියුබාවට එරෙහිව සම්බාධක පැනවීම හා 1961දී එය ආක්‍රමණය කිරීමට උත්සාහ කිරීම, 1983දී ග්‍රෙනෙඩාව ආක්‍රමණය කිරීම, නිකරගුවාවට එරෙහිව කොන්ට්‍රා කැරලිකරුවන්ට උදව් කිරීම, ඇෆ්ගන්ස්තානයේදී සෝවියට් හමුදාවට එරෙහිව මුස්ලිම් අන්තවාදි සංවිධාන ගොඩ නැගීම ආදී ක්‍රියා රැසකින්ම අධිරාජ්‍යවාදීන්ගේ සමාජවාදයට එරෙහිව ක්‍රියාමාර්ග ප්‍රකාශයට පත් විය.

පොදුවේ ගත් විට සමාජවාදී කඳවුරේ බිඳ වැටීම තේරුම් ගත යුත්තේ, අහම්බයක් හෝ පුද්ගල ද්‍රෝහිකමක් ලෙස නොව කලක් තිස්සේ ප්‍රමාණාත්මකව වර්ධනය වූ අභ්‍යන්තර හා බාහිර හේතු රැසක් නිසා සිදු වූවක් බවය. සමාජවාදය යනු සංක්‍රමණීය අවධියක් වන නිසා එය කොමියුනිස්ට් ක්‍රමයට යාමට පෙර අවස්ථාවාදයට ගොදුරුව සමාජවාදී මාවතින් පිට පැනීමෙන් හා ධනපති පංතියට අවස්ථාව සැලසෙන දුර්වලතා විසින් ඕනෑම මොහොතක බිඳ වැටීමේ හැකියාව තිබේ. මෙය ලෙනින් නිතර අවධාරණය කරන ලද්දකි. සමාජවාදී කඳවුරේ බිද වැටීමේදි න්‍යායික හා ප්‍රායෝගික වශයෙන් එහි ඇතිවූ පිරිහීම සහ පීලි පැනීම මෙන්ම අධිරාජ්‍යවාදීන්ගේ අඛණ්ඩ කුමන්ත්‍රණ හා පහරදීම මෙයට හේතු වූ බව අමතක කළ යුතු නැත. රුසියාවේ මෙන්ම යුරෝපයේ බොහෝ කොමියුනිස්ට් පක්ෂවලට අනුව රුසියාවේ සංශෝධනවාදය ආරම්භ වී ඇත්තේ කෘෂෙව්ගෙන් පසුවය. ලෙනින්වාදී අර්ථයෙන් බලන කළ සත්‍යය නම් සෝවියට් දේශයේ න්‍යායික පීලි පැනීම් ආරම්භ වන්නේ ස්ටාලින් පාලනය සමගය. පුද්ගලාභිවාදනය, නිලධාරිවාදය හා න්‍යායික පීලි පැනීම්වල ආරම්භක ලක්ෂය වන්නේ, ස්ටාලින්ගේ පාලනයයි. ඉන්පසු කෘෂෙව්ගේ සිට ගොර්බචෝෆ් දක්වා මෙම සංශෝධනවාදයන් විවිධ

වේශයෙන් ඉදිරියට ගියේය. මෙම කාලය තුළ බිහිවූ බලාපොරොත්තු තැබිය හැකි නායකයා වූයේ යුරි ආන්ද්‍රපොව්ය. ඔහු සෝවියට් රහස් ඔත්තු සේවයේ (KGB) ප්‍රධානියා වශයෙන්ද බොහෝ කලක් සේවය කොට පළපුරුද්ද ඇති අයෙකි. 1982 නොවැම්බර් 12 ඔහු බලයට පත් විය. එහෙත් ඔහුගේ පාලනය වසරකට පමණ සීමා විය. එනිසා ඔහුගේ පත්වීමෙන් ප්‍රතිඵල ලබාගන්නට තරම් කාලයක් නොවීය. ඔහුගේ හදිසි මරණය පිළිබඳ ඇතැමුන් සැක පහළ කරන අතර එයද සෝවියට් දේශය බිඳ දැමීමේ කුමන්ත්‍රණයේම පියවරක් ලෙසද ඇතැම්හු සලකති.

කෙසේ වෙතත් සෝවියට් දේශය බිඳවැටීමත් සමඟ එය මත පදනම්ව තිබූ නැගෙනහිර යුරෝපීය සමාජවාදී රටවල්ද බිඳවැටුණි. මෙම කුණාටුවේදී අරක්‍ෂා වීමට සමත් වූයේ සිය රටට අනන්‍ය වූ සමාජවාදී ක්‍රමයක් පවත්වාගෙන යමින් ස්වාධීනව තම දෙපයින් සිටි සමාජවාදී රටවල් කිහිපය පමණි.

ඉහත අප සඳහන් කළ මාක්ස් ලෙනින්වාදයෙන් පිට පැනීමෙන් සිදුකළ වැරැදි භාවිතාවන් මෙන්ම අධිරාජ්‍යවාදයේ බලපෑම්ද හේතුවෙන් සමාජවාදී කඳවුර බිඳ වැටිණ. එය එසේ වුවද මේ වන විට ධනවාදය උත්තරීතර සමාජයක් බවට පත්ව නැත. සමාජවාදය විසින් එම ජනතාවට අවම වශයෙන් ලබාදුන් දෙයක්වත් ධනවාදය විසින් ඔවුනට මෙතෙක් ලබාදීමට සමත්ව නැත. එපමණක් නොව සමාජවාදය යටතේ ඔවුන් ලද ජීවිතයද ධනවාදය විසින් උදුරා සුනුවිසුණු කොට ඇත. එම තත්වය විසින් එම රටවල ජනතාව අත්විඳින්නේ ඛේදනීය තත්වයකි.

# 6

# බිඳ වැටුණු සමාජවාදී රටවල වත්මන් තත්වය

සමාජවාදී කඳවුර බිඳ වැටෙමින් හා බිඳ වට්ටවමින් සිටි 1990 දශකයේ අග භාගයේදී ධනවාදය උදම් ඇනුවේ, සමාජවාදයට වඩා යහපත් ජීවිතයත් එම රටවල ජනතාවට ලබාදෙන බවය. අධිරාජ්‍යවාදය විසින් මෙහෙය වනු ලබන මාධ්‍ය තුළින් පෙන්වූයේ, සමාජවාදී රාජ්‍ය පද්ධතිය යනු අන්ත දරිද්‍රතාවයෙන් පෙළෙමින් සිටි, නිදහස මුළුමනින්ම අහිමි කළ, මානව හිමිකම් බිඳකුදු නොමැති අති භයානකම, මිනිස් වර්ගයාගේ අනාගත පැවැත්ම හා යහපත උදෙසා වහාම ලෝකයෙන් තුරන් කළ යුතුම දෙයක් ලෙසින්ය. ඒ සියල්ල මුළාවක්, කටේ නරිවාදන් පමණක් බව දැන් හොඳින් ප්‍රත්‍යක්ෂ වෙමින් පවතී. පූර්වයෙන් සමාජවාදී කඳවුරට අයත්ව තිබී ධනවාදයට ගොදුරුවූ සමාජවාදී කඳවුරේ රටවල් දෙස විමර්ශනාත්මකව බලන විට, ජනතාව ධනවාදී තරගයට ඇද දමා ඇති නමුත්, ඔවුනට ආර්ථික වශයෙන් හෝ යහපත් ජීවිතයක් ලබාදීමට ධනවාදය සමත්ව නැති බව පැහැදිලිය. එම රටවල් සමස්තයක් ලෙසම ධනවාදී අර්බුදය නැමැති ප්‍රචණ්ඩ, පතුලක් නොපෙනෙන ගැඹුරු අගාධය වෙත ඇදගෙන යමින් පවතී. සමාජවාදයෙන් ධනවාදය තුළට එම රටවල් කඩා වැටෙද්දී දෑත දිගුකළ ධනවාදයේ රැකවලුන් ඔවුනටද පෙරටුව එම අගාධයට පෙරළෙමින් සිටී. සමාජවාදී රකුසාගෙන් මුදවා ගත්තා යැයි කියූ ජනතාව දරිද්‍රතාවය, පීඩනය, අපරාධ, දූෂණයන්, ආත්මගරුත්වය බිඳවැටීම ඇතුළු ධනවාදයට ආවේණික ව්‍යසනයන්ගෙන් වටකොට සිටියි. මෙම ඛේදවාචකයේ සත්‍ය පින්තූරයක් සඳහා එම රටවල් ඇසුරෙන් කළ සමීක්ෂණ වාර්තා සහ සංඛ්‍යා ලේඛනද උපයෝගී කොටගනිමින් කරනු ලබන විශ්ලේෂණයක් අවශ්‍යය.

සමාජවාදී කඳවුර පැවැති අවධියේ නැගෙනහිර යුරෝපයට අයත්ව තිබූ රටවල් ගණනාවකි. ඒ බල්ගේරියාව, හංගේරියාව, චෙකොස්ලොවැකියාව, රුසියාව, පෝලන්තය, යුගොස්ලාවියාව,

ඇල්බේනියාවය. රුසියාව ඇතුළු සමාජවාදී සෝවියට් දේශයට අයත් සමූහාණ්ඩු පහළොවකි. ඒ රුසියාව, කසකස්තානය, කිර්ගීසියාව, ටජිකිස්තානය, තුර්ක්මේනියාව, අසර්බයිජානය, ආර්මේනියාව, යුක්රේනය, බෙලෝරුසියාව, ලිතුවේනියා, ලැට්වියාව, එස්තෝනියාව, ජෝර්ජියාව, මෝල්දාවියාව, උස්බෙකිස්තානය ලෙසින්ය. සමාජවාදය බිඳවැටීමෙන් පසු මේවා විසිර යන්නට විය. සෝවියට් සමූහාණ්ඩුව නම් වූ දැවැන්ත රාජ්‍ය වෙනුවට සීසිකඩ කළ හුදකලා රටවල් බවට ඒවා පත් විය. වෙන් වෙන්ව එම රටවල් අතුරින් කිහිපයක ධනවාදය තුළ ලද පලදාව කෙසේදැයි විමසා බලමු.

## දරිද්‍රතාවය

යුරෝපා ළමා භාරය 2000 වසරේදී පළ කළ වාර්තාවට අනුව සියලුම බිඳ වැටුණු. සමාජවාදී රටවල් දාහතේ ජනගහනයෙන් සියයට 40ක්ම දුප්පත්කමේ රේඛාවෙන් පහළ එනම් දිනකට ඇ.ඩො. 1කට අඩුවෙන් උපයමින් ජීවත්වේ. 1990 වන විට මධ්‍යම හා නැගෙනහිර යුරෝපා සමාජවාදී රටවල සහ පැරණි සෝවියට් දේශයට අදාළ රටවල දිනෙක ආදායම ඇමරිකන් ඩොලර් 2 ට අඩු ජනගහනය සියයට 5ක් තරම් අඩු එකක් විය. 2010 වසර වන විට ඉහත පවසන ලද රටවල දෛනික ආදායම ඇමරිකන් ඩොලර් දෙකට අඩු ජනගහනය සියයට 20 දක්වා වර්ධනය වී තිබේ. එයින් කියවෙන්නේ එම රටවල පැවැති දුප්පත්කම ධනවාදය තුළ සිව් ගුණයකින් පමණ වර්ධනය වී ඇති බවයි. වත්මන් රුසියාවේ සෑම දරුවන් 10කින් එක් අයෙකුම එනම් මිලියන තුනක් අන්ත දරිද්‍රතාවයෙන් පෙළෙමින් ජීවත්වේ. හරි හැටි අහරක් නොමැතිව වැරැහැලි අඳිමින් ජීවත් වන මෙම දරුවෝ අපිරිසිදු, සීතල, මුඩුක්කු නිවාස වල වාසය කරති. මොස්කව්හි පමණක් වීදි දරුවෝ 30,000ක් - 50,000ක් අතර ගණනක් ජීවත් වෙති. 1998 සිට සත්‍ය ඒක පුද්ගල ආදායම අඩුවීම ඉතා ශීඝ්‍ර එකකි. රුසියාව,

කිර්ගීසියාව, යුක්රේනය යන රටවල ඒක පුද්ගල ආදායම සියයට 10කින් අඩුවී ඇත. එම අඩුවීම ජෝර්ජියාව, මෝල්දාවියාව, තජිකිස්තානය යන රටවල සියයට 40 කි. සමාජවාදයේ ආරම්භයේ කිර්ගීසියාවට භාෂාවක් පවා නොතිබුණි. එම ජනතාවට තමන්ගේම භාෂාවක් නිර්මාණය කරදෙමින්, ඔවුනගේ සාක්ෂරතාවය ඉහළ දමමින්, තම භාෂාවෙන් විශ්වවිද්‍යාල අධ්‍යාපනය පවා ලැබීමට අවස්ථාව සලසා දෙනු ලැබූයේ සමාජවාදයයි. එවකට රජයෙන් නොමිලේ සෞඛ්‍ය, ප්‍රවාහනය, අධ්‍යාපනය, නිවාඩු නිකේතනවල ගතකිරීමට අවස්ථාව හා පහසුකම් විය. නමුත් වර්තමානයේ ඔවුනගේ ජීවන තත්වය කඩා වැටී ඇත. මානව සංවර්ධන මට්ටම සලකා බැලීමේදී ආර්මේනියාව, ජෝර්ජියාව, උස්බෙකිස්තානය යන රටවල ජීවන මට්ටම 1990 දී පැවති මට්ටමට වඩා සියයට 80කින් පහත වැටී ඇත. මේ හේතුවෙන් ජනතාවගෙන් හතරෙන් එකක් වෙනත් ප්‍රදේශයන් කරා සංක්‍රමණය වී ඇත. 1990 සිට සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුවට අයත්ව තිබූ රටවල මානව සංවර්ධන මට්ටම සමස්තයක් ලෙස පහත වැටුණි. තජිකිස්තානය ස්ථාන 21කින් ද යුක්රේනය ස්ථාන 17කින් ද 1990 සිට 2003 වන විට රුසියාව ස්ථාන 48කින්ද මානව සංවර්ධන දර්ශකයේ දරන ලද ස්ථානය පහළ වැටුණෝය. මෙයට හේතුව සැලසුම් සහගත රාජ්‍යයකට අයත් ආර්ථිකය විනාශවීම හා ඒ හේතුවෙන් සෞඛ්‍යය පහළ වැටීමෙන් ආයු අපේක්ෂා කාලය බිඳවැටීමය.

## සෞඛ්‍යය හා ආයු අපේක්ෂාව

රටක සෞඛ්‍ය මට්ටම මනිනු ලබන එක් මිනුමක් වන්නේ ජනතාවගේ ආයු අපේක්ෂාවයි. ඒ අනුව සලකා බලන විට 1985 වර්ෂයේදී එනම් සමාජවාදී අවධියේදී සෝවියට් දේශයේ පුරවැසියන්ගේ ජීවිත අපේක්ෂා කාලය හෙවත් සාමාන්‍යයෙන් මිනිසකු ජීවත් වන කාලය අවුරුදු 65ක් වූ අතර, එය සමාජවාදය බිඳවැටීමෙන් පසු මුල්

දශකයේදී වසර 58කට අඩු විය.

medical journal සඟරාවේ වාර්තා වන පරිදි සෝවියට් දේශයේ ආයු අපේක්ෂාව පහත වැටීම මෙසේය.

| | |
|---|---|
| 1985 | වසර 65 |
| 1990 | වසර 65 |
| 1995 | වසර 58 |
| 2000 | වසර 63 |
| 2009 | වසර 64 |

ආයු අපේක්ෂාව එලෙසින් පහත වැටෙද්දී උපතේ සිට වසර 5ක කාලය තුළ මිය යන සංඛ්‍යාවද ඉහළ ගොස් ඇත. 1990 සිට 2012 දක්වා සිදුවූ ළදරු මරණ සංඛ්‍යාව මිලියන 15ක් වීමෙන් මෙය ඉතා පැහැදිලිය. තත්වය කෙතරම්දයත්, මීළඟ දශකවලදී රුසියාවේ ජනගහනය සියයට 30කින් අඩුවේ යැයි සංඛ්‍යා දත්තයන් පෙන්වයි. රුසියාවේ සමාජවාදය බිඳවැටී වසර 23කට පසුද එහි ආයු අපේක්ෂා කාලයේ අගය 1990 තිබූ මට්ටමටවත් ළඟාවී නැත. එයට හේතුව මත්පැන්, මානසික පීඩනය, මානසික අවපාතය, දුම්පානය, රිය අනතුරු හා හිංසන ක්‍රියාවන් වේ.

කාර්මික නිෂ්පාදනය බිඳවැටුණු, තාක්ෂණික වශයෙන් පහළට ඇද වැටුණු හා ජීවන මට්ටම කඩා වැටුණු සමාජයක් බවට රුසියානු සමාජය පත්ව තිබේ. මරණ ප්‍රමාණය 1990දී පැවැතියාක් මෙන් සියයට 30කින් වැඩි විය. සමාජවාදී පාලනය බිඳවැටීමෙන් පසු ඇතිවූ සමාජ ආර්ථික අර්බුදය නිසා පමණක් ලක්ෂ 77ක් මිනිස්සු පෙරට වඩා මරණයට පත්ව සිටිති. ජනගහනය එවකට මිලියන 138කි. ජනගහන වර්ධන වේගය ඍණ 0.48කි. 2000 වසරේ දී ජනගහනයට වඩා 2010 දී ජනගහනය සියයට 1.6කින් අඩුවී තිබේ. එනම් මිලියන 2.31කින් අඩුවී තිබේ. ඒ අනුව 2000 දී මිලියන 145.17ක් වූ රුසියන් ජනගහනය 2010 දී මිලියන 142.86ක් දක්වා පහත වැටුණි.

මේ අනුව එම රටවල සෞඛ්‍ය මට්ටම පහළ වැටීමට සාපේක්ෂව ආයු අපේක්ෂාවද පහළ වැටෙන බව ඉතා පැහැදිලිය. ධනවාදයේ 'ආශ්චර්යය' වෙත රැගෙන පැමිණි සමාජවාදී රටක ජනතාවගේ වත්මන් සෞඛ්‍ය තත්වය එසේය.

## දුම්පානය

සමාජ ජීවිතයන්ගේ කඩාවැටීම පෙන්වන එක් සාධකයක් වන්නේ රටක මත්පැන් පානය හා දුම්පානයයි. සමාජවාදය කඩා වැටීමෙන් පසුව දුම්පානය පැත්තෙන් රුසියාව පත්ව ඇති තත්වය ඉතා කණගාටුදායක තත්වයකි. වර්තමානයේ වැඩිම දුම්බොන ජනතාවක් සිටින රට රුසියාවයි. එහි වසරක් තුළ දුම්බීම නිසා සිදුවන මරණ සංඛ්‍යාව සාමාන්‍ය මරණවලින් සියයට 4 කි. එක් වැඩිහිටියෙක් වසරකට බොන දුම්වැටි ප්‍රමාණය 2319කි.

වර්තමානයේදී වසරකට එක් වැඩිහිටියෙක් බොන දුම්වැටි ප්‍රමාණය පැරණි සමාජවාදී රටවල් කිහිපයක් ඇසුරෙන් පහත සඳහන් ලෙස දැක්විය හැකිය.

| රට | වසරකට එක් පුද්ගලයෙකු පාවිච්චි කරන දුම්වැටි ගණන |
|---|---|
| ස්ලොවේනියාව | 2537 |
| යුක්රේනය | 2526 |
| බල්ගේරියාව | 2437 |
| චෙක් රාජ්‍ය | 2368 |
| රුසියාව | 2319 |
| මෝල්දාවියාව | 2239 |
| බොස්නියා හර්සගොවිනා | 2145 |
| ආර්මේනියා | 2083 |

| | |
|---|---|
| ලැට්වියා | 1890 |
| ක්‍රොඒෂියා | 1849 |
| බෙලෝරුසියා | 1846 |
| පෝලන්තය | 1810 |

මේ තුළින් පැහැදිලි වන්නේ පොදුවේ කඩා වැටුණු සමාජවාදී රටවල ඒක පුද්ගල දුම්පානය ඉතා ඉහළ අගයක් දරන බවය.

## මත්පැන් පානය

මත්පැන් පානය සෝවියට් රුසියාවේද පැවැතිය නමුත් සමාජවාදී රජය එය හා බැඳුණු ව්‍යසනයන් දුරලීමට කටයුතු කළේය. එහෙත් සමාජවාදය බිඳ වැටීමෙන් පසුව මත්පැන් උවදුර තවත් ප්‍රබල එකක් විය. 'The London times' වල වූ දත්තයන්ට අනුව වර්තමානයේ රුසියානුවෙක් මසකට මත්පැන් පානය කරන ප්‍රමාණය - ලීටර් 15කි. එය 1990 තිබූ ප්‍රමාණය මෙන් තුන් ගුණයකි. මෙයට අමතරව සලකා බලන විට 1990- 2001 දක්වා වසරවලදී වයස අවුරුදු 15 - 54 දක්වා වයස් සීමාවට අයත් මරණවලින් සියයට 52ක් මත්පැන් නිසා සිදු විය. මෙය මුළු මහත් ලෝකයේම සලකා බැලුවත් මෙම දත්තයන් තැති ගන්වන සුළුය. මන්දයත් ලෝකයේ 1990 - 2001 තුළ ඉහත වයස් කාණ්ඩයට අයත් මරණවලින් සියයට 4ක් පමණ මත්පැන් නිසා සිදුවන ඒවා වීමයි. මෙම වයස් කාණ්ඩය යනු පුද්ගලයෙක් ශ්‍රම කාර්යයේ නියලෙන අවධියයි. එසේ මත්පැන් උවදුරට ගොදුරුවී තරුණ පරපුර මිය යන්නේ නම් ඒ අහිමි වන්නේ රටේ ශ්‍රම සම්පතයි.

## HIV/AIDS **ව්‍යාප්තිය**

ඒඩ්ස් වැනි රෝගයක් එහි ව්‍යාප්තිය වැළැක්වීම සහ රෝග පාලනය යන දෙආකාරයෙන් මැඩලිය යුතුය. සමාජවාදී රාජ්‍යයන් පැවැති අවධියේ ඒඩ්ස් මැඩලීම ක්‍රමවත් විද්‍යාත්මක වැඩපිළිවෙළක් තුළ සිදු කළේය. ඒ අනුව සමාජවාදී රාජ්‍ය සමයේ නැගෙනහිර යුරෝපය, මධ්‍යම ආසියාව හා රුසියාව යන සියලුම රටවල සිටි ඒඩ්ස් රෝගීන් ප්‍රමාණය 10,000ට අඩුය. එහෙත් 2007 වසරේදී රුසියාවේ සිටින HIV අසාදිතයින් ගණන 940,000 කි. වර්තමානයේ 2013 වසර වන විට එම සංඛ්‍යාව 980,000කි. යුක්රේනයේ එය 350,000කි. ලොව වැඩියෙන්ම HIV ව්‍යාප්ත වන ප්‍රදේශය නැගෙනහිර යුරෝපය ලෙස සැලකේ. 1995 වන විට නැගෙනහිර යුරෝපයේ ඒඩ්ස් රෝගීන් සංඛ්‍යාව 30,000කි. 2004 වන විට ලක්ෂ 15 දක්වා එය වර්ධනය වී තිබේ.

(UN HIV/AIDS report – Eastern Europe + Central Asia)

සමාජවාදය බිඳවැටීමෙන් පසුව එම රටවල ගණිකා වෘත්තිය බහුලවීම මෙයට රුකුලක් විය. ධනේශ්වර ආර්ථික හා සමාජයීය අර්බුදයේ හේතු මත මෙම රටවල ගණිකා වෘත්තිය වේගවත්ව පැතිර යන්නට විය. සමාජවාදී අවධියේ එවන් තත්වයක් නොවීය.

## **සියදිවි නසා ගැනීම්**

සියදිවි නසාගන්නට හේතුව වන්නේ, මානසික බිඳවැටීම, ආර්ථිකය කඩාවැටීම, බලාපොරොත්තු කඩවීම, හුදකලාවීම, කලකිරීම ආදියයි. බිඳවැටුණු සමාජවාදී රාජ්‍යයන්හි සියදිවි නසා ගැනීමේ අගයන් ඉතා ඉහළය. මෙය ඉතා බරපතල සමාජ ඛේදවාචකයකි. සමස්ත ලෝකයම සලකා බලද්දී සිය දිවි නසාගැනීම් අනුපාතය ජනගහනය ලක්ෂයට 14 දෙනෙකි. වර්තමාන රුසියාවේ එම අගය

ජනගහනය ලක්ෂයකට 21.4 දෙනෙකි. ඒ අනුව සිය දිවි නසාගැනීම් අතින් ලෝකයේ 12 වැනි ස්ථානය රුසියාවට හිමිවේ. 1990 සිට 2010 දක්වා රුසියානුවන් ලක්ෂ 8ක් සියදිවි නසාගෙන ඇත. රුසියාවේ වයස 15 - 19ත් අතර දරුවන් විසින් සියදිවි නසාගැනීම් 1500කි. මෙය යුරෝපයේ ඉහළම අගයයි. එනම් ලක්ෂයකට 19.81කි. එය ලෝකයේම එම වයසේ දරුවන්ගේ සියදිවි නසා ගැනීමේ අගය මෙන් 2.7කට වැඩි අගයකි. ලොව වැඩිම සියදිවි නසාගැනීම් ඇත්තේ පැරැණි සමාජවාදී රාජ්‍යයක් වූ ලිතුවේනියාවේය. ලොව වැඩිම තරුණ සියදිවි නසාග ැනීම් ඇත්තේ පිළිවෙලින් බෙලෝරුසියාව, කසකස්ථානය, රුසියාව යන රටවලය. සමාජවාදය තුළ පැවැති සමාජ සුරක්ෂිතතාවය, බලාපොරොත්තු සහගත බව, මානසික සතුට, අන්‍යෝන්‍ය ගෞරවය, සාමූහික බැඳීම ආදිය ධනවාදය විසින් අහිමි කිරීම මේ තත්වය ඇතිවීමට හේතුවයි.

## සමාජය කඩාවැටීම

පැරැණි සමාජවාදී රටවලත්, පොදුවේ ධනේශ්වර යුරෝපා රටවලත් 1990 සිට දික්කසාදවීමේ ප්‍රතිශතය අඛණ්ඩව වැඩිවී ඇත . මෙයින් පෙන්නුම් කෙරෙන්නේ, සමාජවාදයේ සිට ධනේශ්වරකරණයට ලක්වූ පවුල් ඒකකය කඩාවැටෙමින් තිබෙන තත්වයයි. මත්ද්‍රව්‍ය භාවිතය හා අලෙවිය ආශ්‍රිත අපරාධ දැවැන්ත පිපිරුමක ආකාරයෙන් ව්‍යාප්ත වෙමින් පවතී. බිඳ වැටුණු සමාජවාදී රටවල මිනී මැරුම් දිගටම වැඩි වෙමින් පවතී. ගැහැනු සහ පිරිමි සියදිවි නසාගැනීම් ප්‍රමාණය වැඩිවී තිබේ. සමාජයේ ස්ත්‍රී දූෂණ ප්‍රමාණය වැඩිවී තිබේ. ඒ අනුව ස්ත්‍රී දූෂණ වැඩිම රට යුක්රේනය සහ රුසියාවයි. තවද අපරාධවලට සිරගත වූවන් ප්‍රමාණය වැඩිවී තිබේ. Sovietica පොතෙහි කතුවරිය වන ඉරිනා මලෙන්කෝ වසර 20ක් සෝවියට් දේශය තුළ ජීවත් වූවාය. දැනට ජීවත්වන අයර්ලන්තය හා ඊට පෙර වසර 8ක්

ජීවත් වූ ඕලන්දය සමග සෝවියට් දේශය සංසන්දනය කරමින් ඇය පවසන්නේ, සෝවියට් දේශය තුළ ජීවත් වූ වසර 20 ක කාලය තුළ තමා ජීවත්වූ ලක්ෂ පහක ජනගහනයක් සිටි තම නගරයේ සිදුවූයේ මිනීමැරුම් දෙකක් පමණක් බවය.

# 7

# සමාජවාදය අභිබිවීමෙන් බිඳ වැටුණු ජීවිත

ධනවාදී ලෝකය තුළ සමාජවාදයට එහා 'දිව්‍ය' ලෝකයක් ඇත යන්න බිඳ වැටුණු සමාජවාදී රටවල ජනතාව තුළ ඇතිකර තිබූ මතයයි. එහෙත් දුබල මහලු ධනවාදය තුළ ඔවුන් සෙවූ ලෝකය තිබුණේ නැත. ඒ වෙනුවට සමාජවාදයෙන් ඔවුන් අත්පත් කරගත් සියල්ලද ධනවාදය විසින් උදුරා ගනු ලැබීය. එය විසින් ලබා දෙන ලද්දේ මතවාදයෙන් අන්ධ, ජීවිතයෙන් නරුම සහ බුද්ධි හීන ජීවිතයකට මාවතක් පමණි. තවමත් සිතන්නට හැකියාවක් ඉතිරිව පවතින මිනිසුන්ට එය පසුතැවිල්ලකි. එසේ අහිමි වූ සමාජවාදී ජීවිතය පිළිබඳව ආපසු හැරී බලන්නන්ගේ අදහස් වේදනාත්මකය. ඒ වේදනාවෙන් පමණක් අහිමි වූ සියල්ල ආපසු ලබාගත නොහැකිය. ඒ වෙනුවට තත්වයන් යළි පෙළගැසෙද්දී විද්‍යාත්මක කොමියුනිස්ට්වාදයේ මූල ධර්මයන් මත පිහිටා සංවිධානය වීමෙන් සමාජයේ ප්‍රගමනය දිශාවට යළි ලෝකය යොමු කළ හැකිය. ඒ සඳහා අවබෝධය පුළුල් කරගැනීමට සමාජවාදී ජීවිත අහිමිවීමෙන් අසරණභාවයට පත්වූවන්ගේ අදහස් ඉදිරිපත් කිරීම් හා ඒ පිළිබඳව වන සමීක්ෂණ වාර්තා ඉතා හොඳ තෙවැනි ඇසකි. එබැවින් එවන් සමීක්ෂණ වාර්තා කිහිපයක් පහත විමසා බලමු.

සමාජවාදී ජීවිත අහිමිවී අසාර්ථක ධනවාදී ජීවිතයට කඩාවැටුණු හා ධනේශ්වර ක්‍රමයේ අර්බුදය අන් කවරෙකුටත් වඩා හොඳින් අත්දකින කිහිප දෙනෙකු විවිධ සමීක්ෂණයන්හිදී කරන ලද විශේෂ ප්‍රකාශයන් පහත දැක්වේ. ඒ සමාජවාදී ජීවිතය තුළ ඔවුන් අත්විඳි සැබෑ ජීවිතය හා ධනවාදය තුළ විඳවන මායාකාරී වර්තමාන ජීවිතය පිළිබඳ සජීවි නිදර්ශනයන්ය. උස්බෙකිස්ථාන් ජාතික අන්වර් සමාජවාදය බිඳවැටීමෙන් අහිමිවූ හා කඩාවට්ටවන ලද ජීවිතය පවසන අතර කිර්ගීසියානු සාශා පවසන්නේ, එම කඩා වැටුණු ජීවිතයට අමතරව සෝවියට් දේශයේ නොතිබුණු ජාතිවාදී පීඩනයකටද ඔහු යටත්ව ඇති බවය. කසකස්ථානයේ අල්මාස් මෙම බේදවාචකයේ බරපතළකම හුවා දක්වයි. මිනිසකු මරාදැමීම අපරාධයක් නමුදු එය

එතකින් අවසන්වේ. ඔහුට විඳවීමට දෙයක් ඉතිරි වන්නේ නැත. එහෙත් සමාජ සංවර්ධනයේ ඉදිරිගාමී සමාජයකට පා තබා තිබූ මිනිසකු යළි පසුකොට පැමිණි සමාජයට තල්ලු කොට දමන්නේ නම් එය ඔහු සතුව තිබූ උසස් මානව සබඳතා සියල්ල ක්‍රෑර ලෙස ඉරා දැමීමකි. මිනිසකු බවට පරිණාමය වූ පසු බලහත්කාරී ලෙස ඉන්ද්‍රියයන් හා අවයව කපා දමමින් මිනිසාට පූර්වයෙන් බිහිවූ සත්වයෙකු බවට ඔහු යළි පත්කිරීමට ගන්නා උත්සාහයක් බඳුය. එය කෙතරම් විකෘති සහගතද? වේදනාත්මකද? යන්න පහත සමීක්ෂණයන්ගෙන් පැහැදිලි වේ.

පහත සඳහන් වන්නේ පැරිස් සරසවි ආචාර්ය උපාධි නිබන්ධනයක් සඳහා Baclaloy Ulugbek විසින් කරන ලද සමීක්ෂණයකින් ගන්නා ලද උපුටා ගැනීමකි. මෙහි කතානායකයා වන අන්වර්ගේ අත්දැකීම යනු වයස අවුරුදු 60ක් වන එනම් 1950 දශකයේ මුල් අවධියේ උපන් මිනිසෙකුගේ කතාවකි. දෙවන කතාව දැනට වයස 68ක් වන එනම් දෙවන ලෝක යුද්ධය නිමාවන අවධියේ උපන් සාශාගේ කතාවයි. දැනට වයස 52ක එනම් 1961දී උපන් අල්මාස්ගේ කතාව තෙවැනියට කියවේ. මොවුන් තිදෙනා 1940, 1950, සහ 1960 දශකයන්වල උපන් පුද්ගලයින්ය. මොවුන් ලෝක යුද්ධයට මුහුණ දීමෙන් විනාශයට පත් සෝවියට් දේශය හා ලෝක යුද අභියෝගය අභීතව ජය ගෙන එහි සමාජවාදී ජීවිත යළි ගොඩ නැගුණ අවධියේ ජීවත් වූවන්ය. වෙනස් සහ සමාන කාල වල අත්දැකීම් සහිත වූවන්ය.

## 1. උස්බෙකිස්තාන ජාතික අන්වර් පවසන කතාව

අන්වර් යනු වයස 60ක් පමණ වන ශරීරයෙන් කුඩා මිනිසෙකි. ඔහු ගැඹුරු පෙනුමකින් හා රත්රන් දත් සහිත පුද්ගලයෙකි. (එය මධ්‍යම ආසියාවේ, රුසියාවෙහි ඉතා සුලබ දෙයකි.) 2011 නොවැම්බරයේ පැරිසියේදී ඔහු මට මුණ ගැසුණි.

1990ට පසු ඉස්ලාම් ආගම වැළඳගත් අන්වර් ඌරු මස් නොකෑවද ඔහු තවමත් මත්පැන් පානය කරයි. සෝවියට් සංගමයේ පුරවැසියෙකු වීම ගැනත්, ලොව ඉහළම අධ්‍යාපන ක්‍රමය තිබූ රටේ ඉගෙනීමට ලැබීම ගැනත් සතුටු වන අන්වර් ටෂ්කන්ට්හි විදේශ භාෂා විශ්වවිද්‍යාලයෙන් උපාධිය ගෙන එහිම ගුරුවරයෙකු ලෙස විශාල කාලයක් සේවය කළේය. ඔහු සෝවියට් දවස් පිළිබඳ හැඟීම්බරව අදහස් දක්වයි.

"සෝවියට් දේශය නැතිවීමත් එක්ක අපට බොහෝ දේ නැති වුණා. එය බිඳවැටීම විසින් අපිව අද සිටින ලැජ්ජා සහගත තත්වයට පත්වුණා. මම ගුරුවරයෙක්. ඒ නිසා මට කියන්න පුළුවන් සෝවියට් සංගමය නැතිවීම නිසා අපේ ජීවිතවලට විශේෂයෙන්ම රාජ්‍ය අංශයේ වෘත්තිකයන්ගේ ජීවිතවලට වෙච්ච බලපෑම ගැන. අද අපි ලබන වැටුප අපේ ගෙවල්වල ඉතාම අවශ්‍ය දේවල්වත් සම්පූර්ණ කරගන්න බැරිතරම් දුප්පත් එකක්. මගේ පඩිය ඇ.ඩො. 300යි. ඒක අපේ ගෙදර සති දෙකක කෑම වියදමට පමණයි. වාසනාවට වගේ මගේ බිරිදත් පඩි සහිත රැකියාවක් කරන නිසා ඉතිරි සති දෙක ගෙදර කටයුතු කරගන්නේ ඇයගේ වැටුපෙන්. මගේ බිරිඳ ප්‍රංශ භාෂාව පිළිබඳව මහාචාර්යවරියක්. ඒත් ඇගේ විශ්වවිද්‍යාලයෙන් (සමාජවාදය බිඳ වැටුණට පස්සේ) ගෙව්ව පඩිය ඉතා අඩු එකක්. ඒ නිසා ඇය සරසවි රැකියාව අතහැරියා. දැන් ඇය උස්බෙකිස්තාන අගනුවර ජීවත් වන ප්‍රංශ ජාතිකයෙකුගේ නිවසේ ගෘහ සේවිකාවක ලෙස සේවය කරනවා. ඇයගේ දැන් වැටුප ඇමරිකන් ඩොලර් 450ක්. අපට දුවෙක් ඉන්නවා ඇයට වයස 15යි. කලින් සෝවියට් කාලයේදී ජීවිතය මීට වඩා සම්පූර්ණයෙන්ම වෙනස්. අපිට වැදගත් වැටුපක් ලැබුණා. ඒකෙන් හොඳ ජීවිතයක් ගෙවන්න හැකිව තිබුණා. අපට අවශ්‍ය දේ මිලදී ගන්න, කාර් එකක් ගන්න, සංස්කෘතික හා ක්‍රීඩා කටයුතු සඳහා වියදම් කරන්න, තවත් රටක විනෝද චාරිකාවක් යන්න මේ වගේ දේවල් එදා

අපේ වැටුපෙන් කළ හැකිව තිබුණා. සමහර අවස්ථාවලදී වැටුපම වගේ ඉතිරි කරගත්ත අවස්ථා තිබුණා. ඒත් අද ආහාර, විදුලි, ගෑස් බිල් ගෙව්වම පඩිය ඉවරයි. දැන් අපි උදේ නැගිටින්නේ කොහොමද සල්ලි හොයන්නේ කියන උභතෝකෝටිකයත් එක්ක. ඔබට මාව විශ්වාස නැතිනම් ඔබ ඕනෑම උස්බෙක් ගුරුවරයෙකුගෙන් අහන්න අන්තිමට චිත්‍රපටියක්, නාට්‍යයක් බලන්න ගියේ කවදාද කියලා. මට විශ්වාසයි ඔක්කොමලා කියයි "මුදලුත් නෑ වෙලාවකුත් නෑ" කියලා."

"ඒත් සෝවියට් කාලයේදි හැම කෙනෙක්ම අපේ රැකියාවට ගරු කළා. අප දරුවන්ගේ අනාගතය, සැලසුම්, ආකල්ප ගැන ඇසූ හැමවිටම ඔවුන් අපව දිරිමත් වන අදහස් අපට කිවුවා. අපි අපේ රැකියාවෙන් උපරිම තෘප්තියක් ලැබුවා. අපි කරන දෙයින් හොඳම ප්‍රයෝජනයක් වෙනවා කියන තෘප්තිය, හැඟීම අපට තිබණා. මොකද සෝවියට් යුගයේ තිබූ සමාජ හා ජීවිත අගයන් අදට වඩා වෙනස්. අපට එදා සමාජ පිළිගැනීමක් තිබුණා. ඒත් අද ගුරු වෘත්තිය ලැජ්ජා සහගත එකක්. ශිෂ්‍යයන්ගෙන් ඇහුවොත් අනාගතයේදි ගුරුවරයෙකු වෙන්න කැමතියි කියලා කියන්නේ ඉතා සුළු පිරිසක්. ඒ අදහස හරි. තමන්ගේ මූලික අවශ්‍යතාවයන් ඉටුකරන්න බැරි රැකියාවක් කරන්න ඉදිරිපත් වෙන්නේ කවුද? ඒ නිසා අද ගුරු වෘත්තිය ලැජ්ජා සහගත, නින්දිත තත්වයකට පත්වෙලා. ගුරුවරුන්ගේ අගහිඟතා විසින් ඔවුන් දූෂිතයන්, වංචනිකයන් බවට පත්කරලා. ඔවුන් සමහර විශේෂ සටහන් ලබාදීමට අත යටින් සිසුන්ගෙන් මුදල් ගන්නවා. විභාග වංචා කරනවා. සිසුනුත් දන්නවා තමන් පංතියට ආවේ නැතත් ඔවුන්ට තමන්ගේ ඩිප්ලෝමාව ගුරුවරයාට පගාව දීම මගින් ලබාගන්න පුළුවන් කියලා. ඒ නිසා දරුවන්ට ඉගෙන ගන්න හිතෙන්නේ නෑ. මෙහෙම සමාජයක් ගමන් කරන්නේ කොතෙන්ටද? මම කවදාවත් හිතුවේ නෑ, මා කරන ගුරු වෘත්තිය මේ තරම් පහත් තත්වයට පත්වෙයි කියලා."

## 2. කිර්ගිස්ථානයේ සාශා පවසන කතාව

සාශා 2010 දී බිෂෙක් අගනුවර දී මුණ ගැසුණු 68 හැවිරිදි රුසියන් ජාතිකයෙක්. ඔහු 1970 දී බිෂෙක්වල ලෝහ කම්හලේ සේවයට පැමිණි කෙනෙක්. ඔහු සහ ඔහුගේ බිරිඳ එම කර්මාන්ත ශාලාවට අයත් පොදු නිවසක ජීවත් වූවන්ය. ඔවුන්ගේ එකම දරුවා වන නඩියා, වත්මනෙහි රුසියාවෙහි ජීවත්වන අතර, ඇය කොණ්ඩා මෝස්තර සකසන්නියක් ලෙස රැකියාව කරයි. අද ඔහු ඉතා කුඩා විශ්‍රාම වැටුපකින් දිවි ගැටගහ ගනිමින් අතීත සෝවියට් යුගය ගැන බිඳුණු හඬකින් අදහස් කියයි.

"මම වෙලියා බින්ස්තා කර්මාන්ත ශාලාවේ වැඩට ඒමට පෙර සෝවියට් හමුදාවේ සෙබළෙක් ලෙස සයිබීරියාවේ සේවය කළා. අපේ පාලන අධිකාරිය අපව මධ්‍යම ආසියාවේ කර්මාන්තවල සේවයට යොමු කළා." මගේ හමුදා මිත්‍රයන්ද රාශියක් සිටි බැවින් මම රුසියානුවෙක් වුවත් මම කිර්ගීසියාවේ මේ කම්හලේ සේවයට ආවා. මම කම්හල තුළ වැඩ කණ්ඩායමක වගකීම ඉසුළුවා. මම මගේ වෘත්තියෙන් සතුටු වුණා. ඔබ හොඳින් සේවය කළොත් ඔබට ප්‍රසාද දීමනා (Bonus) ලැබුණා. කර්මාන්ත ශාලාව තුළ නිතර සංස්කෘතික හා ක්‍රීඩා උත්සව පැවැත්වුණා. මට මගේ බිරිඳ, කිර්ගීසියාවේ ඉපදුන රුසියානුවෙක්, මුනගැසුණේ මේ කර්මාන්ත ශාලාවේදි. සෝවියට් යුගය ආයෙත් එන එකක් නෑ. ඔබ දන්නවා හැම වසරකම මැයි 8 වෙනිදා පෙබරවාරි 23 වෙනිදා පැවැත්වුණු අති විශාල ආචාර පෙළපාලි ක්‍රෙම්ලීනය වෙත ගියපු ගමන්, ඒවා ඔක්කොම හීනයක් වෙලා. ඔබට මතක නැතිනම් ඔබේ දෙමව්පියන්ගෙන් අහන්න. ඒ යුගය ඉතා ලස්සනයි. හැම දෙයක්ම පිළිවෙළට. නිවසක්, රැකියාවක්, ජීවත්වීමට සුදුසු වැටුපක්, සෞඛ්‍ය පහසුකම්, සති අන්තවල චිත්‍රපට, නාට්‍ය බලන්න, පාර්ක්වලට යන්න, ග්‍රීෂ්ම කාලයේදි කඳුවල නිවාඩු ගන්න යන්න. ජීවිතේ ඒ කාලේ හොඳයි. අද ඔබ හිතන්නේ සල්ලි

හොයන්නේ කොහොමද කියලා විතරයි. වාසනාවකට අපට නිවසකුත් විශ්‍රාම වැටුපකුත් තියෙනවා. එහෙම නොවුණා නම් මොනවා වෙයිද කියලා හිතාගන්න බෑ. මම කවදාවත් හිතුවේ නෑ මගේ අන්තිම කාලය බිෂෙක්වල මෙහෙම තත්වයක් ඇතිවෙයි කියලා. මම එක දවසක් හිතුවා මම රුසියාවේ පදිංචියට යන්න ඕන කියලා. රුසියාවේ මගේ පවුලේ කවුරුත් නෑ. ඒකත් මට මතකයි. මම කොම්සමෝල් සාමාජිකයෙක් විදියට සෝවියට් කොඩිය අරන් ගියා." (සෝවියට් යුගය තුළ ජාතිවාදය නොතිබුණු බැවින් විවිධ සමූහාණ්ඩුවල ජනතාව නිදහසේ වෙනත් සමූහාණ්ඩවල ජීවත් වූහ. විවාහ වූහ) නමුත් ධනවාදය ප්‍රතිෂ්ඨාපනය කිරීමෙන් පසු බොහෝ මධ්‍යම ආසියානු රටවල ජාතිවාදය මතුවී තිබේ. ඒවායේ සිටින සාශා වැනි රුසියානුවන් ජාතික, සංස්කෘතික කොන්වීමකට ලක්වී ඇත.)

## 3. කසකස්තානයේ අල්මාස් පවසන කතාව

අල්මාස් යනු කසකස්ථානයේ කුඩා නගරයක ඉපදී හැදී වැඩුණු කෙනෙකි. (කසකස්තානය සෝවියට් දේශයේ ධාන්‍යාගාරය ලෙසින් හැඳින්විය.) ඔහු 52 වියති ඉංජිනේරුවෙකි. අද ඔහු ප්‍රංශයේ ජීවත් වන්නෙකි. ඔහු සෝවියට් හමුදාවේ සේවය කළ යුතු කාලය පෝලන්තයේ සේවය කළ කෙනෙකි. සෝවියට් සංගමය බිඳවැටුණු පසු ඔහු ඉංජිනේරුවකු ලෙස සේවය කළ කම්හල පුද්ගලීකරණය කෙරිණි. ඔහු එහි දිගටම සේවය කළද එහි වැටුප් එන්න එන්නම අඩුවිය. ඔහුගේ බිරිඳ හා දරුවන් රැකීමට එය ප්‍රමාණවත් නොවීය. පසුව ඔහු රැකියාවෙන් ඉවත්වී රුසියාවේ වසර 4ක් පමණ ඉදිකිරීම් සමාගමක සේවය කළේය. වසර හතරෙන් පසු ඔහු නැවැත ගමට එන විට ඔහුට රැකියාවක් නොතිබිණි. ඔවුන් ජීවත් වෙමින් තිබූ නිවස විකිණීමෙන් පසු පවුල ඔහු අතහැර ගොස් තිබිණි. ඔහුගේ ජීවිතය වියවුලක් විය. ඉන් පසු විදෙස් ගතවීමට තීරණය කළ ඔහු චෙක් ජනරජයට ගියේය.

චෙක් ජනරජයෙන් "නීති විරෝධී" ක්‍රමවලින් ඉතාලියට ගිය ඔහු පසුව ප්‍රංශයට පැමිණියේය ප්‍රංශයේදී ඔහුගේ ජීවිතය වියවුලෙන් පිරි එකකි.

"හමුදාවේදි අපි සියලු දෙනාම සහෝදරයෝ වගේ වුණා. කොමියුනිස්ට්වාදය අපේ ජාතිකත්වයන් නොසලකා අපව එක්කර තිබුණා. එහි සෝවියට් සංගමයේ සියලුම ජනරජවල අය රුසියානුවෝ. කොකේසස් ප්‍රදේශවල අය, මධ්‍යම ආසියාවේ අය, බෝල්ටික් රටවල අය කොරියානුවෝ මේ හැම කෙනෙක්ම හිටියා. අපි ඔක්කොම සෝවියට්වරු වුණා. අපි ආඩම්බර වුණා. ලොව ඉහළම විද්‍යාත්මක බලය සහිත, ලෝකයේ පලමු වැනි අභ්‍යවකාශ යානා හදපු, ලෝකයේ හොඳම හමුදාව ඉන්න රටේ අයවීම ගැන. අපේ කර්මාන්ත ශාලාවේ තත්වය වුණත් ඒකමයි. ඔබ මොන සෝවියට් ජනරජයේ වුණත් එය අදාළ වුණේ නෑ. ඔබට හැම තැනම, හැම රටකම මිත්‍රයන් සිටියා. අපේ මිත්‍රත්වයේ භාෂාව වුණ රුසියන් භාෂාව අපව එකතු කළා. හිතන්න, කසකස්තානයේ කුඩා නගරයක තිබූ කර්මාන්ත ශාලාවක මම ඉංජිනේරුවකු ලෙස සේවය කළා. කොරියානුවෝ, පෝලන්ත ජාතිකයෝ, යුක්රේනියානුවෝ, රුසියානුවෝ මේ හැමෝම හිටියා. අපේ කම්හලට පාපන්දු කණ්ඩායමක් තිබුණා. ඒක තමයි අපේ නගරයේ හොඳම කණ්ඩායම. කෙටියෙන් කීවොත් ජීවිතය අදට වඩා හොඳයි. අපට අධ්‍යාපනය, රැකියාව, පවුලක් තිබුණා. අපට ලැබුන පඩිය හොඳටම ප්‍රමාණවත් වුණා. නමුත් සෝවියට් දේශය බිඳ වැටීමෙන් අවුල් වුණා. අද වෙනකොට කසකස්තාන්වල තියෙන්නේ ඔබට මුදල් තියෙනවා නම් ඔබට මිතුරන්, කාර් එකක් සියල්ල ලැබෙනවා. මුදල් නැත්නම්, ඔබ මගේ තත්වයට පත්වෙනවා. මම යුරෝපයට පැමිණ නැතිභංගවූවෙක්. අපේ රට (කසකස්තානය) ගැන මෙහේ (ප්‍රංශයේ) අය දන්නේ අස්ථානා (අගනගරය) ගැනත් අපේ රටේ තෙල් හා යුරේනියම් තිබෙන බවත් විතරයි. කවුරුත් අපේ රටේ දුප්පත්කම හා සමාජ බේදවාචකයන්ට ගොදුරු වුණ ජීවිත දකින්නේ නෑ."

මෙසේ සමාජවාදී ජීවිතයක් ගෙවා එය අහිමිව ගිය තිදෙනෙකුගේ ප්‍රකාශයන්ගෙන් අමතරව තවත් සමීක්ෂණ වාර්තා කිහිපයක් ඇසුරෙන් එම බිඳවැටීම තවදුරටත් තහවුරු කරගත හැකිය. මෙහිලා අප උපුටා ගන්නා සියලුම සමීක්ෂණ වාර්තා දැඩි කොමියුනිස්ට් විරෝධී ආයතනවලින් කරන ලද හෝ ධනේශ්වර ආයතන විසින් කරන ලද ඒවා බව සඳහන් කළ යුතුය.

■ කැනේඩියානු Globe and Mail පුවත්පත 2008 දී කළ සමීක්ෂණයේදී අවුරුදු 37ක ලේඛිකාවක් වන Zahanna Sribnaya කළ ප්‍රකාශය.

"ළමා පුරෝගාමී කඳවුරු අපට මතකයි. ගිම්හාන නිවාඩුවට අපි ඔක්කෝටම කළු මුහුදේ ගත කරන්න යන්න පුළුවන් වෙනවා. ඒත් අද ඒක මුදල් තියෙන අයට පමණක් හිමි දෙයක් වෙලා."

■ ඇමරිකා එක්සත් ජනපදයේ දක්ෂිණාංශික සඟරාවක් වන Foreign Affairs -1999 කළ ජනමත සමීක්ෂණය ඇසුරෙන් ලබා ගන්නා ලද දත්ත.

රුසියානුවෝ සියයට 75ක් සෝවියට් දේශය බිඳවැටීම ගැන කනගාටු වෙති. සියයට 80ක් පමණ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය යනු ධනවාදී පාලනයක් බව විශ්වාස කරති. සියයට 80ක්ම ගැටලුවලට හේතුව අසාධාරණ ආර්ථික ක්‍රමය බව විශ්වාස කරති.

■ Foreign Affairs May – June – Flight from Freedom

"රුසියානුවන් තුළ සුවකළ නොහැකි රෝගයක් වෙයි. ඔවුන් නැවත කොමියුනිස්ට් ක්‍රමයට යාමට කැමතිය. ඒ සඳහා ඔවුන්ගේ ඇති ආශාව තනි පක්ෂ පාලනයක් වුවද කම් නැතැයි කියන තරමටම පවතී. ඇමරිකානුවන් මෙන් බහු පක්ෂ ක්‍රමයට ඔවුන්ගේ කැමැත්තක් නැත ."

ඉහත ජනමත සමීක්ෂණයට අනුව සැලසුම් සහගත ආර්ථිකය හා බෙදාහැරීම සහිත ක්‍රමය වඩා හොඳ බව 58%ක් විසින් පිළිගන්නා ලදී. වෙළඳපොළ ආර්ථිකය වඩා හොඳයැයි පිළිගන්නා පිරිස 28% කි.

සමාජවාදය බිඳවැටීමෙන් පසු එම රටවල තත්වය තනි පුද්ගලයන් ලෙස ප්‍රකාශයට පත් කරන ආකාරය ඉහත නිදර්ශනයන්ගෙන් ගෙන හැර දැක්වේ. අප විමසා බැලූ රටවල වෙන් වෙන් වශයෙන් එම බිඳවැටීම ප්‍රකාශයට පත්වන ආකාරය සමීක්ෂණයන් කිහිපයක් ඇසුරින් විමසා බලමු. එම රටවල සමාජ ආර්ථික හා ආධ්‍යාත්මක ජීවිත ගොඩනැඟී තිබුණු මට්ටමත්, එහි කඩාවැටීමේ ප්‍රමාණයත්, ඉන් ලද හානියේ ප්‍රමාණයත් හා වර්තමානයේ ඔවුන් ජාතියක් ලෙසින් විඳවන ප්‍රමාණයත් මෙම සමීක්ෂණ වාර්තාවන් අධ්‍යයනයේදී අපට අවබෝධ කොට ගත හැකිය. සියලුම සමීක්ෂණ වාර්තා දැඩි කොමියුනිස්ට් විරෝධී ආයතනවලින් කරන ලද හෝ දක්ෂිණාංශික හා ධනේශ්වර ආයතනවලින් කරන ලද ඒවා බව නැවතද සඳහන් කළ යුතුය.

## රටක් වශයෙන් වෙන්ව ගෙන කළ සමීක්ෂණ වාර්තාවන්

පුද්ගලයින් ලෙස අහිමි වූ සමාජවාදයේ හා වත්මනෙහි විඳවමින් සිටින ධනවාදයේ අත්දැකීම් පිළිබඳව සංසන්දනාත්මකව කරනු ලබන හෙළිදරව් කිරීම් තුළින් ඔවුන්ගේ හැඟීම්, හඳුනා ගන්නා පාඨකයාට සමාජවාදය බිඳ වැටුණු එක් එක් රටෙහි ධනවාදය තුළ වත්මන් තත්වය පිළිබඳව කරන ලද පුළුල් සමීක්ෂණ වාර්තා ඇසුරෙන් ස්වයං අධ්‍යයනයකට යෑමට හැකි වනු ඇත.

## 1. රුමේනියාව

රුමේනියාවේ ජනගහනය මිලියන 21කි. එහි වත්මන් ජනගහන වර්ධන වේගය ඍණ 0.26කි. ඒ අනුව රුමේනියාවේ ජනගහනය වර්ධනය නොවෙන තරම්ය. මෙලෙසින් ජනගහන වර්ධන වේගය බිඳවැටීම යනු සමාජ ආර්ථික බිඳවැටීමේ ප්‍රකාශනයකි. 1947 වන විට රුමේනියාවේ නොදියුණු ග්‍රාමීය ජනතාව හා සංක්‍රමණික ජනතාව සමස්ත රුමේනියාව ජනගහනයෙන් 3/4ක් විය. සමාජවාදය පැවැති සමයේ සෙසු නැගෙනහිර යුරෝපීය රටවලට වඩා රුමේනියාව ආර්ථික, සමාජීය, සංස්කෘතික හා ක්‍රීඩා යන ක්ෂේත්‍රයන්ගෙන් ඉදිරියෙන් විය. නමුත් සමාජවාදය බිඳ වැටීමෙන් පසුව ප්‍රංශය, ජර්මනිය, ග්‍රීසිය, ඉතාලිය ඇතුළු යුරෝපීය රටවල වීදි ජීවිත ගෙවන දශලක්ෂ ගණන් රෝමාවරුන් (අතිබහුතරය රුමේනියානුවන්ය) යුරෝපයේ දුප්පත්කමේ සංකේතය බවට පත්ව ඇත.

2012 දෙසැම්බර් 23 වෙනිදා රුමේනියානු පාර්ලිමේන්තුවේදී සියදිවි නසා ගැනීමට උත්සාහ කළ වයස අවුː 40ක් පමණ වන එරට රාජ්‍ය රූපවාහිනියේ තාක්ෂණ ශිල්පියාගේ එම ක්‍රියාව හා බැඳි පසුබිම් කතාව තුළින් මෙම තත්වය පිළිබඳව ඔවුන් දරන අදහස ඉතා පැහැදිලිය. රුමේනියා අගමැති එමිල් බෝක්ට එරෙහි විශ්වාසභංගයට ඡන්දය විමසන අවස්ථාවේදී මෙම රූපවාහිනී ශිල්පියා පාර්ලිමේන්තු බැල්කනියේ සිට පහළට පැන්නේය. ඔහු එම ක්‍රියාමාර්ගය ගෙන තිබුණේ ආබාධිත දරුවන්ට වෙන් කරනු ලබන අරමුදල් කප්පාදුවට එරෙහිවයි. එම අවස්ථාවේ ඔහු හැඳ සිටි ටී ෂර්ට් එකෙහි සඳහන්ව තිබුණේ - You Have Killed Our Future යන්නය. ඔහුගේ එම ප්‍රකාශයෙන් පැවසෙන්නේ, බහුතරයක් රුමේනියානුවන්ගේ ඇත්ත හැඟීමය. සමාජවාදය බිඳ දමා ලබාදුන් ධනවාදය විසින් ඔවුන් ඇද වට්ටවා ඇති තරම මින් නොකියවෙන්නේද? (මෙම සිද්ධියෙන් පසුව අස්ථි බිඳීයාම හේතුවෙන් ඔහු රෝගාතුරවී ඇත.) මරණයද නොතකා

මෙවන් විරෝධය දැක්වීම්වලට මිනිසුන් පෙළඹෙන්නේ පීඩනයේ හා අසාධාරණයේ ප්‍රමාණය ඉක්මවා යෑම හේතුවෙනි.

සමාජවාදය බිඳවැටීමෙන් පසු රුමේනියාව පිළිබඳව කරනු ලබන සමීක්ෂණ කිහිපයක දත්ත සහිත විග්‍රහයන් පහත සඳහන්වේ. සමාජවාදය වෙනුවට ධනවාදය විසින් රුමේනියාවට ගෙන දුන් ඛේදවාචකයේ තරම වටහා ගැනීම සඳහා මෙය හොඳම කියවීමකි. එම සමීක්ෂණ වාර්තාවට අනුව සමාජවාදය වෙත යාමට කැමැත්ත ප්‍රකාශ කරනු ලබන පිරිස සැලකිය යුතු සංඛ්‍යාවක් වේ. ඔවුහු තම ජීවිතයේ කඩා වැටීම හා අනාරක්ෂිත බව අත්විඳිමින් සිටින්නෝය. එහෙත් ධනවාදය විසින් තම ජීවිතය සමාජවාදී අවධියට වඩා ඉහළට ඔසවා තබනු ඇතැයි ඔවුන් විසින් විශ්වාස කරන ලදී. නමුත් එය එසේ නොවීය.

## BBC සමීක්ෂණ වාර්තාවකට අනුව

ලොව පුරා ධනවාදය තවදුරටත් වැඩකට ඇති දෙයක් නොවන බව BBC සමීක්ෂණ වාර්තාවක් මඟින් දක්වා තිබේ. ඒ අනුව ධනවාදයට එහි අති බහුතරයක් දෙනා එකඟ නොවන බව හොඳින් පැහැදිලි වේ.

"රුමේනියානුවන් 46%ක් නැවැත තම රට කොමියුනිස්ට් යුගය වෙත  යනවා නම් හොඳ යැයි පවසනවා. 5%ක් ඒ ගැන කිසිවක් පවසන්නේ නැහැ."  මේ සමීක්ෂණය කර තිබුණේ "කොමියුනිස්ට් අපරාධ පිළිබඳව සමීක්ෂණය සඳහා වන ආයතනය " නම් පිරිසකි. කොමියුනිස්ට් අපරාධ පිළිබඳව සමීක්ෂණය සඳහා වන ආයතනයක් තිබුණට ධනේශ්වර අපරාධ සමීක්ෂණය සඳහා වන ආයතනයක් ලෝකේ කොහේවත් තියනවා කියලා මම නම් හිතන්නේ නෑ. මතක තබා ගන්න ධනවාදයට අනුව අපරාධ කියන්නේ පුද්ගල බද්ධ සිදුවීම්.

ඒ අනුව බලන කොට පුද්ගලයා මිසක් ධනවාදය අපරාධ කරන්නේ නෑ. ඒ නිසා ඔබට කවදාවත් එය විවේචනය කරන්න විදියක් නෑ. තම රට නැවැත කොමියුනිස්ට් යුගය දක්වා යනවා නම් හොඳයි කියලා රුමේනියානුවන් හිතන්නේ ඇයි? සමහර විට ඔවුන් මුහුණ දෙන අනාරක්ෂිත තත්වය සහ බිඳවැටුණු ජීවන තත්වය නිසා එහෙම හිතනවා වෙන්න පුළුවන්. මොකද, ධනවාදය තමන්ට ඉහළම ජීවන තත්වයක් ලබාදෙනු ඇති කියලා  ඔවුන් කලින් හිතුවත් මේ වන විට එය අසාර්ථක වෙලා තියෙනවා. එදා පාලකයෝ කිව්වා 46% කියන්නේ බහුතරය නොවෙයි කියලා. නමුත් පසු ගිය වසරේ BBC ආයතනය කරන ලද සමීක්ෂණයකට අනුව සමීක්ෂණයට යොදාගත් සෑම පුද්ගලයන් පස්දෙනෙකුගෙන් තුන් දෙනෙක්ම ධනවාදයේ නිදහස් වෙළඳපොළ ක්‍රමයට විරුද්ධ බවත්, ලෝකයේ 89%ක් ජනතාව ධනවාදය තවදුරටත් වැඩකට නැති දෙයක් බව පවසන බවත් හෙළි වුණා. මේ ගැන මොකද කියන්නේ ? අපේ රට නැවත කොමියුනිස්ට් යුගය කරා යනවාට කැමති නැති 54% ට එරෙහිව ඒ 89% ඉන්නවා.”

## රුමේනියාවේ ආර්ථික වර්ධන වේගය පහත වැටීම

රුමේනියාව සමාජවාදය බිඳවැටීමට ආසන්න කාලයේ තිබූ ආර්ථික වර්ධනය ක්‍රමයෙන් පහළ වැටෙමින් වර්තමානය වන විට එය බින්දුවයි දශම ගණනට ඇද වැටී ඇත. රුමේනියාවේ වර්තමාන තත්වය සලකා බලද්දී ආර්ථික වර්ධන වේගය සමාජවාදී අවධියට වඩා 1/3ටත් අඩු අගයක පවතී. සමාජවාදයේ අවසන් වසර 18 තුළ එනම් 1973 - 90 අතර  කාලය තුළ එරට ආර්ථික වර්ධන වේගය 3.31% කි. ධනවාදයේ මුල් වසර 18 තුළ  එනම්  1990 - 2008 අතර කාලය තුළ එහි ආර්ථික වර්ධන වේගය 1.90%කි. 2012 වන විට ආර්ථික වර්ධනය වේගය 0.9%කි. මේ අනුව ධනවාදය තුළ ආර්ථික වර්ධන වේගය තෙගුණයකින් පමණ පහත වැටී ඇත.

මෙසේ ආර්ථිකයේ බිඳවැටීම හමුවේ දරිද්‍රතාවය ඉහළ ගියේය. එහි ප්‍රතිඵල ලෙසින් රුමේනියාවේ උපත් සංඛ්‍යාව පෙරට වඩා අඩකින් අඩු විය. මරණ සංඛ්‍යාව නිරපේක්ෂ ලෙස වැඩි විය. ජීවත් වීමේ ගැටලු සහගත තත්වය නිසා රට වැසියන් දරුවන් හැදීම සීමා කරගන්නට විය. 1989 වසරේ දි මිලියන 25ක් වූ ජනගහනය 2012 වසරේ දී මිලියන 21.8ක් දක්වා පහත වැටුණේය. 1990 එනම් සමාජවාදය බිඳවැටෙන අවධියේ ජනතාවගේ සාක්ෂරතාවය සියයට 99.3ක් වූ ඉහළ අගයක පැවති අතර 2010 දී එම සංඛ්‍යාව සියයට 97.7 දක්වා පහත වැටී ඇත.

සමාජ ආරක්ෂණය හා සෞඛ්‍යය අරාජිකවීම හේතුවෙන් සමාජ අපරාධ බහුල වීමත් බියකරු රෝග වසංගත තත්වයට පත්වීමත් සිදුවේ. ඒඩ්ස් රෝගීන් ප්‍රමාණය 2001 වසරේදී 6000ක් වූ නමුත් 2011 වසර වන විට සමාජවාදය බිඳ වැටීමෙන් වසර 20 කට පමණ පසු එම සංඛ්‍යාව 16,000ක් බවට පත් විය. අපරාධ සිදුවීම් සලකා බැලුවද දක්නට ලැබෙන්නේ වර්ෂ 1995 -2000 දක්වා වන කාලය තුළ මිනී මැරීම් 6.44 සිට 7.44 දක්වා වන 15.5%ක වර්ධනයකි. එම කාල පරතරයේදීම ස්ත්‍රී දූෂණ ප්‍රමාණය 6.44 - 8.4 වර්ධනයක් දක්නට ලැබෙන අතර එය සියයට 29.5ක් වේ. සමස්ත අපරාධ සංඛ්‍යාවේ වර්ධනය 1995 වසරේදී 552 සිට 2000 වසරේදී 1049ක් වන අතර එය 90%ක වර්ධනයකි. සමස්ත අපරාධවල වර්ධනය එකට එකක් වැඩිවී ඇත. වත්මන් රුමේනියාවේ ලිංගික වහලුන් වසරකට 20,000ක් සේවයේ යෙදවේ. ඒ පිළිබඳව සංඛ්‍යා දත්තවලින් යුරෝපයේ වැඩිම අගය එයය. යුරෝපයේ පමණක් නොව තායිලන්තය වැනි රටවලටද වඩා එය ඉහළ අගයකි. රුමේනියාව තරුණ හා ලාබාල තරුණියන් ලිංගික වහලුන් ලෙස සේවයේ යෙදෙන ලොව පළමු පෙළේ රටවල් අතරට පත්වී තිබේ. ඒ හා බැඳෙමින් ඒඩ්ස් රෝගින් ප්‍රමාණයේ වර්ධනය 2001 වසරේ 6000ක් වූ අතර 2011 වසරේදී එය 16,000 ලෙස

දස දහසකින් වැඩිවිය. සමාජයේ කඩාවැටීමේ දර්ශකයක් ලෙස සිය දිවි නසාගැනීම් ඉහළ ගොස් ඇත. 1990 වසරේ දි එය ජනගහනයෙන් ලක්ෂයකට 9ක් වූ අතර 2009 වසරේ සිට ජනගහනයෙන් ලක්ෂයකට 12ක් දක්වා වැඩිවීමක් දක්නට ලැබේ.

## ධනවාදී රුමේනියාව තුළ ජනමත සමීක්ෂණ ප්‍රතිඵල

රුමේනියානුවන් 45%ක් කොමියුනිස්ට් විරෝධී විප්ලවය සිදු නොවුණා නම් තම ජීවිත අදට වඩා හොඳ විය හැකි බව විශ්වාස කරයි. 61%ක් වැඩිහිටියන්ට අනුව කොමියුනිස්ට් පාලනයට (චෞචෙස්කෝගේ පාලනයට) වඩා පහළ ජීවිතයක් දැන් ගත කරන බව විශ්වාස කරයි. 24%කගේ මතය වී ඇත්තේ එසේ නොවන බවය.

2010දී 1476ක් වැඩිහිටියන් යොදාගනිමින් Romanian Institute for Evaluation and Strategy (IRES) විසින් කළ සමීක්ෂණ වාර්තාවට අනුව 84%ක් දෙනා පවසන්නේ, කොමියුනිස්ට් යුගයේ සිටි ජනාධිපති වන නිකොලායි චෞචෙස්කෝ සාධාරණ නඩුවකින් තොරව එල්ලා මැරීම වැරැදි බවයි. එමෙන්ම 60%ක් ඔහුගේ මරණය ගැන දුක්වෙති. තවද 54%ක් කොමියුනිස්ට්වාදය හොඳ අදහසක් බව විශ්වාස කරති. 44%ක් මෙම හොඳ අදහස වැරැදි ලෙස ක්‍රියාත්මක කළ බව පවසති. 15%ක් දෙනා මෙම හොඳ අදහස නිවැරදි ලෙස ක්‍රියාත්මක කළ බව කියති. කොමියුනිස්ට්වාදය නරක බව පවසන්නේ, 29%ක් පමණය. එරට ගැහැනු පිරිමි දෙපාර්ශ්වයම බොහෝ දුරට සමාන ලෙස ඉහත අදහස් දරති. එසේම සමාජවාදී යුගයේ මතකයන් සහිත වයස අවුරුදු 40ට වැඩි අයගෙන් බහුතරයක් කොමියුනිස්ට් ක්‍රමය හොඳ බව පවසති. වයස අවුරුදු 60ට වැඩි 74%ක්ද වයස 20 - 39ත් අතර තරුණ අයගෙන් 49%ක්ද වයස 20ට අඩු 31%ක්ද විසින් එම මතය දරනු ලබයි. ග්‍රාමීය ජනයාගෙන් සියයට 79ක් කොමියුනිස්ට් ක්‍රමය හොඳ බව පවසති.

## ධනවාදයට එරෙහිව රුමේනියාවේ විරෝධතා

ධනවාදය තුළ සමාජ ආර්ථික බිඳවැටීමට එරෙහිව රුමේනියානු ජනතාව තම විරෝධය දක්වමින් සිටියි. එම විරෝධය පහත සමීක්ෂණ දත්තවලින් මනාව තහවුරු වේ.

මෙම තොරතුරු හා දත්තයන් රුමේනියාවේ සමාජ (ජනමත) සමීක්ෂණ වාර්තා ඇසුරෙනි.

1. Romanian Institute for Evaluation and Strategy (IRES)- 2010

එල්ලා මරා දමන ලද චචෙස්කො නැවත ජනාධිපතිවරණයට ඉදිරිපත් වුවහොත් තමන් ඔහුට ඡන්දය දෙන බව 41% දෙනෙකු පවසති. 63%ක් පවසන්නේ කොමියුනිස්ට්වාදය තුළ ජීවිතය වඩා හොඳ වූ බවයි.

2. Soros Foundation Romania - 2006

සියයට 53ක් දෙනෙකු පවසන්නේ, කොමියුනිස්ට්වාදය යහපත් සංකල්පයක් බවයි. සමස්තයක් ලෙස වයස, අධ්‍යාපනය නොසලකා බාල, මහලු සහ උගතුන් බොහෝ දෙනෙකු පොදුවේ මෙම අදහස දරන බව සමීක්ෂණයෙන් පැහැදිලි විය.

3. Center For Urban and Rural Sociology (CURS) - 2009

ඉහත සඳහන් සමීක්ෂණ වාර්තා තුළින් පැවැති සමාජවාදයේ ප්‍රතිපත්තිවල බලපෑම වර්තමානයේද ජනතාව තුළ පවතින බව පැහැදිලි වේ.

එම බලපෑම මත වත්මන් ජනතාව අතුරින් 86%කගේ මතය වන්නේ ආණ්ඩුව විසින් යහපත් ජීවන මට්ටමක් සැපයිය යුතුය යන්නය. තවද ජනතාවගෙන් 84%ක් ආණ්ඩුව සැමටම හොඳ රැකියා ලබා දිය යුතු යැයි විශ්වාස කරති. එමෙන්ම ජනතාවගෙන් 50%ක්

දෙනා ආණ්ඩුව විසින් පුද්ගලයන්ගේ ආදායම සීමා කළ යුතු යැයි පවසති. මේ කොමියුනිස්ට් පාලනයේ පැවැති සංකල්පයන්ගෙන් ජනතාව තුළට තහවුරු වූ අදහස්ය. එම සමාජයේ ඉහළ උගතුන් හා තරුණ අය තුළ කොමියුනිස්ට් ක්‍රමයට ඇති කැමැත්ත පෙරට වඩා ඉහළ ගොස් ඇත.

CURS හි 1999දී කරන ලද සමීක්ෂණයේදී බොහෝ උගතුන් කොමියුනිස්ට්වාදයට සහය පළ නොකළ නමුත් ඒ බොහෝ දෙනෙක් 2009 වන විට තම අදහස වෙනස් කරගනිමින් කොමියුනිස්ට්වාදයට සහය දක්වන්නට වූහ.

## කොමියුනිස්ට්වාදය පිළිබඳ සුභවාදී හැඟීම වර්ධනය වෙමින් තිබීම

කොමියුනිස්ට්වාදය පිළිබඳව එම ජනතාවන් තුළ තිබෙන වැරැදි ආකල්පයන් දුරුව යමින් තිබේ. ධනවාදය හා කොමියුනිස්ට්වාදය යන සමාජ ආර්ථික අත්දැකීම් සහ අත්විඳීම් විසින් කොමියුනිස්ට්වාදයේ නිවැරදි හා යහපත් බව ඔවුනට ප්‍රත්‍යක්ෂ වෙමින් ඇත. එය සමාජවාදය තුළ ජීවිතය හොඳය යන අදහස දරමින් 2007 වසර වන විට සිටි 32%ක් වන ජනතාව 2011 වසර වන විට 50% දක්වා ඉහළ යාම තුළින් තහවුරු වේ. 2006 වසරේදී "කොමියුනිස්ට්වාදය යහපත් දෙයකි" යන්න පිළිගත් 53%ක් වූ පිරිස 2011දී 61% දක්වා වර්ධනය වීමෙන් පැවසෙන්නේ, ධනවාදය හා සංසන්දනයේදි කොමියුනිස්ට්වාදය ජනතාවාදී පාලනයක් බව පිළිගනු ලබන පිරිස ප්‍රමාණාත්මකව ඉහළ ගොස් ඇති බවය. මෙයට අමතරව රුමේනියානු මැතිවරණ නිරීක්ෂණ ආයතනයක් වන CSOP කළ සමීක්ෂණයක් අනුව ජනගහනයෙන් අඩක් පවසා තිබෙන්නේ අදට වඩා චෞචෙස්කු පාලනය ඉතා හොඳ බවය.

## 2. බල්ගේරියාව

බල්ගේරියානු ජනගහනය මිලියන 7කි. වර්තමානයේ ජනගහන වර්ධන වේගය පවතින්නේ ඍණ 0.78ක් තරම් අඩුම ප්‍රමාණයකය. 1944 සිට 89 දක්වා කාල වකවානුවේදී බල්ගේරියාව පැවතියේ සමාජවාදී රාජ්‍යයක් ලෙසිනි. පැවති සමාජවාදී ආර්ථිකය තුළ නිෂ්පාදන මාධ්‍යයන්හි අයිතිය රාජ්‍ය හා සාමූහික දේපළ යන ආකාර දෙකින්ම පැවතුණි. එම කාලය තුළ සමාජවාදී බල්ගේරියාව තම ස්ථාවර වත්කම් ප්‍රමාණය 22 ගුණයකින් ඉහළ නංවා ගන්නට සමත් විය. සමාජවාදය ආරම්භ වන 1944 වසරේදී ග්‍රාමීය ගොවි ජනතාව 75%ක් වීමෙන් පෙන්නුම් කෙරෙන්නේ, එය එවකට ගොවි රටක්ව පැවැති බවයි. 1939 වකවානුවේ 99%ක්ම අපනයන භාණ්ඩ වශයෙන් පැවැතුණේ අමුද්‍රව්‍ය හා කෘෂි නිෂ්පාදනයන්ය. නමුත් 1983 වන විට අපනයන භාණ්ඩවලින් 55% යන්ත්‍ර සූත්‍ර වීම තුළින් පෙන්නුම් කෙරෙන්නේ, සමාජවාදී ආර්ථිකය තුළ ඇති වූ වර්ධනයේ ප්‍රමාණයයි. මෙහිදි බල්ගේරියාව කාර්මීකරණය වූයේ ග්‍රාමීය ප්‍රදේශ විනාශ කරමින් නොවේ. ඒ වෙනුවට පරිසර හා හිතකර සමාජ වටපිටාවන් සුරකිමිනි. කාර්මීකරණය විසින් විශාල වශයෙන් රැකියා ජනිත කළේය. සමාජවාදී බල්ගේරියාව විසින් කෘෂිකාර්මික යන්ත්‍ර සූත්‍ර, උපකරණ හා අනෙක් දෑ නිපදවන ලද්දේය. එමෙන්ම කාර්මීකරණය විසින් කෘෂිකර්මාන්තය වඩා දියුණු විය. කාර්මීකරණය හා විද්‍යුත්කරණය හේතුවෙන් බල්ගේරියාව තුළ විදුලි උපකරණ හා යන්ත්‍ර සූත්‍ර භාවිතය විශාල ලෙස ඉහළ ගොස් තිබිණි..

**පහත දැක්වෙන සංඛ්‍යා දත්ත සටහනින් එය මනාව පැහැදිලි වේ.**

| භාණ්ඩ වර්ගය | 1965දී (සමස්ත නිවාස ඒකක ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස) | 1988දී (සමස්ත නිවාස ඒකක ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස) |
|---|---|---|
| රූපවාහිනී | 80% | 100% |
| ගුවන්විදුලි යන්ත්‍ර | 59% | 95% |
| ශීතකරණ | 5% | 96% |
| මෝටර් රථ | 22% | 40% |

බල්ගේරියාව සමාජවාදී වීමට පෙර 1939 වසරේදී පැවති දළ ජාතික නිෂ්පාදිතය මෙන් 26 ගුණයක් 1989 වසරේදී සමාජවාදය යටතේ වැඩි කරගෙන තිබුණේය. ඒක පුද්ගල ආදායම 1939දී තිබූ අගය මෙන් 11 ගුණයක වර්ධනයක් සමාජවාදය බිඳවැටෙන ආසන්න සමය වන විට දක්නට තිබුණි.

සමාජවාදී යුගයේදී බල්ගේරියාවේ මිනිසුන් දශ ලක්ෂයකට මිනිසුන් 52ක් වර්ෂ 100 කට වැඩි ආයුෂ සහිතව ජීවත් වූ අතර එය ලොව වැඩිම ආයු අපේක්ෂිත අගය ලෙස සැලකිණි. එහෙත් ධනවාදය යළි ස්ථාපිත කළ පසු 1990 වසරේ සිට 2012 වසර වන විට සියයට 2.68 කින් ළදරු මරණ අනුපාතය ඉහළ ගොස් ඇත.

**ඒ අනුව ළදරු මරණ අනුපාතයේ ඉහළයෑම පහත සඳහන් පරිදි වේ.**

| වර්ෂය | ප්‍රතිශතයක් ලෙස (සජීවී උපත් දාහකට) |
|---|---|
| 1939 | 138.9 |
| 1990 | 14 |
| 2012 | 16.68 |

තවද සමාජවාදී බල්ගේරියාවේ ක්‍රීඩාව සලකා බලන විට 1956 - 1988 වසරවලදී ඔලිම්පික් පදක්කම් 153ක් දිනාගෙන තිබේ.

එයින් එම රජය ක්‍රීඩාව කෙරෙහි දැක්වූ යහපත් ආකල්පය මනාව ඉස්මතු වේ.

## සමාජවාදී බල්ගේරියාවේ අධ්‍යාපනය

1989 වසර වන විට බල්ගේරියාව රටේ ජනගහනයෙන් වෘත්තීය හා උසස් අධ්‍යාපනය ලැබූවන් ප්‍රමාණය වැඩිම රටවල් අනුපිළිවෙළෙහි 26 ස්ථානයේ පවතින රට බවට පත්වී තිබුණේය. 1970 වසරේ සිට 1980 වසර දක්වා සමස්ත ජනගහනයෙන් සියයට 3.1ක් උපාධිධාරීහු වූහ. මෙය ප්‍රංශය, ඉතාලිය, නෝර්වේට වඩා ඉහළ අගයක් විය.

## සමාජවාදය තුළ නිවාස

1965 වසරේ දී ජනගහනයෙන් 1000 කට ඉදිකරන ලද නිවාස ප්‍රමාණය 253ක් වූ අතර 1989 වසරේදී එය ජනගහනයෙන් 1000 කට නිවාස ප්‍රමාණය 374 දක්වා ඉහළයාමක් පෙන්වන ලදී. මෙය ඒ සම්බන්ධයෙන් වන ලොව ඉහළම අගය විය. ඒ අතර විරැකියාව, දුප්පත්කම, යාචකයින් හා ඇති නැති පරතරය අවම කර තිබුණේය.

දේශපාලනිකව සමාජවාදී බල්ගේරියාව තම ජාත්‍යන්තර යුතුකම සලකමින් වියට්නාමය, ඉන්දුනීසියාව, ලිබියාව, ඇන්ගෝලාව, අෆ්ගනිස්ථානය, මැද පෙරදිග යන රටවල හා ප්‍රදේශවල ජාතික විමුක්ති අරගලවලට ආධාර උපකාර කළේය.

## බල්ගේරියාව තුළ ධනවාදය ස්ථාපිත කිරීමෙන් පසු ( 1989 - 2006 දක්වා) කාලය

සමාජවාදය බිඳ වැටීමෙන් පසුව බල්ගේරියාව පෙර පැවති කර්මාන්ත, කෘෂිකර්මාන්තය, රජය සතු ගොවිපළවල් පුද්ගලීකරණය

කරන ලදී. එහි එක් ප්‍රතිඵලයක් ලෙස පරිසර විනාශය ඉතා ඉහළ මට්ටමකට වර්ධනය විය. එහි ප්‍රතිපලයක් ලෙස සෑම දිනකම පාපන්දු ක්‍රීඩාංගණ සියයක ප්‍රමාණයේ වනාන්තර ප්‍රමාණයක් කපා විනාශ කරන්නට විය. වැඩිදුරටත් පෙන්වා දෙන්නේ නම් බල්ගේරියාවේ පුද්ගලීකරණයේ ප්‍රතිඵල පහත සඳහන් ලෙස කරුණු වශයෙන් දැක් විය හැකිය.

1. පුද්ගලීකරණයේ ප්‍රතිඵලයක් ලෙස බල්ගේරියාවේ විශාලතම ඛනිජ කර්මාන්ත ශාලාව (Kremikovtsi) මේ වන විට ඇමරිකානු ඩොලර් ලක්ෂයකට විකුණා අවසන්ය.

2. බල්ගේරියානු ගුවන් සමාගමවූ Balkan - ඇමරිකානු ඩොලර් 150,000කට (ඇ. ඩො. ලක්ෂ එක හමාර) විකුණා දමන ලදී.

3. කලු මුහුදේ පිහිටා තිබූ Varua නැව් තටාකාංගණයද විකුණා දමා තිබේ.

4. Bulgarian Telegraps Company- BTK 2005 වසරේදී ඇමරිකා එක්සත් ජනපද සමාගමකට යුරෝ මිලියන 220කට විකුණා දමන ලදී. මෙම විකුණූ මිල එම ආයතනය ලබමින් තිබුණු ලාභ ප්‍රමාණයට සමාන වීම මගින් පැහැදිලි වන්නේ, සමාජවාදය ප්‍රතික්ෂේප කොට වැළඳගත් ධනවාදයේ මුග්ධකම හා ධනවාදය තුළ පවතින නාස්තිකාර කොමිස් ක්‍රමයේ ස්වභාවයයි. පසුව එය මිලදී ගත් ඇමරිකානු සමාගම විසින් මෙම ආයතනය යළි ඔස්ට්‍රියන් සමාගමකට යුරෝ බිලියන 1.6කට විකිණීය. මෙය ඇමරිකානු සමාගම විසින් මිලදි ගත් මිලට වඩා හත් ගුණයකට වැඩි මුදලකි.

5. 1989 වසර වන විට යුරෝ බිලියන 1.1 වූ එරට විදෙස් ණය ප්‍රමාණය 2004 වසර වන විට යුරෝ බිලියන 12ක් දක්වා වර්ධනය වී ඇත.

6. 1989 බල්ගේරියානු කර්මාන්ත හා ඉදිකිරීම්වල වටිනාකම - ඩොලර් මිලියන 90,527කි. ( බිලියන 90.5කි.) නමුත් 2001 වසර වන විට මෙම

අගය ඩොලර් මිලියන 14105ක් (බිලියන 14.1ක්) දක්වා පහත වැටී ඇත. ඒ අනුව එම පහත වැටීම ඩොලර් බිලියන 76.4ක අඩුවීමකි. මේ ධනවාදී ආර්ථිකය තුළ බල්ගේරියාව ලද පලදාවයි.

## බල්ගේරියාවේ වත්මන් ආර්ථික හා සමාජයීය කඩා වැටීම

බල්ගේරියාවේ වත්මන් ධනවාදය තුළ පුද්ගලික භාණ්ඩ හා සේවා පරිභෝජනය 1989 වසරෙහි පැවති අගයෙන් සියයට 55ක් දක්වා පහළ ගොස් ඇත. එය සමාජවාදය පැවැති අවධියට වඩා අඩකට ආසන්න අගයකින් පහත වැටී ඇත. එනම් ජනතාවගේ මූලික අවශ්‍යතා අඩකින් පමණ කප්පාදු වී ඇත. වෘත්තිකයින්ගේ මූලික වැටුප 2004 වසර වන විට 1989 වසරෙහි පැවති ප්‍රමාණයෙන් සියයට 47ක් දක්වා අඩු විය. මෙය සමාජවාදය තුළ ලැබූ වැටුපෙන් අඩකටද අඩු අගයකි. විශ්‍රාමිකයෙකු සමාජවාදය අවධිය තුළදී වාර්ෂිකව ලැබූ විශ්‍රාම වැටුප් ප්‍රමාණයෙන් වර්තමානයේ ඔහු ලබන්නේ සියයට 41ක ප්‍රමාණයකි. තවද වර්තමානයේ රට හැරගොස් ඇති වෘත්තිකයින් ප්‍රමාණය මිලියන 1 (දශ ලක්ෂය)කි. ඔවුන් රට හැර යන්නේ පවතින ක්‍රමය පිළිබඳ කලකිරීම නිසාය. මේ වන විට බල්ගේරියාවේ විරැකියාව සියයට 20 කි. නමුත් 1990 දි එනම් සමාජවාදයේදී එය සියයට 1ක් තරම් පහළ මට්ටමක පැවැතිණි. දරිද්‍රතාවය මනිනු ලබන ගිනි සංගුණකය 1989 දී එනම් සමාජවාදය බිඳ වැටෙන අවස්ථාව වනවිට 23ක් වූ අතර වර්තමානයේදී එය 35ක් දක්වා ඉහළ ගොස් තිබේ. එම ඉහළයාමෙන් පෙන්නුම් කරනුයේ බල්ගේරියාවේ දරිද්‍රතාවය ඉහළ ඉහළ ගොස් ඇති ප්‍රමාණයයි. එනම් ජීවිත කඩාවැටෙන වේගය ඉහළ යෑමේ ප්‍රමාණයයි.

එරට වැඩ කරන ජනතාවගේ සාමාන්‍ය වැඩ කාලය පවා පැය 12 -16 දක්වා දීර්ඝ වී ඇත. ඔවුනගේ සාමාන්‍ය වැටුප යුරෝ 100කි. එරට වැටුප් ප්‍රමාණයන් බරපතළ ලෙස පහළ වැටීමට අමතරව

මාස ගණනාවක් තිස්සේ එක දිගට වැටුප් නොගෙවූ ආයතනයන්ද පවතියි.

තවද රට තුළ ජනගහනය සැලකිය යුතු සංඛ්‍යාවකින් පහළ යෑමක් දක්නට ලැබේ. එම පහළ යෑම මිලියන දෙකකි. 1989 වසරේ, සමාජවාදය බිඳවැටෙන අවස්ථාවේ විසූ ජනගහනය 9,009,018 කි. 2012 වසර වන විට එය 7,037,935ක් දක්වා පහත වැටී ඇත. එරට ජනගහන වර්ධන වේගය ඍණ 0.78 කි. මේ වන විට යුරෝපයේ වැඩිම මරණ අනුපාතය බල්ගේරියාවෙන් වාර්තා වේ. එසේම අඩුම උපත් අනුපාතයද බල්ගේරියාවෙන් වාර්තා වේ. ළදරු මරණ අනුපාතය 1990 වසරේ දී උපත් 1000 කට 14ක් වූ අතර එය 2012 වසර වන විට උපත් දහසකට 16.13ක් දක්වා ඉහළ යාමක් පෙන්නුම් කරයි. 2013 වසර වන විට එම අගය නැවත 16.68ක් දක්වා ඉහළ ගොස් ඇත. මෙයින් පැහැදිලි වන්නේ, එම අගය තව තවත් වැඩිවෙමින් පවතින බවය. බල්ගේරියානු ජනතාවගේ ආයු අපේක්ෂිත කාලයද වසර 15ක් ඇතුළත අවුරුදු 7 - 8 පමණකින් පහත වැටී ඇත. මේ සියල්ලම හේතුවෙන් ජනගහනය අඩුවන අතර, ආර්ථික අස්ථාවරභාවය නිසා වන ජන සංක්‍රමණයන්ද මෙයට ප්‍රධාන වශයෙන් බලපානු ලබයි.

ළමුන්ගේ ජීවිත සලකා බලද්දී ළමා වහලුන් ලෙස යොදවා ගන්නා සහ යෙදවෙන ප්‍රමාණය සැලකිය යුතු සංඛ්‍යාවකි. 2005 වසරේදී වයස අවුරුදු 5ත් 17ත් අතර වයසේ ළමුන් 83,000ක් කම්කරුවන් ලෙස වැඩවල යොදවා ඇති බව සංඛ්‍යා දත්තයන් සඳහන් කරයි. යුරෝපයේ වැඩිම හිංසනයට ලක්වන ළමුන් සිටින්නේද බල්ගේරියාවේය. ආර්ථික අමාරුකම් නිසා දෙමව්පියන් විසින් අත්හැර දමන ලද වැඩිම ළමුන් ප්‍රමාණයක් සිටින්නේද බල්ගේරියාවේය. ළමයින් විකිණීමට එරෙහිව නීතිය ඉදිරියේ ඔප්පු වූ නඩු 250කි. පාසැල් යන වයසේ දරුවන්ගේ පාසල් අධ්‍යාපනය සියයට 50කින් පහත වැටී තිබීමෙන් රටේ අනාගතය කෙතරම් බියකරු තත්වයකට

ඇද වැටී තිබේ දැයි පැහැදිලි වේ.

සමාජ ආර්ථික අර්බුදය හේතුවෙන් ව්‍යාප්තවූ සමාජ ප්‍රශ්න අතරට ගණිකා වෘත්තියද ඉහළින්ම දායකවී ඇත. 1989 වසර වන විට එරට තුළ ගණිකා වෘත්තිය නැති තරම් විය. එහෙත් මේ වන විට INTERPOL වාර්තා අනුව යුරෝපය තුළ ගණිකා වෘත්තියෙහි නිරතවන බල්ගේරියානු කාන්තාවන් ගණන 20,000ක් පමණ වේ. 2004 වසර වන විට බල්ගේරියාවේ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන්ගේ ලේඛන ගත සංඛ්‍යාව ලක්ෂ දෙකකි. 1984 වසර දෙස ආපසු හැරී බලන විට එය ඉතා ඉහළ අගයකි.

පහත සඳහන් ජනමත සමීක්ෂණ වාර්තාවලට අනුව ඉහත විග්‍රහ කරගන්නා ලද කරුණු තවදුරටත් ඉතා හොඳින් පැහැදිලි වනු ඇත.

බල්ගේරියාවේ සමාජවාදී අවධියට වඩා ධනපති ක්‍රමය යටතේ ජීවිතය දුෂ්කරය යන්න පිළිගන්නා ප්‍රමාණය සියයට 80කි. අනෙක් අතට ධනවාදය තුළ ජීවිතය යහපත් යැයි පවසන ප්‍රමාණය සියයට 5කි.

Mimi Vitkova - බල්ගේරියානු (1995 - 1997) හිටපු සෞඛ්‍ය ඇමතිනියගේ පහත ප්‍රකාශය එහි වර්තමාන යථාර්ථය මනාව ප්‍රකාශයට පත් කරයි.

"අපේ රට කවදාවත් පොහොසත් රටක් වෙලා තිබුණේ නෑ. ඒත් සමාජවාදය තිබෙද්දි අපේ දරුවන්ට හොඳින් පෝෂණය ලැබුණා. හොඳ සෞඛ්‍ය මට්ටමක හිටියා. සියලු දෙනාටම ප්‍රතිශක්තිකරණය ලැබුණා. විශ්‍රාමික හා ආබාධිත අයට නොමිලේ බෙහෙත් ලැබුණා. අපේ රෝහල් තුළ නොමිලේ සෞඛ්‍ය ක්‍රම තිබුණා. ඒත් අද පුද්ගලයෙකුට මුදල් නැත්නම් ප්‍රතිකාරත් නෑ. බොහෝ අයට මුදල් නෑ. අපේ ආර්ථිකය විනාශවෙලා."

උපුටා ගැනීම - Bulgarian Tribunal Examines NATO War Crimes.

මේ අතර 2009 PEW Globle Attitudes Project සමීක්ෂණ වාර්තාවෙන් පවසන්නේ, බල්ගේරියාවේ ධනවාදය තුළ පුද්ගලයින් 9කින් 8කගේම ජීවිතය කඩා වැටී ඇති බවය.

මේ තත්වය තුළ දේශපාලන අර්බුදයද ඉහළ යන්නට විය. දක්ෂිණාංශික අගමැති බොයිකෝ බොරිසෝව් 2013 මාර්තු 23 ඉල්ලා අස්විය. ඉන්පසුව පාර්ලිමේන්තුව විසුරුවා හරින ලදී. එහෙත් ආණ්ඩුවට එරෙහි විරෝධතා අඩුවක් නොවීය. සමාජවාදය බිඳ වැටීමෙන් පසු ධනවාදය තුළ වන අර්බුදය හේතුවෙන් ගිනි තබාගෙන මිය ගිය සංඛ්‍යාව හයදෙනෙකි. පවතින තත්වයට එරෙහිව කළු මුහුද ආසන්නයේ වර්නා නගරයේ 50,000 ආසන්න පිරිස් සහභාගි වූ පෙළපාලි දක්නට තිබිණි.

## 3. හංගේරියාව

හංගේරියාවේ ජනගහනය මිලියන දහයකට ආසන්නය. එහි නිවැරදි සංඛ්‍යාව 9,958,453කි. ජනගහන වර්ධන වේගය සෘණ 0.184කි. ජනගහනයෙන් මිලියන 1.5ක්ම සිටින්නේ දරිද්‍රතා රේඛාවෙන් පහළය. රට තුළ විරැකියාවෙන් පෙළෙන්නන් මිලියන 1කි. වත්මන් ධනවාදී හංගේරියාවේ රතු තරුව සහ දෑකැත්ත මිටිය සහිත ලාංඡන තහනම්ය. එරට කොමියුනිස්ට්වාදය හා ෆැසිස්ට්වාදය සමාන අපරාධ ලෙස සලකනු ලැබේ. මේ මර්දනයන් තුළ පැහැදිලි වන්නේ කොමියුනිස්ට්වාදය කෙරෙහි ධනවාදී පාලකයන්ගේ වන භීතියේ තරමය.

ධනවාදය ස්ථාපිත කිරීම සමග රෝමානු කතෝලික පල්ලියට අයත්ව තිබූ අති විශාල වතුයායන් හා දේපළ නැවත පල්ලියට පවරා

දෙන ලදී. එයට අමතරව හංගේරියාව වාර්ෂිකව ඇමරිකානු ඩොලර් මිලියන 9.2ක් පල්ලියට ගෙවනු ලබයි. ඒ නැවත ලබාදීමට නොහැකි වූ දේපළ වෙනුවෙනි. සැබැවින්ම සමාජවාදී අවධියේ එම දේපළ පොදු ජන සුභසෙත සඳහා යොදාගත් ඒවාය.

US Dept. of State- 2003 සමීක්ෂණ වාර්තාවට අනුව ඇති නැති පරතරය 1990 වසරෙන් පසු විශාල ලෙස වර්ධනය වෙමින් තිබේ. දරිද්‍රතාවය මනින ගිනි සංගුණකය 1989 වසරේදී 25ක අගයකි. එය 2005 වසරේදී එය 30ක අගයක් ගන්නා ලදී. 2013 වන විට හංගේරියාවේ ගිනි සංගුණකය 36ක් දක්වා ඉහළ ගොස් තිබේ.

මේ වන විට හංගේරියාවේ ජනගහනය විශාල ලෙසින් පහළ වැටෙමින් තිබේ. එය 2012 වසරේදී 9,958,453ක් විය. මේ අනුව දැනට ජනගහනය අඩුවීම මිලියන 2කි. හංගේරියාවේ පවතින ජනගහන වර්ධන වේගය ඍණ 0.184කි. එමෙන්ම එහි මාතෘ මරණ අනුපාතය 2010දී 10,000 කට 21ක් වශයෙන් දක්නට ලැබේ.

රටේ අපරාධ වර්ධනය වීම සලකා බලද්දී 2012 වසරේදී ජනගහනයෙන් ලක්ෂයකට වාර්තාගත මිනීමැරුම් 2.1ක් වේ. 2012 වසර වන විට හංගේරියාව ස්ත්‍රී දූෂණ අතින් ලොව 24වැනි ස්ථානයේ සිටින රටක් බවට පත්ව තිබේ. එරට ඒක පුද්ගල මත්පැන් පානය මසකට ලිටර් 18කි. එය ලොව දක්නට ලැබෙන ඉහළම අගයයි. ලොව දියුණු යැයි සැලකෙන රටවලින් වැඩිම සියදිවි නසාගැනීම් ඇති රට හංගේරියාවයි. එය 2012 වසරේදී ජනගහනයෙන් ලක්ෂයකට 21ක් ලෙසින් වාර්තා විය. සමාජවාදී පාලනය පැවැති යුගයේ අපරාධ, සියදිවි නසාගැනීම් හා මත්පැන් ඇබ්බැහිය නොසැලකිය හැකි තරම් මට්ටමක තිබුණි..

තවත් ජනමත සමීක්ෂණවලින් ඉහත තත්වය තවදුරටත් තහවුරු වේ. GIF plackututo ආයතනය විසින් කරන ලද සමීක්ෂණ

වාර්තාවකට අනුව එම ජනතාව වඩාත්ම සතුටින් ජීවත්වූ කාලය සමාජවාදී අවධිය යන්න පිළිගන්නා සියයට 60ක් පමණ ජනතාවක් තවමත් එරට වෙසෙයි.

ආර්ථික හා දේශපාලන අර්බුදය උත්සන්නවීම හේතුවෙන් හංගේරියාවේ ව්‍යවස්ථා සංශෝධනවලට එරෙහිව 2013 මාර්තු මස මුලදී ඇරඹි විරෝධතා වඩාත් උත්සන්න විය. උසස් අධ්‍යාපනයට වෙන්කරන මුදල් කපා හැරීම හේතුවෙන් සහ නිවාස අහිමිවීම හේතුවෙන් එරට නිරන්තරයෙන් විරෝධතාවන් ඇති විය. කෙසේ වුවද රට තුළ ධනවාදය විසින් වපුරන ලද බීජවල පලදාව මේ වන විටත් මෙලෙස අස්වැන්න ලෙසින් ලැබෙමින් පවතී.

## 4. පෝලන්තය

මේ වන විට පෝලන්ත ජනගහනය 38,415,284කි. එහි ජනගහන වර්ධන වේගය සෘණ 0.8කි. සැබවින්ම මෙය ඉතාමත් අඩු අගයකි.

පෝලන්තයේ ප්‍රධාන කොමියුනිස්ට් විරෝධීයාවූ Solidarity වෘත්තීය සමිතියේ හිටපු නායක ලේක් වැලෙන්සා ජනාධිපති වූ පසු සියලුම කොමියුනිස්ට් ප්‍රචාරක කටයුතු තහනම් කර ඒවා අපරාධ ලෙස නම් කරන ලදී. ජාත්‍යන්තර ගීතය ගායනා කිරීම, රතු ධජය රැගෙනයාම, භාවිතා කිරීම, කොමියුනිස්ට් ලාංඡනය භාවිතා කිරීම, චේ ටී ෂර්ට් ඇඳීම තහනම් විය. ප්‍රතිවිප්ලවය අවස්ථාවේ පෝලන්තයේ ආණ්ඩු විරෝධී උද්ඝෝෂණ ආරම්භවූ Vladimir Lenin shipyard in Gdsik නැව් තටාකාංගණය, එනම් Solidarity Trade Union සංවිධානය ආරම්භවූ ස්ථානයද අද වන විට පුද්ගලීකරණය කර තිබේ. 1980 දශකයේදී Solidarity Trade Union හි සාමාජිකත්වය ලැබූ සේවකයින් 20,000කි. 2013 වසරේ වන විට එය 2200 දක්වා

පහළ වැටී ඇත. මේ වන විට අවසාන පෝලන්ත කොමියුනිස්ට් නායකයා වු ජෙනරාල් ජෙරුසෙල්ස්කි පිළිබඳ ධනාත්මක අදහස් වර්ධනය වෙමින් පවතී.

ධනවාදයේ මුල් වසර 15ට වඩා කොමියුනිස්ට්වාදයේ අවසන් වසර 15 ආර්ථික වර්ධන වේගය ඉහළ මට්ටමක විය. 1980 වන විට පෝලන්තයේ ශක්තිමත් ආර්ථිකයක් තිබිණ. ජනගහනයෙන් සියයට 64ක් වයස 40 ට අඩුවීම හා යුරෝපයේ ඉහළම උපත් අනුපාතය තිබූ රට විය. 1980 වන විට රැකියා කරන අයගෙන් සියයට 50ක්ම ඔවුන්ගේ දෙමව්පියන්ගේ සමාජ මට්ටමෙන් වෙනස් ඉහළ සමාජ තලයකට අයත් වූහ. එය සමාජය තුළ සිදුවූ සමාජ සංවර්ධනය හා සාධාරණත්වය හොඳින් නිරූපනය වන්නකි. පෝලන්තයේ සියලුම වෘත්තිකයන් හා බුද්ධිමතුන්ගෙන් තුනෙන් එකක් කම්කරු පංති පවුල්වලින්ද, හතරෙන් එකක් ගොවි පවුල්වලින්ද බිහිවී තිබිණි. මෙය ලොව සාධාරණම සමාජයක් වෙත පෝලන්තය ගමන් කරමින් තිබූ බවට  වැදගත් සාධකයෙකි.

1990දී සමාජවාදය බිඳ වැටෙන යුගයේ එහි සාක්ෂරතාවය සියයට 98කි. එරට ජනගහනයෙන් සියයයට 17ක් උසස් අධ්‍යාපනය හදාරා තිබුණි. ජනගහනයෙන් සියයට 4ක් උපාධිධාරීහු වූහ.

**1980 වසර වන විට පෝලන්ත ශ්‍රම බලකායේ සංයුතිය**

| | |
|---|---|
| කර්මාන්ත | 40% |
| කෘෂිකර්මාන්ත | 30% |
| සේවා | 30% |

**2013 වසර වන විට පෝලන්ත ශ්‍රම බලකායේ සංයුතිය**

| | |
|---|---|
| කර්මාන්ත | 22% |
| කෘෂිකර්මාන්ත | 27% |

සේවා 50%

සමාජවාදයේදී සියයට 30ක් සේවා අංශය ලෙසින් ශ්‍රම බලකාය සමබර හා ස්ථාවර තත්වයකට පත්ව තිබිණි. එහෙත් ධනවාදය තුළ සේවා අංශය ඉහළ දමමින් එම පැවති සමබරතාවය බිඳ දමා තිබේ.

බිඳ වැටුණු සෑම සමාජවාදී රටකටම වඩා ධනවාදය තුළ යම් හෝ ආර්ථික වර්ධනයක් පෙන්නුම් කළේ පෝලන්තය පමණි. එරට පමණක් 2000 වසර වන විට 1990 දී තිබුණු දළ ජාතික නිෂ්පාදනයේ මට්ටමට ළඟාවී තිබුණි.

"පෝලන්තයේ සාපේක්ෂ සාර්ථකත්වයට හේතුව එය වොෂින්ටන් සම්මුතියේ ආර්ථික උපායමාර්ගය නිශ්චිතවම ප්‍රතික්ෂේප කිරීමයි. එය IMF විසින් උපදෙස් දුන් පරිදි කටයුතු නොකළේය. සීග්‍ර පුද්ගලිකකරණය ප්‍රතික්ෂේප කළේය."

ජෝසප් සිට්ග්ලිට්ස් 2002 (Was Communism Better? Research by University of Zagreb)

පෝලන්තයේ දුප්පත්කම, විරැකියාව, ඇති නැති පරතරය - 2004 පෙබරවාරි 21, 22 Financial Times පුවත්පතට අනුව මෙසේය. මේ වන විට පෝලන්තයේ පවතින විරැකියාව සියයට 20ක් වේ. ශ්‍රම බලකායෙන් සියයට 30කගේ රැකියා පීඩිත හා කොන් කරනු ලැබූ ඒවාය. (ගණිකා වෘත්තිය, මත්ද්‍රව්‍ය ආශ්‍රිත රැකියා, පදික වෙළඳුන්, පාතාල ආර්ථික කටයුතු කරන පිරිස ආදී වශයෙනි.) පෝලන්තයේ ඒක පුද්ගල ආදායම 1990 වසරේ වූ මට්ටමට වඩා අඩුවී මේ වන විට යම් ඉහළ නැඟීමක් තිබුණද එහි සැබෑ අගය එනම් රජයෙන් ලැබුණ සෞඛ්‍ය, අධ්‍යාපන, සහනදායි නිවාස කුලී, විශ්‍රාම වැටුප් ක්‍රම ආදී සුබසාධන කටයුතුවල අගයද එක්කර සැලකූ විට 1990 වසරට වඩා එනම් සමාජවාදී පාලනයට වඩා අඩුය. පෝලන්තය ඇතුළු බොහෝ

බිඳ වැටුණු සමාජවාදී රටවල ඇති නැති පරතරය මේ වන විට විශාල ලෙස ඉහළ ගොස් තිබේ. වත්මන් පෝලන්තයේ පොහොසත්ම සියයට 1ක් රටේ සමස්ත පුද්ගලික දේපළවලින් සියයට අසූව (80)කටද සමස්ත පුද්ගලික ආදායම්වලින් සියයට පනහ(50)කටද අයිතිවාසිකම් කියයි. පෝලන්තයේ ගිනි සංගුණකය (ඇති නැති පරතරය මැනීමේ ඒකකය) 1989 වසරේ දී 27ක අගයක් ගත් අතර 2005 වසරේදී එම අගය 35ක් බවට පත්විය.

පෝලන්තය විශාල ලෙස ඒඩ්ස් පැතිරුණ රටකි. එය ධනවාදයෙන් ඔවුන් ලද දායාදයකි. එක් අතකින් සමාජයේ කඩා වැටීමත්, අනෙක් අතින් සෞඛ්‍ය සේවයේ පවතින දුර්වලතාවයත් හේතුකොට ගෙන පෝලන්තයේ ඒඩ්ස් ආසාදිතයින්ගේ වේගවත් හා ඉහළ වර්ධනයක් දක්නට ලැබේ. මෙම තත්වය විසින් පසු කාලීනවද සමාජ අර්බුදයන් නිර්මාණය වනු ඇත. සංඛ්‍යාත්මක දත්ත ඇසුරින් මෙය පැහැදිලි කොට ගනිමු.

**ඒඩ්ස් රෝගීන් සංඛ්‍යාවේ වර්ධනය**

| **රට** | **2001 වසර** | **2011 වසර** |
|---|---|---|
| බෙලෝරුසියාව | 4900 | 20,000 |
| කසකස්තානය | 9200 | 19,000 |
| කිර්ගීසියාව | 1000 | 12,000 |
| තජිකිස්තානය | 5400 | 11,000 |
| මෝල්දාවියාව | 1000 | 15,000 |
| රුමේනියාව | 6000 | 16,000 |
| පෝලන්තය | 4000 | 35,000 |

## 5. නැගෙනහිර ජර්මනිය

මේ වන විට නැගෙනහිර ජර්මනිය නම් රටක් නොමැති නිසා එහි වත්මන් තත්වය සංසන්දනය කිරීමේ ප්‍රායෝගික ගැටලුවක් පවතී.

1976 වසරේ දී නැගෙහිර ජර්මනියේ ආර්ථික වර්ධන වේගය සියයට 5ක් විය. 1990 වසර දක්වා ආර්ථික වර්ධන වේගය එම මට්ටමේ පැවැති අතර නැගෙනහිර ජර්මනිය හෙවත් ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය (GDR) සමාජවාදී රටවල් අතර පොහොසත්ම ආර්ථිකය විය. කැමරා, කාර්, ඔර්ලෝසු, තුවක්කු ආදිය ඔවුනගේ අපනයන් අතර ප්‍රධාන විය. 1986 වසරේදී (නැගෙනහිර ජර්මන්) මාර්ක් 2ක් (ඇමරිකානු ) ඩොලර් 1කට සමාන විය. නිල විදේශ විනිමය අනුපාතය ධනේශ්වර ගණනයන් අනුව එසේ වුව නැගෙනහිර ජර්මනියෙහි අති විශාල ලෙස සහනශීලී සහනාධාර මත මිලදී ගැනීමට අවස්ථාව සලසා තිබූ ආහාර, ඇඳුම්, ප්‍රවාහනය, සෞඛ්‍ය, අධ්‍යාපනය, ක්‍රීඩා, සිනමාශාලා පහසුකම්, නිවාස කුළී, විදුලිය, ජලය ආදිය සමග සන්සන්දනය කොට බලන විට මෙම මුදලේ අගය ඉතා ඉහළ අගයකි. උදාහරණයක් ලෙස 1984 වසරේදී රජය නිවාස සඳහා අය කරන කුලිය එරට කම්කරුවකුගේ වැටුපෙන් සියයට 3ක් පමණි. මෙය බටහිර රටකදී නම් ඉතාම ඉහළ අගයකි. 1960දී ආරම්භ කළ නිවාස ඉදිකිරීමේ වැඩපිළිවෙළ තුළින් 1980 වන විට ඉදිකළ නව නිවාස හෝ අලුත්වැඩියා කළ නිවාස ගණන මිලියන 2කි. 1990 වන විට අලුතෙන් නිවාස මිලියන දෙකක් නිම කිරීමට හැකි විය. 1985 වන විටත් රටට අවශ්‍ය නිවාස ප්‍රමාණය ඉදි කිරීමේ ඉලක්කය සපුරා හෝ ඉක්මවා තිබුණි. ඒවායින් සියයට 15ක් නිවාස පුද්ගලික අයිතිය සහිතය. මෙම නිවාස සුඛෝපභෝගී නොවුණද පාසලට, දුම්රිය හා බස් නැවතුම්පළට, ආපනශාලාවන්ට, ක්‍රීඩාංගණයන්ට, තැපැල් කාර්යාලයන්ට, හා සුපිරි වෙළඳ සංකීර්ණයන්ට ඉතා ආසන්නව පිහිටා තිබුණේය.

නැගෙනහිර ජර්මනියේ පැවති ජන ජීවිතය කෙසේදැයි අවබෝධ කරගැනීමට එහි ජනතාව එදානෙදා භාවිත කළ ගෘහ උපකරණ පිළිබඳව දත්තයන් සලකා බලමු.

## නැගෙනහිර ජර්මනියේ ගෘහ භාණ්ඩ හිමිකම

| භාණ්ඩ වර්ගය | 1965 | 1985 |
|---|---|---|
| ශීතකරණ | 26% | 99% |
| රූපවාහිනී | 28% | 92% |
| මෝටර් රථ | - | 46% ( මාසික වැටුප මෙන් 8 හෝ 9 ගුණයකි.) |
| රෙදිසෝදන යන්ත්‍ර | - | 91.8% |

මුදල් ඒකක සංසන්දනයේදී නිල විනිමය අනුපාතය බටහිර ජර්මන් මාර්ක් 1 සමානයි ඒකක 100ක් ලෙස සැලකූ විට නැගෙනහිර ජර්මනියේ මාර්ක් එකක් 1960 වසරේදී ඒකක සියයට 76කි. 1969 වසරේ වන විට එම අගය සියයට 86 දක්වා ඉහළ නැගුණේය. 1977 වන විට එය සියයට 100 දක්වා ඉහළ නංවා ගෙන තිබුණි. එසේ වුවද රටවල් දෙකේ ජීවන වියදම් මල්ල (පැකේජය) සංසන්දනයේ දී GDR (නැගෙනහිර ජර්මන්) මාර්ක් එකක් බටහිර ජර්මන් මාර්ක් 1 හා සමානවේ. එනම් Deuche Mark 1.06 කි. ඒ අනුව නැගෙනහිර ජර්මන් (GDR) මුදල් ඒකකය බටහිර ජර්මන් මුදල් ඒකකයට වඩා ශක්තිමත් බව ඔප්පු විය. එම අධ්‍යයනය කරන ලද්දේ - Institute of Economic Reaserch West Germany ආයතනය විසින් 1983 වසරේදීය.

නැගෙනහිර ජර්මනියේ උපත් අනුපාතය බටහිර ජර්මනියට වඩා අඩු අගයක වූයේ නැත. එය 1980 දශකයේදී බටහිර ජර්මනියට වඩා ඉහළ අගයක්ව තිබිණි. උපත් අනුපාතිකය බටහිර ජර්මනියට වඩා අඩුවූයේ 1990 දශකයේදීය.

මේ අතර ක්‍රීඩා ක්ෂේත්‍රයේදී නැගෙනහිර ජර්මනිය, බටහිර ජර්මනියට වඩා දිගින් දිගටම ඉදිරියෙන් සිටියේය.

මෙයට අමතරව වෙනත් ජනමත සමීක්ෂණයන්ට අනුව නැගෙනහිර ජර්මනිය පිළිබඳ පළවන අදහස් කීපයක් මෙසේය.

දක්ෂිණාංශික සඟරාවක් වන Der Spiegel කළ සමීක්ෂණයේ වාර්තාව මෙසේ පවසයි. 'බර්ලින් තාප්පය බිඳවැටී 20 වසරකට පසු නැගෙනහිර ජර්මනියේ ශ්‍රේෂ්ඨත්වය පිළිබඳව අදහස්වල විශාල වර්ධනයක් දක්නට ලැබේ. සමීක්ෂණයට අනුව පැවති නැගෙනහිර ජර්මනියේ ජනතාව සියයට 59ක් එම රට වෙනුවෙන් පෙනී සිටිමින් අදහස් ප්‍රකාශ කළේය. නැගෙනහිර ජර්මනිය, වත්මන් ජර්මනිය තරම් හොඳ නැති බව සියයට 8ක් පවසයි. නැගෙනහිර ජර්මනිය තුළ නරක දේට වඩා යහපත් දේ පැවති බව පවසන ප්‍රමාණය සියයට 49කි.' නැගෙනහිර ජර්මනිය පිළිබඳව ජනතාවගේ යහපත් අදහස් තවදුරටත් මෙසේය.

"තාප්පය බිඳවැටීමත් සමග අප දිව්‍ය ලෝකයෙන් අපායට තල්ලුකර දැමිණි. "Give me back my wall and this time make it two meters higher" ("මට යළිත් බර්ලින් තාප්පය දෙන්න. මෙවර එය තවත් මීටර 2ක් උසට බඳිමු.") යන ඔවුනගේ ප්‍රකාශය තුළින් පෙනීයන්නේ පැවති රට පිළිබඳ ජනතාවගේ හැඟීමය. "Los Angeles Time 21.7.2003 පුවත්පතට අනුව හිටපු ආරක්ෂක ඇමති Heinz Kessla මෙසේ පැවසිය. "දැන් අපට 'නිදහස' තිබේ. නැගෙනහිර යුරෝපයේ මිලියන ගණන් ජනයා දැන් 'නිදහස්' වී තිබේ. සෞඛ්‍ය ආරක්ෂණයෙන් 'නිදහස් ' වී තිබේ. සමාජ සුභසාධනයෙන් 'නිදහස්' වී තිබේ. ආරක්ෂාව සහිතව ගමන් කළ හැකි වීදිවලින් 'නිදහස්' වී තිබේ."

2009 කළ රොයිටර් සමීක්ෂණයේ මෙසේ ප්‍රකාශ වේ. 'ධනවාදය ප්‍රතිෂ්ඨාපනය කර දශක දෙකකට පසු නැගෙනහිර ජර්මන් වැසියන්ගෙන් අඩකට වැඩි පිරිසකට නැවත නැගෙනහිර ජර්මන් සමාජවාදී පාලනයට යෑමට අවශ්‍යවී තිබේ. රොයිටර් සමීක්ෂණයට අනුව ජනයාගෙන් සියයට 52 කට ධනවාදී පාලනය ගැන විශ්වාසයක් නොමැති අතර බහුතරයක් සමාජවාදී ආර්ථිකයකට යෑමට අවශ්‍ය බව

ප්‍රකාශ කරති.'

නැගෙනහිර බර්ලිනයේ 46 වියැති තොරතුරු තාක්ෂණ වෘත්තිකයෙක් කළ මෙම ප්‍රකාශය බලන්න. "අපි සමාජවාදයේ භයංකර දේවල් ගැන කියවීමු. අපි ඒවා නිවැරදිම ඒවා ලෙස විශ්වාසද කළෙමු. කාල් මාක්ස් හෙළා දැකීමු. එසේ වුවද බර්ලින් තාප්පය බිඳවැටීමට පෙර මගේ ජීවිතය අදට වඩා ඉතා හොඳ මට්ටමින් තිබිණි. කිසිවෙකු මුදල් ගැන එතරම් උනන්දු නොවිණි. මන්දයත් මුදල් සත්‍ය වශයෙන්ම එදිනෙදා ජීවිතයට බලපෑවේ නැති බැවිනි. ඔබට රැකියාවක් අත්‍යවශ්‍යව නොතිබුණත් ඔබට රැකියාවක් ලැබිණි. කොමියුනිස්ට්වාදය, කොමියුනිස්ට් අදහස් ඔවුන් ඉගැන්වූ පරිදි වැරදි දෙයක් නොවේ යැයි මට සිතේ."

මෙම දත්තයන්, සමීක්ෂණ වාර්තාවන්, අත්දැකීම් පිළිබඳව පුද්ගල ප්‍රකාශයන් අපට කියාපාන්නේ සමාජවාදී 'දෙව්ලොවින්' යළි ධනවාදී 'අපායට' ඇද වැටීමේ අනිටු ප්‍රතිඵලය හා ඉන් ජනතාව අත්විඳින ඛේදවාචකයේ තරමයි. එම රටවල සමාජවාදයට පෙර පැවැති තත්වය පවා වර්තමානයේ ජනතාවට අහිමි කරනු ලැබ තිබේ. මෙයින් කියවෙන තවත් පණිවිඩයක් වන්නේ, සමාජවාදය ජයග්‍රහණයට පෙර ලෝක ධනවාදය තිබුණු තත්වයට වඩා වර්තමානයේ ධනවාදය සමාජක්‍රමයක් ලෙසින් අන්ත පිරිහීමකට පත්ව යළි ගොඩගත නොහැකි මට්ටමක පවතින බවය. ධනවාදයේ නූතන අර්බුදය විසින් මෙම තත්වය තිව්‍ර කර ඇත. තවදුරටත් එය විස්තරාත්මකව විමසා බලමු.

# 8

# ලෝක ධනවාදයේ වත්මන් තත්වය

2008 සැප්තැම්බර් මාසයේදී එක්සත් ජනපදයෙන් ඇරඹී ලෝකය පුරා ව්‍යාප්ත වූ ආර්ථික අර්බුදය විසින් රටවල් ගණනාවක් බරපතළ අර්බුදකාරී තත්වයන්ට ඇද දමා තිබේ. එමගින් ඇති කළ බිඳවැටීම සමාජ, ආර්ථික, සංස්කෘතික ක්ෂේත්‍රවල දිනෙන් දින වර්ධනය වෙමින් පවතී. අර්බුදයේ බරපතළ ස්වභාවය තේරුම් ගැනීමට රටවල් කිහිපයක් පිළිබඳව විමසා බලමු.

"ධනවාදයේම කොටසක් වන ගෝලීයකරණය, උරුමය හා සම්ප්‍රදාය විනාශකර දමනවා පමණක් නොව ඇදහිය නොහැකි ලෙස අස්ථාවර වෙයි. එය ක්‍රියාත්මක වනුයේ අර්බුදයන් මාලාවක් අතරිනි. එසේම මෙම අර්බුද මෙම සුවිශේෂී යුගයේ අවසානය සනිටුහන් කිරීමක් ලෙස සැලකිය හැකිය."

(ඉතිහාසඥ එරික් හොබ්ස් බෝව්ම් )

අධිරාජ්‍යවාදයේ මූලස්ථානය ඇමරිකා එක්සත් ජනපදයයි. ධනවාදයේ නූතන අර්බුදය වඩාත් හොඳින්ම සහ කල් ඇතිව ප්‍රකාශයට

පත්වූයේද එක්සත් ජනපදයේය. ලෝක ධනවාදයේ වත්මන් තත්වය විමසා බැලීමේදී එය ආරම්භ කිරීමට සුදුසුම කේන්ද්‍රය එතනයි.

## ඇමරිකා එක්සත් ජනපදය

පළමුවෙන්ම ධනේශ්වර ආර්ථික විශේෂඥයින් දෙදෙනෙකු විසින් කරන ලද ප්‍රකාශයන් දෙකක් විමසා බලමු. එයින් ධනේශ්වර ගෝලීයකරණය පිළිබඳ මිථ්‍යාව හා ධනේශ්වර අර්බුදයේ දිශානතිය හඳුනාගත හැකිය.

"ගෝලීයකරණය න්‍යාය පත්‍රය ඉතාමත් කිට්ටුවෙන් වෙළඳපොළ මූලධර්මවාදය (market fundamentalism) එනම් නිදහස් වෙළඳපොළ හා නිදහස් මූල්‍ය ක්‍රම පදනම්වූ දර්ශනය මත පදනම්ව ඇත. මෙම අර්බුදයේ දි වඩාත්ම නිදහස් වෙළඳපොළ ක්‍රමය මත පදනම් වූ ආයතන, ආර්ථිකය (ඇමරිකානු ආර්ථිකය) අසාර්ථක වන සැටිත්, රජයේ උපකාර ඉල්ලන සැටිත් අපි දකිමු. ලොව සිටින සියලු දෙනාම මෙය වෙළඳපොළ මූලධර්මවාදයේ අවසානය බව ප්‍රකාශ කරනු ඇත. මෙය සැබැවින්ම බර්ලින් තාප්පයේ වැටීම සමාජවාදයට බලපෑවේ යම් ආකාරයකින්ද වෝල් ස්ට්‍රීට් (Wall street) හි වැටීම වෙළඳපොළ මූලධර්මවාදයට බලපාන්නේද ඊට සමාන ආකාරයකිනි. මෙම වැටීම ලෝකයට පෙන්වා දෙන්නේ, මෙම ආකාරයේ ආර්ථික උපායමාර්ග බිඳවැටී ඇති බවත් එය තිරසාර නොවන බවත්ය. මෙම ක්‍රමය ක්‍රියාත්මක නොවන බව දැන් සියලු දෙනාම පවසනු ඇත. මෙම මොහොත මූල්‍ය වෙළඳපොළ නිදහස්කරණය පිළිබඳ තිබූ සියලු මත රැවටිලිකාර ඒවා බව සලකුණු කරන මොහොතකි."

ජෝෂප් ස්ටිග්ලිට්ස්

- ලෝක බැංකුවේ හිටපු ප්‍රධාන ආර්ථික උපදේශක, ආර්ථික විද්‍යාව පිළිබඳව නොබෙල් ත්‍යාගලාභී, හිටපු ඇමරිකානු ජනාධිපති

බිල් ක්ලින්ටන්ගේ ප්‍රධාන ආර්ථික උපදේශක

උපුටා ගැනීම - Huffington post පුවත්පත 2008 සැප්තැම්බර් 16

"මෙය ඓතිහාසික හූ දේශපාලන විපර්යාසයකි. ලෝක බල තුලනය නැවත වෙනස් කළ නොහැකි ලෙස වෙනස්වී තිබේ. දෙවන ලෝක යුද්ධයෙන් පසු ආරම්භ වූ ඇමරිකානු එක්සත් ජනපදයේ ගෝලීය නායකත්වය අවසන් විය. ඇමරිකානු නිදහස් වෙළඳ ඇදහිල්ල ස්වයං විනාශකාරි එකක් වී ඇති අතර ආර්ථිකය මත සම්පූර්ණ පාලනයක් තිබූ රටවල් පමණක් අපකීර්තියෙන් ගැලවී ඇත. "

දේශපාලන දර්ශනය පිළිබඳ මහාචාර්ය ජෝන් ග්‍රේ - London School of Economics ආර්ථික විද්‍යාව පිළිබඳ ලන්ඩන් විද්‍යාලය

තවමත් ලොව ලොකුම ආර්ථිකයට හිමිකම් කියන එක්සත් ජනපදය ලෝක ආර්ථිකයෙන් සියයට 25ක් නියෝජනය කරයි. එමෙන්ම අනෙක් පැත්තෙන් ලොව ලොකුම ණයකරුවා වී සිටින්නේද එක්සත් ජනපදයයි. 2010 වසර පළමු කාර්තුව අවසන් වන විට එක්සත් ජනපදයේ සමස්ත ණය ප්‍රමාණය ඩොලර් ට්‍රිලියන 50.2 කි. ඒ අනුව ඒක පුද්ගල ණය ප්‍රමාණය ඩොලර් 175,000කි. 2012 වසරේ ජූනි 25 වන විට එක්සත් ජනපදයේ රාජ්‍ය ණය ප්‍රමාණය ඩොලර් ට්‍රිලියන 15.78කි. මෙය ඉලක්කමෙන් ලියූ විට අංක 14කින් යුක්තය. (15,780,000,000,000) එබැවින්, මෙම ණය ප්‍රමාණය ඇමරිකානුවන් විසින් හඳුන්වනු ලබන්නේ "අංක දාහතරේ නින්දාව" යනුවෙන්ය. පසුගිය කාලය තුළදී රාජ්‍ය ණය ප්‍රමාණය ශීඝ්‍ර ලෙස ඉහළ ගිය අතර 2003 වසරේ සිට වසරකට ඩොලර් බිලියන 500 බැගින් එය ඉහළ ගියේය. 2008 වසරේ දී ඩොලර් ට්‍රිලියන 1කිනුත් 2009 වසරේදී ඩොලර් ට්‍රිලියන 1.9කිනුත් 2010 වසරේදී ඩොලර් ට්‍රිලියන 1.7කිනුත් 2011 වසරේ දී ඩොලර් ට්‍රිලියන 1.2කිනුත් ඉහළ ගොස් තිබේ. 2011 වසර අවසන් වන විට ඇමරිකාවේ ණය වර්ධන වේගය තත්පරයකට ඩොලර් 40,000කි. මේ

හේතුවෙන් කඩා වැටෙන ඇමරිකානු ආර්ථිකයට සේලයින් සැපයීමට එක් එක් වකවානුවල සිටි පාලකයින්ට සිදු විය. ඒ අනුව 2008 වසරේ බුෂ්ගේ පාලනය විසින් ඩොලර් බිලියන 168ක උත්තේජක පැකේජයක් ඇමරිකානු ආර්ථිකයට එන්නත් කළේය. එයින් පසු කාලීනව වෝල් වීදියේ බැංකු හා මූල්‍ය ආයතන ඇද වැටීම වැළැක්වීම සඳහා ඩොලර් බිලියන 700ක ඇපකරයක් නිකුත් කළේය. 2009 වසරේ ඩොලර් බිලියන 862ක් ඇද වැටෙන ආර්ථිකය පණගැන්වීම සඳහා නිකුත් කරන ලදී. මේ අනුව 2009 මුල් කාර්තුව වන විට ඇමරිකා එක්සත් ජනපදය නිකුත් කළ සමස්ත ඇපකර ප්‍රමාණය ඩොලර් ට්‍රිලියන 9.7කි.

## ඇමරිකාවේ දළ ජාතික නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ණය

| වසර | ද.ජා.නි. රාජ්‍ය ණය ප්‍රතිශතය |
|---|---|
| 2001 | 57.3 |
| 2004 | 61.6 |
| 2007 | 66.6 |
| 2008 | 67.2 |
| 2009 | 69.4 |
| 2010 | 89.4 |
| 2011 | 98.5 |
| 2012 | 103 |

## ඇමරිකාවේ රැකියා ක්ෂේත්‍රය

ඇමරිකාවේ රැකියා අර්බුදය ඉතාමත් බරපතළය. මෙය සමාජ අර්බුදයක් බවට පත්ව ඇත. ඒ අනුව 2010 වසර වන විට මුළු රැකියාවන්ගෙන් සියයට 20ක් නිමවුම් අංශයේ වුවද 2012 වසරේ එය සියයට පහක් දක්වා පහත වැටිණ. 2011 වසරේ දී චීනය ලෝක වෙළඳ

සංවිධානයට බැඳුණු තැන් පටන් ඇමරිකා එක්සත් ජනපදයට මසකට 50,000ක් බැගින් නිෂ්පාදන ක්ෂේත්‍රයේ රැකියා අහිමි විය. සියයට 20ක් පමණ වන ඇමරිකානු වැඩිහිටියෝ ඉතා අඩු වැටුප් ලබති. ඇමරිකානු පවුල්වලින් සියයට 43ක් ඔවුහු උපයන මුදලට වඩා වැඩිපුර වියදම් කරති. ශ්‍රම බලකායට අලුතෙන් එකතුවූ ප්‍රමාණය 642,000ක් වන අතර වයස අවුරුදු 45 අඩු උපාධිධාරීන්ගෙන් අඩකට රැකියා නැත. එරට ශ්‍රම බලකාය මිලියන 154.4කි. ඉන් සියයට 12.7කට රැකියා නැත. මින් සියයට 42.8ක් මාස හයක් තුළ රැකියාවක් කර නැත. 2012 වසර මැයි මාසයේදී රැකියා අවස්ථා ලක්ෂ 1.5ක් නිර්මාණය කරගැනීමට අපේක්ෂා කළද, නිර්මාණය වී ඇත්තේ රැකියා 69,000ක් පමණි. 2008 අර්බුදයේදී රැකියා අහිමිවූ ප්‍රමාණය මිලියන 8.8කි. පසුගිය මැයි මාසයේදී රාජ්‍ය අංශයේ රැකියාවලින් නෙරපුණු ප්‍රමාණය 13,000කි. තවමත් රැකියාවලින් නෙරපමින් පවතින බව වාර්තා වේ.

## ඇමරිකාවේ දරිද්‍රතාවය

රාජ්‍ය ණය ඉහළ යාමත් රැකියා අර්බුදයත් විසින් ආර්ථිකය බරපතළ කඩාවැටීමකට පත්ව ඇති එක්සත් ජනපදයේ දරිද්‍රතාවයද ඉතා ඉහළ යමින් තිබේ. 1959 වසරෙන් පසු 2010 වසර වන විට එක්සත් ජනපදයේ ඉහළම දරිද්‍රතා මට්ටම වාර්තා විය. එය සියයට 15.1කි. (දිනකට ඩොලර් 1 1/4කට වඩා අඩුවෙන් ආදායම් ලබන්නන්) එනම් ජනතාව මිලියන 46.9ක් දිළිඳුකමින් පෙළෙන අතර අන්ත දරිද්‍රතාවයෙන් පෙළෙන ජනගහනය මිලියන 20.5ක් වේ. පොදුවේ තත්වය මෙය වුවත් කළු ජාතිකයන්, හිස්පැනික්වරුන් පිළිබඳව සැලකූ විට තත්වය තවත් දරුණු වනු ඇත. හිස්පැනික්වරුන්ගේ දරිද්‍රතාවය සියයට 26.6ක් වන විට කළු ජාතිකයන්ගේ එය 27.4ක අගයක් ගනියි. වයස 18 අඩු දුප්පතුන්ගේ ප්‍රමාණය 2007 සිට 2010 දක්වා සියයට 22කින් වර්ධනය වී ඇත. එරට විවිධ ප්‍රාන්ත ප්‍රදේශවල දරිද්‍රතාවය

විවිධාකාරය. සමහර ප්‍රාන්තවල තත්වය ඉතා බරපතළ වී ඇත.

**මේ තත්වය තුළ දරිද්‍රතාවයෙන් පීඩා විඳින දරුවන්ගේ ප්‍රතිශතය මෙසේ දැක්විය හැකිය.**

| | |
|---|---|
| කැලිෆෝනියා | - 30% |
| පිලඩෙල්ෆියා | - 36.4% |
| ඇට්ලන්ටා | - 40.1% |
| ක්ලෙවලන්ඩ් | - 52.6% |
| ඩෙට්‍රොයිට් | - 53.6% |

සෑම එක්සත් ජනපද වැසියන් 6 දෙනෙකුගෙන් එක් අයෙකුට (ආසන්න වශයෙන් කෝටි පහක ජනතාවක්) එදිනෙදා ආහාර සපයා ගැනීමට නොහැකි තත්වයකට පත්වී ඇත. ළමුන් සම්බන්ධයෙන් ගත් කළ තත්වය මීටත් වඩා බරපතළ වේ. වයස අවුරුදු 6කට අඩු ළමුන්ගෙන් සියයට 25ක් කුසගින්නෙන් පෙළෙති. මෙම තත්වය මඟ හැරවීමට විද්‍යාත්මක නොවන පැළැස්තර පිළිතුරු ඉදිරිපත් වුවද ඒවා හුදු විසුළුකාරී දේවල් පමණි. ඇති නැති පරතරය පිළිබඳව සිය අදහස් දක්වන Ample Harvest නම් ආයතනය සාමාන්‍ය දිනකට එක් වැසියකු ආහාර රාත්තලක් ඉවත දමන බැවින් එය ආහාර නොමැතිව පීඩා විඳින අයට දීම සඳහාවූ වැඩපිළිවෙළක් අවශ්‍ය බව කියයි. ඒ සඳහා ඔවුන් වෙබ් අඩවියක් ආරම්භ කර ඇති අතර ආහාර නොමැතිව පීඩා විඳින අයටත් ආහාර වැඩිපුර තිබෙන අයටත් වෙබ් අඩවිය මගින් ලියාපදිංචි වීමට අවස්ථාව සලසා එම දෙපාර්ශ්වයන් ගැලපෙන පරිදි සම්බන්ධ කිරීම කරනු ලබයි. සැබවින්ම දරිද්‍රතාවයට හේතුව සුළුතර ධනපති පංතිය විසින් ලෝක ධනය හා ශ්‍රමය කොල්ලකෑමය. එම තත්වය එසේ තිබියදී වැඩිපුර ආහාර තිබෙන අයට ආහාර නොමැති අය සඳහා අනුග්‍රහය දක්වන්නැයි ඉල්ලීම විහිළුවකි. එපමණක් නොව 2006 වසරේදී Hunger (කුසගින්න) යන වචනය වෙනුවට Very

Low Food Insecurity යන්න භාවිත කිරීමට එක්සත් ජනපද රජය විසින් තීරණය කෙරිණි. ඒ මගින් කුසගින්න වැළැක්වීම වෙනුවට එය ප්‍රකාශයට පත්වීම වළක්වනු ලැබ ඇත.

## ඇමරිකාවේ ජන ජීවිතයේ කඩා වැටීම

ජන ජීවිත කඩා වැටීම හේතුවෙන් ඇමරිකා එක්සත් ජනපදයේ සියදිවි නසාගැනීම් හා ප්‍රචණ්ඩ ක්‍රියා කැපී පෙනෙන ලෙස ඉහළ ගොස් තිබේ. එය සමාජ ඛේදවාචකයක්ව ඇත. උදාහරණයක් ලෙස ලොස්ඇන්ජලීස් නගරයේ සියදිවි නසා ගැනීම් ප්‍රමාණය 2006 වසරේ දී 689ක් වූ අතර 2007වසරේදී එය 695ක් දක්වා වර්ධනය විය. නැවත 2008 වසරේ දී එය 805 දක්වා තියුණු ඉහළ යාමක් පෙන්නුම් කළේය. මෙම තත්වය  අනෙකුත් ඇමරිකානු ප්‍රාන්තවලද වැඩි වෙනසක් නැත. අර්බුදය සමග මානසික රෝග බහුල වූ අතර ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තා අනුව වයස 18 වැඩි පුරවැසියන්ගෙන් මානසික රෝගීන්ගේ ප්‍රතිශතය සියයට 29.4කි. මීට අමතරව දික්කසාදවීම ඉතා ඉහළ ගොස් ඇත. ජීවිතවල හුදකලාභාවයද තව තවත් වර්ධනය විය. මානසික කඩාවැටීම්වලට මේ සියල්ල හේතු විය. ඒ පසුපස සියදිවි නසා ගැනීම් වර්ධනයවීම සාමාන්‍ය දෙයක් බවට පත් වී ඇත.

මෙසේ සාමාන්‍ය ජනතාවගේ ජීවන මට්ටම බිඳවැටීම එක්සත් ජනපදය පුරා බරපතළ ප්‍රචණ්ඩ ක්‍රියා රැල්ලක් හටගැනීමට හේතුවී ඇත. වැඩි වශයෙන් මේ තත්වයට ගොදුරුවී තිබෙන්නේ අපේක්ෂාභංගත්වයට පත් සාමාන්‍ය ජනතාවයි. පහත දැක්වෙන්නේ ඊට අදාළ ප්‍රසිද්ධ නිදසුන් කිහිපයකි.

2008 ඇතිවූ ආර්ථික අවපාතයත් සමඟ කඩා වැටෙන ධනවාදය තුළ ඇමරිකානු ඛේදවාචකය මෙසේ විය.

1. ලොස්ඇන්ජලීස්හි "සෝනි පික්චර්ස්" ආයතනයේ මූල්‍ය

කළමනාකරුවකු ලෙස සේවය කළ 45 හැවිරිදි කාර්තික් රාම්රාජ් 2008 ඔක්තෝබර් මුල් සතියේ දී තම බිරිඳට හා දරුවන්ට වෙඩි තබා මරා ඔහුද සියදිවි නසාගන්නා ලදී. හේතුව වූයේ ඔහුව මාස කිහිපයකට පෙර රැකියාවෙන් ඉවත් කරනු ලැබීමය.

2. ඔහියෝ ප්‍රාන්තයේ අක්රෝන්හි පදිංචි වයස අවුරුදු 80ක වැන්දඹුවක වන ෆැනී මාජ් තමන් වසර 38ක් පදිංචිවී සිටි නිවස උගසට සින්නවී ඇති බව දන්වා එවන ලද ලිපියක් කියවා 2008 ඔක්තෝබර් 1වැනි දින පපුවට වෙඩි තබාගැනීමෙන් සියදිවි නසා ගත්තාය.

3. මැසචුසෙට්ස්හි ගෘහණියක වන කර්ලෙන් බෝල්ඩ්රෙමා තම නිවස උකස් කළ සමාගමට ලියා ඇත්තේ නිවස අහිමි කළහොත් තමා වෙඩි තබාගන්නා බවයි. නමුත් එම ලිපිය නොතකූ උකස් සමාගම ඇගේ නිවස පවරාගැනීමට කටයුතු කළ නිසා ඇය විසින් සියදිවි නසාගන්නා ලදී.

4. මෙලෙසම වෙඩි තබාගත් ෆැමෙලා රෝස් නම් 57 හැවිරිදි කාන්තාව මුදල් ගෙවීම සඳහා තව දින දහයක් කල් ඉල්ලා උකස් සමාගමට ලියන ලද ලිපියක්ද විය.

5. ඔකාලාහි විසූ රෝලන්ඩ් ගෝර් තම නිවෙස උකස්වීමේ නිවේදනය දැකීමෙන් පසුව තම බිරිඳට හා සුනඛයාට වෙඩි තබා පසුව නිවසටද ගිනිතබා සියදිවි නසා ගත්තේය.

6. එක්සත් ජනපදයේ මානසික සහනයන් සඳහා පිහිටුවා ඇති ආයතනවල පිහිටුවා ඇති දුරකථන පද්ධතිය අධික ලෙස භාවිත කිරීම නිසා මේ වන විට අවුල් ජාලයක්වී තිබූ බව වාර්තා වේ. හූස්ටන්හි සායනික මනෝ විද්‍යා ආචාර්ය එඩ්වඩ් චාල්ස් වර්ත් පවසන්නේ ජනතාව අසරණ වීමෙන් හා රජය විසින් නොසලකා හරිනු ලැබීමෙන් මානසික රෝගීන් වී ඇති බවයි.

ඇමරිකන් පම්පෝරිය හා එහි යථාර්ථය දක්වන ජන ජීවිතයේ භාවිතයන් කිහිපයක් මෙසේ දැකිය හැකිය. ධන කුවේරයන් සිටින ඇමරිකාවේ කුසගින්නෙන් පෙළෙන ජනතාව පිළිබඳ කරුණු 20ක් පහත පළවේ. ඒ තුළින් ඇමරිකාවේ දරිද්‍රතාවයේ ප්‍රතිඵල කෙසේදැයි තේරුම් ගත හැකිය.

1. ඇමරිකාවේ ආහාර මුද්දරලාභීන්ගේ ප්‍රමාණය ඇලස්කාව, ආර්කන්සාස්, කනේන්ටිකට්, ඩෙලාවර්, කොළොම්බියා, හවායි, ඉඩාහෝ, ඉයෝවා, කැන්සාස් මායින්, මිසිසිපි, මොන්ටානා, නෙබ්රස්කා, නෙවාඩා, නවහෙම්ස්පයර්, නවමෙක්සිකෝ, උතුරු ඉකෝමා, ඔක්ලහෝමා. රෝඩ් දූපත, දකුණු ඩකෝටා, උටා වර්මන්ට්, බටහිර වර්ජීනියා, වියොමින්ක් යන ප්‍රාන්ත 24 රේ සම්පූර්ණ ජනගහනයේ එකතුවට වඩා වැඩිය.

2. 2008 වසරේ ඔක්තෝබරයේදී ආහාර මුද්දර ලැබූ ඇමරිකානුවන් ගණන මිලියන 30.8කි. 2012 වසරේ අගෝස්තු වන විට ආහාර මුද්දර ලබන ඇමරිකානුවන් ගණන මිලියන 47.1කි.

3. වර්තමානයේදි සෑම ඇමරිකානුවන් 07කින් එක් අයෙක් සෑම දරුවන් 4කින් එක් අයෙක් ආහාර මුද්දර ලබයි.

4. විශ්ලේෂණ අනුව සියලුම ඇමරිකානු දරුවන්ගෙන් අඩකට එනම් සියයට පනහකටම තම වයස 18 වීමට පෙර එක් වතාවක් හෝ ආහාර මුද්දර ලබා ගැනීමට සිදුවනු ඇත .

5. ඇමරිකානු සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ නවතම වාර්තා අනුව දරිද්‍රතාවයෙන් පෙළෙන ඇමරිකානු ජනගහනය මිලියන 49.7කි. (කෝටි පහකි.)

6. පසුගිය වසර හතරට ඇමරිකා එක්සත් ජනපදයේ දුප්පතුන් මිලියන 6කින් වැඩිවී තිබේ.

7. වර්තමානයේදී ඇමරිකාවේ වැඩකරන ජනතාවගෙන් 25%කගේ වැටුප ඇමරිකානු දරිද්‍රතා රේඛාවට පහළින් තිබේ.

8. ඇමරිකානු එක්සත් ජනපදය සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව අනුව දරිද්‍රතාවයෙන් පෙළෙන දරුවන් ගණන ජනගහනයෙන් සියයට 22 කි.

9. ඇමරිකාවේ වෙසෙන දරුවන්ගෙන් සියයට 57ක් වාසය කරන නිවාස අඩු ආදායම් සහ දුක්ඛිත ගණයේ ලා ගැනෙයි.

10. ඇමරිකා එක්සත් ජනපදයේ ජනගහනයෙන් මිලියන 100ක් දුප්පත් හෝ 'ආසන්න දුප්පතුන්' ලෙස සැලකෙයි.

11. විශ්වවිද්‍යාලයක ඇස්තමේන්තුවකට අනුව ළමා දරිද්‍රතාවය වෙනුවෙන් වාර්ෂිකව ඇමරිකානු එක්සත් ජනපදයට ඇ. ඩො. බිලියන 500ක් වෙන් කිරීමට සිදුවේ.

12. ස්වාමි පුරුෂයා රහිත ගෘහමූලිකභාවය දරන මව්වරුන්ගෙන් (single mother) සියයට 31.6ක් දුප්පත්කමේ රේඛාවෙන් පහළ ජීවිතයක් ගතකරයි.

13. 2010 වසරේදී ස්වාමි පුරුෂයා රහිත ගෘහමූලිකභාවය දරන මව්වරුන්ගෙන් සියයට 42ක් ආහාර මුද්දරලාභීන්වී සිටියහ.

14. ඇමරිකානු දුප්පත් දරුවන් පිළිබඳ ජාතික ආයතනයේ සමීක්ෂණයකට අනුව දුප්පත්කමෙන් පෙළෙන දරුවන් ප්‍රතිශතයක් ලෙසින් මෙසේය.

| **ප්‍රාන්තය** | **ප්‍රතිශතය** |
|---|---|
| පිලඩෙල්පියා | 36.4% |
| ඇට්ලෆිමා | 40.1% |
| ක්ලෙවර්ලන්ඩ් | 52.6% |
| ඩෙට්‍රියට් | 53.6% |

15. 2007 වසරේ සිට මේ වන විට කැලිෆෝනියා ප්‍රාන්තයේ දුප්පත් දරුවන් ප්‍රමාණය සියයට 30කින් වැඩිවී ඇත.

16. නිවාස අහිමිවූ පවුල් ප්‍රමාණය වොෂිංටන් DCහි (ඉතාම ධනවත් ප්‍රාන්තය ලෙස සැලකේ.) පමණක් සියයට 23කින් වැඩිවී තිබේ.

17. ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රාදේශීය පාලන ඒකක (country) 314ක දරුවන්ගෙන් සියයට 30ක් ආහාර හිඟතාවයෙන් පෙළෙයි.

18. ඇමරිකා එක්සත් ජනපද දරුවන්ගෙන් මිලියන 20ක් තම කුසගින්න නිවාගන්නේ පාසල් දිවා ආහාර වැඩසටහන මගිනි.

19. ඇමරිකානුවන් මිලියන සියයට වැඩි ප්‍රමාණයක් දැනට මධ්‍යම රජයේ සුබසාධන වැඩසටහන්වලින් අඩුම තරමින් එකකින් හෝ ප්‍රතිලාභ ලබයි. මේ සුබසාධනවලට සමාජ ආරක්ෂණ හෝ සෞඛ්‍ය ප්‍රතිකාර අයත් නොවේ.

20. ජාතික ආහාර ආරක්ෂා කිරීමේ ඇමරිකානු සංවිධානයට අනුව ඇමරිකා එක්සත් ජනපදයේ නිපදවන ආහාරවලින් සියයට 40ක් නිවෙස්වලින්ද ආපනශාලාවලින්ද ඉවත දමන ආහාර නිසාද තවත් ප්‍රමාණයක් ආහාර පලදාව නෙළා නොගෙන මිල පවත්වා ගැනීම සඳහා විනාශවීමට හැරීම නිසාද නාස්තියට ලක්වේ.

## ග්‍රීසිය

මෑත අතීතයේදී යුරෝපයේ පිහිටි සමෘද්ධිමත්ම රාජ්‍යයක් වූ ග්‍රීසිය, මේ වන විට දැඩි සමාජයීය හා දේශපාලන අර්බුදයකට මුහුණපා සිටියි. කලෙක ධනේශ්වර රාජ්‍ය ආකෘතියේ ආදර්ශමත්ම රටක් වූ ග්‍රීසියේ ධනපති දේශපාලන පක්ෂ අසමත්භාවයේ සංකේත බවට පත්ව ඇත. 1974 මිලිටරි පාලනය බිඳවැටීමෙන් පසු දිගටම පැවැති තට්ටුමාරු ධනපති දේශපාලනයෙන් අද ග්‍රීසිය බංකොලොත්ව ඇත. මහා භාණ්ඩාගාරයේ මුදල් නොමැත. රැකියා අහිමි වූවෝ දහස්

ගණනක් මහ මඟ රස්තියාදු වෙති. ආර්ථික පීඩනයට ලක්වූවෝ ප්‍රසිද්ධ ස්ථානවලට පැමිණ සියදිවි නසා ගනිති.

ග්‍රීසියේ ණය අර්බුදය 2009 වසරේ සිට විශාල ලෙස වර්ධනය වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයෙන් ගෙවිය යුතු මුළු ණය මුදල සියයට 127ක් වේ. එය 2010 වසරේදී සියයට 144ක් වූ අතර 2012 වසර අවසාන වන විට සියයට 170ක් දක්වා වර්ධනය වී ඇත. ග්‍රීසිය මෙම තත්වයෙන් බේරාගැනීමට යුරෝපා සංගමය හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මැදිහත් වී 2010 මැයි මාසයේදී විශාල කොන්දේසි සහිතව යුරෝ බිලියන 110ක ණයක් සියයට 5.5 ගිනි පොලියට ලබා දෙන ලදී. ඉන් පලක් නොවූ තැන ජාත්‍යන්තර මූල්‍ය අරමුදල 2011 ඔක්තෝබර්වලදී බිලියන 130ක දෙවන ණය මුදලක්ද සපයනු ලැබීය. එහෙත් අද වන විට සමස්ත ණය ප්‍රමාණය බිලියන 346ක් දක්වා වර්ධනය වී ඇත.

ග්‍රීසියේ ජනගහනයෙන් 15න් එකක් අන්ත දුගී බවෙන් පෙළෙන අතර ඔවුන්ගේ වාර්ෂික ආදායම යුරෝ 13,842. (එක්සත් ජනපද ඩොලර් 15641.46) කි. සමහර ග්‍රීක පුරවැසියන් තම දරුවන් අත්හැර දමා ගොස් ඇත. සියදිවි නසාගන්නා අනුපාතය සියයට 40කින් ඉහළ ගියේය. 77 හැවිරිදි විශ්‍රාමිකයෙකු වූ දිමිට්‍රිස් කිස්ට්‍රොයුලස් පසුගිය අප්‍රේල් මාසයේදී ග්‍රීක පාර්ලිමේන්තුව අසලට පැමිණ තමන්ට වෙඩි තබාගත්තේය. 2012 පෙබරවාරි මස තුළ පමණක් එරට 20,000ක ජනතාවට නිවාස අහිමි විය. ඓතිහාසික නගරයක් වූ ඇතන්ස්හි කඩ සාප්පුවලින් සියයට 20ක් මේ වන විට වසා දමා ඇත.

මේ වන විට එහි වෙසෙන ශ්‍රම බලකාය මිලියන 5කි. ලොව වැඩිම වේලාවක් වැඩ කරන (ශ්‍රමය වැය කරන) රටවල් අතුරින් මූලික රට වී ඇත.

| වසර | විරැකියාව |
|---|---|
| 2008 | - 7.2 |
| 2012 | - 21.8 |
| 2013 | - 27 |

2012 වසරේ තරුණ විරැකියාව 50.8%කි. ග්‍රීසියේ වයස අවුරුදු 24ට අඩු සෑම 10ක ගෙන් 6ක් විරැකියාවෙන් පෙළෙති. පසුගිය දා සම්මතවූ එරට අයවැය යෝජනා මගින් විශ්‍රාම යන වයස 65 සිට 67 දක්වා ඉහළ දැමීම හා රාජ්‍ය අංශයේ සේවක වැටුප් තුනෙන් එකකින් පහළ දැමීම, ප්‍රසාද දීමනා මුළුමනින්ම නවතා දැමීම සිදු කෙරිණි.

## ස්පාඤ්ඤය

ස්පාඤ්ඤයද ධනේශ්වරයේ කඩා වැටීම තුළ අර්බුදයට ගිය තවත් රටකි. ආර්ථික අර්බුදය ආරම්භ වීමත් සමග 2004 වසර පළමු කාර්තුවේදී දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය සියයට 6.9කින් කඩා වැටුණි. පසුව 2010 මුල් කාර්තුවේදී ආර්ථික වර්ධන වේගය 0.6කින් වර්ධනය වුවද 2011 දෙවෙනි හා තුන්වැනි කාර්තුවල යළිත් 0.3ක් හා 0.2ක් වශයෙන් කඩා වැටීමට ලක් විය. රජයේ වංචා දූෂණ පිළිබඳව මහජන අවධානය ක්‍රමයෙන් ඉහළ ගොස් ඇති අතර සමාජ විද්‍යා සමීක්ෂණවලින් පෙනී යන පරිදි එරට විවිධ දේශපාලන පක්ෂවලට අයත් දේශපාලකයින් හෝ හිටපු දේශපාලකයින් 300කට එරෙහිව වංචා දූෂණ පිළිබඳ පරීක්ෂණ සිදුකෙරෙමින් පවතී.

2012 වසරේ හතරවෙනි කාර්තුව වන විට රටේ GDP (දළ ජාතික නිෂ්පාදිතයේ) අගය සියයට 1.8කින් පහත වැටී තිබිණි. 2012 වසරේදී එරට විශාලතම ණය දෙන ආයතන හතරක් වෙත නැවත

ප්‍රාග්ධනය සැපයීමක් සිදුවිය. එම ආයතන වෙත යුරෝ බිලියන 37 (ඩොලර් බිලියන 49.8)ක් යුරෝපා සංගමය වෙතින් ලබා දෙන ලදී.

## ස්පාඤ්ඤයේ දරිද්‍රතාවය

ස්පාඤ්ඤයේ දරිද්‍රතාවය පෙන්වන දත්ත කිහිපයක් මෙසේ දැක්විය හැකිය. කුඩා දරුවන් දෙදෙනකු සිටින යුවළකගේ මාසික ආදායම යුරෝ 4000 සිට 2000 දක්වා අඩුවී ඇත. එරට කම්කරුවන්ගෙන් සියයට 35ක් අවම වැටුප වන යුරෝ 641ක් ලබයි. ස්වයංරැකියාලාභීන්ගෙන් සියයට 40ක් දිළිඳු බවට පත් වී ඇත.

## ස්පාඤ්ඤයේ විරැකියාව

ධනේශ්වර අර්බුදයේ ක්ෂණික ප්‍රකාශවීමක් වන්නේ, රැකියා අර්බුදයයි. ඒ අනුව ස්පාඤ්ඤයේ 2003 වසරේදී රැකියා අහිමිව සිටි ප්‍රමාණය 1,834,000 ( සියයට 8.3ක් )කි. දිගු කාලීනව රැකියාවල නියුතු වූවන්ගේ රැකියා විරහිත ප්‍රමාණය ශීඝ්‍රයෙන් ඉහළ ගිය අතර 2010දී එම අනුපාතය සියයට 42.5කි. 2007 - 2010 වසරවල යුරෝපයේ විරැකියා වර්ධනය 7.51 - 10.1%ක් වේ. එම කාල වකවානුවේම ස්පාඤ්ඤයේ විරැකියා වර්ධනය 8.3 - 20.1%කි. 2012 අවසන් කාර්තුවේ ස්පාඤ්ඤයේ විරැකියාව 5,970,000කි. එනම් 25%කි. විරැකියා අනුපාතය සියයට 25ක් වීමෙන් හා තරුණ විරැකියාව සියයට 50ක් වීමෙන් ස්පාඤ්ඤයේ ජනතාවගේ ජීවිත බිඳවැටීම මනාව තේරුම්ගත හැකිය. දිනකට ඩොලර් 2ට අඩු ආදායම් ලබන ජනගහනය 48% කි. දිනකට ඩොලර් 10ට අඩු ආදායම් ලැබෙන ජනගහනය 80%කි.

ජාතික වන සම්පත් සංගමයේ සභාපති Nikos Bokris පවසන්නේ, ඇතිවී තිබෙන තත්වය අනුව එක් ගිනිපුපුරකින් ඇවිළී යාහැකි මට්ටමේ දැවැන්ත සමාජ විරෝධයක් රට තුළ මතුවී ඇති බවය.

# 9

# කඩා වැටෙන ධනවාදයේ යථා රූපය

ධනවාදය කඩා වැටීම යනු ධනවාදී සිහින සියල්ල බිඳවැටීමයි. ලෝකයේ සම්පත් තව තවත් එක් ලක්ෂයකට සංකේන්ද්‍රණය වෙමින් තිබේ. සැබවින්ම මෙය පැහැර ගැනීමකි. ධනපතියන් තව තවත් පොහොසත් වීම යනු දුප්පතුන් තව තවත් දරිද්‍රතාවයේ පතුළට ඇද දැමීමකි; දුප්පතුන් වැඩි වීමකි. මෙම තත්වය විසින් දැවැන්ත විෂමතාවයක්, අසමානතාවයක් ඇති කරයි. නිදර්ශනයන් කිහිපයක් මඟින් එය වටහා ගැනීමට උත්සාහ කරමු. ලෝකයේ දරුවන් මිලියන 250 (1/6)ක් ළමා ශ්‍රම සූරාකෑමට ගොදුරු වෙති. එක්සත් ජනපද රජය තම අයවැයෙන් සියයට 24ක් දුප්පත් රටවලට වෙන් කරන බව එරට වැසියන් සිතා සිටියත්, එහි ඇත්ත අගය සියයට 1කි. දුප්පත්ම සියයට 40කට ගෝලීය ආර්ථිකයෙන් සියයට 5ක් හිමිවන විට පොහොසත්ම සියයට 20ට ගෝලීය ආර්ථිකයෙන් සියයට 75ක් හිමිවේ. ලෝක ජනගහනයෙන් බිලියනයක් මුළු සමාජ නිෂ්පාදනයෙන් සියයට 8.5කට උරුමකම් කියන විට තවත් බිලියනයක් දිනකට ඩොලරයක් උපයාගත නොහැකිව අපා දුක් විඳිති. ලොව පොහොසත්ම තිදෙනාගේ වත්කම

රටවල් 48ක දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම ඉක්මවන තරම්ය. ඔක්ස්ෆෑම් වාර්තාවකට අනුව ලොව ධනවත්ම පුද්ගලයින් 85 දෙනා පාලනය කරනු ලබන ධනය ලොව දුප්පත්ම මිනිසුන් බිලියන 3.5 (ලොව සමස්ත ජනගහනයෙන් අඩක්) විසින් හසුරුවන ධනයට සමානය. ලොව ධනවත්ම සියයට එක් දෙනා විසින් ලොව සමස්ත ධනයෙන් සියයට 46ක් පාලනය කරයි. සුළඟින් හා වැස්සෙන් බේරීමට නිවසක් නොමැති ජනතාව සියයට 23කි. එවන් ළමයින් මිලියන 640 (1/3)ක් එනම් සියයට 33 පමණය. පරිගණකයක් නොමැති ලෝක ජනතාව සියයට 78ක් වේ. විදුලි බලය නොමැති ජනතාව සියයට 22කි. ඇමරිකා එක්සත් ජනපදයේ පමණක් නිවාස අහිමි ජනගහනය 663,483කි. 2013 වසරේ ලොව රැකියා විරහිතභාවය මිලියන 202කි. ලොව ආහාර නොමැතිකම නිසා සහ සුව කළ හැකි රෝගවලින් දිනකට 25,000ක් මිය යයි. ලෝක ජනගහනය බිලියන 7න් බිලියන 1ක් සෑම දිනකම කුසගින්නේ නින්දට යයි. පෝෂණ ඌනතාවයෙන් පෙළෙන ජනගහනය මිලියන 900 (903,443,745)කි. යුනිසෙෆ් වාර්තා අනුව ලොව දිනකට දරිද්‍රතාවය නිසා මියයන දරුවන් ගණන 22,000කි.

ලොව පුරා පාසල් යා යුතු වයසේ ළමයි මිලියන 67.5ක් (කෝටි 7 කට ආසන්න ප්‍රමාණයක්) පාසල් නොයති. (මෙය යුරෝපයේ සහ උතුරු ඇමරිකානු සමස්ත ප්‍රාථමික සිසුන් ප්‍රමාණයට සමානය.) අකුරු ලිවීමට හෝ කියවීමට නොහැකි ලෝක ජනගහනය සියයට 17 කි. ආසන්න වශයෙන් මිලියන 100ක (කෝටි 100) ජනතාවකට පොතක් පතක් කියවීමට හෝ තම අත්සනවත් යෙදීමට නොහැකිවීම 21 වැනි සියවසේ සිටින ලෝකය මුහුණ දී ඇති කනගාටුදායක තත්වයකි.

සනීපාරක්ෂාව නොමැති ජනගහනය බිලියන 2.6කි. සෞඛ්‍ය පහසුකම් අහිමි ළමුන් මිලියන 270 (මුළු ළමා ජනගහනයෙන් 1/7කි) සංවර්ධනය වන රටවල පිරිසිදු ජලය ඇති ජනගහනය බිලියන 1.1කි.

එච්.අයි.වී. අසාදනයෙන් 2004 වසර තුළදී පමණක් මිලියන තුනක් මියගොස් ඇත.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තාවලට අනුව සෑම වසරකම ලොව මිනිස්සු ලක්ෂ 10ක් සිය දිවි නසා ගනිති. එනම් සෑම මිනිසුන් ලක්ෂයකින්ම 16කි. තවත් ලෙසකින් කිවහොත් සෑම තත්පර 40කටම වරක් ලොව එක් මිනිසෙකු සියදිවි නසාගනී. යුරෝපා සංගමයේ පුරෝකථනය අනුව 2020දී මෙම අගය සෑම තත්පර 20කටම එක් අයකු වනු ඇත. පසුගිය වසර 40 තුළදී ලෝකයේ සියදිවි නසාගැනීම් සියයට 45කින් වර්ධනයවී තිබේ. එමෙන්ම ලෝකයේ වාර්ෂිකව මිලියන 1ක් සියදිවි නසාගැනීම්වලට ලක්වන විට මිලියන 20ක් ඒ සඳහා උත්සාහ කරති.

## දරිද්‍රතාවයේ බල මහිමය

මිනිසුන්ගේ දරිද්‍රතාවය විසින් ඔවුන් සමාජයට වෛර කරන, සමාජයට එරෙහි, පෞරුෂය බිඳවැටුණු පුද්ගලයින් බවට පත්කරයි. එමෙන්ම සියල්ල වෙළඳ භාණ්ඩ වන ධනවාදී ලෝකයේ හෘදය සාක්ෂිය, ආත්මගරුත්වය, ස්වාධීනත්වය, සදාචාරය ආදී සියල්ලම පරදුවට තබයි. ඒ සඳහා වන කදිම උදාහරණයක් පහත දැක්වේ.

### යුරෝ කිහිපයක් වෙනුවෙන් මිනිසුන් නිරුවත්වීම

ජර්මන් සහ ඩෙන්මාර්ක් දේශසීමාවේ පිහිටි underlugum සුපිරි වෙළඳසැලක් 2012 ජූනි මාසයේ පළමු සෙනසුරාදා මුලින්ම එන 100 දෙනාට යුරෝ 240ක වට්ටමක් දෙනු ලබන බව ප්‍රසිද්ධ කළේය. එහි කොන්දේසිය ඔවුන් නිරුවතින් පැමිණිය යුතු වීමයි. වෙළඳසැලෙහි කළමනාකාරිත්වය 10 දෙනෙක් පමණ පැමිණෙනු ඇතැයි බලාපොරොත්තු වුවද සියගණනක් දෙනා නිරුවතින් පැමිණීම තුළින් ප්‍රකාශ වූයේ, දරිද්‍රතාවයේ ප්‍රමාණය හා එය විසින් සියලු සදාචාරයන් ඉවත දමා ඇති තරමයි.

## ධනවාදී අර්බුදයන්ගේ ඉතිහාසය

ධනවාදයේ අර්බුදය අද ඊයේ ඇති වූවක් නොවේ. ධනවාදය ආරම්භයේ සිට වරින් වර එය ප්‍රකාශයට පත්වෙමින් තිබේ. ඒ බව මාක්ස් විසින්ද පෙන්වා දෙන ලදී.

"කලින් කල යළි යළිත් ආපසු පැමිණෙන, එලෙස ආපසු පැමිණෙන හැම වාරයකදීම වඩ වඩාත් තර්ජනාත්මක ලෙස මුළු මහත් ධනපති සමාජයේ පැවැත්මට තර්ජනය කරන වාණිජ අර්බුද ගැන සඳහන් කිරීම ප්‍රමාණවත්ය. මෙම වාණිජ අර්බුදවලදී නිෂ්පාදනය කර තිබූ භාණ්ඩවලින් සෑහෙන කොටසක් පමණක් නොව නිෂ්පාදන බලවේගයන්ගේද සෑහෙන කොටසක් පවා සෑම වාරයකදීම විනාශකර දමනු ලැබේ. "

(කොමියුනිස්ට් ප්‍රකාශනය, පිටුව 40)

ධනවාදයේ ඉතිහාසය තුළ මෙතෙක් පැවැති දැවැන්ත ආර්ථික අර්බුද අවස්ථාවන් පිළිවෙළින් පහත සඳහන් ලෙසින් පෙළගැස්විය හැකිය.

1. 1929 - 1930 අර්බුදය
2. 1973 - 1974 අර්බුදය
3. 1996 -1997 අර්බුදය
4. 2008 න් ඇරඹි ආර්ථික අර්බුදය

## 1837 -1843 ආර්ථික අර්බුදය

නිදහස් තරගය තුළ ආරම්භ වූ ධනවාදය 19වැනි සියවසේ මුල් භාගයේ සිටම අර්බුදයට යන්නට විය. 1837 වසරේ ඇමරිකානු එක්සත් ජනපදය තුළින් මහා ආර්ථික අවපාතයක් ආරම්භ විය. එය කොතරම් බලවත් වීද යත් ඇමරිකාවේ පැවැති බැංකු 850න් 343ක්ම මාස දෙකක් තුළ වසා දමන්නට සිදුවිය. තවත් බැංකු 62ක් පසුව බංකොලොත් විය. 1837 වසරේ ඇරඹි මෙම අර්බුදය 1843 දක්වාම පැවැතුණි. 1837 මැයි 10 නිව්යෝර්ක් නගරයේ බැංකු ගෙවීම් නතර කළේය. විරැකියාව සියයට 25 දක්වා ඉහළ ගිය අතර ව්‍යාපාර ලාභ මිල ගණන්, වැටුප් පහළ ගියේය. ඉඩම් මිල පහළ වැටුණි. ඇමරිකා එක්සත් ජනපදය බ්‍රිතාන්‍යයෙන් මූල්‍ය ආයෝජන ලබාගෙන තිබීම සහ බ්‍රිතාන්‍ය විසින් අනුගමනය කළ මූල්‍ය ප්‍රතිපත්තීන් මෙම හදිසි කඩාවැටීමට ප්‍රධාන වශයෙන් බලපෑවේය. නැවැත මෙම අර්බුදය 1873 දී වියානා කොටස් වෙළඳපොළ කඩාවැටීමත් සමග මතු විය.

## 1873 දීර්ඝ අවපාතය (Long Depression)

ලෝකයේ සිදුවූ පළමු ජාත්‍යන්තර මට්ටමේ ආර්ථික අවපාතය ලෙස සැලකෙන්නේ මෙම 1873 දැවැන්ත ආර්ථික අවපාතයයි. 1873 මෙම ආර්ථික අවපාතය 1879 දක්වාම පැවැතිණි. එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍යය, ප්‍රංශය හා යුරෝපා රටවල් ප්‍රධාන වශයෙන් මෙම ආර්ථික අවපාතයට ගොදුරු වූ රටවල් විය.

දෙවන කාර්මික විප්ලවයේ බලපෑම නිසා නිෂ්පාදනය සියලු ක්ෂේත්‍රයන්හි දෙතුන් ගුණයකින් ඉහළ ගියේය. 1870 ප්‍රංශ - ජර්මන් (ප්‍රසියාව) යුද්ධයේ ප්‍රතිඵල ලෙස ප්‍රංශයට ජර්මනිය සඳහා පවුම් මිලියන 200ක් වන්දි ගෙවීමට සිදු විය. ඇමරිකානු සිවිල් යුද්ධයෙන් පසුව නිෂ්පාදනයේ වර්ධනයක් සිදුවුවත් සංසරණයට ප්‍රමාණවත්

මුදල් නොතිබීම අර්බුදයක් විය. එයට හේතු වූයේ ඇමරිකාව තමන්ගේ රන් සංචිත මට්ටම පවත්වා ගැනීමට මුදල් මිලදී ගනිමින් ඒකරාශි කිරීමය. එනිසා වෙළඳාමට ප්‍රමාණවත් මුදල් නොමැති විය. මූල්‍ය විශ්ලේෂකයන්ගේ මතය අනුව රන් සංචිත ඉක්මවන මුදල් වෙළඳපොළට පැමිණීම නිසා යුරෝපා රටවල දැවැන්ත මූල්‍ය අර්බුදයක් නිර්මාණය වීම විය. 1873 මැයි 8 වෙනිදා වියානා කොටස් වෙළඳපොළ කඩා වැටීම නිසා වසා දැමීමට සිදු විය.

මෙම අර්බුදය හේතුවෙන් ඇමරිකා එක්සත් ජනපදයේ පමණක් ව්‍යාපාර 18,000 සම්පූර්ණයෙන්ම බංකොලොත්භාවයට පත්විය. 1874 වසරේ දී ඇමරිකාවේ විරැකියාව සියයට 14ක් විය. මෙම අර්බුද චකවානුව තුළ යුරෝපයේ සහ ඇමරිකා එක්සත් ජනපදයේ ආර්ථික වර්ධන වේගය ශීඝ්‍ර ලෙස පහත වැටීම සිදුවිය. 1870 - 1890 කාලය තුළ යකඩ නිෂ්පාදනය ටොන් මිලියන 11 සිට 23 දක්වා ඉහළ ගිය අතර වානේ ටොන් මිලියන භාගයේ සිට මිලියන 11 දක්වා ඉහළයාම සිදුවිය. එයට සමානුපාතිකව භාණ්ඩ මිල ගණන් දෙතුන් ගුණයකින් පහළ ගියේය. කපු රෙදි මිල සියයට 50කින් පහත වැටුණි. නිව්යෝර්ක් කොටස් වෙළඳපොළ වසා දැමිණි. 1873 සැප්තැම්බර් 18 වෙනිදා 'කළු බ්‍රහස්පතින්දාව' ලෙස නම් විය.

## 1929 මහා ආර්ථික අවපාතය

20වැනි ශත වර්ෂයේ සිදුවූ විශාලතම ආර්ථික අවපාතය මෙය ලෙස හැඳින්වේ. 1929 වසරේ ඔක්තෝබර් මස 29 වැනි දිනය ඇමරිකානු ඉතිහාසයේ 'කළු අඟහරුවාදා' ලෙස නම් කෙරුණි. Daw Jones කොටස් වෙළඳපොළ දර්ශකය අනුව 1929 සැප්තැම්බර් මස 3වැනිදා එහි අගය ඒකක 381.17ක් ලෙස සටහන් විය. එය ඓතිහාසික ලෙස කොටස් මිල ඉහළයාමකි. නමුත් කළු බ්‍රහස්පතින්දා ලෙස හඳුන්වන ඔක්තෝබර් 24 වැනිදා එම වෝල්

ස්ට්‍රීට් කොටස් වෙළඳපොළ සියයට 11කින් බිඳ වැටුණි. ඒ අවස්ථාවේදී ඇමරිකාවේ ඉහළම බැංකුකරුවන් වන මොර්ගන් බැංකුව, Chase බැංකුව, නිව්යෝර්ක් නැෂනල් සිටි බැංකුව ආදී බැංකු ප්‍රධානීහු රැස්වී මෙම අර්බුදයට විසඳුම් සෙවීම ඇරඹූහ. ඔක්තෝබර් මස 28 'කළු සඳුදා' බොහෝ ආයෝජකයින් විසින් එකවර තම මුදල් කොටස් වෙළඳපොළෙන් ඉවත්කර ගැනීමට තීරණය කරන ලදී. ඒ අනුව එදින කොටස් වෙළඳපොළ දර්ශකය පහළයාම ඒකක 38.33කින් නැතහොත් සියයට 13ක් විය. ඊළඟ දිනයේදී 'කළු අඟහරුවාදා' මිලියන 16ක් පමණ කොටස් අලෙවි වී Dow Jones දර්ශකයට අනුව ඒකක 30කින් එනම් සියයට 12කින් පහත වැටුණේය. 1929 ඔක්තෝබර් මස 29වැනි දින රොකෆෙලර් පවුලේ ව්‍යාපාරික සාමාජිකයන් තමන්ගේ මුදල් කොටස් වෙළඳපොළට යොදා අර්බුදයෙන් මිදීමට උත්සාහ කළද එය අසාර්ථක විය. ඔක්තෝබර් මස 29 දින පමණක් කොටස් වෙළඳපොළේ අහිමිවූ මුදල ඩොලර් මිලියන 14ක් විය. එම දින දෙකට පමණක් අලෙවි වූ කොටස්වල වටිනාකම ඩොලර් මිලියන 30 ඉක්මවිය.

**කළු සඳුදා සහ කළු අඟහරුවාදා Daw Jones දර්ශකය වෙනස්වූ ආකාරය**

| **දිනය** | **වෙනස්වීම** | **වෙනස්වීමේ ප්‍රතිශතය** | **අගය** |
|---|---|---|---|
| 1929 ඔක් | -38.33 | -12.82 | 260.64 |
| 1929 ඔක් | -30.57 | -11.73 | 230.07 |

1920 දශකයේ මුල් භාගයේදී වාහනේ නිෂ්පාදනය, ගොඩනැගිලි ඉදිකිරීම, තොග වෙළඳාමේ පිරිවැටුම, වාහන ලියාපදිංචිය, දුම්රිය මාර්ග ඉදිකිරීම ආදිය විශාල ලෙස වර්ධනය විය. 1929 මුල් මාස හයේදී 1928ට සාපේක්ෂව නිෂ්පාදන කර්මාන්ත සියයට 36.6ක

වර්ධනයක් පෙන්විය. මෙම වර්ධනය ධනපතින්ට, නිෂ්පාදකයින්ට විශාල ලෙස කොටස් වෙළඳපොළේ ආයෝජනය කිරීම පිළිබඳව බලාපොරොත්තුවක් ජනිත කරන ලදී. ඒ නිසාම විශාල ආයෝජකයන් ප්‍රමාණයක් තමන්ගේ අත ඇති වත්කම්වලට අමතරව මුදල් ණයට ගැනීමෙන් පවා කොටස් වෙළඳපොළේ ආයෝජනයට පෙළඹිණ.

කොටස්වල මුහුණත වටිනාකමෙන් තුනෙන් දෙකක්ම බ්‍රෝකර්වරුන් විසින් කුඩා ආයෝජකයන්ට ණය ලෙස ලබාදෙනු ලැබිය. ණය මගින් කොටස් මිලදී ගත් ආයෝජන ප්‍රමාණය ඇමරිකානු ඩොලර් මිලියන 8.5ක් විය. ඇමරිකානු ආර්ථිකයේ සංසරණය වූ මුදල් ප්‍රමාණය ඉක්මවන මුහුණත වටිනාකමෙන් යුත් කොටස්, වෙළඳපොළේ විය. තව තවත් ලාභ අපේක්ෂාවෙන් කොටස් වෙළඳපොළේ ආයෝජනයන් දිරිමත් කිරීමට මිල ගණන් ඉහළයාම උත්තේජනයක් විය. ජනතාව විශ්වාස කළේ කොටස් මිල තවදුරටත් ඉහළ යන බවකි. නමුත් ඉන් සිදුවුයේ ආර්ථික බුබුළක් (Economic Bubble) නිර්මාණය වීමයි.

අර්බුදය ආරම්භ වන්නේ, ඉතා ඉහළ තිරිඟු නිෂ්පාදනයක් ලැබීමත් සමගය. 1929 වසර ආරම්භයේ දී තිරිඟු නිෂ්පාදනය බුසල් මිලියන 250ක් විය. මැයි ශීත සෘතුවේදි මිසිසිපි මිටියාවතේ පමණක් තිරිඟු එලදාව බුසල් මිලියන 560ක් විය. මෙම අධි නිෂ්පාදනය තිරිඟු මිල ශීඝ්‍ර ලෙස පහළ බැසීමට හේතුවක් විය. මෙලෙසම ප්‍රංශයේ, ඉතාලියේ සහ ඕස්ට්‍රේලියාවේ තිරිඟු නිෂ්පාදනය ඉහළ යාමෙන් තිරිඟු මිල සමගම කොටස් මිලද ශීඝ්‍ර ලෙස පහළ යාමට හේතු විය. 1929 වසරේ ජූලිවලදී බුසලකට ඩොලර් 1.49ක මිලක් ලැබුණද ඔක්තෝබර් වන විට තිරිඟු බුසලක මිල ඩොලර් 1.31ට පහත බසින ලදී. ඩොලර් මිලියන 100ක් ගොවීන්ට සහනාධාර ලෙස ගෙවීමට ඇමරිකානු කොංග්‍රසය විසින් අනුමත කරන ලදී. නමුත් අනෙකුත් රටවලත් ඇමරිකාවේත් සිදුවූ ආර්ථික පරිහානිය ඉන් නතර කළ නොහැකි විය.

## 1973 -1974 කොටස් වෙළඳපොළ බිඳ වැටීම

1970 දශකයේ ලෝකයේ සිදුවූ දැවැන්තම කොටස් වෙළෙඳපොළ බිඳවැටීම මෙය ලෙස සලකනු ලැබේ. මෙම කොටස් වෙළඳපොළ බිඳවැටීමට බලපෑ හේතු කීපයකි.

1. 1973 ඛනිජ තෙල් අර්බුදය
2. බ්‍රෙට්න්වුඩ් සම්මුතිය බිඳ වැටීම
3. එක්සත් ජනපද ඩොලරය අවප්‍රමාණය
4. Nixon Shock

Daw Jones (ඩොව් ජෝන්ස්) දර්ශකය අනුව 1973 ජනවාරි මස 11 වැනි දා සිට නිව්යෝර්ක් කොටස් හුවමාරුව දින 99ක් තුළ ඔවුන්ගේ වටිනාකමෙන් සියයට 45ක් අහිමි කර ගත්තේය. 1972 වර්ෂයේ දී සියයට 15 ක වර්ධනයක් පෙන්නුම් කළ ඇමරිකානු කොටස් මිල දර්ශකය 1973 වර්ෂයේ ඊට වඩා ප්‍රගතියක් අපේක්ෂා කළද දින තුනක් ඇතුළත මෙම දැවැන්ත ආර්ථික පරිහානිය පෙන්නුම් කරන ලදී. 1972 -1974 කාලය තුළ ඇමරිකානු ආර්ථික වර්ධන වේගය සියයට 7.2 සිට සියයට 2.1 දක්වා පහතට වැටුණේය. ඒ අතර මිල උද්ධමනය සියයට 3.4 සිට 1974 වන විට සියයට 12.3 දක්වා ඉහළ නැග්ගේය. මෙම අර්බුදය දරුණු ලෙසටම බලපෑ එක්සත් රාජධානියේ කොටස් වෙළඳපොළ කඩා වැටිණි. 1972 දී සියයට 5.1ක් වූ එක්සත් ජනපද ආර්ථික වර්ධන වේගය 1974 දී සියයට 1.1ක් අඩු විය. මේ අතර බ්‍රිතාන්‍ය වෙළඳපොළ හා එංගලන්ත බැංකුව ණය අය කර ගැනීමට නොහැකි දැවැන්ත අර්බුදයකට මුහුණ දුන්නේය. Hong Kong කොටස් දර්ශකයද 1800 සිට 300 දක්වා අගයකට කඩා වැටිණි. එක්සත් ජනපදයට 1987 වන තුරු තම ආර්ථිකය යථා තත්වයට පත්කර ගැනීමට නොහැකි විය.

## 1973 ඛනිජ තෙල් අර්බුදය

1973 ඔක්තෝබරයේ 'ඔපෙක් (OPEC) සංවිධානයේ අරාබි සාමාජිකයන්, ඊජිප්තුව හා සිරියාව එක් පාර්ශ්වයකටත් ඇමෙරිකා එක්සත් ජනපදය හා ඊශ්‍රායලය එක් පාර්ශ්වයකටත් බෙදී පැවතුණි. 1973 ඔක්තෝබර් මස 19 දින ඇමරිකානු ජනාධිපති රිචඩ් නික්සන් කොන්ග්‍රසයට විශේෂ යෝජනාවක් ඉදිරිපත් කරමින් ඊශ්‍රායලයට ඇමරිකන් ඩොලර් බිලියන 2.2 ක විශේෂ හදිසි ප්‍රතිපාදනයක් ලබා දීමට අනුමත කරගන්නා ලදී. ඒ සමගම ලිබියාව ඇමරිකාවට තෙල් ලබා නොදෙන ලෙස සම්බාධක ප්‍රකාශයට පත්කරන්නට විය. 1973 ඔක්තෝබර් මස 20 වැනි දින සෞදි අරාබිය ඇතුළු අනෙකුත් තෙල් නිපදවූ රටවල්ද එම පියවරම අනුගමනය කරන ලදී. එසේම ඔපෙක් සාමාජික රටවල් විසින් තම තෙල් මිල සියය 70 කින් ඉහළ දමනු ලැබීය. තෙල් බැරලයක් සඳහා මිල ඩොලර් 3 සිට ඩොලර් 12 දක්වා ඉහළ ගියේය. මෙම මිල ඉහළ යාම මූල්‍ය අර්බුදයක ආරම්භ විය.

## බ්‍රෙටන්වුඩ් සම්මුතිය බිඳවැටීම

1944දී ස්ථාපිත කරන ලද බ්‍රෙටන්වුඩ් සම්මුතිය අනුව එක්සත් ජනපද ඩොලරය ස්ථාවර අගය ලෙසින් සලකා විදේශ විනිමය අනුපාත තීරණය විය යුතුය. ඒ අනුව එක්සත් ජනපද ඩොලරයේ වටිනාකම තීරණය කළේ රන් පදනමින්ය. (Gold Standerd) රන් අවුන්සයක් ඩොලර් 35ක් යන්න පදනම ලෙස සලකන ලදී. නමුත් 1970 මුල් වකවානුවේදී වියට්නාම් විප්ලවයේ යුද වියදම් නිසා එක්සත් ජනපදයේ උද්ධමනය සීග්‍රයෙන් ඉහළ ගියේය. එනිසා ගෙවුම් ශේෂ හිඟයක් හා වෙළඳ ශේෂ හිඟයක් ඇතිවිය. ඒ අනුව ඇතිවූ නව තත්වය තුළ ඩොලරයේ වටිනාකම හා රන් වටිනාකම අතර පරතරය වැඩි විය. එනිසා 1971 වර්ෂයේදී මුදල් සැපයුම සියයට 10කින් වැඩි කිරීමට සිදුවිය. 1971 මැයි මාසයේදි පළමුවෙන්ම ජර්මනිය විසින් බ්‍රෙටන්වුඩ්

සම්මුතියෙන් ඉවත්වී ඔවුන්ගේ මුදල් ඒකකය වන ඩොයිෂ් මාර්ක් ස්වාධීන කළේය. අනෙකුත් රටවල්ද තම රටවල මුදල් ඒකක රත්රන් සමග සැසඳීමට තීරණය කළේය. 1971 අගෝස්තු මස යුරෝපා මුදල් ඒකකවලට වඩා ඩොලරය කඩා වැටුනේය. ඒ නිසා යුරෝපා රටවල් හා ස්විස්ටර්ලන්තය බ්‍රෙටන්වුඩ් සම්මුතියෙන් ඉවත්විය.

මෙම තත්වයට මුහුණදීම සඳහා එක්සත් ජනපදය සහ ඔහුගේ උපදේශකයන් 15 දෙනාත් ජාත්‍යන්තර මූල්‍ය සමාගමේ අවසරයකින් තොරව ක්‍රියාමාර්ග කිපයක් ගනු ලැබිණ. 1971 අගෝසතු මස 15 දින විධායක නියෝජිතයන් 1615 සහභාගිත්වයෙන් එය සිදු විය. ඇමරිකා එක්සත් ජනපදය විසින් 1976 ආර්ථික ස්ථායිකරණ පනත ගෙන එනු ලැබීය. ඒ අනුව දින 90කින් උපරිම වැටුප් ගෙවීම සහ උපරිම මිල සහතික කිරීම තීරණය විය. සියයට 10 කින් යුතු ආනයන අධිභාර ඇති කළේය. රත්රන් රටින් බැහැර වන දොරටු වැසීමට තීරණය විය. තවද ඩොලර් සහ රත්තරන් පරිවර්තනය කිරීම නතර කෙරිණ. මෙම පියවරයන් වෙනත් රටවල් හැඳින්වූයේ නික්සන් ෂොක් (Nixon Shock) යනුවෙනි.

## 1997 නැගෙනහිර ආසියානු ආර්ථික අර්බුදය

නැගෙනහිර ආසියානු ප්‍රාතිහාර්යය ලෙස හඳුන්වනු ලැබූ ආර්ථික වර්ධනයන් අත්පත් කරගත් නැගෙනහිර ආසියාවේ රටවල් මෙම අර්ථික අර්බුදයට මුහුණ පැවේය. අර්බුදයට ලක්වූයේ මැලේසියාව, ඉන්දුනීසියාව, සිංගප්පූරුව, තායිලන්තය, දකුණු කොරියාව, පිලිපීනය, තායිවානය ඇතුළු අග්නිදිග ආසියාවේ රටවල් වේ. නැගෙනහිර ආසියානු ආර්ථික අර්බුදය මූල්‍ය ජාවාරම්කරුවන් විසින් ධනේශ්වර ආර්ථිකයන්හි පවත්නා බුබුළුමය ස්වභාවය පදනම් කොට ගනිමින් උපක්‍රමශීලීව නිර්මාණය කරන ලද්දකි; කෘත්‍රිමව නිර්මාණය කරන ලද්දකි. සැබවින්ම එය මූල්‍ය සමපේක්ෂණ වාසි

ලබාගැනීමේ අරමුණෙන් අටවන ලද ආර්ථික උගුලක ප්‍රතිඵලයකි. මෙම අර්බුදය, නිෂ්පාදනය මත පදනම් වනවා වෙනුවට මූල්‍ය හුවමාරුව මත ආර්ථිකයන් රඳා පැවැතීමේ ප්‍රතිවිපාකයකි. සමපේක්ෂණ සූදුව මගින් මුදල් උපයන ජෝර්ජ් සෝරෝස් ඇතුළු මූල්‍ය ජාවාරම්කරුවන් විසින් තායිලන්තයේ බැංකුවලින් තායි බාත් වැඩි ප්‍රමාණයක් ණයට ගන්නා ලදී. ඉන්පසු එකවරම එම තායි බාත් යොදවා තායිලන්ත මහ බැංකුවේ ඩොලර් සංචිතයෙන් ඩොලර් මිලදී ගැනීමත් සිදුවිය. මේ අතර තායි බාත්වල අගය අඩුවන්නේ යැයි ප්‍රචාරයක් දියත් කරන ලදී. එම ප්‍රචාරයට බියවූ ව්‍යාපාරිකයෝ තමන් සතු තායි බාත් අඩුමිලට විකුණා ඩොලර් මිලදී ගත්තෝය. එවිට තායිලන්තයේ ඩොලර් සංචිතය වේගයෙන් සිඳී ගියේය. එනිසා නැවැත විදේශ වත්කම් මිලදී ගැනීමට තායිලන්ත මහ බැංකුවට තායි බාත්වල අගය පහත දමන්නට සිදුවිය. 1997 වසර මැද වන විට බාත්වල අගය අඩකින් පහත බැස තිබුණි. එවිට මූල්‍ය ජාවාරම්කරුවෝ තමන් සතු ඩොලර්වලින් කොටසක් ගෙවා බාත් මුදල් මිලදී ගෙන ඔවුන් ලබාගත් බැංකු ණය ගෙවා දැමූහ. ඔවුන් ගෙවිය යුතුව තිබුණේ ඩොලරයට සාපේක්ෂව තමන් එදා ගත් ණය මුදලින් භාගයකි. එය ඔවුන් විසින් නිර්මාණය කළ තත්වයේ ප්‍රතිඵලයකි. සමපේක්ෂණ  වාසි ජාවාරම එලෙසින්ය. මෙසේ කිසිදු නිෂ්පාදනයක් නොකර ජාවරම්කරුවෝ ඩොලර් බිලියන ගණන් ඉපයූහ.

1997 ජූලි 2 වැනිදා තායිලන්ත බැංකු බංකොලොත් විය. 1996 නොවැම්බර් සිට 1997 නොවැම්බර් දක්වා ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව තායි බාත් සියයට 53කින්ද ඉන්දුනිසියානු රුපියා සියයට 44කින්ද පිලිපීන පෙසෝ සියයට 30කින්ද මැලේසියානු රිංගිට් සියයට 32කින්ද දකුණු කොරියා වොන් සියයට 22කින්ද කඩා වැටුණි. ඉන්දුනීසියාවේ බැංකු 16ක් බංකොලෙත් වූ අතර ලියාපදිංචිවූ සමාගම් 228න් 200යක්ද තායිලන්තයේ මූල්‍ය සමාගම් 56ක්ද දකුණ කොරියාවේ බැංකු 10ක්ද වසා දැමිණ.

## විරැකියාව

ඉන්දුනීසියාවේ 1997දී රැකියා කළ සියයට 15කට 1998 අගෝස්තු වන විට රැකියා අහිමි විය. කොරියාවේ රැකියා අහිමිවීම් සිව් ගුණයකින්ද තායිලන්තයේ එය තුන් ගුණයකින්ද ඉහළ ගියේය. කොරියාවේ ජනගහනයෙන් 1/4ක් දිළිඳුභාවයට ඇද වැටුණි. තායිලන්තය කෙටි කලකින් එය නිවැරදි කරගැනීමට තරම් සමත් විය.

"අවසානයේදී ජාත්‍යන්තර අරමුදලේ උදහසට ලක්වීමේ අවදානම දැරීමට තරම නිර්භීතකමක් පෙන්වූයේ මලයාසියාව පමණි. අගමැති මහතීර් පොලී අනුපාතය පහළ මට්ටමක තබා ගැනීමට හා සමපේක්ෂණ මුදල් වේගයෙන් රටින් බැහැරට ගලා යාම අවහිර කිරීමට සුදුසු ප්‍රතිපත්ති අනුගමනය කළේය. එම ප්‍රතිපත්තිවලට නන්දිසාවෙන් ප්‍රහාර එල්ලවූ නමුදු මලයාසියාවේ ආර්ථික පසුබැස්ම කෙටිකාලීන එකක් වූ අතර, එය අනෙක් කවර හෝ රටක දක්නට ලැබුණු තරම් ගැඹුරු අර්බුදයක් නොවීය. "

(ජෝශප් ඊ. ස්ටිග්ලිට්ස් - ගෝලීයකරණය හා එහි අසහනයෝ)

## 2008 සැප්තැම්බර් ඇමරිකානු එක්සත් ජනපදයෙන් ඇරඹි අර්බුදය

පසුගිය වසර 80ක පමණ ඉතිහාසයේ, ධනවාදය මුහුණ දෙන දැවැන්තම ආර්ථික අර්බුදය මෙයයි. ආර්ථික අර්බුදයේ සිවුවන කාර්තුව ලෙසින් හැඳින්වෙන මෙම අර්බුදය 2008න් ඇරඹී මේ දක්වා අවසන් නොවී පවතියි. මෙය ඇමරිකානු එක්සත් ජනපදය සහ යුරෝපය මූලික කරගත් ආර්ථික අර්බුදයක් ලෙසින් හැඳින්විය හැකිය.

2007 මුල සිට ක්‍රමිකව ආරම්භවී පැමිණි මෙම අර්බුදයේ ආරම්භයම මූල්‍ය ක්ෂේත්‍රයේ අර්බුදයක් ලෙස ප්‍රකාශයට පත්ව

වෙනත් ක්ෂේත්‍රවලටද පැතිරී ගියේය. 2002 සිටම 'යුරෝ 'පොදු මුදල් ඒකකයක් ලෙස භාවිතා කිරීමෙන් යුරෝවලට සාපේක්ෂව ඩොලරය දුර්වල විය. 2001 සැප්තැම්බර් මස 11 ප්‍රහාරයේ බලපෑම නිසා ඇමරිකන් විදේශ ආයෝජන සහ ගුවන්සේවා කර්මාන්තයේ ආදායම අඩුවිය. තවද ඇමරිකා එක්සත් ජනපදයේ හදිසි ආරක්ෂක වියදම් ඉහළ ගියේය. පැන නැගි ආර්ථික අවපාතයට පිළිතුරු ලෙස බැංකු පොලී අනුපාත අඩු කෙරිණි. මේ පොලී අනුපාත අඩුකිරීමේ අභිලාෂය වූයේ, රට තුළ මූල්‍ය සංසරණය වැඩි කිරීමය. තවද "සෑම ඇමරිකානුවකුටම තමාගේම නිවසක් " යන තේමාව යටතේ නිවාස මිලදී ගැනීම සඳහා අවම පොලී අනුපාත යටතේ ණය හඳුන්වාදීමට බැංකුවලට නිර්දේශ කෙරිණි. ඒ සඳහා නිවාස ඉදිකිරීම් සමාගම්වලට ඩොලර් මිලියන ගණනක් ඉතා අඩු පොලියට රජය විසින් නිකුත් කරන ලදී. මූල්‍ය සමාගම් ඉතාම අඩු පොලියට ණය ලබාදීම සිදු කරන්නට විය. නිවාස ඉදිකිරීම් සමාගම් තම ප්‍රචාරණය මඟින් නිවාස වටිනාකම් ඉහළ දමා අලෙවි කළේය. ජනතාව තම ආර්ථික හැකියාව ඉක්මවා ණය මත නිවාස මිලදී ගන්නට වූ නමුත් ඉක්මනින්ම එම ණය ගෙවා ගැනීමට නොහැකිවීමෙන් ජනතාවද නිවාස සමාගම්ද මූල්‍ය සමාගම්ද ඩොමිනෝ ආකාරයේ අර්බුදයකට පත්විය.

## ආර්ථික බිඳවැටීමේ පියවර

අර්බුදයේ ප්‍රතිඵල ලෙස බැංකු කඩා වැටීම ආරම්භ විය. 2008 සැප්තැම්බර් 16 'ලේමන් බ්‍රදර්ස්' බැංකුව තමන් බංකොලොත් බව ප්‍රකාශයට පත් කළේය. 2008 සැප්තැම්බර් මස 16වැනිදා ඔවුන්ගේ කොටස් මිල සියයට 95කින් කඩා වැටුණි. 2008 සැප්තැම්බර් 15 වොෂින්ටන් මියචුවල් බැංකුව බිඳ වැටිණ. 2008 සැප්තැම්බර් 14 'මෙරිල් ලින්ච්' සමාගම තම කොටසක් ඩොලර් 29 බැගින් ඩොලර් මිලියන 50කට විකුණා දමන ලදී. සේවකයින් 60,900ක් සිටි මෙම

ආයතනය රටවල් 40කට සේවා සැපයූ සමාගමකි.

මෙම අර්බුදය මූල්‍ය ක්ෂේත්‍රයට පමණක් සීමා නොවීය. සේවා සමාගම්, තොරතුරු තාක්ෂණ සමාගම්, සන්නිවේදන සමාගම් හා නිෂ්පාදන සමාගම් වෙතද අර්බුදය විකාශනය විය. අර්බුදය ප්‍රකාශයට පත් 2008 වසර තුළදී ඇමරිකා එක්සත් ජනපදය තුළ පමණක් ආයතන 67,428ක් බංකොලොත්භාවය ප්‍රකාශයට පත් කළේය. ඒ හරහා පුද්ගලයින් 1,095,000ක් බංකොලොත්භාවයට පත්කර ඇත. 'ලේ වැකි ඉරිදා' ලෙස නම් වූ 2009 ජනවාරි 26 දිනයේ පමණක් ඇමරිකාවේ ජනතාව 74,000 කට එකවර රැකියා අහිමිව ගියේය. 2009 මාර්තු මාසයේදී එක්සත් ජනපදයේ ලක්ෂ තුනකට නිවාස අහිමිවූ අතර 2009 අප්‍රේල් මාසයේදී පමණක් 342,000කට නිවාසවලින් පිටවීමේ නිවේදන ලැබී තිබිණි. පැන නැගි මෙම ගෝලීය ආර්ථික අර්බුදය සමග ලොව පුරා රටවල් රැසක ආර්ථික වර්ධන වේගය පහත වැටිණි.

## මෙම අර්බුදයේ මූලයෝ

2008 ආර්ථික අවපාතයේදී ධනවාදය මුහුණ දුන් අර්බුදය සඳහා මුල්වූ කරුණු කිහිපයක් වෙන් වෙන්ව විග්‍රහ කරගැනීම වඩා වැදගත් වනු ඇත. ඒ ඇසුරෙන් දේශපාලන ආර්ථික විද්‍යාත්මකව හා සමාජ විද්‍යාත්මකව ධනවාදය තම ගෙල වැළලා ගනු ලැබූයේ කෙසේදැයි යන්න වටහා ගැනීම පහසු වනු ඇත.

### 1. නිවාස ණය

මෙහි ආරම්භය වන්නේ නිශ්චල දේපොළ මිල ඉහළ යන්නට වීමත් සමඟම ඇමරිකානු බැංකු ඇපකර තබා ගැනීමේ පදනම මත වැඩි වැඩියෙන් ණය දීමට පෙළඹීමයි. ඉදිකිරීම් කේෂ්ත්‍රයේ ආයෝජකයෝ

නිවාස මිල ඉහළ යාමට පෙර නිවාස ඉදිකිරීම සඳහා බැංකුවලින් ණය ගෙන ගොඩනැගිලි ඉදිකරන්නට වූහ. අර්බුදයට විසඳුමක් ලෙස බුෂ් පාලන කාලයේ සිටම රජය මෙම ක්‍රියාවලිය දිරි ගැන්වීය. සැබැවින්ම මෙය නිවාස අතිරික්තයක් දක්වා ඉහළ ගියේය. බැංකු ගිණුම් පොත් පිටු පුරා ලැබීමට නියමිත යැයි උපකල්පනය කරන ලද ණය සහ පොලිය සටහන් විය. නිවාස ඉදිකිරීම් සමාගම් සතුවද ලැබිය යුතු යැයි සටහන්වූ වාරික ගාස්තු ඊනියා අනාගත වත්කම් ලෙස පැවතිණි. මෙම ආර්ථික ක්‍රියාවලිය තුළ සත්‍ය නොවන වටිනාකම් එක් රැස්වන්නට විය. මේ තත්වය තුළ ඩොලර් ට්‍රිලියන 8ක් වන නිවාස මිල බුබුළක් නිර්මාණය විය. ජනතාවද වාරික ගෙවීමේ පදනම මත නිවාස මිලදී ගත් අතර, ආර්ථික අර්බුදය උත්සන්න වත්ම ඒවා ගෙවා ගැනීමට නොහැකිව ණයකරුවෝ බවට පත්වූහ. නිවාස ඉදිකිරීම් සමාගම් විසින් වාරික නොගෙවන ජනතාව නිවෙස්වලින් පිටමං කරන ලදී. එය ආර්ථික මෙන්ම සමාජ අර්බුදයක් දක්වා වර්ධනය විය. නමුත් ණය අයකරගත නොහැකිවීමත් සමගම බැංකු හා නිවාස ඉදිකිරීම් ආයතන සටහන් කොටගත් ණය සත්‍ය නොවන ලැබීම් බවට පත් විය. නිවාස ණය ඇතුළු ජනතාවට ලබාදුන් ණය අයකර ගත නොහැකිව උකස් සමාගම් බැංකු හා මූල්‍ය ආයතන විශාල ලෙස අලාභ ලැබීය. 2008 ජූලි මස 17 වන විට මූල්‍ය ආයතනවලින් නිකුත් කළ ණය යළි නොලැබීම නිසා ඇතිවූ අලාභය ඩොලර් බිලියන 435ක් බව ප්‍රකාශ විය. මූල්‍ය අවපාතයේ පළමු සංඥාව නිකුත් කළේ නිවාස උකස් ණය අර්බුදයය.

## 2. ණයපත් අර්බුදය

නිවාස ණය මෙන්ම ණයපත් (Credit Card) අර්බුදයද ජන ජීවිතය කඩාබිඳ දැමීමට හේතු විය. බැංකු අතර වන තරගය හේතුවෙන් එකිනෙකා පරයමින් බැංකු විසින් ණයපත් හෙවත් ක්‍රෙඩිට්

කාඩ් ජනතාවට නිකුත් කරන්නට විය. ජනතාව තම අනාගත ඊනියා ඉපයීම් ද ණයපත් හරහා මාස ගණනාවකට පෙරම එයට වැය වියදම් කරන්නට පෙළඹුණි. ණයපත් වටිනාකම් බැංකුවට ආපසු ගෙවීමට ජනතාව අත මුදල් නොමැතිවීම හේතුවෙන් බැංකු අසරණ විය. ගෙවීමට 2008 සැප්තැම්බර් මාසය වන විට එක් ඇමරිකානු පවුලක් ගෙවිය යුතු සාමාන්‍ය මාසික ණයපත් වටිනාකම ඩොලර් 9205කි. එපමණ මුදලක් ගෙවීමේ හැකියාවක් ඔවුනට නොමැති නිසා පැහැර හැරීම් වැඩිවිය. 2009 වසර තුළදී පමණක් ඩොලර් බිලියන 101ක ණය අය කරගත නොහැකි බව දක්වා ඇත. 2008 සැප්තැම්බර් මස සිට 2009 වසර මැද දක්වා ඩොලර් බිලියන 970ක ණයපත් අවදානම් සහගත ඒවා ලෙස වර්ගකර ඇත. ආරක්ෂක පියවරක් ලෙසින් බැංකු ණයපත් නිකුත් කිරීම සීමා කිරීමත් සමග ඇමරිකානු ජනතාවට දෛනික ජීවිතය පවා ගෙනයාමට නොහැකි තවත් අර්බුදයක් නිර්මාණය විය. රජය මගින් මුදල් පොම්ප කිරීම, ණය කපාහැරීම වැනි තාවකාලික පියවරයන් ගනු ලැබුවද මේ දක්වා නොවිසඳුණු වරින් වර යළි යළිත් මතුවන ආර්ථික අර්බුදයක් තවමත් ලොව පුරා පවත්නේය.

## 3. ආර්ථික බුබුළ හා අතත්‍ය ප්‍රාග්ධනය

අතත්‍ය ප්‍රාග්ධනය හෙවත් මිථ්‍යා ප්‍රාග්ධනය මාක්ස්ගේ ප්‍රාග්ධනය කෘතියේ තුනවන වෙළුමේ පැහැදිලි කරයි. මාක්ස් දුටු පරිදි මිථ්‍යා ප්‍රාග්ධනයේ උපත ණය ක්‍රමයන්ගේ සහ ඒකාබද්ධ කොටස් (Joint Stock) සංවර්ධනය මගින් සිදුව ඇත. මූල්‍ය ප්‍රාග්ධනය කොටස් වෙළඳපොළ තුළ ක්‍රියාත්මක වන විට ප්‍රාග්ධනය සේ පෙනුණද එය විසින් සැබෑ ලෙස අතිරික්ත වටිනාකම් නිපදවන්නේ නැත. අතිරික්ත වටිනාකම් බිහිකරන්නේ නැති නමුදු ප්‍රාග්ධනය සේ පෙනී සිටින තත්වයකට පත්වීම මිථ්‍යා ප්‍රාග්ධනය යනුවෙන් හැඳින්වේ.

"පොලීකාර ප්‍රාග්ධනයේ වර්ධනය සහ ණය ක්‍රමයත් සමග සියලුම ප්‍රාග්ධනය දෙගුණ හා සමහර විට තෙගුණ වන බව පෙනෙන්නට වේ. එකම ප්‍රාග්ධනය විවිධ මාදිලින් ලෙස හෝ සමහර විට ණය හිමිකම් ස්වරූපයෙන් වෙනස් ස්වරූපයකින් වෙනස් අරමුදලක පැවැතිය හැකි වුවද ඒවා බැංකුකරුගේ හිමිකම් පමණි. කෙසේ වෙතත්, ඒවා තැන්පතු ලෙස නොපවතී"

(ප්‍රාග්ධනය, වෙළුම 3, පරිච්ඡේදය 29)

ප්‍රාග්ධනය මිථ්‍යා ප්‍රාග්ධනය ලෙස හැසිරෙන්නේ බැංකු, රක්ෂණ සමාගම්, ලිසිං සමාගම් සහ කොටස් වෙළඳපොළ තුළය. අතත්‍ය ප්‍රාග්ධනය ක්‍රියාත්මක වීමේදී කොටස් මිල ඉහළ නංවා එම කොටස් වැඩි මිලට විකුණා ලාභ පෙන්වුවද එලෙස හැසිරෙන ප්‍රාග්ධනය අතිරික්ත වටිනාකම් නිපදවන්නේ නැත. කිසියම් සමාගමක් තම නිෂ්පාදන අවශ්‍යතා සඳහා නිකුත් කරනු ලබන කොටස් බැඳුම්කර වැනි දේවල් මිථ්‍යා ප්‍රාග්ධනය ලෙස සලකන්නේ නැත. නමුත් එය කොටස් ප්‍රාග්ධනය ලෙස නොව කොටස් වෙළඳපොළ තුළ ඉහළ මිල ගණන්වලට අලෙවි වීමෙන් මිත්‍යා ප්‍රාග්ධනය බිහිවේ. එම කෘත්‍රිම තත්වය තුළ ආර්ථික බුබුළක් නිර්මාණය වේ. ආර්ථික බුබුළ බිඳීයාමත් සමග ධනවාදය නැවතත් අර්බුදයට පත්වේ. ආර්ථික බුබුළ පිපිරීමත් සමග උකස් වෙළඳපොළ, නිවාස ඉදිකිරීම් සමාගම්, නිවාස

සැපයීමේ සිල්ලර ආයතනයන්, වෝල් වීදියේ මූල්‍ය සමාගම් අරමුදල්, විදේශ බැංකු මත එය අතිශයින් අනුකම්පා විරහිත ලෙසින් පතිත විය. එම බර දරාගත නොහැකිව සියල්ල ඇද වැටෙන්නට පටන් ගත්තේය.

## විසඳුම් නැති ධනවාදයේ අර්බුදය

ධනවාදය ලෝක පරිමාණයෙන් මුහුණදී ඇත්තේ විසඳුම් නැති අර්බුදයකටය. නිදහස් තරගයේ සිට ආර්ථික බුබුළ දක්වා අප දුටුවේ එයය. ධනපති පංතියේ කැපවීමෙන් හෝ උත්සාහයෙන් එම අර්බුදයට විසඳුම් සෙවිය නොහැකිය.

"තමන්ගේ උත්සාහයෙන් අර්බුදයෙන් මිදීමට ධනපති පංතිය දරන උත්සාහය කෙනෙක් තමන්ගේ සපත්තු පටිවලින් ඇද තමන්ම ඔසවා ගැනීමට දරන උත්සාහයක් වැනිය."

වී. අයි. ලෙනින්

# 10

# අර්බුදය සමඟ මතු වූ නව තත්වයන්

සමාජවාදී කඳවුර බිඳ වැටීමෙන් පසු එක්සත් ජනපදය ලෝක බලවතා බවට පත්වීම හා ද්වි ධ්‍රැවීය ලෝකය වෙනුවට ඒක ධ්‍රැවීය ලෝකයක් නිර්මාණය වීම සිදුවිය. ඒ අනුව එක්සත් ජනපදය මූලික වූ නව ලෝක රටාවක් ඇති විය. ධනවාදයේ අර්බුදයත් සමග ඇතිවූ නව තත්වය වන්නේ, බහු ධ්‍රැවීය ලෝකයක් නිර්මාණය වීමයි. ඒ අනුව චීනය මූලිකවූ ලෝක සංවිධාන, ලතින් ඇමරිකානු කලාපයේ වාමාංශික ප්‍රවණතාවය, යුරෝපය හා එක්සත් ජනපදය අතර අන්තර් අධිරාජ්‍ය විරෝධය වැනි ක්‍රියාකාරිත්වයන් ඉස්මතු වීම නොවළැක්විය හැකි ලෙසින්ම සිදුවෙමින් පවතියි. ප්‍රධාන වශයෙන් පවතින එවන් සංවිධානයන් හා ප්‍රවණතාවයන් කිහිපයක් පිළිබඳව දැන් අපි විමසා බලමු.

## චීනය මැදිහත්වීමෙන් අරඹා ඇති සංවිධාන

අධිරාජ්‍යවාදීන් කේන්ද්‍රය කොටගෙන ලොව පවතින සංවිධානයන්ට එරෙහිව චීනය මුල්වී ගොඩ නැංවෙන ජගත් සංවිධානයන් අතර ෂැංහයි සහයෝගිතා සංවිධානය ප්‍රධාන එකකි.

2001 ජූනි 15 "ෂැංහයි සහයෝගිතා සංවිධානය" චීනයේ ෂැංහයිවල ආරම්භ විය. ආරම්භයේ රටවල් පහක් ෂැංහයි සහයෝගිතා සංවිධානයට එක්විය. ඒ චීනය, රුසියාව, කසකස්තානය, කිර්ගීසියාව, තජිකිස්තානය යන රටවල්ය. ෂැංහයි රටවල් පහ යනුවෙන් හැඳින්වෙන්නේ මෙම රටවල්ය. උස්බෙකිස්තානය 2004 ජූනි 5 ෂැංහයි සහයෝගිතා සංවිධානයට එක් විය. ෂැංහයි සහයෝගිතා සංවිධානය වාමාංශික සංවිධානයක් නොවන අතර එය ඇමරිකානු හා යුරෝපා අධිරාජ්‍යවාදයට එරෙහිව ක්‍රියාත්මක වන ධනේශ්වර සංවිධානයකි. 2011 සංවිධානය පිහිටුවීමේ දසවන සමරුව නිමිති කොට එහි රැස්වීමක් කසකස්තානයේ අස්තානාවල පැවැත්විණි. නිරික්ෂණ මට්ටමින් ඉන්දියාව, මොංගෝලියාව, පකිස්තානය හා ඉරානය මෙයට සම්බන්ධ විය. මෙහි ප්‍රකාශිත අරමුණ වූයේ, පළමුව කලාපයේ නිරායුදකරණය සහ අන්‍යෝන්‍ය විශ්වාසය තහවුරු කිරීම, අන්‍යෝන්‍ය යුදමය විශ්වාසය සවිමත් කිරීම, දේශ සිමාවන්හි හමුදාවන් අඩුකර ගැනීම, පසුව දේශපාලන, ආර්ථික, වෙළඳ හා රාජ්‍යතාන්ත්‍රික සහයෝගය ලබාදීම යන කරුණු විය. 2002 ජූනි මාසයේ සාමාජික රටවල නායකයන් රුසියාවේ ශාන්ත පීටර්ස්බර්ග්හිදී හමුවී සිය පරමාර්ථ, සංවිධාන ව්‍යුහය, සහයෝගිතා පවත්වා ගන්නා ආකාරය පිළිබඳව සාකච්ඡා කොට ප්‍රඥප්තියක් සකස්කොට ගෙන ප්‍රකාශයට පත් කළහ.

ෂැංහයි සහයෝගිතා සංවිධානයේ අරමුණු මෙලෙසින් පෙළගැස්විය හැකිය.

1. අසල්වැසි මිත්‍ර සබඳතා තරකර ගැනීම.

2. දේශපාලන, ආර්ථික, වෙළඳ, විද්‍යා, තාක්ෂණ, සංස්කෘතික, අධ්‍යාපන, බලශක්ති, ප්‍රවාහනය, පරිසර සංරක්ෂණය සහ අනෙකුත් ක්ෂේත්‍රයන්හි සහයෝගීතාවය තීව්‍ර කිරීම

3. කලාපයේ සාමය, ආරක්ෂාව සහ ස්ථාවරත්වය සාමූහිකව පවත්වාගෙන යාම

4. ප්‍රජාතන්ත්‍රවාදය හා යුක්තිය මත පදනම්වූ නව අන්තර් ජාතික දේශපාලන හා ආර්ථික ක්‍රමයක් ඇති කිරීම

ෂැංහයි සහයෝගීතා සංවිධානයේ මූලික ප්‍රතිපත්ති සකස් වන්නේ පහත සඳහන් පරිදිය.

1. එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට ගරුකිරීම

2. එකිනෙකාගේ නිදසට හා භෞමික අඛණ්ඩතාවයට ගරුකිරීම

3. රටවල අභ්‍යන්තර කටයුතුවලට මැදිහත් නොවීම

4. බලහත්කාරය භාවිතා නොකිරීම

5. සාමාජික රටවල සමානත්වය පිළිගැනීම

6. සියලු ගැටලු සාකච්ඡා මගින් විසඳා ගැනීම

7. නොබැඳි බව පිළිගැනීම, බාහිර ලෝකයට විවෘතවීම

8. සෙසු රටවල් හා සංවිධාන සමග අදහස් හුවමාරු කරගැනීම හා සහයෝගයෙන් ක්‍රියා කිරීම

## ත්‍රස්තවාදයට, බෙදුම්වාදයට සහ අන්තවාදයට එරෙහිව වූ වැඩපිළිවෙළ

2004 ජනවාරි උස්බෙකිස්ථානයේ ටෂ්කන්හිදී ත්‍රස්ත විරෝධී කලාපීය ව්‍යුහය පිහිටුවා ගන්නට විය. "යක්ෂ බලවේග ත්‍රිත්වය" (Devil Force) ලෙසින් හඳුන්වන බෙදුම්වාදය, ත්‍රස්තවාදය හා අන්තවාදයට එරෙහිව ක්‍රියා කිරීම එසේ පිහිටුවාගත් කලාපීය ව්‍යුහයේ අරමුණු විය. (කිර්ගීසියාවේ K2 base කඳවුර එක්සත් ජනපදය විසින් චීනයේ සිංජියෑං පළාතේ බෙදුම්වාදී අරගලය අරමුණු කොට චීන දේශ සිමාවට සැතපුම් 236ක් දුරින් පිහිටවූ කඳවුරකි.) ෂැංහයි සහයෝගිතා

සංවිධානය පිහිටුවාගෙන ඇත්තේ, රුසියානු විදේශ ප්‍රතිපත්තියට අනුකූලව කලාපය තුළ ඇමරිකානු බලපෑම් ඇතිවීම වැළැක්වීමට බවත් එමෙන්ම චීනයට අවශ්‍යවී ඇත්තේ මධ්‍යම ආසියාවේ ඛනිජ ඇතුළු ස්වභාවික සම්පත් අත්කරගැනීම උදෙසා උපායමාර්ගයක් සකස්කර ගැනීමටත් බව එයට විරුද්ධ මත දරන්නන්ගෙන් ප්‍රකාශ වේ.

## BRICS කණ්ඩායම

මෙහි සාමාජිකත්වය සකස් වන්නේ බ්‍රසීලය, රුසියාව, ඉන්දියාව, චීනය සහ දකුණු අප්‍රිකාව යන රටවලිනි. දකුණු අප්‍රිකාව එක්වූයේ මෑතකදීය. දකුණු අප්‍රිකාව එක්වීමට පෙර මෙහි නම BRIC පමණක් විය. පළමු සමුළුව 2009 ජූනි 16 යෙකතැරින්බර්ග්වල (Yekaterinburg) කැඳවන ලදී. මෙය විකල්ප ආර්ථික කණ්ඩායමක් ලෙසින් කටයුතු කරන්නට ගොඩනැංවූවක් බව පැවසේ. එක්සත් ජනපදය හා යුරෝපා සංගමය සමග එක්වීමෙන් පමණක් නැතහොත් ලෝක බැංකුව සමග එක්වීමෙන් පමණක් යම් රටකට සංවර්ධනය වීමට හැකි යැයි යන මතය බිඳහෙළීම අරමුණු කොටගෙන BRICS සංවිධානය බිහිවී ඇත. මූලික කොට එක්සත් ජනපද උපායමාර්ග යන්ට අවනත නොවීම යන කාරණය මත පමණක් BRICS වැදගත්වේ.

දැනට ඇති ඇස්තමේන්තුවලට අනුව 2017 වනවිට BRICSහි ඒකාබද්ධ ආර්ථිකය G7 රටවල ආර්ථිකය අභිබවා යනු ඇත. මෙක්සිකෝව හා දකුණු කොරියාව සංවිධානයට එකතුවීමට කැමැත්ත පළකර සිටින රටවල්ය.  දැනට මෙම සංවිධානය ලොව භූමියෙන් 1/4ක් හා ජනගහනයෙන් 2/5ක් නියෝජනය කරයි. එහි 2013 දක්වා රැස්වීම් වාර මෙසේය. 2010 බ්‍රසීලය, 2011 සන්යා(චීනය), 2012 නවදිල්ලි, 2013 දකුණු අප්‍රිකාවේ ඩර්බන්, 2014 බ්‍රසීලියා(බ්‍රසීලය), 2015 උෆා(රුසියාව) 2016 ගෝව(ඉන්දියාව) වශයෙන් පැවැත්විණි.

# ලතින් ඇමරිකානු රටවල් එක්වී සැදුණු විකල්ප සංවිධාන

## ALBA සංවිධානය

ALBA යන්නෙහි තේරුම ස්පාඤ්ඤ භාෂාවෙන් Dawn අරුණෝදය යන්නය. 2004 වර්ෂයේ දී එම සංවිධානයේ ක්‍රියාත්මකවීම ආරම්භ විය. වෙනිසියුලාව, කියුබාව, බොලිවියාව, නිකරගුවා, ඩොමිනික්, ඉක්වදෝර්, ඇන්ටිගුවා, බර්මියුඩා, ශාන්ත වින්සන්ට්, ග්‍රෙනෙඩාව, හොන්ඩියුරාස් මෙම සංවිධානයට අයත් රටවල්ය. (2009 බලය අල්ලා ගැනීමේ කුමන්ත්‍රණයෙන් පසු හොන්ඩියුරාස් ඉන් ඉවත්විය.) සංවිධානයේ 11වැනි සමුළුව 2012 පෙබරවාරි 4 සහ 5 යන දිනවල කරකාස්හි පැවැත්විණි. දැනට ශාන්ත ලුසියා හා සුරිනාම් යන රටවල් සාමාජිකත්වය අපේක්ෂාවෙන් සිටියි.

### ALBA යනු කුමක්ද ?

වෙනිසියුලියානු ජනාධිපති හියුගෝ චාවේස් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවකට අනුව ලතින් ඇමරිකාවේ හා කැරිබියන් රටවල සහෝදරත්වය, සහයෝගිතාවය සහ සමානාත්මතාවය මත එම රටවල් එක්සත්ව කටයුතු කිරීම සඳහා බිහිකළ සංවිධානයකි. එය අධිරාජ්‍යවාදයට හා ගෝලීයකරණයට විරුද්ධ දේශීයත්වය හා ජාත්‍යන්තරවාදය මත ඉදිරිපත් කර ඇති මහාද්වීපික දේශපාලන ආර්ථික හා සංස්කෘතික වැඩපිළිවෙළකි.

### ALBA බිහිවූ පසුබිම

එය බිහිවීමට බලපෑ ප්‍රධාන හේතුව වූයේ එක්සත් ජනපදය විසින් ලෝක වෙළඳ සංවිධානයේද සහයෝගය මත තම ආර්ථික දේශපාලන වුවමනාවන් ලතින් ඇමරිකාව තුළ ශක්තිමත් කරගැනීම

සඳහා යෝජනා කළ ඇමරිකානු නිදහස් වෙළඳ වැඩපිළිවෙළ පැරදවීමේ වුවමනාවය. FREE TRADE AREA OF AMERICA (FTAA) මගින් දකුණු ඇමරිකාවේ දුප්පත්කම වැඩිවීමත්, ඇති නැති පරතරය තවත් වැඩිවීමත්, විදේශ ණය බර වැඩිවීමත්, කලාපයේ රටවල් අතර විරසකභාවය තවත් වැඩිවීමත්, රටවල ස්වාධීනත්වය ඇමරිකා එක්සත් ජනපදයෙන් ලැබෙන MOST FAVORABLE NATION - "වඩාත් වරප්‍රසාදිත රට" නැමැති සහතිකය වෙනුවෙන් හිලව් කිරීමට සිදුවීමත්, National Treatment සහතිකය මගින් දේශීය කර්මාන්තවලට ලබාදෙන සියලු සහන බහුජාතික සමාගම්වලට ලබාදීමට සිදුවන නිසා ජාතික නිෂ්පාදන කර්මාන්ත කඩා වැටීමත් අනිවාර්ය විය. එනිසා ALBA වැඩපිළිවෙළ වෙනිසියුලානු ජනාධිපතිවරයා විසින් ඉදිරිපත් කළේ ඉහත ඇමරිකා එක්සත් ජනපදය ඉදිරිපත් කරන ලද එම වැඩපිළිවෙළට විකල්පයක් ලෙසිනි. ඔහු විසින් නිල වශයෙන් මෙම සංකල්පය 2001 දෙසැම්බර් මාසයේදී මාගරිටා දූපත්හි පැවැති 3 වන කැරිබියානු රාජ්‍ය නායක සමුළුවේදී ඉදිරිපත් කරන ලදී.

## කස්ත්‍රෝ සහ චාවේස් අතර අත්සන් කෙරුණු ALBA ගිවිසුම

2004 දෙසැම්බර් 14 දින කියුබාවේ හවානා නුවරදී කස්ත්‍රෝ සහ චාවේස් අතර ALBA ගිවිසුම අත්සන් කෙරුණි. ALBA ගිවිසුම් පූර්විකාවේ FTAA මගින් ලතින් ඇමරිකානු හා කැරිබියානු රටවල් යළි යටත්විජිතකරණයට ලක්වන ආකාරයත් එම නිසා ලතින් ඇමරිකාව බේරාගත් සයිමන් බොලිවාර් (වෙනිසියුලා), හොසේ මාර්ටි (කියුබාව), සුකිරේ ඔහිගින්ස්, සැන් මාටින් (ආර්ජන්ටිනාව), හිඩැල්ගෝ (මෙක්සිකෝව), පේටියන් මොරාසන්, සහ සැන්ඩිනෝ (නිකරගුවා) වැනි ජාතික නායකයින් ගත් මඟ ගනිමින් සහෝදරත්වයෙන් හා සහයෝගීතාවයෙන් සංවර්ධනයෙන් පිරුණු ශ්‍රේෂ්ඨ නිජ භූමියක් බවට ලතින් ඇමරිකාව පත්කිරීම සඳහා (A Great Homeland of Our America) ගිවිසුම ගෙන එන ලදී.

## ALBA ගිවිසුමේ ප්‍රධාන තම මූලධර්ම හා ප්‍රතිපත්ති දොළස

1. තිරසාර සංවර්ධනයක් සඳහා ලතින් ඇමරිකාවේ හා කැරිබියානු ඒකාබද්ධවීම අන්ධ ලෙස වෙළඳපොළ ආක්‍රමණය කිරීමෙන් හෝ විදේශ වෙළඳපොළවල් අල්ලා ගැනීමෙන් හෝ වෙළඳාම ප්‍රසාරණය කළ නොහැක. එම නිසා ඉලක්ක ජයගැනීමට රජයන් විසින් ආර්ථික ක්‍රියාවලිය නියාමනය හා සම්බන්ධීකරණය කළ යුතුය.

2. එක් එක් රටේ සංවර්ධනයේ මට්ටමත් ආර්ථිකයේ විශාලත්වය යන දෙකම සැලකිල්ලට ගනිමින් සෑම රටකම ALBA වැඩපිළිවෙළ මගින් යහපත සැලසෙන බවට සහතික විය යුතුය.

3. රටවල් අතර තරගකාරිත්වය වෙනුවට විශේෂඥ දැනුම සහිතව නිෂ්පාදන අගයකරන අතර සෑම රටකම දුප්පත්කමට එරෙහිව තම සංස්කෘතික අනන්‍යතාවයන් රැකගනිමින් කරන අරගලය ඇගයේ.

4. අවම සංවර්ධිත රටවල් සඳහා සහයෝගය, සහෝදරත්වය තුළ නූගත්කම හා දුර්වල සෞඛ්‍ය පහසුකම්වලට එරෙහිව මහද්වීපික සැලැස්මක් සකස් කළ යුතුය.

5. ලතින් ඇමරිකාව සඳහා හදිසි අවස්ථා සමාජ සඳහා අරමුදල (Social emergency fund) ඇතිකළ යුතුය.

6. ලතින් ඇමරිකානු හා කැරිබියානු රටවල් අතර ඒකාබද්ධතාවය වැඩිකිරීම සඳහා මහා මාර්ග, දුම්රිය ගමනාගමනය, ගුවන් හා මුහුදු මාර්ග, සන්නිවේදන සබඳතා දියුණු කිරීමට හා අලුතින් ඇති කිරීම සඳහා ඒකාබද්ධ වැඩපිළිවෙළක් සැකසිය යුතුය.

7. පරිසරය සංරක්ෂණය කරමින් කරනු ලබන තිරසාර සංවර්ධනය ඇගයේ.

8. කලාපයේ රටවල බලශක්ති කර්මාන්තය ඒකාබද්ධ කිරීම මගින් කලාපයේ ජනතාවගේ බලශක්ති අවශ්‍යතා සැපිරිය යුතු අතර ඒ

සඳහා වෙනිසියුලාව මගින් (Petrosur ) Petro South සමාගම ආරම්භ කරනු ලැබේ.

9. කලාපයේ රටවල ආයෝජන, කලාපය තුළම යෙදවීමට දිරිගන්වනු ලැබේ.

මේ සඳහා

I. ලතින් ඇමරිකානු අරමුදලක්.

Latin American Investment Fund

II. දකුණු ඇමරිකානු සංවර්ධන බැංකුවක්.

Southern Development Bank

III. අන්‍යෝන්‍ය ලතින් ඇමරිකානු සුරැකුම් සඳහා සංගමයක් පිහිටුවීම. Society for Reciprocal Latin American Guarentees

10. ලතින් ඇමරිකානු හා කැරිබියානු සංස්කෘතිය හා අනන්‍යතාවය රැකගැනීම සඳහා දකුණු ඇමරිකානු රූපවාහිනි චැනලයක් ආරම්භ කිරීම. (TeleSUR )

11. ලතින් ඇමරිකානු සහ කැරිබියානු රටවල් අතර බුද්ධිමය දේපළ පිළිබඳව සහයෝගිතාවක් පවත්වා ගැනීම හා ඒවායේ උරුමය බහුජාතික සමාගම්වලින් ආරක්ෂා කරගැනීම.

12. අනිකුත් කලාප සමග කේවල් කිරීමේදී එක්සත් ජාතීන් හා අනෙකුත් ජාත්‍යන්තර සංවිධාන වඩා ප්‍රජාතන්ත්‍රවාදී කිරීමේදී කලාපය තුළ පොදු එකඟතාවයකින් ඒවා සිදු කිරීම.

මෙම ප්‍රතිපත්තීන්ට අනුව යමින් බලශක්ති, සෞඛ්‍ය, අධ්‍යාපන, සන්නිවේදන, කෘෂිකර්මය, ක්‍රීඩා, විද්‍යාත්මක, පරීක්ෂණ, සංස්කෘතික, මූල්‍ය යනාදී ක්ෂේත්‍ර විශාල ප්‍රමාණයක් ආවරණය කරමින්

ගිවිසුම් 49ක් අත්සන් කරන ලදී. ඒ ගිවිසුම්වල හා ALBA ගිවිසුම මගින් ඇතිකරගෙන තිබෙන එකඟතා මගින් අති බහුතරයක් දැනට ඇත්තේ කැරිබියානු රටවල් අතර ඇති Petrocaribe ගිවිසුමය. එම ගිවිසුම අත්සන්කොට ඇත්තේ කියුබාව, බ්‍රසීලය, ආර්ජන්ටිනාව, උරුගුවේ වැනි රටවල් අතරය,

**මේ අනුව කියුබාව හා වෙනිසියුලාව අතර වූ එකඟතා ගිවිසුම් මෙසේය.**

01. කියුබාවට හා වෙනිසියුලාවට එක් එක් රටින් ආනයනය කරනු ලබන භාණ්ඩ සඳහා සියලු බදු ඉවත් කිරීම.

02. කියුබාවට හා වෙනිසියුලාවට එක් එක් රටින් කරනු ලබන රාජ්‍ය හා පුද්ගලික ආයෝජන සියලු බදුවලින් නිදහස් කිරීම.

03. ඉදිරි වසර 15 තුළදී  දිනකට තෙල් බැරල් 90,000 බැගින් කියුබාවට තෙල් බැරල් එකක් ඩොලර් 27 බැගින් සැපයීම.

04. කියුබාව වෙනිසියුලාවේ සෞඛ්‍ය සේවය නගාසිටුවීමට වෛද්‍යවරුන් 15,000ක් එහි යැවීම සහ වෙනිසියුලානු වෛද්‍ය ශිෂ්‍යයින් හා සෞඛ්‍ය සේවකයින් පිළිවෙළින් 40,000ක් හා 5000ක් පුහුණු කිරීම.

05. දෙරටේ නාවික හා ගුවන් කටයුතුවලදී උපරිම වරප්‍රසාද ලබාදීම.

06. කියුබාව තුළ වෙනිසියුලානු ජාතික පෙට්‍රෝලියම් සමාගමේ ශාඛා ආරම්භ කිරීම හා ඔවුන් කියුබාවේ තෙල් පිරිපහදු කටයුතු ආරම්භ කිරීම.

07. හවානාහි වෙනිසියුලානු බැංකුවේ කටයුතු ආරම්භ කිරීම  හා කරකාස්හි කියුබානු බැංකු ශාඛා ආරම්භ කිරීම.

08. කියුබානු අපනයනයන් 104ක් සඳහා වෙනිසියුලාවෙන් විශේෂ බදු සහන ලැබීම.

09. කියුබාවෙන් වෙනිසියුලාවට විශාල සීනි කර්මාන්ත ශාලාවක් හා උක් වගාව ආරම්භ කිරීමට අවශ්‍ය තාක්ෂණික සහය දීම.

10. කියුබානු විශේෂඥයන්ට බලශක්ති ක්ෂේත්‍රය පිළිබඳව පුහුණුවක් ලබාදීමට වෙනිසියුලාව අවස්ථාවක් ලබාදීම.

11. වෙනිසියුලාවෙන් ආර්ජන්ටිනාවට තෙල් ටොන් මිලියනයක් ලබාදීමට හිලව් ලෙස විදේශ විනිමය ගෙවීමකින් තොරව ආර්ජන්ටිනාවෙන් වෙනිසියුලාවට ධාන්‍ය හා උසස් වර්ගයේ කිරි හරක් ලබා දීම.

12. වෙනිසියුලාව හා කැරිබියානු රටවල් 13ක් අතර petrocaribe ගිවිසුම අත්සන් කිරීම 2005 ජූනි 29 දින විය. ඒ අනුව වෙනිසියුලාවෙන් මෙම රටවලට ඉදිරි වසර 17 ක කාලය තුළ තෙල් බැරලයක් ඩොලර් 40ට ලබාදීම.

13. එක් එක් රට ලබා දෙන මුදල් ප්‍රමාණය හා ගෙවන කාලය අනුව තෙල් බැරලයක මිල ඩොලර් 15, 20, 22, 24, 40 වැනි සහන මිල ගණන් හඳුන්වාදීම.

මෙයට අමතරව මෙම රටවල ක්‍රියාත්මක වීමට PDV CARIER නම් නව සමාගමක් වෙනිසියුලාවෙන් ආරම්භ කර සියලුම රටවල තෙල් නිසියාකාරව නිස්සාරණය, පිරිපහදුව, ගබඩාකරණය දියුණු කරදීම කළ යුතු බවට අදහස් කරන ලදී.

ALBA ගිවිසුමේ ප්‍රතිපත්තීන් මත ලතින් ඇමරිකානු හා කැරිබියානු රටවල් අතර නව ගිවිසුම් විශාල ප්‍රමාණයක් ඇතිකරගෙන තිබෙන අතර තවදුරටත් ඇති කරගනිමින්ද සිටියි. මේ අනුව කියුබාව හා වෙනිසියුලාව අතර ගිවිසුම් ගණනාවක් ඇති කරගෙන තිබේ.

1. යකඩ හා වානේ දියුණු කිරීමේ වෙළඳ ගිවිසුම.

2. දුම්රිය මාර්ග සංවර්ධනය කිරීමේ ගිවිසුම.

3. සංචාරක කර්මාන්තය දියුණු කිරීම පිළිබඳ ගිවිසුම.

4. ප්‍රවාහනය මූලික ගමනාගමනය, වරාය සංවර්ධනය කිරීම පිළිබඳ ගිවිසුම් 3 කට එළඹීම.

5. කෘෂිකර්මය හා සත්ව සෞඛ්‍යය තාක්ෂණය දියුණු කිරීම පිළිබඳ ගිවිසුම්.

6. සංචාරක ක්ෂේත්‍රය තොරතුරු තාක්ෂණය, ජෛව විවිධත්වය, විද්‍යාව හා තාක්ෂණය, ජල විදුලි නිෂ්පාදන වැනි ක්ෂේත්‍රවල ගිවිසුම් අත්සන් කිරීම.

**මෙයට අමතර ගිවිසුම්**

01. වෙනිසියුලාව හා ආජන්ටිනාව Food for oil නම් ගිවිසුම් අත්සන් කිරීම.

02. වෙනිසියුලාව හා බ්‍රසීලය අතර වෙනිසියුලාවේ කෘෂිකර්මාන්තය දියුණු කිරීම සඳහා බ්‍රසීලයත්, බ්‍රසීලයේ බලශක්ති කර්මාන්තය දියුණු කිරීමට වෙනිසියුලාවත් සහයෝගයදීම.

## ALBA වැඩපිළිවෙළේ ප්‍රධාන අනාගත ආයෝජන

01. NATOවල විකල්ප ලෙස South Atlantic Treaty Organization (SATO) ආරම්භ කිරීම.

02. එක්සත් ජාතින්ට විකල්ප සංවිධානයක් ආරම්භ කිරීම.

03. විදේශ ණය ගෙවීම කල්දැමීමට හා කපා දැමීමට ලතින් ඇමරිකාවේ මහාද්විපික ජනමත විචාරණයක් පැවැත්වීම.

04. OPEC සංවිධානයට විකල්ප ලතින් ඇමරිකානු විකල්ප සංවිධානයක් එනම් petrosur (petrosouth) පිහිටුවීම.

05. Telesur රූපවාහිනී ආයතනය ලෝක පරිමාණ රූපවාහිනී නාලිකාවක් කිරීම

බොලීවියානු පරිවර්තනයේ මූලික සමාජ ආර්ථික ප්‍රතිසංස්කරණ යටතේ ජාතික කර්මාන්ත හා ඛණිජ තෙල් සමාගම් ජනසතු කෙරිණි.

කලාපීය ආරක්ෂක මණ්ඩලයක් යෝජනා කරමින් බොලීවියානු ජනාධිපති මොරාලේස් පැවැසුවේ, 'ආරක්ෂක හමුදා සේවය කළ යුත්තේ ජනතාවටයි. අධිරාජ්‍යවාදයට නොවේ' යනුවෙනි. 2009 සමුළුවේදි කලාපීය මුදල් ඒකකයක් යෝජනා විය. 2007 අප්‍රේල් ලතින් ඇමරිකානු වෛද්‍ය විද්‍යාලය පිහිටුවනු ලැබිණි. 2005 Telesur කලාපීය රූපවාහිනිය ඇරඹීම, කලාපීය ALBA ක්‍රීඩා උළෙලක් ඇරඹීම හා 2009 කියුබාවේදී හා 2011 දී අප්‍රේල්වල වෙනිසියුලාවේදී වශයෙන් ක්‍රීඩා උළෙල පැවැත්වීම සිදුවිය. දකුණු බැංකුව Bank of ALBA අනුව යම් රටක් සාමාජික වීමේදී තම විදේශ සංචිතයෙන් 1% ක් බැංකුවේ තැන්පත් කළ යුතුය. වෙනිසියුලාව මේ සඳහා ඩොලර් මිලියන 300ක් ලබාදී ඇත. තවද SUCRE නම් කලාපීය මුදල ඒකකයක් ඩොලරයට විකල්පව යෝජනා කර ඇත. වර්ෂ 2011 දී SUCRE හරහා ඩොලර් මිලියන 216 ක වටිනා වෙළඳාමක් සිදුකොට ඇත. පසුගිය කාලයේ සිදුවූ චාවේස්ගේ මරණයත්, වෙනිසියුලාවේ චාවේස් පාලනය මුහුණ දුන් අභියෝගත් නිසා මෙම වැඩපිළිවෙළද දැන් අභියෝග යකට මුහුණ දී ඇත.

## අධිරාජ්‍ය විරෝධී සංවිධානවල ක්‍රියාකාරීත්වය

## ලෝක සාම මණ්ඩලය World Peace Council (WPC)

1950 පෝලන්තයේ වොර්සෝ නුවරදී ලෝක සාම මණ්ඩලය World Peace Council (WPC)ආරම්භ විය. එහි අරමුණ වන්නේ, න්‍යෂ්ටික අවි භාවිතයට එරෙහිව අවි තරගය හා අවි පර්යේෂණ අත්හිටුවීමට බලකිරීමයි. 1970 දශකයේදී එය ලෝක නිරවිකරණය පිළිබඳ 'හෙල්සින්කි' ගිවිසුම අත්සන් කිරීමට විශාල කාර්යභාරයක්

කරන ලදී. 1980 දශකයේ ඇමරිකාව විසින් ආරම්භ කළ 'තාරුකා යුද වැඩපිළිවෙළ' Star Wars ලෝක සාම මණ්ඩලය WPC මගින් හෙළාදකින ලදී. 1991 පසු එය නව ලෝක රටාවට එරෙහිව තම අරගලය ආරම්භ කළේය. සමාජවාදී කඳවුර බිඳ වැටීමත් සමග සංවිධානමය හා දේශපාලනමය ගැටලුවලට මුහුණදීමට සිදුවූ ලෝක සාම මණ්ඩලයට WPC 1996 දී පැවැති මෙක්සිකෝ සමුළුවේ සිට නැවැත ප්‍රතිසංවිධානය වෙමින් මේ වන විට රටවල් සියයක පමණ සංවිධාන සහිත ලොව ඇති විශාලතම සාම සංවිධානය බවට පත්ව තිබේ.

## ලෝක සාම මණ්ඩලයේ WPC අරමුණ හා ප්‍රතිපත්ති

1. සියලුම සමූහ ඝාතක අවි අහෝසි කිරීම හා අවි තරගය අහෝසි කිරීම

2. සියලුම විදේශ හමුදා කඳවුරු අහෝසි කිරීම

3. සියලුම ආකාරයේ යටත්විජිතකරණයත්, නව යටත්විජිතකරණයත්, ජාතිවාදයත්, ලිංගභේදය මත පදනම්වූ අසාධාරණයත් ඇතුළු සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම් අහෝසි කිරීම

4. ජනතාවගේ ස්වයංතීරණ අයිතියට ගරුකිරීම හා නිදහසට ගරුකිරීම

5. රටවල් බෙදීම නතර කිරීම, රූකඩ රාජ්‍ය ගොඩනැගීමට එරෙහිවීම හා රාජ්‍යයන්හි භෞමික අඛණ්ඩතාවය පිළිගැනීම

6. රටවල්වල අභ්‍යන්තර කටයුතුවලට මැදිහත් නොවීම ඇතුළුව අධිරාජ්‍ය විරෝධී කටයුතු, ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් රැකගැනීම ආදිය වෙනුවෙන් ලෝක සාම මණ්ඩලය WPC කටයුතු කරයි.

මේ මොහොතේදි ලෝක සාම මණ්ඩලය WPC පලස්තීන නිදහස වෙනුවෙන්ද, ලිබියාව, සිරියාව ඇතුළු ආක්‍රමණවලට

එරෙහිවද, කියුබාවට එරෙහි සම්බාධකවලට එරෙහිවද ඇතුළු ගෝලීය ගැටලුවලදී කටයුතු කරයි.

**ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනය**

World Federation of Democratic Youth - WFDY

1945 නොවැම්බර් මස 10 දින ලන්ඩන්හි ආරම්භ විය. රටවල් 63 ක මිලියන 30 ක පමණ තරුණ ප්‍රජාවක නියෝජනය කරන සංවිධාන ඉහත සමුළුවට සහභාගි විය.

WFDY **සංවිධාන ව්‍යුහය**

1. ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සමුළුව සෑම වසර හතරකට වරක්ම පවත්වයි.

2. මහා මණ්ඩලය සාමාජික රටවල් 35 කි.

එහි වත්මන් සංවිධානයේ (මූලික) සංයුතිය

සභාපති - සයිප්‍රස් කොමියුනිස්ට් පක්ෂයේ (AKEL) තරුණ සංගමය (EDON)

ප්‍රධාන ලේකම් - කියුබානු කොමියුනිස්ට් පක්ෂයේ තරුණ සංගමය (YCJ )

උප සභාපති - ජනතා විමුක්ති පෙරමුණේ (People's Liberation Front ) සමාජවාදී ශිෂ්‍ය සංගමය (Socialist Student Union) (ශ්‍රී ලංකාව)

## සංවිධානයේ ප්‍රධාන ක්‍රියාකාරකම්

ලෝ පුරා තරුණ අයිතීන් (රැකියා, අධ්‍යාපන) වෙනුවෙන් අරගල කිරීම, අධිරාජ්‍යවාදී ආක්‍රමණවලට කටයුතුවලට එරෙහිවීම, ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට පක්ෂව අරගල කිරීම, මර්දනයට විරුද්ධව කටයුතු කිරීම, යටත්විජිතකරණයට නව යටත්විජිතකරණයට විරුද්ධවීම හා ලෝක අධිරාජ්‍ය විරෝධී තරුණ හා ශිෂ්‍ය උළෙල පැවැත්වීම යනාදිය එහි ක්‍රියාකාරිත්වයන්ය.

## ලෝක තරුණ හා ශිෂ්‍ය උළෙල

World Festival of Youth and Students – WFYS

ලොව පවත්වන විශාලතම ගෝලීය පරිමාණයේ නියෝජනයක් සහිත අධිරාජ්‍ය විරෝධී තරුණ හා ශිෂ්‍ය එකතුව මෙයයි. ලොව පුරා ධනේශ්වර විරෝධී, අධිරාජ්‍ය විරෝධී සංවිධානවල සහ පුද්ගලයන්ගේ ජාත්‍යන්තර එකතුවක් වන මෙම උළෙල අධිරාජ්‍ය විරෝධී ගෝලීය පරිමාණයෙන් මුවහත් කරන අත්දැකීම් හා සම්බන්ධතා පුළුල් කරන්නකි.

## තරුණ උළෙලේ ඉතිහාසය

1. උළෙල 1947 වසර ප්‍රාග් - තේමා පාඨය "චෙකොස්ලොවැකියා තරුණයනි එක්වව්. සාමය වෙනුවෙන් පෙරට යමු." 17,000ක් පිරිස සහභාගි වූහ.

2. 1949 වසර "බුඩාපෙස්ට්" (හංගේරියාව) - තේමා පාඨය "ලෝක සාමය, ප්‍රජාතන්ත්‍රවාදය, ජාතික නිදහස සඳහා තරුණයෙනි එක්වව්" රටවල් 82 කින් 10,400ක් පිරිස එයට සහභාගි වූහ.

3. 1951 වසර "බර්ලින්" (ජර්මනිය) තේමා පාඨය - "සාමයට, මිත්‍රත්වයට, නිරවිකරණයට" රටවල් 104 කින් 26,000ක් සම්බන්ධ විය.

4. 1949 වසර "බුකාරෙස්ට්" (රුමේනියාව) - රටවල් 111ක පිරිස 30,000ක් සහභාගි වූහ.

5. 1955 වසර "වෝර්සෝ" (පෝලන්තය) - රටවල් 114 කින් 30,000ක පිරිස සම්බන්ධ වූහ.

6. 1957 වසර "මොස්කව්" (සෝවියට් දේශය) - රටවල් 131කින් 34,000ක් සහභාගි වූහ.

11. 1978 වසර "හවානා" (කියුබාව) "අධිරාජ්‍ය විරෝධී සහයෝගය සාමය මිත්‍රත්වය" රටවල් 145 කින් 18,500ක පිරිස සහභාගි වූහ.

15. 2001 වසර (ඇල්ජීරියාව)

16. 2005 වසර (වෙනිසියුලාව) - රටවල් 144ක පිරිස 17,000ක් සහභාගි විය.

17. 2010 වසර (දකුණු අප්‍රිකාව) රටවල් 126ක පිරිස සහභාගිත්වය 15,000කි.

18. 2013 වසර (ඉක්වදෝරය)

## ජාත්‍යන්තර කොමියුනිස්ට් සම්මන්ත්‍රණය

International Communist Seminar

ආරම්භය 1992 බෙල්ජියමේ බ්‍රසල්ස් නුවරය. මූලිකත්වය ගනු ලැබූයේ බෙල්ජියම් කම්කරු පක්ෂය (International Communist Seminar) විසිනි. කොමියුනිස්ට් නාමය සහිත පක්ෂ හා කම්කරු පක්ෂවල එකතුවක් ලෙස මෙහි සහභාගිත්වය සකස් වේ.

මෙම සම්මන්ත්‍රණය සඳහා පක්ෂ තෝරා ගැනීමේදී

1. මාක්ස් ලෙනින්වාදය පිළිගැනීම

2. නිර්ධන පංති ජාත්‍යන්තරවාදය පිළිගැනීම

3. සංශෝධනවාදයට විරුද්ධවීම

එම සංවිධානය වගකීම් සහගත භූමිකාවක් අදාළ රටවල් තුළ නිර්ධන පන්තිය වෙනුවෙන් ඉටුකිරීම වැනි කරුණු පිළිබඳව සැලකිලිමත් වේ. එමෙන්ම සාමාජිකත්වය පිරිනැමීම පිළිබඳව අනෙකුත් සාමාජික පක්ෂවල එකඟතාවය මෙහිලා වැදගත්වේ.

## සම්මන්ත්‍රණ ආකෘතිය හා සංවිධානය

ජාත්‍යන්තර කොමියුනිස්ට් සම්මන්ත්‍රණය සෑම වසරකම බෙල්ජියමේදී පැවැත්වේ. එහි සංවිධාන කටයුතු හා මූලික පිරිවැය බෙල්ජියම් කම්කරු පක්ෂය විසින් දරනු ලබයි. නමුත් මෙම සංවිධාන කමිටුව සම්මන්ත්‍රණය පැවැත්වීමට අදාළ පරිපාලන හා දේශපාලන කරුණු ගැන වගකියන සංවිධානයක් වුවද සමුළු වාර දෙකක් අතර සහ පක්ෂ දෙකක් අතර සම්බන්ධීකරණය සිදුකරන හා කාලීනව මතුවන දේශපාලන කරුණු අරභයා මැදිහත්වන ලේකම් කාර්යාලයක් නොවේ.

සමුළුව සාමාන්‍යයෙන් දින 3ක් පමණ පැවැත්වේ. එය ජනමාධ්‍යයට විවෘත නැත. සමුළුව තුළ පක්ෂවලට තම අදහස් ඉදිරිපත් කිරීමට ඉඩදෙනු ලබන අතර ඉන්පසු අකාරාදී පිළිවෙළට හා මහාද්වීපික පිළිවෙළට අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබේ. එමෙන්ම එහිදී මතුවන කරුණු පිළිබඳව සංවාදයකට ඉඩ ඇත. එක් එක් වර්ෂයේ සමුළු තේමාව ඊට පෙර සමුළුවේදී තීරණය කරනු ලැබේ.

## සමුළු තේමා

1996 - නව ලෝක රටාව තුළ අධිරාජ්‍ය විරෝධී අරගලයේ ස්වභාවය

1997 - ඔක්තෝබර් විප්ලවයේ උපාය මාර්ගය කම්කරු පංතියේ විමුක්තියේ උපාය මාර්ගයයි

1998 - කම්කරු පංතිය හා එහි නියමු කාර්යභාරය හා සූරාකෑමේ නව ආකෘති හා අරගලයේ හා සංවිධාන කටයුතු පිළිබඳ අත්දැකීම්

1999 - අධිරාජ්‍යවාදය යනු යුද්ධයයි

2000 - අධිරාජ්‍යවාදය ෆැසිස්ට්කරණය හා ෆැසිස්ට්වාදය

2001 - අධිරාජ්‍යවාදී ගෝලීයකරණ යථාර්ථයක් තුළ ලෝක සමාජවාදී විප්ලවය

2002 - ආර්ථික අර්බුදය හා ලෝක පරිමාණයේ ආර්ථික අර්බුදයක් ඇතිවීමේ ඉඩකඩ

2003 - මාක්ස් ලෙනින්වාදී පක්ෂ හා අධිරාජ්‍යවිරෝධී පෙරමුණ යුද්ධයට මුහුණ දිය යුත්තේ කෙසේද

2004 - ලෝක යුද්ධයට එරෙහිව උපායමාර්ග හා උපක්‍රම

2005 - ජාත්‍යන්තරවාදි අත්දැකීම් හා අධිරාජ්‍ය විරෝධී අරගලය තුළ කොමියුනිස්ට්වාදීන්ගේ භූමිකාව

2006 - ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ අතීත හා වර්තමාන අත්දැකීම්

එකී සමුළුව තුළ 2012 සිට ජනතා විමුක්ති පෙරමුණද සාමාජිකත්වය දරයි. 2012 පැවති ලෝක සමුළුවට ලොව කොමියුනිස්ට් සහ කම්කරු පක්ෂ 61ක් සහභාගි වූ අතර ඊට අමතරව පක්ෂ 18 කින් තම වාර්තා ඉදිරිපත්කර තිබිණි.

## ලෝක වෘත්තීය සමිති සම්මේලනය

World Federation of Trade Unions (WFTU)

1945 ඔක්තෝබර් මස 03 ආරම්භය විය. මහද්වීප පහ නියෝජනය කරන රටවල් 105ක වෘත්තීය සමිති 2100කින් මිලියන 78ක් සාමාජිකත්වයක් දරයි. සභාපති - ශබාන් අසූස් වන අතර ප්‍රධාන ලේකම් - ජෝර්ජ් මව්රිකොස්ය. ප්‍රධාන කාර්යාලය ග්‍රීසියේ ඇතැන්ස් අගනුවර පිහිටා තිබේ.

### ආරම්භය හා පසුබිම

සම්මේලනයේ ආරම්භය 1945 පෙබරවාරි මස 6 සිට 17 වෙනි දින දක්වා ලන්ඩනයේ පැවැති ලෝක වෘත්තීය සමිති සම්මන්ත්‍රණය මගිනි. සීතල යුද්ධ සමයේදී එය ඇමරිකානු අධිරාජ්‍යවාදයට විරුද්ධ ස්ථාවරයක සිට කටයුතු කරනු ලැබීය. 1990දී සමාජවාදී කඳවුර බිඳවැටීමත් සමගම සංවිධානමය හා දේශපාලනමය ගැටලුවකට මුහුණ දුන්නේය. ජනතා විමුක්ති පෙරමුණේ අන්තර් සමාගම් සේවක සංගමය මේ වන විට WFTUහි සාමාජිකත්වය දරමින් සිටියි. WFTUහි ආසියා පැසිපික් කලාපීය කමිටු රැස්වීම 2012 වසරේදී ලංකාවේ කොළඹ නගරයේදී පවත්වන ලද්දේ සමාජවාදී කම්කරු සංගමය හා අන්තර් සමාගම් සේවක සංගමයේ සංවිධායකත්වයෙනි.

## නව බලවේග තුළ සමාජවාදය පිළිබඳ විශ්වාසය වර්ධනය වීම

දැනට දශකයකට පමණ පෙර ලොව ප්‍රගතිශීලී හා වාමාංශික කොටස් මැදිහත්වූ උදසෝෂණවල මූලික ඉලක්කය වූයේ ගෝලීයකරණ විරෝධයයි. නමුත් වර්තමානයේ යුරෝපයේ හා එක්සත් ජනපදය තුළ පැන නගින උද්සෝෂණ ඉන් ඔබ්බට ගොස් සමාජ ක්‍රමයක් ලෙස ධනවාදයට එරෙහිව සංවිධානය වේ.

පසුගිය උද්ඝෝෂණවලදී භාවිතා වූ We are 99% සටන් පාඨයෙන්ද පංති ප්‍රශ්නය ගෙනහැර දක්වයි. සමාජවාදය උදෙසා ගී ගැයූ, ඝාතනය කරන ලද ඇමරිකානු විප්ලවීය ගායක ජෝන් ලෙනන්ගේ ගීතවල භාවිත කළ සමාජවාදය නියෝජනය කරන වැකි සටන් පාඨවලට යොදාගැනීම සිදුවේ. උදාහරණයක් වශයෙන් 'Power to the people' යන යෙදුම ඔහුගේ ගීතවලින් ගෙන වර්තමාන උද්ඝෝෂණයන්හි භාවිතා වේ. තවද උද්ඝෝෂණවල පොදු පැහැය ලෙස රතුපාට යොදා ගැනීම විශේෂත්වයකි. සමාජවාදය අගය කරන දේශපාලන ව්‍යාපාර ආරම්භ කිරීම සිදුවේ. උදාහරණ වශයෙන් Back to the USSR සංවිධානය ගත හැකිය. ධනේශ්වර ආර්ථික විද්‍යාඥයින් පවා අර්බුදයේ ගැඹුර සෙවීමට නැවැත මාක්ස්ව කියවීමට (ප්‍රාග්ධනය කෘතියේ නව පිටපත් යුරෝපයේ බහුලව අලෙවි වේ.) පෙළඹී ඇත.

## ධනවාදය බිඳවැටීම හා වමේ නැගිටීම

සෝවියට් දේශය ඇතුළු සමාජවාදී කඳවුර බිඳ වැටුණද එය තාවකාලික පසුබැසීමක් පමණක් බව 90 දශකයේ අගදී වුවද වටහා ගැනීමට මාක්ස් ලෙනින්වාදී මූල ධර්මයන් පිළිබඳව අවබෝධය හා ඒ වෙනුවෙන් පෙනී සිටීමේ ධෛර්යය සහිත විප්ලවවාදීන්ට හැකි විය. හුදකලාව වුවද සමාජවාදය උදෙසා කියුබාව, වියට්නාමය, ලාඕසය, උතුරු කොරියාව සහ චීනය පෙනී සිටීම තුළින්ද ප්‍රකාශයට පත් වන්නේ එයයි. ජනතා විමුක්ති පෙරමුණද ඇති වූ තත්වය නිවැරදි ලෙස විග්‍රහ කරගනිමින් තම දැක්ම වන මාක්ස් ලෙනින්වාදයේ හා තම ඉලක්කය වන සමාජවාදයේ ධජය කිසිදා මොහොතකට හෝ පසෙක තැබුවේ නැත. ධෛර්යයට කිසිවක් ඉතිරි නොකර පසුබැසීම් හා පලායාම් පමණක්ම තිබූ අවධියේ වුවද නොපැකිළ සමාජවාදය උදෙසා වන භාවිතයක නියළීමට ජනතා විමුක්ති පෙරමුණ සමත්වීම නිහතමානී ආඩම්බරයකටද හේතු වන්නකි. සැබවින්ම

සමාජවාදයේ යුගය ආරම්භ කළ පසු ධනවාදයේ යුගයක් යළි බිහි වන්නේ නැත. සමාජවාදයේ ස්වභාවයම වන සංක්‍රමණීය අවධියක් යන්න හේතුවෙන් අත්හදා බැලීම් හා තාවකාලික පසු බැසීම්වලට මුහුණදීමට සිදුවීම අරුමයක් නොවේ. එහෙත් ධනවාදය යළි හිස ඔසවන්නක් නොවේ. සිය මරණීය වේදනාවෙන් ජීවිතය හා පොර බදන්නකි. එය ජයග්‍රහණයක් නොව අවසානයට ළඟා වීමකි. එම අවසානය ඉක්මන් කිරීම වෙනුවෙන් තනි තනි රටවල වම විසින්ද ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයක් ලෙසින්ද වමට පැවැරුණ අති විශාල පංගුවක් ඇත.

මේ වන විටත් ලතින් ඇමරිකාව පුරා හමායන වාමාංශික සහ අධිරාජ්‍ය විරෝධී පෙළගැස්ම එලෙසම පවතී. චාවේස් මිය යාමෙන් හෝ ෆිදෙල් ඔත්පල වීමෙන් එම ප්‍රවාහය නැවතී නැත. 2006 ජනවාරි බොලිවියාවේ බලයට පැමිණි ඉවෝ මොරාලේස් සමාජවාදය සඳහා ජනතා ව්‍යාපාරය ගොඩනැගීය. එල්සැල්වදෝරය යනු එක්සත් ජනපදය එළිපත්තේ ඇති රටකි. 2009 මැයි 15 පැවති ජනාධිපතිවරණයෙන් පැරබුන්ඩෝ මාටි ජාතික ව්‍යාපාරය (FMLN) යේ මොරිකෝ ෆියුන්ස් 40%ක් චන්ද ලබා ජයග්‍රහණය කළේය. 2011 නොවැම්බර් නිකරගුවාවේ පැවැති මැතිවරණයෙන් ඩැනියෙල් ඔටේගා නැවැත ජයග්‍රහණය කිරීම සිදුවිය. සැනිඩිනිස්ටා ජාතික විමුක්ති පෙරමුණ FSLN නැවත ක්‍රියාත්මක වෙමින් පවතී.

සමාජවාදී කඳවුරෙන් ඉතිරිව පවතින රටවල් කිහිපය පවා ලෝක ධනවාදයෙන් ඔවුන්ව ආර්ථික, දේශපාලනමය සහ මිලිටරීකරණය ලෙස පීඩාවට පත්කරද්දීත් එම සමාජවාදී රටවල් ලබාගන්නා සමාජ, භෞතික ජයග්‍රහණයන් අනෙකුත් රටවල වාමාංශික ව්‍යාපාර තහවුරු වීමට සාධනීය ලෙස බලපානු ලබයි. මේ අතර නේපාලය තුළ ක්‍රියාත්මක වාමාංශික ව්‍යාපාරයද පසුගිය කාලය

තුළ ඉදිරියට පැමිණ ඇත. ලෝක අධිරාජ්‍ය විරෝධී ක්‍රියාවලියේදී ආරම්භක භූමිකාවක් ඉටු කළ පෘතුගාලයේද කොමියුනිස්ට් පක්ෂය මැතිවරණවලදී ඉදිරියට පැමිණ ඇති අතර රුසියාවේ සමාජවාදී පාලනය අගය කරන ව්‍යාපාර බිහිවී ඇත. පසුගිය කාලයේදී රුසියානුවන් විසින් යෙල්ට්සින්ගේ පිළිරූ කඩා බිඳ දමා තිබේ.

ධනවාදය තම අර්බුදය පියමං කිරීම සහ අධික ලාභ ඉපයීම උදෙසා යොමු වූ මාර්ගයේ තර්කානුකූල අවසානය අධිරාජ්‍යවාදී අවධියයි. කොමියුනිස්ට්වාදය ධනවාදයට එරෙහිව විකල්පය ලෙසින් වන අරගලයේදී ධනවාදය පරාජය කිරීම ආරම්භ කොට ඇත. එය සමාජවාදී අවධියට අවතීර්ණව ඇත. එහිදි දැවැන්ත ජයග්‍රහණයන් මෙන්ම එවන්වූ පසුබැසීම්ද පවතියි. එහෙත් අධිරාජ්‍යවාදී අවධිය හෙවත් ඒකාධිකාරී ධනවාදය තුළ නිෂ්පාදනයේ දැවැන්ත සමාජමයකරණයත් එහෙත් එය අත්පත් කරගනු ලබන පෞද්ගලික ස්වරූපයත් විසින් දැවැන්ත ප්‍රතිවිරෝධයක් මතුව තිබේ. එය අවසන් විය හැකි යැයි සිතිය හැකි මාර්ග දෙකකි. එක් අතකින් නිෂ්පාදනයේ සමාජමය ස්වරූපය ඉවත්ව නැවත එය පෞද්ගලික ස්වරූපයට පැමිණිය යුතුය. එහෙත් සමාජ සංවර්ධනය ආපසු හැරවිය නොහැක. නිෂ්පාදන බලවේගයන්ගේ අතිමහත් දැවැන්ත සංවර්ධනය විසින් එය ගෙනවිත් තිබෙන ස්ථානය යළි වෙනස් කළ නොහැක. එසේ නම් දැන් ඉතිරිව පවතින්නේ, සමාජමය නිෂ්පාදනය සමාජය සතුවන කොමියුනිස්ට් ක්‍රමය තුළින් මෙම ප්‍රතිවිරෝධය විසඳාලීමයි. සෝවියට් දේශය ඇතුළුව සමාජවාදී කඳවුරේ රටවල් ගණනාවක්ම ඇද වැටුණද ධනවාදය සදාකාලිකව ස්ථාවර වන්නේ නැත. එනිසා මේ පියමං කරන්නේ සමාජවාදයේ අවධියයි. සමාජවාදය බිඳවැටුණු රටවල පමණක් නොව දිගටම පැවැති ධනවාදී රටවල පවා සමාජ විප්ලවයේ ඉල්ලීම වන්නේ, සමාජවාදයයි. ඒ අනුව සමාජවාදී කඳවුර බිඳවැටී විසිපස් වසරක් ගෙවීයමින් පවතින මේ මොහොතේ ලෝකය තුළ වඩ

වඩාත් දැල්වෙන්නේ සමාජවාදය පිළිබඳ බලාපොරොත්තුවයි.

2008 ඇමරිකා එක්සත් ජනපදයෙන් ඇරඹි මහා අවපාතයේදී මේ පිළිබඳව ෆිදෙල් කස්ත්‍රෝ මෙසේ පැවසීය.

***"මෙම අර්බුදය සත්‍යය පිළිබඳ වැඩි දැනුමක්ද, වැඩි දේශපාලන සවිඥානකත්වයක්ද, වැඩි කැරලිකාරීත්වයක්ද, වැඩි විප්ලව ගණනාවක්ද ගෙනෙනු ඇත."***

ධනවාදයේ කඩාවැටීම සමාජවාදී පරිවර්තනයකට පෙරවදන බවට පත්ව තිබුණාද කලින් පැවැති සමාජවාදී කඳවුර බිඳ දැමීම විසින් සමාජය තුළ තහවුරු වී ඇති විවිධ නිර්මාක්ස්වාදී සහ අවිද්‍යාත්මක මත නූතන සමාජවාදී සමාජයක් නිර්මාණය කිරීමට බාධාවක්ද වී තිබේ. එනිසා මේ තීරණාත්මක මොහොතේදී "සෝවියට් දේශය ප්‍රමුඛ සමාජවාදී කඳවුර බිඳ වැටුණේ ඇයි?" යන්න පිළිබඳවත්, "සමාජවාදය යනු කුමක්ද? සහ සමාජවාදී විප්ලවය යනු කුමක්ද?" යන කරුණ පිළිබඳවත් මාක්ස් ලෙනින්වාදී දැක්මක් මත පිහිටා කරගනු ලබන නිවැරදි විග්‍රහයක් අත්‍යවශ්‍ය වන්නේය.

ISBN 978-955-8696-43-9
9 789558 696439

ආධාරය: රු.300/-

නියමුවා ප්‍රකාශන

43/20, ශුභගත පෙදෙස, පිළියන්දල පාර, මහරගම.
දුරකථන:- +94112785612
ෆැක්ස්:- +94112786050
ඊ-මේල්:- niyamuwanews@gmail.com